
# ක්‍රිස්තුස්වහන්සේ තුළ
# ආත්මික ආශිර්වාද



## එපීස අධ්‍යයනය 01

# ක්‍රිස්තුස්වහන්සේ තුළ ආත්මික ආශිර්වාද

**එපීස 1 : 1-14**

**<u>හැඳින්වීම</u> :-**

පාවුල්තුමා, ඔහුගේ තුන්වන මිෂනාරි ගමනේදී එපීසය වෙත ගොස්, තුන් අවුරුද්දක් මුළුල්ලේ එහි රැඳී සිටිමින් සේවය කළේය (**ක්‍රියා 20 : 31**). දෙවියන්වහන්සේ පාවුල් තුළින් කෙතරම් බලවත් හාස්කම් කළාද යන්න, පාවුල්ගේ ලේන්සුවක් ලෙඩුන් ළඟට ගෙනගිය පමණින් රෝගීන් සුවය ලැබීමෙන් සහ නපුරු ආත්ම දුරුවීමෙන්, අපට පැහැදිලි වේ. (**ක්‍රියා 19 : 11, 12**)

දෙවියන්වහන්සේ මේ ආකාරයට පාවුල් තුළින් ක්‍රියාකිරීමේ හේතුවෙන් බොහෝ දෙනෙක් ඇදහිල්ලට පැමිණි අතර, (**ක්‍රියා 19 : 17 - 20**) එපීසයේ පිහිටා තිබුනු අර්තේමියස්ගේ දේවාලයේ රිදී රූප සාදන්නාවූ රිදී කරුවන්ගේ කර්මාන්තයට මෙය තර්ජනයක් විය. මෙම හේතුව නිසාම ඔවුහු එපීසයේ මහත් කැළඹීමක් ඇතිකල නිසා, පාවුල් තම ගෝලයන්ගෙන් සමුගෙන, එපීසයෙන් පිටත්ව, මකදෝනිය වෙත ගියේය (**ක්‍රියා 20 : 1**).

මෙම ලිපිය පාවුල් විසින් ලියන ලද්දේ, රෝමයේ හිරකරුවෙක් ලෙස වන අතර (**එපීස 3:1, 4:3**) එය එපීසයේ සභාව වෙත යවන ලද්දේ තුඛිකස් නමැති ඇදහිලිවන්ත - යෙකුගේ අතිනි (**එපීස 6 : 21**). එපීස පොත පරිච්ඡේද හයකින් සමන්විත වේ. මෙම පරිච්ඡේද හය අතුරින්, ප්‍රථම තුනේ තේමාව **'ක්‍රිස්තුස්වහන්සේ තුළ අපට හිමි ආශිර්වාද'** ලෙසද, ඉතිරි තුනේ තේමාව **'ක්‍රිස්තුස්වහන්සේ තුළ ඇවිදීම හෝ හැසිරීම'** ලෙසද, විස්තර කළ හැක.

එබැවින් මෙම අධ්‍යයනයේදී අප අරඹන්නට යන්නේ **'ක්‍රිස්තුස්වහන්සේ තුළ අපට හිමිවන්නාවූ ආශිර්වාද'** වෙත අපගේ අවධානය යොමුකිරීම වන අතර, **එපීස 1** සිට **3** දක්වා තේරුම්ගැනීමේ යතුරක් ලෙස **එපීස 1 : 4** හඳුන්වාදීමට කැමැත්තෙමි.

**එපීස 1 : 4 :-**

" **..... උන්වහන්සේ තුළ ස්වර්ගීය ස්ථානවල <u>සියලු ආත්මික ආශිර්වාදවලින්</u> උන්වහන්සේ අපට ආශිර්වාද කළසේක."**

එබැවින් දේව දරුවන් වන අප හට ක්‍රිස්තුස්වහන්සේ තුළ, මහත් දේ කළ හැකි අතර (**පිලිප්පි 4 : 13**), උන්වහන්සේ - ගෙන් වෙන්ව අපට කිසිත් කළ නොහැක (**යොහන් 15 : 5**).

**පිලිප්පි 4 : 13 :-**

" **මා බලවත් කරන්නාවූ <u>තැනන්වහන්සේ තුළ මට සියලු දේ කරන්ට පුළුවන</u>."**

ප්‍රේමණීය දේව දරුව, මෙය පැහැදිලිව තේරුම්ගෙන, අපගේ ජීවිතයේ බලය, ශක්තිය, ආශිර්වාද සහ එල දැරීම යනාදිය රඳා පවතින්නේ, ක්‍රිස්තුස්වහන්සේ තුළ බැවින්, මිදිවැලක අතු, වැලට සම්බන්ධව පවතින ආකාරයට, ක්‍රිස්තුස්වහන්සේට සම්බන්ධවී මොහොතක් පාසා මොහොතක් ජීවත්වීමට තිරලෙස තීරණය කරන්න (**යොහන් 15:4**). මේ අන්දමින් යේසුස්වහන්සේට සම්බන්ධවී, අප ජීවත්වන්නෙමු නම්, අප සැමගේ ජීවිත ආලෝක මෙන් බැබළිම අප ඇසුරුකරන සැමදෙනා නියතින්ම දකිනවා ඇත.

<u>**අධ්‍යයනය**</u> **:-**

**එපීස 1 : 4-14** දක්වා සඳහන්වන්නාවූ, ක්‍රිස්තුස්වහන්සේ තුළ අපට හිමිවන්නාවූ ආශිර්වාද හයක් ඔබට මෙම අධ්‍යයනය තුළින් හඳුන්වා දෙනු ලැබේ. මෙම පද එකොළහේ ' **ක්‍රිස්තුස්වහන්සේ තුළ** ' හෝ ඊට සමාන වචන එකොළොස්වතාවක් සඳහන්වීම, විශේෂත්වයකි. මෙම ආශිර්වාද ඔබට හඳුන්වාදීමට ප්‍රථමයෙන් දෙවියන් - වහන්සේ මේ සම්බන්ධයෙන් මාගේ හදවතේ තැන්පත්කළ අදහස් කිහිපයක් ඔබ සමඟ බෙදා ගැනීමට කැමැත්තෙමි.

❖ පාවුල්තුමා තම තෙවන මිෂනාරි ගමනේ එපීසයට යෑමට පෙර, **'යොහන්ගේ බව්තීස්මය'** පමණක් දැන සිටි අපොල්ලොස් නම් යුදෙව්වෙක් එපීසයට පැමිණ, යේසුස්වහන්සේගේ කාරණා ගැන ඉගැන්නුවේය.
(**ක්‍රියා 18 : 24, 25**)

එබැවින් පාවුල් එපීසයට පැමිණ, එහිදී ඔහුට මුණගැසුනු 'ගෝලයන්ගෙන් ', ඔවුන් අදහාගත් කල ශුද්ධාත්මයාණන් - වහන්සේ ලැබුවේදැයි ඇසූවිට ඔවුන්ගේ පිළිතුර වූයේ, ඔවුන් ශුද්ධාත්මයාණන්වහන්සේ ගැන අසාවත් නොතිබුණු බවයි **(ක්‍රියා 19 : 1, 2).**

පාවුල් ඔවුන්ට උගන්වා, ඔවුන්ව යේසුස්වහන්සේගේ නාමයට බව්තීස්ම කර, ඔවුන් පිට අත් තැබූ කල, ශුද්ධාත්මයාණන්වහන්සේ ඔවුන් කෙරෙහි පැමිණ, ඔවුහු අන්‍යභාෂාවලින් කථාකරමින් අනාගතවාක්‍ය කීවෝය. **(ක්‍රියා 19 : 5, 6)**

එපීසයේ පාවුල් ලද මෙම අත්දැකීම තුළින් දෙවියන්වහන්සේ මාගේ හදවතේ තැන්පත්කල අදහස්, ඉතා යටහත්ව ඔබ ඉදිරියේ තැබීමට කැමැත්තෙමි.

(i) එපීසයේ සිටි 'ගෝලයින් ' ලෙස හඳුන්වනු ලැබූ මෙම දොළොස්දෙනා **(ක්‍රියා 19 : 7)** **'ක්‍රිස්තුස්වහන්සේ තුළ'** ඇති ආශිර්වාද ගැන කිසිම දැනගැනීමක් නොතිබීම නිසාම, එපීස සභාවට පාවුල් යැවූ මේ ලිපියේ මූලික තේමාව ලෙස පාවුල් උගන්වන්නේ **'ක්‍රිස්තුස්වහන්සේ තුළ ඇති ආශිර්වාද'** සහ **'ක්‍රිස්තුස්වහන්සේ තුළ ඇවිදීම'** යන්න වේ. දෙවි සමිඳුන් මාගේ හදවතට පෙන්වාදුන්නේ උන්වහන්සේගේ පුදුමාකාර ක්‍රියාකිරීමයි.

පාවුල්තුමාට රෝමයේ සභාව වෙත යෑමට තද ආශාවක් තිබුණු නමුත්, ඔහුට එහි යෑමට නොහැකිවීම නිසාම, පාපය, ගැළවීම, පාරිශුද්ධකරණය යනාදිය පිළිබඳව වඩාත් අනර්ඝ දේවධර්මය රෝම පොතේ, ඔහු තුළින් ලියා යැවීමයි. පාවුල්තුමා එපීසයේ ලත් මුල් අත්දැකීම නිසාම **'ක්‍රිස්තුස්වහන්සේ තුළ'** ජීවිතය ගැන ඉතා අනර්ඝ දේවධර්මය, ඔහු තුළින් ලියා යැවීය.

සැබවින්ම ශුද්ධවූ බයිබලයේ, සෑම පොතක්ම ඉතා වැදගත්වන අතර, මේවා අතුරින් රෝමවාසීන්ට සහ එපීස සභාවට පාවුල් ලියූ ලිපි සුවිශේෂ තැනක් ගන්නා බව නොරහසකි.

(ii) අද දවසේ **'කිතුනු'** නම දරන, බොහෝ දෙනා ශුද්ධාත්ම - යාණන්වහන්සේගේ ක්‍රියාකිරීම, ශුද්ධාත්මයාණන්-වහන්සේගේ බලය සහ ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනා යනාදිය ගැන ඇත්තාවූ දැනුම සහ අත්දැකීම ගැන සෑහීමට පත්වීමට සභාවට නොහැකි වේ.

මෙය ගැන විශේෂ අවධානය යොමුකරන ලෙස, ආත්මික දීමනා අත්දකින්නාවූ සෑම සහෝදර, සහෝදරියන්ගෙන් මා බැගෑපත්ව ඉල්ලා සිටිමි.

(iii) පාවුල්ට ප්‍රථමයෙන් එපීසයේ ඉගැන්වූ අපොල්ලොස් දැන සිටියේ යොහන් බව්තීස්තගේ බව්තීස්මය පමණක් වූ අතර, පාවුල් බොහෝසෙයින් ආත්මික දීමනා ලද ගුරුවරයෙකි.

මෙය තුළින් දේව වචනය නැවත වරක් අපට පෙන්වා දෙන්නේ, අප සිටිනා ආත්මික තලයෙන් එතෙරට අපගේ ගෝලයන් අපට ගෙන යා නොහැකි බවයි. යොහන්ගේ බව්තීස්මය පමණක් දැන සිටි අපොල්ලොස්ට එපීසයේ ගෝලයන් ගෙන යෑමට හැකිවූයේ එතනට පමණි. එබැවින් ආත්මික ආලේපලත් ගුරුවරුන්, සභාව තුළ වැඩි වැඩියෙන් පත්කරන ලෙස සමිඳුන්ගෙන් යදිමු.

(iv) එපීසයේ සිටි **' ගෝලයන් '** දොලොස් දෙනාගේ ජීවිතවල දෙවියන්වහන්සේ අපොල්ලොස් තුළින් (සමහරවිට) ඇරඹුවාවූ දේ, උන්වහන්සේ පාවුල් තුළින් සම්පූර්ණ කල සේක.

**පිලිප්පි 1 : 6 :-**

**" නුඹලා තුළ යහපත් වැඩක් පටන්ගත් උන්වහන්සේ, යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ දවස දක්වා ඒක සම්පූර්ණ කරනසේකැයි යන මේ විශ්වාසය ඇතුව සිටිමි. "**

දේව දරුව, මේ පොරොන්දුව ඔබගේම ලෙස භාරගන්න. දෙවියන්වහන්සේ ඔබගේ ජීවිතයේ ආරම්භ කර ඇති දේ, (එපීසයේ කළ ලෙසම) උන්වහන්සේ සම්පූර්ණකරන බව අදහමින්, විශ්වාසවන්තව, යේසුස්වහන්සේ තුළ ජීවත්වන්න.

**<u>ක්‍රිස්තුස්වහන්සේ තුළ අපට හිමි ආශිර්වාද</u>**

(a) **දෙවියන්වහන්සේ විසින් තෝරා ගනු ලැබීම - එපීස 1 : 4**

**එපීස 1 : 4 :-**

" **ලෝකය මැවීමට ප්‍රථමයෙන් ක්‍රිස්තුස්වහන්සේ තුළ <u>අප තෝරාගත් ලෙසම</u> .....** "

දේව වචනයේ ඉතා පැහැදිලිව උගන්වන්නේ ඔබ සහ මම, දෙවියන්වහන්සේ විසින්ම තෝරාගෙන ඇති බවයි. මේ සම්බන්ධයෙන් අප මුලින්ම වටහාගත යුතු දෙයක් වන්නේ, දෙවියන්වහන්සේ මෙසේ අප තෝරාගෙන ඇති බවත්, **<u>දෙවියන්වහන්සේ</u>, උන්වහන්සේගේ වචනය තුළින් <u>මනුෂ්‍ය වූ අපට කරන්නාවූ එළිදරව්කිරීමක්</u> මිස, මනුෂ්‍යයන් විසින් ඉදිරිපත් කරනු ලබන්නාවූ අදහසක් පමණක් නොවන බවයි.**

සැබවින්ම ' **ලෝකය මැවීමටත් ප්‍රථමයෙන්** ' උන්වහන්සේ අපව තෝරාගත්තේ කෙසේද කියා, 100% පැහැදිලි අංග - සම්පූර්ණ විස්තරයක් කිරීමට හෝ 100% වටහාගැනීමට, කාලයෙන් සීමාවූ මනුෂ්‍යයාට නොහැකි බව, මාගේ විශ්වාසයයි.

මෙනමුත් එය නොවෙනස්වන්නාවූ,බොරු නොකියන්නාවූ දෙවියන්වහන්සේගේ වචනයේ සඳහන් එළිදරව්කිරීමක් බැවින්, මම එය 100% සත්‍යය බවට ඇදහිල්ලෙන් පිළිගන්නාවූ කරුණකි. මේ අතරම දෙවියන්වහන්සේ මනුෂ්‍යයන් පමණක් නොව ජාතීන්ද තෝරාගන්නා බව සෑම කිතුනුවෙක්ම පිළිගන්නාවූ සත්‍යයක්ව පවතියි.

**නිදසුන් වශයෙන් :-**

(1) **<u>දෙවියන්වහන්සේ ආබ්‍රම් තෝරාගෙන</u>,** ඔහුට කථාකොට, ඔහුට මහත් පොරොන්දු රාශියක් දුන් බව අපි අදහමු. **(උත්පත්ති 12 : 1-3)**

(2) දෙවියන්වහන්සේ ආබ්‍රහම්ගේ (ආබ්‍රම්) මුනුබුරන් දෙදෙනා වූ ඒසව් සහ යාකොබ් අතුරින්, යාකොබ්ව තෝරා, ඔහුට ඉශ්‍රායෙල් යන නම තබා, ඔහුගෙන් බිහිවූ **<u>ඉශ්‍රායෙල් ජාතිය තමන්වහන්සේගේ සෙනඟ ලෙස තෝරාගත්</u>** බවද අපි අදහමු. **(උත්පත්ති 35 : 10-12)**

ප්‍රේමණීය සහෝදරයා, සහෝදරී, අපගේ මනසට තේරුම්ගත නොහැකිතරම් විශාලවූ විශ්ව මණ්ඩලයේ මැවුම්කාර වූ සර්වබලධාරී <u>දෙවියන්වහන්සේ,</u> දූවිලි මෙන්වූ <u>අපව (ඔබව) තෝරාගෙන තිබේ</u> !

සැබවින්ම කෙතරම් මහත් ආශිර්වාදයක්ද? කෙතරම් වාසනාවක්ද? කෙතරම් අපව සතුටින් උද්දාමයට පත්කරන්නාවූ කරුණක්ද?

දේව දරුවෙනි, අපි අතිශයින් වාසනාවන්ත සෙනඟකි. මන්දයත්, මහෝත්තමවූ දෙවියන්වහන්සේම අපව තෝරාගෙන ඇතිසේක. එබැවින් උන්වහන්සේ අපව තෝරාගෙන ඇත්තේ කුමක් උදෙසාද? යන ප්‍රශ්නයටද, දේව වචනයෙන් පිළිතුරක් සෙවීම ඉතා වැදගත් සේ සලකමි.

මෙම ප්‍රශ්නයට පිළිතුරු වශයෙන්, දේව වචනයෙන් පද තුනක් පමණක් ඔබ ඉදිරියේ තබමි.

(i) **යොහන් 15 : 16 :-**

**" නුඹලා මා තෝරාගත්තා නොව <u>මම නුඹලා තෝරාගෙන පත්කෙළෙමි</u>. <u>එසේ කළේ</u> [1] <u>නුඹලා ගොස් ඵල දරන පිණිසත්</u>, [2] <u>නුඹලාගේ ඵල පවතින පිණිසත්</u>, මාගේ නාමයෙන් පියාණන් - වහන්සේගෙන් [3]<u>නුඹලා ඉල්ලන කොයි දෙයක් නුමුත් උන්වහන්සේ නුඹලාට දෙන පිණිසත්ය</u>. "**

(ii) **එපීස 1 : 3, 4 :-**

**" ..... මක්නිසාද උන්වහන්සේ ඉදිරිපිට ප්‍රේමයෙන් [4] <u>ශුද්ධව, නොකැලැල්ව සිටින පිණිස</u>, ලෝකය මැවීමට ප්‍රථමයෙන් ක්‍රිස්තුස්වහන්සේ තුළ අප <u>තෝරාගත් ලෙසම</u>, ...... "**

(iii) **1 පේත්‍රුස් 1 : 15 - 16 :-**

**" ...නුඹලාත් නුඹලාගේ මුළු හැසිරීමේදී ශුද්ධව සිටපල්ලා."**

දෙවියන්වහන්සේගේ කැමැත්ත මෙම පදවල සඳහන් - වන්නාවූ 1, 2, 3, 4 සේ සලකුණු කොට, යටින් ඉරි ඇඳ ඇති දේ, අපගේ ජීවිතවල ඉටුවීම වේ. අප සැම යාච්ඤාවෙන්, මේ අයුරින් ජීවත්වීමට උන්වහන්සේගෙන් ශක්තිය සහ බලය ඉල්ලා සිටිමු.

(b) **<u>දෙවියන්වහන්සේගේ පුත්‍රයන් වීමට පෙරනියම කරනු ලැබීම</u> -**
**( <u>එපීස 1 : 6</u> )**

**එපීස 1 : 6 :- " තමන්වහන්සේගේ කැමැත්තේ ප්‍රසන්නකමේ හැටියට, යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කරණකොටගෙන පුත්‍රයන් වීමට අප පෙර නියමකළසේක. "**

දෙවියන්වහන්සේගේ මෙම පෙරනියම කිරීම, වැඩියෙන් තේරුම් ගැනීම උදෙසා **රෝම 8 : 29, 30** වෙතද ඔබගේ අවධානය යොමු කරමි.

**රෝම 8 : 29, 30 :- " මක්නිසාද උන්වහන්සේ පූර්වයෙන් ඇඳිනගත්තවුන් තමන්වහන්සේගේ පුත්‍රයා බොහෝ සහෝදරයන් අතරේ කුලුඳුලා වන පිණිස ඒ <u>පුත්‍රයාගේ ස්වරූපයට සමානවෙන්ට පූර්වයෙන් නියමකළසේක. පූර්වයෙන් නියමකළවුන් උන්වහන්සේ කැඳවාගත්සේක. කැඳවාගත්තවුන් උන්වහන්සේ ධර්මිෂ්ඨ කළසේක</u>. "**

ඉහත සඳහන් පදවලින් අපට පෙනීයන්නේ, දෙවියන් - වහන්සේ තෝරාගත් අප සැම, උන්වහන්සේ කැඳවාගත් බවත්, කැඳවාගත් අප සැම ධර්මිෂ්ඨ කළ බවත්, උන්වහන්සේගේ පුත්‍රයන් වී යේසුස්වහන්සේගේ ස්වරූපයට සමානවීමට අප සැම පෙරනියම කළ බවත්ය.

දෙවියන්වහන්සේ පෙරනියම කළ අන්දමට, උන්වහන්සේ - ගේ පුත්‍රයන්වීම උදෙසා අප යේසුස්වහන්සේව අපගේ **' <u>ජීවිතවලට පිළිගැනීම</u> '** අත්‍යවශ්‍ය වේ. **(යොහන් 1 : 12)** දේව දරුව, දෙවියන්වහන්සේ ඔබව උන්වහන්සේගේ පෙරදැනගැනීම අනුව තෝරා, ඔබව කැඳවා, උන්වහන්සේගේ පුත්‍රකමට ඔබව ඇතුල්කර ඇත්තේ **යේසුස්වහන්සේගේ ස්වරූපයට සමාන වන පිණිසය.**

ඔබ උදෙසා දෙවියන්වහන්සේගේ කැමැත්ත වන්නේ, ඔබ දිනෙන් දින, දෙවියන්වහන්සේට කීකරුව ඇවිදිමින්, දිනෙන් දින, වැඩි වැඩියෙන් යේසුස්වහන්සේ මෙන් වීමයි.

දේව දරුවන්වූ අප සැම, යේසුස්වහන්සේගේ අඩිපාරේ යෑමට උත්සාහකරමින්, දිනෙන් දින ශුද්ධාත්මයාණන් - වහන්සේගේ ක්‍රියා කිරීම තුළින් උන්වහන්සේ මෙන් වීමට කැපවෙමු.

**1 යොහන් 3 : 1 - 2 :-**

" **<u>අපි දෙවියන්වහන්සේගේ දරුවෝයයි</u> කියනු ලබන ලෙස පියාණන්වහන්සේ කෙබඳු ප්‍රේමයක් අපට දී වදාළසේක්දැයි බලාපල්ලා. අපි එබඳුවෝම ..... ..... ප්‍රේමවන්තයෙනි, <u>දැන් අපි දෙවියන්වහන්සේගේ දරුවෝය</u> ..... උන්වහන්සේ ප්‍රකාශවුණාම <u>අපි උන්වහන්සේට සමානවන බව දනිමුව</u> ....."**

දෙවියන්වහන්සේට අපගේ ජීවිත භාරදී ඇති අප සැම, උන්වහන්සේගේ දරුකමට පත්ව සිටින බව අප දනිමු. උන්වහන්සේගේ දරුවන් ලෙස යේසුස්වහන්සේ තම පියාණන්වහන්සේට කීකරුවුනාක් මෙන්, අපද අපගේ ස්වර්ගයේ වැඩසිටින අපගේ පියාණන්වහන්සේට සම්පූර්ණයෙන්ම කීකරුව ජීවත් වෙමු. අපද යේසුස් - වහන්සේව අනුගමනය කරමින්, සැමවිටම ප්‍රේමයෙන් සහ යටහත්කමින් ක්‍රියාකරමු.

(c) **යේසුස්වහන්සේගේ ලේ තුළින්, මිදීම ලැබීම - එපීස 1 : 7**

**එපීස 1 : 7 :-**

" **..... උන්වහන්සේගේ ලේ කරණකොටගෙන අපේ මිදීම වන අපේ වරදවලට කමාව අපට ඇත්තේය."**

මෙම පදයේ '**මිදීම**' යන වචනයේ අර්ථය වන්නේ -

**' අවශ්‍ය මිලය ගෙවා නිදහස් කිරීමයි.'**

**1 පේත්‍රුස් 1 : 18, 19 :-**

" **මක්නිසාද නුඹලාගේ පියවරුන්ගෙන් ලැබූ නුඹලාගේ නිෂ්ඵල හැසිරීමෙන් නුඹලා මුදනු ලැබුවේ, රන් රිදී වැනි දිරායන දේවල් කරණකොටගෙන නොව, කැලලක්වත් පලුද්දක්වත් නැති බැටළු පැටවකුගේ ලේ වැනිවූ ක්‍රිස්තුස්වහන්සේගේ අනර්ඝ ලෙය කරණකොටගෙන බව නුඹලා දන්නහුය."**

අපගේ පාපවලින් අපව මුදවා ගැනීම උදෙසා, ගෙවන ලද මිලය වන්නේ යේසුස්වහන්සේගේ ලේ බව අප සැම දන්නා කරුණකි. මේ මිලය අප උදෙසා යේසුස්වහන්සේ පිදූ නිසා අපගේ සියළු පාපවලට සමාව අපට ඇත්තේය.

**යෙසායා 44 : 22 :-**

**" මම නුඹේ අපරාධ වලා පටලයක් මෙන්ද, නුඹේ පාප වලාකුළක් මෙන්ද මකා දැමුවෙමි. මා වෙතට හැරී වරෙන්න ; මක්නිසාද මම නුඹ මිදුවෙමි. "**

මිදීම සහ පාප සමාව ගැන ඔබ නිසැකවම නිතර අසා ඇති බැවින්, එය ගැන වැඩිදුරට විස්තර නොකරමි. මෙනමුත් එය ගැන නොදන්නා ජන සමූහයක් මැද වෙසෙන අප සැම, එය ගැන අන් අයට කියාදීමේ වැදගත්කම, ඔබට මෙහිදී මතක්කිරීමට කැමැත්තෙමි.

(d) **දෙවියන්වහන්සේ උන්වහන්සේගේ කැමැත්තේ රහස අපට දන්වාදීම - එපීස 1 : 10**

**එපීස 1 : 9, 10 :-**

**" ....... කාලවල සම්පූර්ණකමේ නියමය ලෙස ස්වර්ගයෙහි දේවල්ද පොළොවෙහි දේවල්ද යන සියල්ල ක්‍රිස්තුස්වහන්සේ තුළ ඒකරාශිකරන්ට, තමන්වහන්සේ තුළ ....... තමන්ගේ කැමැත්තේ රහස අපට දන්වාදීමෙන්ය. "**

මෙහි 'රහස' යන්නෙන් අදහස්කරන්නේ, **' මෙතෙක් කල් දෙවියන්වහන්සේ එළිදරව් නොකල සත්‍යයක් '** යන්න වන අතර, මෙහි අප ලබා ඇති අනර්ඝ ආශිර්වාදය වන්නේ, උන්වහන්සේ උන්වහන්සේගේ කැමැත්තේ රහසක්ව පැවතුනාවූ, ස්වර්ගයෙහි දේ සහ පොළොවෙහි දේ ක්‍රිස්තුස්වහන්සේ තුළ ඒකරාශීකිරීමේ රහස අපට එළිදරව් කිරීමයි.

**පිලිප්පි 2 : 9 - 11 :-**

**" එබැවින් දෙවියන්වහන්සේ උන්වහන්සේව ඉතා උසස්කොට, සියලු නාමවලට වඩා උසස් නාමය උන්වහන්සේට දුන්සේක. එසේ කළේ, ස්වර්ගයෙහිද පොළොවෙහිද, පොළොව යටද සියල්ලන් යේසුස් යන නාමයෙන් දණ නමන පිණිසත්, යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ස්වාමීන්වහන්සේ බව ..... සියලු දිව්වලින් ඒත්තුගන්න පිණිසත්ය. "**

ප්‍රේමණීය දේව දරුව, පියවූ දෙවි ස්වාමීන්වහන්සේ උන්වහන්සේගේ අනර්ඝ රහස් අපට එළිදරව් කරදී ඇති අතර, ඒවා එළිදරව් කර ඇත්තේ දේව වචනය තුළින් වේ.

එබැවින් උන්වහන්සේගේ වචනය අධ්‍යයනය කරමින් සහ මෙනෙහි කරමින් එම රහස් යාච්ඤාවෙන්ද, ශුද්ධාත්මයාණන්වහන්සේගේ මඟපෙන්වීමෙන්ද ලබාගනිමින්, ඒවා අන් අයටද ඉගැන්වීමේ වගකීම, උන්වහන්සේ අපට පවරා ඇත.

අප සැම දෙන, උන්වහන්සේගේ වචනය අධ්‍යයනය කරමු. උන්වහන්සේගේ වචනය අනුව ජීවත්වෙමු. එහි අප ඉගෙනගන්නාවූ, අනර්ඝ සත්‍යයන්, සහ දෙවියන් - වහන්සේගේ රහස් අන් අය සමඟ බෙදා ගනිමු.

(e) **යේසුස්වහන්සේ තුළ උරුමයක් ලැබීම - එපීස 1 : 14**

**එපීස 1 : 14 :- " අපේ උරුමයේ අත්තිකාරමවූ ....... "**

දෙවියන්වහන්සේගේ දරුවන් ලෙස, අප දෙවි පියාණන් - වහන්සේගේ උරුමක්කාරයෝ වෙමු.

**රෝම 8 : 17 :- " තවද දරුවෝ නම් උරුමක්කාරයෝය ; දෙවියන්වහන්සේගේ උරුමක්කාරයෝය, ක්‍රිස්තුස්වහන්සේ සමඟ හවුල් උරුමක්කාරයෝය. "**

ස්වර්ගයෙහි අප උදෙසා තබා තිබෙන්නාවූ උරුමය ගැන **1 පේත්‍රුස් 1 : 4** දෙස බලමු.

**1 පේත්‍රුස් 1 : 4 :- " නුඹලා උදෙසා ස්වර්ගයෙහි තබා තිබෙන්නාවූ, ජරාවට නොපැමිණෙන්නාවූ, නොකිලුටුවූ, පහ නොවෙන්නාවූ උරුමයක් ගැන ..... "**

ලෝකයේ පියෙකුගෙන් අපට ලැබෙන්නාවූ උරුමයක් ගැන සිතන විට, අපගේ සිතට නැගෙන්නේ වතු පිටි, මිල මුදල්, ඉඩම් කඩම් සහ ගෙවල් දොරවල් වැනි සිතුවිලි විය හැක. මෙනමුත් ස්වර්ගීය පියාණන්වහන්සේගෙන් ලැබෙන උරුමය ගැන පාවුල්තුමා **1 කොරින්ති 2 : 9** හි සඳහන් කර ඇත්තේ මෙසේය.

**1 කොරින්ති 2 : 9 :-**

**" දෙවියන්වහන්සේ විසින් තමන් ප්‍රේමකරන්නන්ට සූදානම් කළ යම් දෙයක් ඇද්ද, ඒ දේ ඇසට නොපෙනුණේය, කනට නොඇසුණේය, මනුෂ්‍යයන්ගේ සිතට නොපැමිණින්නේය. "**

සැබවින්ම මෙය අපට හුරු පුරුදු වචනවලින් අප ප්‍රකාශකරනවා නම් මේ උරුමය ගැන අප කියනුයේ **' මට නම් හිතාගන්ටවත් බැහැ '** වැනි වචන බව නිසැකය.

එබැවින්ම මෙම උරුමය ගැන **' අපට හිතාගත නොහැකි '** දේව වචනයේ සඳහන් පද දෙකක් ඔබ ඉදිරියේ තබමි.

**2 තිමෝති 2 : 12 :- " අපි ඉවසමු නම් උන්වහන්සේ සමඟ රජකම් කරන්නෙමුව. "**

**එළිදරව් 5 : 10 :- " ඔවුන් අපගේ දෙවියන්වහන්සේට රාජ්‍යයක්ද පූජකයන්ද කළසේක ; ඔව්හු පොළොවෙහි රජකම්කරතියි කීවෝය. "**

(f) **ශුද්ධාත්මයාණන්වහන්සේගෙන් මුද්‍රාකරනු ලැබීම - එපීස 1 : 14**

**එපීස 1 : 14 :- " ........ ශුද්ධාත්මයාණන්වහන්සේගෙන් නුඹලා උන්වහන්සේ තුළ මුද්‍රාකරනු ලැබුවහුය. "**

යම්කිසි දෙයක් මුද්‍රාකරනු ලැබීම තුළින් පෙන්නුම් - කරන්නේ, ඒ දෙය, මුද්‍රාකරන තැනැත්තාට අයිතිබව සහතික කිරීමක් සහ ඒ තැනැත්තාගේ ආරක්‍ෂාව යටතේ පවතින බව තහවුරු කිරීමක් වැනි අදහස්ය.

**එපීස 4 : 30 :- " දෙවියන්වහන්සේගේ ශුද්ධාත්මයාණන් - වහන්සේට දුක් නොදෙල්ලා ; මක්නිසාද උන්වහන්සේ තුළ නුඹලා මිදීමේ දවසට මුද්‍රාකරනු ලැබුවහුය. "**

**2 කොරින්ති 1 : 22 :-" උන්වහන්සේ අප මුද්‍රාකොට ආත්මයාණන්වහන්සේ නැමති අත්තිකාරම අපට දුන්සේක."**

ප්‍රේමණීය සහෝදරයා, සහෝදරී, මේ අයුරින් අපව මුද්‍රාකිරීම තුළින් අප ලබා ඇති අනර්ඝ ආශිර්වාදය වන්නේ, අප දැන් දෙවියන්වහන්සේට අයිතිව සිටින බවත්, සදහටමත් අයිතිව සිටින්ට යන බවත්, දෙවියන්වහන්සේම සහතික කිරීමයි.

මේ පිළිබඳව **රෝම 8 : 23** දෙසද බලමු.

**රෝම 8 : 23 :-**

**" එපමණක් නොව ආත්මයාණන්වහන්සේ නැමති ප්‍රථම ඵල ලැබූ අපිද ....... "**

ප්‍රථම ඵල වලින් සහතිකවන්නේ, අනාගතයේ අස්වැන්න නෙලන කාලය පැමිණෙන බවයි. ඒ ආකාරයටම 'ශුද්ධාත්මයාණන්වහන්සේ නමැති ප්‍රථම ඵල' වලින් සහතිකවන්නේ අප ලබන්ට යන්නාවූ උරුමයයි.

**එපීස 1 : 14** හිද පෙන්වාදෙන්නේ, අප ලබා ඇති ශුද්ධාත්මයාණන්වහන්සේ, අප ලබන්නට යන්නාවූ උරුමය සහතික කරන්නාවූ අත්තිකාරමක් බවයි.

❖ සෙනෙහෙවන්ත සහෝදර, සහෝදරියනි, අප සැබවින්ම අතිශයින් භාග්‍යවන්තයෝ වෙමු. අප ස්වර්ගීය ස්ථානවල සියලු ආත්මික ආශිර්වාදවලට හිමිකම් ලබා සිටින්නෙමු.

මේ ආශිර්වාදවලට ඇතුල්වීම උදෙසාද, ඒවා අත්දකිමින්ද භුක්තිවිඳිමින්ද ජීවත්වීම උදෙසාද, අප විසින් කල යුතුම දෙයක් තිබෙන බව ඔබට නැවත මතක් කිරීමට කැමැත්තෙමි.

**එනම් මේ ආශිර්වාද අප ලබන්නේ ' ක්‍රිස්තුස්වහන්සේ තුළ ' බවයි.**

**එබැවින් අප සැම,**

**සැමවිටම ක්‍රිස්තුස්වහන්සේ තුළ ජීවත්වීමටද,**

**අත්ත මිදිවැලෙහි පවතින ආකාරයට**

**උන්වහන්සේ තුළ පවතින්ටද කැපවෙමු.**

**මේ අයුරින් ජීවත්වෙමින්,**

**සියලු ආශිර්වාද**

**වැඩි වැඩියෙන් අත්දකින්නට**

**දෙවිපියාණන්වහන්සේම**

**ඔබට පිහිටවන සේක්වා !!!**

## සටහන

# සභාව උදෙසා
# පාවුල්ගේ යාච්ඤාව



# එපීස අධ්‍යයනය 02

# සභාව උදෙසා පාවුල්ගේ යාච්ඤාව

**එපීස 1 : 15 - 23**

**<u>හැඳින්වීම</u> :-**

පසුගිය අධ්‍යයනයේදී ' ක්‍රිස්තුස්වහන්සේ තුළ ' අපට හිමි ආශිර්වාද, එපීසයේ සභාවට හඳුන්වාදීමට පාවුල්තුමා ගන්නා වූ දැඩි උත්සාහය අප දුටුවෙමු.

දෙවියන්වහන්සේ මෙසේ අපට ලබා දී ඇති ආශිර්වාද පිළිබඳව උන්වහන්සේ වෙත පාවුල්තුමාගේ හද පත්ලෙන් නැගී එන්නාවූ ප්‍රශංසාවේ සහ නමස්කාරයේ ගැඹුර අපට පෙනීයන්නේ, දෙවියන්වහන්සේට ගෞරවය සහ මහිමය ගෙන දෙන්නාවූ (ග්‍රීක් භාෂාවෙන්) එක වගන්තියක් ලෙස **එපීස 1 : 3-14** දක්වා මෙම ආශිර්වාද ඔහුගේ හදවතින් ගලාඒමයි.

ප්‍රේමනීය දේව දරුව, පාවුල්තුමා මෙහි ප්‍රකාශකරන්නාවූ ආශිර්වාදවලට අප ඇතුල්වීමේ වැදගත්කම නිසාම, පසුගිය අධ්‍යයනයේදී අප වටහාගත්තාවූ එක සත්‍යයක් නැවත වරක් ඔබ ඉදිරියේ තබමි.

**එනම් මෙම ආශිර්වාද අප ලබන්නේ "ක්‍රිස්තුස්වහන්සේ තුළ" පමණක් බවත්, උන්වහන්සේ තුළ අපට සියලු දේ කිරීමට හැකි බවත් (පිලිප්පි 4:13), උන්වහන්සේගෙන් වෙන්ව අපට කිසිවක් කිරීමට නොහැකි බවත්ය (යොහන් 15:5).**

මෙම ආශිර්වාද කෙතරම් අලංකාර ලෙසද, කෙතරම් පැහැදිලි ලෙසද සභාවට ඉගැන්වීමට පාවුල්තුමා උත්සාහ කළත්, ඒවා සැබැවින්ම අල්ලාගැනීම උදෙසා දෙවියන් - වහන්සෙගේ උපකාරය සභාවට අත්‍යවශ්‍ය බව පාවුල්තුමා දැන සිටි හෙයින් **එපීස 1 : 15-23** දක්වා අප දකින්නේ සභාවට ඒවා ලබාදීම උදෙසා ඔහු දෙවියන්වහන්සේට කරන්නාවූ යැදුමකි.

<u>අධ්‍යයනය</u> :-

1. <u>පාවුල්තුමා සභාව ගැන යාච්ඤා කිරීමට හේතු</u> - <u>එපීස 1 : 15, 16</u>

(a) **තම ගෝලයන් කෙරෙහි ඔහු තුළ තිබුණාවූ ප්‍රේමය**

එපීසයේ සභාවේ ඇදහිලිවන්තයන් කෙරෙහි පාවුල් තුළ තිබුණාවූ ප්‍රේමය වටහාගැනීම පිණිස, ඔහුගේ තෙවැනි මිෂනාරී ගමනේ සිදුවීම් දෙස නැවත බලමු. එම ගමනේදී ඔහු එපීසයේ වසර තුනක් නැවතී සේවය කළ නමුත්, එහි පැණ නැගුණාවූ විරුද්ධතාවයන් සහ කෝලහාල හේතු - කොටගෙන, ඔහුට හදිසියෙන් එපීසය අතහැර යන්ට සිදුවිය.

**" කෝලහාලය නැවතුණු පසු පාවුල් ගෝලයන් කැඳවා අවවාදකොට, ඔවුන්ට ආයුබෝවන් කියා, මකදෝනියට යන්ට පිට වුණේය. " (ක්‍රියා 20 : 1)**

මෙසේ හදිසියෙන් පිටත්වූ හෙතෙම, ඔහුට අවස්ථාවක් ලැබුණු විගස, එපීසයේ සභාවේ වැඩිමහල්ලන් මුණගැසී, ඔවුන්ට පැවසුවාවූ දේ තුළින්, පාවුල්ගේ හදවත අපි දකිමු.

**ක්‍රියා 20 : 17, 19 - 20, 31 දෙස බලමු.**

**ක්‍රියා 20 : 17 :- " ඔහු මිලේතසෙන් එපීසියට පණිවුඩ යවා සභාවේ වැඩිමහල්ලන් කැඳවුයේය. "**

**ක්‍රියා 20 : 19 - 20 :- " මම සිතේ <u>සියලූ ආකාර යටත්කමින්ද</u>, <u>කඳුළුවලින්ද</u> ...... ස්වාමීන්වහන්සේට සේවය කළෙමි. ප්‍රයෝජනවත්වූ කිසිදෙයක් ප්‍රකාශ කිරීමෙන් නොවැලකී, ප්‍රසිද්ධයෙන්ද <u>ගෙයින් ගෙටද නුඹලාට උගන්වමින්</u>, ....... "**

**ක්‍රියා 20 : 31 :- " එබැවින් මා තුන් අවුරුද්දක් මුළුල්ලෙහි <u>රෑ දවල් දෙකේ කඳුළුවලින් යුක්තව සියල්ලන්ට නිරතුරු අවවාද දුන් බව</u> සිහිකොට, අවදිව සිටපල්ලා. "**

ප්‍රේමණීය සහෝදරයා සහෝදරී, දෙවියන්වහන්සේ **අප සැම** 'ක්‍රිස්තුස්වහන්සේ තුළ' පිහිටුවා, අපව තෝරා - ගෙන ඇත්තේ **උන්වහන්සේට සේවය කිරීම උදෙසාය.** මෙසේ අප සේවය කරන අතර, දෙව් පියාණන්වහන්සේ අප තුළ දක්නට ආසාකරන්නාවූ ගුණාංගයක් වන්නේ **'පියෙකුගේ හදවත'** ඇතිව උන්වහන්සේට සේවය කිරීමයි.

උන්වහන්සේ ඔබට පවරා ඇති සේවය කුමක් වුවත්, උන්වහන්සේ ඔබට භාර දී ඇති අයට ප්‍රේම කිරීමේ හදවතක් ඇතිව, ඔබගේ සේවයේ යෙදෙන්න. පාවුල්තුමා මෙන්, දෙවියන්වහන්සේ ඔබට භාර දී ඇති අය උදෙසා, යටහත්කමින්ද කඳුළුවලින්ද දිවා රෑ නොබලා සේවයේ යෙදෙමින්, ඔවුන් උදෙසා යාච්ඤාවේ යෙදෙන්න.

(b) **<u>තම ගෝලයන් තුළ තිබුණාවූ ඇදහිල්ල සහ සහෝදර ප්‍රේමය ගැන ඇසීම - එපීස 1 : 15</u>**

මෙම පදයේ සිංහල පරිවර්ථනය අපැහැදිලි නිසා ඉංග්‍රීසි බයිබලයේ සඳහන් වචන, ඔබ ඉදිරියේ තබමි.

**Ephesians 1 : 16 :- " ... I have heard about your faith in the Lord Jesus and your love for all the saints, " (NIV)**

මේ අන්දමින් එපීසයේ සභාවේ තිබුණාවූ <u>ඇදහිල්ල සහ සහෝදර ප්‍රේමය</u> ඇසුවාවූ පාවුල්තුමාගේ ප්‍රතිචාරය වූයේ, **ඔවුන් ගැන දෙවියන්වහන්සේට යාච්ඤාවෙන් තුති පිදීමයි.**

**එපීස 1 : 16 :- " ...... නුඹලා මාගේ යාච්ඤාවලදී සඳහන් - කරමින්, නුඹලා ගැන නොකඩව ස්තුතිකරමි. "**

පාවුල්තුමාගේ මෙම ආදර්ශය දකින අප, අපගෙන්ම අසාගත යුතු ප්‍රශ්නයක් වන්නේ, අප සමඟ එකට සේවයේ යෙදෙන්නාවූ අයගේ, ආත්මික වර්ධනය ගැන අප දක්වන්නාවූ ප්‍රතිචාරය කුමක්ද ? යන්නයි.

අප ඔවුන්ගේ වර්ධනය ගැන දෙවිඳුන්ට තුතිපුදනවාද ? නැත්නම් ඔවුන්ට ඊර්ෂ්‍යා කරනවාද ?

එපීසයේ ඇදහිලිවන්තයන්ගේ ඇදහිල්ල කිසිසේත් හිස්වූ ඇදහිල්ලක් නොවීය. එම ඇදහිල්ලේ ප්‍රතිඵලයක් වූයේ, ඔවුන් තුළ සහෝදර ප්‍රේමය වර්ධනයවීම, සහ ඔවුන් අතරේ ප්‍රේමයෙන් ක්‍රියාකිරීම ඇතිවීමයි.

**යාකොබ් 2 : 17 :- " එසේම ඇදහිල්ල ක්‍රියා නැතුව තනියම තිබේනම් මැරීලාය. "**

එපීසයේ සභාවේ ඇදහිල්ල කිසිසේත් මැරුණු ඇදහිල්ලක් නොවුනු අතර, ඒ ඇදහිල්ල ගැන ' ඔවුන්ගේ ආත්මික පියාවූ ' පාවුල්තුමා දෙවියන්වහන්සේට තුති පිදීම, අප සැමදෙනාද අනුගමනය කිරීම උදෙසා ඉතා යහපත් ආදර්ශයක් යන්න, මාගේ අදහසයි.

(c) **තම ගෝලයන්ට දෙවියන්වහන්සේගේ සහ ශුද්ධාත්ම - යාණන්වහන්සේගේ උපකාරය නැතිව, ඔවුන්ට හිමිව තිබෙන්නාවූ ආශිර්වාද වටහාගත නොහැකි බව, පාවුල්තුමා තේරුම්ගැනීම**

ප්‍රේමණීය දේව දරුව, මෙය තේරුම්ගන්න. ක්‍රිස්තුස් - වහන්සේ තුළ අප සැමටම අයිතිව තිබෙන්නාවූ ආශිර්වාද ගැන අප කොපමණ ඇසුවත්, දෙවියන්වහන්සේම ශුද්ධාත්මයාණන්වහන්සේ තුළින් ඒවා අපට එළිදරව් නොකළහොත් අපටද ඒවා වටහාගැනීමට නොහැකිවේ.

මෙය ඔබට පහදාදීම උදෙසා ඉතා කුඩා නිදසුනක් ඔබ ඉදිරියේ තබමි. ඔබ යම්කිසි පාපයකට ගොදුරු වූවා යයි සිතන්න. ඔබ කළදේ වැරදි බව ඔබගේ මනසින් ඔබ පිළිගන්නා නමුත්, සැබෑ පසුතැවිල්ල ඔබගේ හදවතේ ඇතිවීම උදෙසා ශුද්ධාත්මයාණන්වහන්සේගේ ක්‍රියාකිරීම අවශ්‍ය වේ.

**යොහන් 14 : 26 :- " ...... ශුද්ධාත්මයාණන්වහන්සේ නුඹලාට සියල්ල උගන්වමින්, මා විසින් නුඹලාට කියන ලද සියල්ල නුඹලාට සිහිකරවන සේක. "**

**යොහන් 16 : 8 :- " උන්වහන්සේ ආ කල, පාපය ගැනද ධර්මිෂ්ඨකම ගැනද විනිශ්චය ගැනද ලෝකයාට අඟවාදෙන සේක. "**

**යොහන් 16 : 13 :-**

**" ..... සැබෑකමේ ආත්මයාණන්වහන්සේ ආ කල, උන්වහන්සේ මුළු සත්‍යය කරා නුඹලාට මඟපෙන්වනසේක. "**

මාගේ ප්‍රේමණීය දේව සේවකයෙනි, ඔබ ඉතාමත්ම දීමනාලත් සභාපාලකයකු හෝ ගුරුවරයකු හෝ ඉවැන්ජලිස්තවරයකු හෝ සබත් පාසැල් ගුරුවරයකු හෝ තරුණ සේවයේ යෙදෙන්නෙකු හෝ වෙනත් සේවයන් වල යෙදෙන්නෙකු වන්නට පුළුවන. මෙනමුත් **ඔබගේ උත්සාහයෙන් පමණක් කිසිම ජීවිතයක සැබෑවූද ආත්මිකවූද වෙනසක් ඇතිකිරීමට නොහැකි බව වටහාගන්න.** මෙය කළ හැකිවන්නේ, දෙවියන්වහන්සේට පමණක් බව තේරුම් ගන්න.

එබැවින් **අප සැම දෙන මුළු හදවතින් කැපවී දෙවියන්වහන්සේට සේවය කරන අතර, එම සේවය ශුද්ධාත්ම බලයෙන් පාවිච්චිකරන ලෙස දෙවිඳුන්ට සැමවිටම යදිමු.** අපගේ උපස්ථානය ලබන්නාවූ සියල්ලන් උදෙසා නිතරම යාච්ඥා කරමු.

අප මෙසේ කරනවානම්, දෙවියන්වහන්සේ ඉතා බලවත් ලෙස අපගේ සේවය පාවිච්චිකිරීමට යන බව නොඅනුමානවේ !!

**2. පාවුල්තුමා සභාව ගැන කළ ඉල්ලීම් - එපීස 1 : 17-19**

(a) **සභාව යේසුස්වහන්සේව වඩ වඩා දැනගැනීම - එපීස 1 : 17**

**යොහන් 17 : 3 :- " සදාකාල ජීවනය නම් මේය - එකම සැබෑ වූ දෙවියන්වහන්සේ වන ඔබ සහ ඔබ විසින් එවන ලද තැනැත්තා වන යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ඔවුන් විසින් ඇඳිනගැනීමය. "**

මෙහි සඳහන්වන්නේ, **යේසුස්වහන්සේ ගැන දැනගැනීම නොව යේසුස්වහන්සේව ඇඳිනගැනීම,** බව කරුණාකර වටහාගන්න. මෙය ඔබට පහදාදීම උදෙසා, නැවත වරක් ඉතා කුඩා නිදසුනක් ඔබ ඉදිරියේ තබමි.

මා නමස්කාර කරන්නාවූ සභාවේ නත්තල් දේව මෙහෙයට පමණක් (එනම් වසරකට එක වතාවක්) පැමිණෙන්නාවූ ඉතා ස්වල්ප දෙනෙක් සිටිති. මොවුන් මෙසේ පැමිණෙන්නේ නිසැකවම ඔවුන් යේසුස්වහන්සේ ගැන දන්නා නිසා බව යන්න නිවැරදි නිගමනයකි. මෙනමුත් ඔවුන් යේසුස් - වහන්සේව අඳුනනවාද යන්න, අප නොදනිමු.

දේව දරුව, කිතුනු නම දරන්නාවූ අප සැම යේසුස් - වහන්සේව වැඩි වැඩියෙන් අඳුනාගැනීම, අප ජීවිත තුළ අනිවාර්යයෙන්ම සිදුවෙමින් පවතින්නාවූ දෙයක් විය යුතු බව තේරුම්ගන්න.

මෙහි අත්‍යවශ්‍යතාවය ඔබට තව දුරටත් තේරුම්ගැනීම උදෙසා, යේසුස්වහන්සේගේ ප්‍රකාශනයක් වෙත ඔබගේ අවධානය යොමුකරමි.

**මතෙව් 7 : 22, 23 :- '' ඒ දවසේදී බොහෝ දෙනෙක් : ස්වාමීනි, ස්වාමීනි, ඔබගේ නාමයෙන් අනාගත වචන නොකියෙමුද ? ........ ඔබගේ නාමයෙන් නොයෙක් බලවත් ක්‍රියා නොකෙළෙමුදැ යි මට කියනවා ඇත. එවිට මම : කිසිකලෙකත් නුඹලා නොහැඳින්නෙමි. අධර්මිෂ්ඨකම් කරන්නෙනි, මා කෙරෙන් අහක්ව පලයල්ලා යයි ඔවුන්ට කියන්නෙමි. ''**

යේසුස්වහන්සේ කිසිකලෙකත් නොවෙනස්වන්නාවූ, බොරු නොකියන්නාවූ දේව පුත්‍රයාණන්වහන්සේ වන සේක. එබැවින් උන්වහන්සේ යමෙකුට ''නුඹලා නොහැඳින්නෙමි'' කියා ප්‍රකාශකරන අතර ඒ වචන සත්‍ය වචන වේ. එමනිසා මෙසේ යේසුස්වහන්සේට ''ස්වාමීනි'' කියා ඇමතුවාවූ සමහර අයද ඒ ආකාරයෙන්ම යේසුස්වහන්සේව මෙලොවදී අඳුනා නොසිටි බව ඉතා පැහැදිලි වන අතර, උන්වහන්සේ ඔවුන්ව උන්වහන්සේ වෙතින් පහකරන්ට යන බවද පැහැදිලිය.

එබැවින් අප සැම නැවත වරක්, අපගෙන්ම මෙම ප්‍රශ්න අසාගනිමු.

- මම සැබවින්ම යේසුස්වහන්සේව අඳුනනවාද ?
- මම උන්වහන්සේ තුළ ජීවත්වනවාද ?
- උන්වහන්සේ මා තුළ වැඩවසනවාද ?

ප්‍රේමණීය දේව දරුව, **කිතුනු සභාවේ අද පවතින්නාවූ, අති විශාල අවශ්‍යතාවයක් වන්නේ, යේසුස්වහන්සේව වැඩි වැඩියෙන් දැනගැනීමේ අවශ්‍යතාවයයි.**

අද දවසේ ලෝකයා අපට පවසන්නේ ඃ
'' ඔබවම අඳුනාගන්න '', '' ඔබ කව්ද කියා තේරුම්ගන්න '' වැනි අදහස් වන අතර දෙවියන්වහන්සේ අපට පවසන්නේ,

**<u>යේසුස්වහන්සේව</u>, <u>වඩා හොඳට</u>, <u>වඩා ගැඹුරට</u>, <u>වඩා සම්පූර්ණව දැනගන්න</u>,** කියාය.

මෙසේ යේසුස්වහන්සේව එපීසයේ සභාවේ ඇදහිලිවන්ත - යන් දැනගන්නා පිණිස, ඔවුන්ට **'' ප්‍රඥාවේද එළිදරව් කිරීමේද ආත්මයක් ''** දෙන ලෙස පාවුල්තුමා දෙවියන්වහන්සේගෙන් ඉල්ලයි.

මෙම අධ්‍යයනය ඔබ ඉදිරියේ තබන මමද, ඔබ සැමදෙන පුද්ගලිකව නොදන්නා නමුත්, ඔබ වෙනුවෙන් මේ යාච්ඤාව දෙවියන්වහන්සේ ඉදිරියට ගෙන ඒමට ශුද්ධාත්මයාණන් - වහන්සේ මා පොළඹවන මේ අවස්ථාවේදීද ඔබ වෙනුවෙන් යාච්ඤා කරමින් ලියමි. නමුත් මීට වඩා වැදගත් වන්නේ මෙය **කියවන්නාවූ ඔබ සැමදෙන, මෙම යාච්ඤාව ඔබගේම කරගනිමින්, '' ප්‍රඥාවේද සහ එළිදරව්කිරීමේද ආත්මයක් '' ඔබට ලබා දෙන ලෙස දෙවියන්වහන්සේගෙන් ඉල්ලීමයි.**

මෙම යාච්ඤාව ඔබ කරන්නාවූ අත්‍යවශ්‍යම දෙයක් වන අතර, ඔබ විසින් කළ යුතු තව දෙයක්ද, යටහත්ව යෝජනා කිරීමට කැමැත්තෙමි.

එනම් දිනපතාම යේසුස්වහන්සේ සමග කතාකරමින්, උන්වහන්සේ සමග ඔබගේ සිතුවිලි බෙදාගනිමින්, ඔබගේ ප්‍රේමය උන්වහන්සේට ඔබ ප්‍රකාශකරන්නාවූ කාලයක් දිනපතා පවත්වන්න.

උන්වහන්සේගෙන් කිසිවක් නොසඟවන්න, උන්වහන්සේ කියන දෙයට සවන්දෙන්න, උන්වහන්සේට අකීකරු නොවන්න වැනි අදහස්වලට ඔබගේ ජීවිතයේ ප්‍රමුඛත්වය දෙන්න යන යෝජනාවයි.

(b) **සභාව දෙවියන්වහන්සේගේ කැඳවීමේ බලාපොරොත්තුව කිමෙක්ද කියා දැනගැනීම - එපීස 1 : 18**

අපගේ ප්‍රථම අධ්‍යයනයෙන් අප ඉගෙනගත් ආකාරයට දෙවියන්වහන්සේ අපව තෝරා, අපව කැඳවා, අපව පුත්‍රයන් වීමට පෙරනියම කොට, අපට මිදීම ලබාදී, දෙවියන්වහන්සේගේ කැමැත්තේ රහස් අපට දන්වාදී, අපට උරුමයක් ලබාදී, ශුද්ධාත්මයාණන්වහන්සේ විසින් අපව මුද්‍රා කර ඇත.

මේ සියල්ල දෙවියන්වහන්සේ කර ඇති අතර, උන්වහන්සේ අපව කැඳවීමේදී, උන්වහන්සේ අප ගැන තබා ඇත්තාවූ බලාපොරොත්තුව කිමෙක්ද කියා, අප දැනගන්නා පිණිස අපගේ සිත් නමැති ඇස් පහදන ලෙස පාවුල්තුමා යාච්ඤාකරයි.

දෙවි ස්වාමින්වහන්සේ මට ලබාදී ඇති මඟපෙන්වීම අනුව, උන්වහන්සේ අපව කැඳවා ඇති ජීවිතයේ, අපගෙන් බලාපොරොත්තු වන්නාවූ ක්‍රියාව සහ හැසිරීම පිළිබඳව, අදහස් ස්වල්පයක් මෙහි සඳහන් කිරීමට කැමැත්තෙමි.

(i) <u>ශුද්ධවන්තව සිටීමට</u>
**1 කොරින්ති 1 : 2 :- " ක්‍රිස්තුස් යේසුස්වහහන්සේ කෙරෙහි පිරිසිදුකරන ලද්දාවූ, <u>ශුද්ධවන්තව සිටීමට කැඳවන - ලද්දාවූ</u> ...."**

(තව දුරටත් **1 පේත්‍රුස් 1 : 15, 16** කියවා බලන්න)

(ii) <u>යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සහභාගිකමට ඇතුල්වීමට</u>
**1 කොරින්ති 1 : 9 :- " ස්වකීය පුත්‍රවූ අපගේ ස්වාමීවූ <u>යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සහභාගිකමට නුඹලා කැඳවාගත්</u> දෙවියන්වහන්සේ විශ්වාසව සිටින සේක. "**

(iii) <u>සභාව එක ශරීරයක් ලෙස සිටීමට</u>
**කොලොස්සි 3 : 15 :- " ක්‍රිස්තුස්වහන්සේගේ සමාදානය නුඹලාගේ සිත්වල ආණ්ඩුකෙරේවා. ඒ පිණිස <u>නුඹලා එක ශරීරයක්ව සිටීමට කැඳවාගනු ලැබුවාහුය</u>. "**

(iv) <u>යටහත්ව, මොළොක් ගුණයෙන්, ඉවසිලිවන්තකමින් හැසිරීමට</u>

**එපීස 4 : 1, 2 :- " එබැවින් නුඹලා <u>කැඳවනු ලැබූ කැඳවීමට ඔබින ලෙස</u>, සියලු ආකාර යටහත්කමින්ද, මොළොක් ගුණයෙන්ද, ඉවසිලිවන්තකමෙන්ද හැසිර ...... "**

(v) <u>යේසුස්වහන්සේගේ අඩිපාරේ යෑමට</u>

**1 පේත්‍රුස් 2 : 21 :- " <u>එසේය, ඊට නුඹලා කැඳවනු ලැබුවහුය</u>. මක්නිසාද ක්‍රිස්තුස්වහන්සේ නුඹලා නිසා වධවිඳ නුඹලා උන්වහන්සේගේ අඩිපාරේ යන පිණිස නුඹලාට ආදර්ශයක් දී ගියසේක. "**

ඉහත සඳහන් පද විස්තරකිරීම අනවශ්‍යය බව මා සිතන අතර, දෙවියන්වහන්සේගේ වචනයේ සඳහන්වන්නාවූ, අපගේ කැඳවීමේ බලාපොරොත්තුව පහදාදෙන්නාවූ මෙම පදවල සඳහන් හැසිරීම අපගේම කරගැනීම ඉතා වැදගත්යයි සලකමි.

(c) **සභාව, තම උරුමයේ මහිමයේ සම්පත කිමෙක්ද කියා දැනගැනීම - එපීස 1 : 18**

අපගේ උරුමයේ මහිමයේ සම්පත ගැන ඔබට ඉඟියක් දීම පිණිස, **යොහාන් 14 : 2, 3** වෙත ඔබගේ අවධානයය යොමු කිරීමට කැමැත්තෙමි.

**යොහන් 14 : 2, 3 :-**

**" මාගේ පියාණන්වහන්සේගේ ගෘහයෙහි බොහෝ වාසස්ථාන ඇත්තේය ; ....... මක්නිසාද <u>නුඹලාට ස්ථානයක් පිළියෙළකරන පිණිස යමි</u>. මම ගොස් නුඹලාට ස්ථානයක් පිළියෙලකරම් නම්, මා සිටින තැන නුඹලාත් සිටින පිණිස මම නැවත ඇවිත් නුඹලා මා ළඟට ගන්නෙමි. "**

ප්‍රේමණීය දේව දරුවෙනි, අප කෙතරම් භාග්‍යවන්ත සෙනඟක්ද කියා ඔබ ඒත්තු ගන්නවාද ?

දේව පුත්‍රයාම අප සැම උදෙසා, අපට වඩාත්ම සුදුසු වාසස්ථානයක් සූදානම් කරමින් සිටිනවා පමණක් නොව, එම ස්ථානයට අපව ගෙනයෑමට උන්වහන්සේම මෙහි පොරොන්දු වී ඇතිසේක !!

අපට හිමිවන්නාවූ මේ උරුමය තව වැඩියෙන් තේරුම් ගැනීම පිණිස **පිලිප්පි 3 : 21 සහ එළිදරව් 22 : 3, 4** දෙස බලමු.

**පිලිප්පි 3 : 21 :- "...... උන්වහන්සේ අපේ පහත්කමේ ශරීර තමන්වහන්සේගේ තේජසේ ශරීරයට සමානවන පිණිස ඒවා වෙනස්කරනවා ඇත."**

**එළිදරව් 22 : 4, 5 :- " ඔව්හු උන්වහන්සේගේ මුහුණ දකින්නෝය ; උන්වහන්සේගේ නාමයද ඔවුන්ගේ නළල්වල තිබෙන්නේය ...... ස්වාමිවූ දෙවියන්වහන්සේ ඔවුන්ට ආලෝකය දෙනසේක. ඔව්හු සදාකාලේටම රජකම් කරන්නෝය."**

(d) **සභාව උන්වහන්සේගේ බලයේ මහත්කම දැනගැනීම - එපීස 1 : 19**

දේව බලය ගැන ඔබ සැම නිසැකවම බොහෝසෙයින් අසා ඇති නිසා, මේ පිළිබඳව දේව වචනයෙන් පද කීපයක් වෙත පමණක් ඔබගේ අවධානය යොමුකරමි.

**ලූක් 1 : 37 :- " දෙවියන්වහන්සේගෙන් වූ කිසි වචනයක් බලරහිත නොවන්නේ යයි කීවේය."**

**යෝබ් 42 : 2 :- " ඔබවහන්සේට සියල්ලම පුළුවන් බවත්, ඔබගේ කිසි අදහසක් වලක්වන්ට බැරි බවත් දනිමි."**

**යෙරමියා 32 : 17 :- " අහෝ ස්වාමිවූ දෙවියන්වහන්ස, ඔබගේ මහත් බලයෙන්ද දිගු කළ ඔබගේ හස්තයෙන්ද ඔබ අහසත් පොළොවත් මැවූසේක."**

❖ දේව දරුව, දෙවියන්වහන්සේගේ බලයට සීමා නොදමන්න. උන්වහන්සේගේ බලය සීමා රහිත බව ඔබගේ හදවතේ ලියා ගන්න. මෙය තේරුම්ගැනීම උදෙසා " **නුඹලාගේ සිත් නමැති ඇස් පහදන ලෙස** " (**එපීස 1 : 19**) සමිඳුන්ට යදින්න.

**3. <u>යේසුස්වහන්සේගේ උත්ථානය සහ උසස්කිරීම තුළින් ප්‍රකාශවන්නාවූ දේව බලය - එපීස 1 : 20 - 23</u>**

(a) **<u>මළවුන් නැගිටුවීමේ බලය - එපීස 1 : 20</u>**

නවීන ලෝකයේ, මරණයට පත්වූ කෙනෙක්, දේව දාසයෙක් තුළින් දෙවියන්වහන්සේ නැවත නැගිටුවීම පිළිබඳ සිද්ධීන් අපට අසන්ට ලැබී ඇත. මේ හේතුව නිසාම අප සැම අප ස්වාමීවූ යේසුස්වහන්සේගේ උත්ථානයද මේ ආකාරයෙන්ම සිදුවුණාවූ දෙයක් ලෙස සිතන්ට පුළුවන.

ප්‍රේමනීය දේව දරුව, යේසුස්වහන්සේගේ උත්ථානය මීට හාත්පසින්ම වෙනස් වූ එකකි. උන්වහන්සේගේ උත්ථානය මැරුණාවූ මනිස් ශරීරයකට නැවත පන ලැබීම නොවේ. උන්වහන්සේගේ උත්ථානයේදී සිදුවූයේ, උන්වහන්සේගේ මැරුණාවූ ශරීරය, **<u>දෙවියන්වහන්සේගේ බලය තුළින් අමරණීයවූ, මහිමවත්වූ ශරීරයක් බවට පරිවර්තනය කරනු ලැබීමයි</u>.**

**1 කොරින්ති 15 : 35, 40, 42, 43, 44 :-**

" 35 **නුමුත් : මළවුන් නැගිටින්නේ කෙසේද ? ඔව්හු කොයි ප්‍රකාර ශරීරයක් ඇතුව එද්දැයි යමෙක් අසනවා ඇත.**

**40 ස්වර්ගික ශරීරද, භූමික ශරීරද ඇත්තාහ. නුමුත් ස්වර්ගීකයන්ගේ තේජස එකක්ය, භූමිකයන්ගේ තේජස අනිකක්ය.**

42 **මළවුන්ගෙන් නැගිටීමත් එසේමය. ජරාවෙන් යුක්තව වපුරනු ලැබේ ; ජරාවෙන් වියුක්තව නැගිටුවනු ලැබේ.**

43 **අගෞරවයෙන් යුක්තව වපුරනු ලැබේ ; තේජසින් යුක්තව නැගිටුවනු ලැබේ.....**

44 **ස්වභාවික ශරීරයක්ව වපුරනු ලැබේ ; ආත්මික ශරීරයක්ව නැගිටුවනු ලැබේ .....** "

(b) **යක්ෂයාගේ සෑම බලයක්ම පරාජය කිරීමේ බලය - එපීස 1 : 21**

**එපීස 1 : 21 :- " සියලු අධිපතිකමටත් බලයටත් පරාක්‍රමයටත් ස්වාමිකමටත්, මේ ලෝකයෙහි පමණක් නොව, පරලෝකයෙහිත් සඳහන්කරන ලද සියලු නම්වලටත් වඩා උසස්කොට ...... "**

දේව දරුව, මෙහි ප්‍රකාශවන්නාවූ දේව බලය තේරුම්ගන්න. මේ දේව බලය, අපට විරුද්ධව ක්‍රියාකරන්නාවූ යක්ෂයාගේ සෑම බලයකට වඩා අතිශයින් බලවත් බව තේරුම්ගනිමින්, ඔබ තුළ වැඩවසන්නාවූ ශුද්ධාත්මයාණන්වහන්සේගේ බලයෙන් යක්ෂයාගේ බලය පරාජය කරන්න.

(c) **යේසුස්වහන්සේව තමන්වහන්සේගේ දකුණු පැත්තේ හිඳුවා, සියලු දේ උන්වහන්සේගේ පාදවලට යටත්කිරීමේ බලය - එපීස 1 : 22**

දෙවියන්වහන්සේගේ දකුණු පැත්තේ වැඩසිටින්නාවූ යේසුස්වහන්සේ සභාවේ හිස වනසේක. උන්වහන්සේගේ ශරීරය වන සභාවට එබැවින් හිමිව තිබෙන්නාවූ බලය තේරුම්ගන්න.

මේ අතරම සභාවේ හිස වන්නාවූ යේසුස්වහන්සේට සභාවේ ප්‍රධාන තැනද, ඔබගේ ජීවිතේ ප්‍රධාන ස්ථානයද දීමට තීරණය කරන්න.

මෙම අධ්‍යයනය තුළින්, කිතුනු අප සැමට 'ක්‍රිස්තුස්වහන්සේ තුළ' අයිතිව තිබෙන්නාවූ ඉමහත් බලයද, අපගේ උරුමයේ මහිමයද, උන්වහන්සේගේ කැඳවීමේ බලාපොරොත්තුවද, යේසුස්වහන්සේව වැඩි වැඩියෙන් අඳුනාගැනීමේ ආශිර්වාදයද තේරුම් ගැනීමට,

**දෙවිපියාණන්වහන්සේම**

**ඔබට පිහිටවන සේක්වා !!!**

සටහන

සටහන

# ගැළවීම දේව දීමනාවකි



# එපීස අධ්‍යයනය 03

## ගැළවීම දේව දීමනාවකි

**එපීස 2 : 1 - 10**

**<u>හැඳින්වීම</u> :-**

**එපීස** පොතේ **පළමුවැනි පරිච්ඡේදයේ** ක්‍රිස්තුස්වහන්සේ තුළ අප සැමට හිමි ආත්මික ආශීර්වාද පාවුල්තුමා විස්තර කරන අතර, ඒවා තේරුම්ගැනීමට සහ ඒවා තුළට ඇතුල්වීමට, ප්‍රඥවේද, එළිදරව් කිරීමේද ආත්මයක් ලබා දෙන ලෙස, ඔහු දෙවියන්වහන්සේට කන්නලව් කරයි.

මේ අන්දමින් **'ක්‍රිස්තුස්වහන්සේ තුළ සියලු ආත්මික ආශීර්වාදවලින් දෙවියන්වහන්සේ අපට ආශීර්වාද කර ඇති අතර ' ' ක්‍රිස්තුස්වහන්සේ තුළට '** ඇතුල්වී, **' ක්‍රිස්තුස්වහන්සේ තුළ '** පවතිමින්, ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රේමයෙහි පවතිමින් එල දැරීමේ ජීවිතයක් ගත කිරීමේ (**යොහන් 15, 4, 8, 9** බලන්න) මුල් පියවර ඉගැන්වීම පාවුල් දෙවැනි පරිච්ඡේදයේ අරඹයි.

**එපීස 1** හි පාවුල් දෙවියන්වහන්සේගේ මහත් සැලැස්ම අපට හඳුන්වා දෙන අතර (**එපීස 1 : 9 :- " එසේ කළේ කාලවල සම්පූර්ණකමේ නියමය ලෙස <u>ස්වර්ගයෙහි දේවල්ද පොළොවෙහි දේවල්ද යන සියල්ල ක්‍රිස්තුස්වහන්සේ තුළ එක්රාශි කරන්නට</u> ....") එපීස පොතේ දෙවැනි පරිච්ඡේදයේ** ඔහු පෙන්වා - දෙන්නේ, ඒ සැලැස්ම පියවරින් පියවර ඉදිරියට ගෙන යෑම උදෙසා උන්වහන්සේ හඳුන්වා දී ඇති මාර්ගයයි.

එබැවින් **එපීස 2 : 1-10** දක්වා පාවුල් මනුෂ්‍යයා ගැන අනර්ඝ චිත්‍රයක් නිර්මාණය කරයි. එම චිත්‍රය ඉතා පැහැදිලිව අපට පෙන්වාදෙන්නේ, <u>ස්වභාවයෙන් මනුෂ්‍යයා ඉන්නාවූ ස්ථානය සහ දෙවියන්වහන්සේගේ අනුග්‍රහය තුළින් ඔහුට යා හැකි ස්ථානයයි</u>.

<u>අධ්‍යයනය</u> :-

1. **<u>අප සැම පෙර කාලයේ සිටි ස්වභාවය - එපීස 2 : 1 - 3</u>**

(a) **අප සිටි ආත්මික තත්වය**

**එපීස 2 : 1 :- " නුඹලාගේ වරද සහ පාප කරණකොටගෙන <u>මැරී සිටි කළ</u> උන්වහන්සේ නුඹලා ජීවත් කළසේක. "**

අප සැමදෙනා සිටියේ ආත්මිකව මැරිලාය, නොහොත් දෙවියන්වහන්සේගෙන් ඈත්වෙලාය, උන්වහන්සේගෙන් වෙන්වෙලාය.

අප කවුරුත් හොඳහැටි දන්නා ආකාරයට ආදම්ගේ පාපය නිසා, ඔහු දෙවියන්වහන්සේගෙන් වෙන්වී ආත්මිකව මරණයට පත්වූ අතර, ඔහු ඒදන් උයනින් පිටකරන ලදී.

**උත්පත්ති 3 : 23 :- " ...... ස්වාමීවූ දෙවියන්වහන්සේ ඒදන් උයනෙන් ඔහු පිට කළසේක. "**

**රෝම 5 : 12 :- " එහෙයින් එක් මනුෂ්‍යයෙකු කරණකොට - ගෙන පාපයත්, පාපය <u>කරණකොටගෙන මරණයත් ලෝකයට ඇතුල්වුණාක්මෙන්</u> ..... "**

**රෝම 6 : 23 :- " මක්නිසාද පාපයේ කුලී නම් මරණයය ; ..... "**

පාවුල් මෙම ආත්මිකව මැරුණු ස්වභාවය **එපීස 4 : 18** හි විස්තර කරන්නේ ' ජීවනයට විදේශීව ' සිටීම යනුවෙනි.

**එපීස 4 : 18 :- " ඔව්හු තමුන්ගේ තේරුම්ගැනීමෙන් අඳුරුව, තමුන් තුළ ඇත්තාවූ අඥානකම නිසාද, තමුන්ගේ සිත් දැඩිවීම නිසාද දෙවියන්වහන්සේ කෙරෙන් වූ <u>ජීවනයට විදේශීව</u> සිටිති. "**

සාමාන්‍යයෙන් අප සැම මරණය ලෙස හඳුන්වන්නේ ශාරීරික මරණයයි.

එබැවින් ශාරීරික මරණය සහ ආත්මික මරණය යනු කිමෙක්ද කියා තේරුම් ගැනීමට සහ පහසුවෙන් මතක තබාගැනීම උදෙසා, මේ අයුරින් ඒවා විස්තර කිරීමට කැමැත්තෙමි.

එනම් :-

- ශාරීරික මරණය යනු **<u>අපගේ ආත්මය අපගේ ශරීරයෙන් වෙන්වීමයි.</u>**
- ආත්මික මරණය යනු **<u>අපගේ ආත්මය දෙවියන්වහන්සේ - ගෙන් වෙන්වීමයි.</u>**

(b) **අප හැසුරුණාවූ ආකාරය**

**එපීස 2 : 2, 3 :-**

**" පෙර කාළයේ නුඹලා මේ ලෝකයේ ව්‍යවහාරය ලෙසත්, ....... ආකාශයේ බලයේ අධිපතියාගේ කැමැත්තේ හැටියටත්, ඒවායෙහි හැසුරුණාහුය ...... අප සියල්ලෝද වරක් අපේ මාංසයේ තෘෂ්ණාවල හැසිරෙමින්, මාංසයටත් සිතටත් කැමති දේ කරමින් ...... "**

ප්‍රේමණීය දේව දරුව, මෙය වටහාගන්න. ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළට අප ඇතුල්වන්ට පෙර, අප සැමදෙනාම හැසුරුනේද මේ ආකාරයට වූ නමුත්, අප සමහරවිට එය දැනසිටියේවත් නැත.

අද දෙවි සමිඳුන්, අන් අයට උන්වහන්සේව හඳුන්වා දී, ඔවුන් ' උන්වහන්සේ තුළ ' ඇත්තාවූ ජීවිතයට ළංකිරීමේ සේවය, අපට භාරදී ඇති අතර, ඔවුන් ඉන්නාවූ ස්ථානයද අප සැම සිටියාවූ ස්ථානයද පැහැදිලිව තේරුම් ගැනීම ඉතා වැදගත්වේ.

(i) **අප හැසුරුනේ ලෝකයේ ආකාරයටයි - එපීස 2 : 2**

ආත්මික උපත ලබා, ක්‍රිස්තුස්වහන්සේ තුළට ඇතුල්වීමට ප්‍රථමයෙන් අප සැම හැසුරුනේ ලෝකයේ ආකාරයටයි. අප දෙවියන්වහන්සේ කෙරෙහි අදහමින්, ඉරුදින දේවස්ථානයට යමින්, දේව වචනය කියවමින්, යාච්ඤා කරමින් ජීවත්වුනු නමුත්, අප බොහෝවිට ජීවත්වුනේ ලෝකයේ ආකාරයටයි.

නිසැකවම අපගේ කිතුනු විශ්වාස අපගේ හැසිරීමට බලපෑමක් කළ නමුත්, ලෝකයේ හැසිරීම සමහරවිට ඊටත් වැඩියෙන් අපගේ හැසිරීමට සහ ක්‍රියාකිරීමට බලපෑම් ඇති කළා වෙන්ට පුළුවන.

ලෝකයා සතුටු කිරීම, දෙවියන්වහන්සේව සතුටු කිරීමට වඩා වැදගත් ස්ථානයක තබා අප බොහෝවිට ක්‍රියා කරන්නට ඇත.

(ii) **අප හැසුරුනේ යක්ෂයාගේ කැමැත්ත හැටියටයි - එපීස 2 : 2**

දේව වචනය පවසන්නේ, ක්‍රිස්තුස්වහන්සේ තුළට ඇතුලත් වීමට පෙර අප හැසුරුනේ **'ආකාශයේ බලයේ අධිපති - යාගේ කැමැත්තේ හැටියට '** බවයි. මෙය ඇසූ විගස අප බොහෝ දෙනෙකුගේ ප්‍රතිචාරය වන්නේ, '' නැ නැ මම එසේ නොවෙයි '' යන්න නිසැකය. එම නිසා මේ පිළිබඳව පැහැදිලි කිරීමක් අවශ්‍යවේ.

**1 යොහන් 5 : 19 :-**

**'' අප දෙවියන්වහන්සේගෙන් වන බවද, මුළු ලෝකයා නපුරා තුළ බවද දනිමුව. ''**

යොහන්තුමා මෙහි උගන්වන්නේ, ක්‍රිස්තුස්වහන්සේ තුළට පැමිණ නැති සැමදෙනා නපුරා තුළ සිටින බවයි. එසේනම් ඔවුන් නොදැනුවත්වම ඔවුන් තුළ ක්‍රියා කරන්නේ යක්ෂයා බව අපට නිගමනය කළ හැක.

දේව දරුව, මෙය තේරුම්ගන්න.

යක්ෂයාගේ කැමැත්ත වන්නේ සෑම මනුෂ්‍යයෙක්ම ඉතා දරුනු අපරාධකාරයෙක් හෝ මිණීමරුවෙක් හෝ බේබද්දෙක් හෝ හොරෙක් කිරීම නොවේ.

**යක්ෂයාගේ මූලික ඉලක්කයක් වන්නේ, මනුෂ්‍යයා ක්‍රිස්තුස්වහන්සේ තුළට පැමිණීම වැලැක්වීමයි.**

මෙය කිරීම උදෙසා, මනුෂ්‍යයින් මුලාකොට,

'' යහපත් ජීවිත ගත කරන්න '',
'' ඔබ ඉතා හොඳ කෙනෙක් '' ,
'' අන් අයට පිහිට වෙන්න ''

වැනි සිතුවිලි ඔවුන් තුළට ඇතුලත් කර, ඒ මාර්ගයෙන් මනුෂ්‍යයින් ක්‍රිස්තුස්වහන්සේ තුළට පැමිණීම වැලැක්වීම කරන්නේ යක්ෂයා බවත්, යක්ෂයාට මුලා වී, තමා '' හොඳ කිතුනුවෙක් යැයි සිතා '' ක්‍රිස්තුස්වහන්සේ තුළට ඇතුලත් - වීම ප්‍රතික්ශේප කරන තැනැත්තා ක්‍රියා කරන්නේ **'ආකාශයේ බලයේ අධිපතියාගේ කැමැත්තේ හැටියට '** බව තේරුම්ගන්න.

මෙය කියවන්නා වු ඔබද මමද පෙර කාලයේ සිටියේ මේ ආකාරයටය.

(iii) **අප හැසුරුනේ මාංසයේ තෘෂ්ණාව අනුවයි - එපීස 2 : 3**

**රෝම 7 : 18 :- '' මක්නිසාද මා තුළ එනම් මාගේ මාංසය තුළ කිසි යහපතක් වාසය නොකරන බව දනිමි ....... ''**

මෙසේ අප සැම මාංසයේ තෘෂ්ණා අනුව හැසුරුණු කළ, අප පාපයට වැටුණු අවස්ථා එමට තිබූ බව නිසැකය.

(iv) **අප කළේ අපගේ මාංසයට සහ සිතට කැමති ආකාරයටයි - එපීස 2 : 3**

**රෝම 8 : 8 :- '' මෙසේ මාංසයෙහි සිටින්නන්ට දෙවියන් - වහන්සේ සතුටු කරන්ට නොහැකිය. ''**

ඉහත සඳහන් අපගේ හැසිරීම පිළිබඳව, ඉතා වැදගත් කරුණක් වැඩිදුරට පැහැදිලි කිරීමට කැමැත්තෙමි. එනම්,

**එපීස 2 : 2 :- '' ...... අකීකරුකමේ පුත්‍රයන් තුළ දැන් ක්‍රියා කරන්නාවූ ආත්මය ''**

යන්නෙන් පැහැදිලි වන්නේ තවමත් <u>ක්‍රිස්තුස්වහන්සේ තුළට නොපැමිණි අය තුළ දැන්ද ක්‍රියා කරන්නේ යක්ෂයාගේ කැමැත්ත බවත්</u>, පෙර කාලයේ අප තුළද ක්‍රියා කළේ එයම බවත්ය.

(c) **දෙවියන්වහන්සේ ඉදිරියේ අපට හිම්ව තිබුනාවූ ස්ථානය - එපීස 2 : 3**

**එපීස 2 : 3 :- " .... <u>අප සියල්ලෝද වරක්</u> .... ස්වභාවෙන් අනික් අය මෙන් <u>උදහසේ දරුවෝව සිටියෙමුව</u>. "**

අපගේ පියවූ දෙවියන්වහන්සේ ප්‍රේමයේ දෙවියන් - වහන්සේ බව අප සැම හොඳහැටි දන්නා අතර, දෙවියන්වහන්සේගේ උදහස කිතුනු අප අමතක කරන්නාවූ දෙයක් බව සමහර අවස්ථාවලදී, කිතුනු සභාව තුළ පවා අප දකිමු.

මෙනමුත් **එපීස 2 : 3** හි සඳහන්වන්නේ, අප සියල්ලෝද වරක් ' උදහසේ දරුවන්ව ' සිටි බවයි.

**යොහන් 3 : 36 :- " පුත්‍රයාණන් කෙරෙහි අදහන්නාට සදාකාල ජීවනය ඇත. නමුත් පුත්‍රයාණන්ට කීකරු නොවන්නා ජීවනය නොදක්නේය. දෙවියන්වහන්සේගේ උදහස ඔහු කෙරෙහි පවතී. "**

මෙම පදයේ සදහන්, ' දෙවියන්වහන්සේගේ උදහස ඔහු කෙරෙහි පවතී ' යන්නෙහි තේරුම, කරුණාකර දෙවියන් -වහන්සේගෙන්ම විමසා දැන ගන්නා මෙන් ඔබගෙන් යටහත්ව ඉල්ලා සිටිමි.

**රෝම 1 : 18 - 20 :-**

**" ..... මනුෂ්‍යයන්ගේ සියලු අභක්තියටද අධර්මිෂ්ඨකමටද විරුද්ධව <u>දෙවියන්වහන්සේගේ උදහස ස්වර්ගයෙන් එළිදරව්වී තිබේ</u>.**

**මක්නිසාද දෙවියන්වහන්සේ ගැන දැනගන්ට පුළුවන් දේ ඔවුන් තුළ ප්‍රකාශව තිබේ ...... මක්නිසාද ලෝකය මැවූ තැන් පටන් දෙවියන්වහන්සේගේ අදෘශ්‍යමාන දේ වන උන්වහන්සේගේ සදාකාලික වූ බලය හා දෙව්කම මවන ලද දේ වලින් තේරුම් ගොස් පැහැදිලි ලෙස පෙනී යන්නේය. <u>එබැවින් ඔවුහු නිරුත්තරව සිටිති</u>. "**

මෙහි සදහන් වන්නේ, දෙවියන්වහන්සේගේ මැවිල්ල තුළින් දෙවියන්වහන්සේගේ සදාකාලික වූ බලය පැහැදිලි ලෙස පෙනීයන බැවින්, නොඇදහිලිවන්ත මනුෂ්‍යයන්ට නිදහසට කරුණු නැති බවයි.

මේ ආකාරයෙන් මැවිල්ල තුළින් මනුෂ්‍යයන්ට දෙවියන් - වහන්සේ ගැන දැන ගතහැකි බව දේව වචනය ප්‍රකාශ කරන අතර, උන්වහන්සේගේ වචන ලබා ඇත්තා වූ, එය කියවන්නාවූ කිතුනුවන්, එම වචනයට අකීකරු වන අතර, ඔවුන් වැටෙන්නා වූ තත්ත්වය ඔබට ඉතා පැහැදිලිව පෙනේ යයි සිතමි.

**දේව දරුව, දේවියන්වහන්සේට අකීකරු නොවන්න.**
**දේව පුත්‍රයාට අකීකරු නොවන්න.**
**ශුද්ධාත්මයාණන්වහන්සේට අකීකරු නොවන්න.**

## 2. <u>දෙවියන්වහන්සේගේ ස්වභාවය නිසා උන්වහන්සේ අපට දෙන ස්ථානය - එපීස 2 : 4 - 6</u>

**එපීස 2 : 4 :-**

**" නමුත් දෙවියන්වහන්සේ දයාවෙන් පොහොසත්ව සිටිනසේක. අපට ප්‍රේම කළාවූ තමන්වහන්සේගේ මහත් ප්‍රේමයෙන්, අපගේ වරද කරණකොටගෙන අප මැරී සිටි කල්හි පවා, ක්‍රිස්තුස්වහන්සේ සමඟ අප ජීවත් කර ......... ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ ස්වර්ගීය වූ ස්ථානවල උන්වහන්සේ සමඟ අප හිඳවූ සේක. "**

මෙහි සඳහන් ආකාරයට දෙවියන්වහන්සේ අතිශයින් දයාවන්ත බවත්, අසීමිත ප්‍රේමයකින් අපට ප්‍රේම කරන බවත් අප දනිමු. උන්වහන්සේගේ ඉමහත් ප්‍රේමය නිසා උන්වහන්සේ අපට ලබාදී ඇති ආශිර්වාද ස්වල්පයක් දෙස බලමු.

### (i) <u>දෙවියන්වහන්සේගෙන් උපත ලැබීම</u>

**යොහන් 1 : 13 :-**

**" ඔව්හු ලෙයෙන්වත් මාංසයේ කැමැත්තෙන්වත් මනුෂ්‍ය - යාගේ කැමැත්තෙන්වත් නොව <u>දෙවියන්වහන්සේගෙන් උපන්නෝය</u>. "**

(ii) **<u>ක්‍රිස්තුස්වහන්සේ සමඟ ජීවත් කරනු ලැබීම</u>**

**එපීස 1 : 5 :-**

**" අපගේ වරද කරණකොටගෙන අප මැරී සිටි කල්හි පවා, ක්‍රිස්තුස්වහන්සේ සමඟ අප ජීවත්කර ….. "**

අප සැම දෙනා පාපය කරණකොටගෙන, ආත්මිකව මැරී නොහොත් දෙවියන්වහන්සේගෙන් වෙන්වී සිටි අතර, දෙවියන්වහන්සේ අප සමඟ නැවත එම සම්බන්ධකම ගොඩනැගූ සේක නොහොත් අප ජීවත් කළ සේක.

(iii) **<u>ක්‍රිස්තුස්වහන්සේ තුළ ස්වර්ගීය ස්ථානවල හිඳවනු ලැබීම</u>**

**එපීස 1 : 21** හි අප දකින්නේ දෙවියන්වහන්සේ, යේසුස් - වහන්සේ ස්වර්ගීය ස්ථානවල තමන්වහන්සේගේ දකුණු පැත්තේ හිඳවූ බවය.

එබැවින් **අප යේසුස්වහන්සේ තුළ පවතින අතර, උන්වහන්සේ තුළ සිටින්නාවූ අපද සිටින්නේ දෙවියන් - වහන්සේගේ දකුණු පැත්තේ, උන්වහන්සේට ළඟින්ය.** මෙම සත්‍යය වටහා ගැනීම මාගේ යාච්ඤා ජීවිතය බොහෝසෙයින් ශක්තිමත් කර ඇති බැවින්, එය ඔබ සමඟ බෙදා ගැනීමට කැමැත්තෙමි.

විශේෂ අවස්ථාවන්හි මා යාච්ඤාවෙන් දෙවියන්වහන්සේ වෙත ළං වෙන විට, මාගේ ආත්මික ඇස්වලට පෙනෙන්නේ මා ක්‍රිස්තුස්වහන්සේ තුළ මාගේ පියාණන් - වහන්සේ වන මාගේ දෙවියන්වහන්සේගේ දකුණු පැත්තේ උන්වහන්සේ ළඟම ඉන්නා බවයි, මාගේ තාත්තා මා ළඟින්ම සිටිනා බවයි. යේසුස්වහන්සේගේ ලේ වලින් උන්වහන්සේ මා ධර්මිෂ්ඨ කොට මා උන්වහන්සේගේම දරුවෙක් ලෙස ඉතා ආදරයෙන් පිළිගන්නා බවයි.

මේ අන්දමින් දෙවියන්වහන්සේ සහ මා අතර සම්බන්ධකම ශක්තිමත්වූ විට, උන්වහන්සේ මට ලබා දෙන්නාවූ සැනසීම, සමාදානය, මඟපෙන්වීම, බලය යනාදී අතිශයින් අනර්ඝ වන අතර, **දෙවියන්වහන්සේම මෙසේ උන්වහන්සේ වෙතට ළංවීමට ඔබට උපකාර කරන සේක්වා !!** යන්න මගේ පැතුමයි.

(iv) <u>අප සදාකාල ජීවනය ලැබීම</u>

**1 යොහන් 5 : 11, 12 :-**

**" ඒ සාක්ෂිය නම් දෙවියන්වහන්සේ අපට සදාකාල ජීවනය දුන් බවය, <u>ඒ ජීවනයද තමන් පුත්‍රයාණන් තුළ තිබේ</u>.**

**<u>පුත්‍රයාණන්වහන්සේ ඇත්තාට ඒ ජීවනය ඇත</u>. දෙවියන් - වහන්සේගේ පුත්‍රයා නැත්තාට ඒ ජීවනය නැත, "**

(v) <u>දේව ස්වභාවයට පංගුකාරකම අපට ලැබීම</u>

**2 පේත්‍රුස් 1 : 4 :-**

**" .... ලෝකයේ තිබෙන දූෂ්‍යකමෙන් නුඹලා ගැලවී, .... <u>දේව ස්වභාවයට පංගුකාරයන් වන පිණිසය</u>. "**

**3. <u>දෙවියන්වහන්සේ අපට ලබා දී ඇති ගැළවීම නමැති දීමනාව - එපීස 2 : 8, 9</u>**

**එපීස 2 : 8, 9 :- " මක්නිසාද ඇදහිල්ල කරණකොට - ගෙන ඒ අනුග්‍රහයෙන් නුඹලා ගැළවී සිටින්නාහුය. එය නුඹලාගෙන්ම නොව දෙවියන්වහන්සේගේ දීමනාවය. කිසිවෙක් පාරට්ටු කරනොගන්නා පිණිස ඒක ක්‍රියා වලින් නොවේ. "**

මේ පද දෙක තුළින්, අපට ඉතා පැහැදිලිව පෙනීයන්නාවූ කරුණු වන්නේ -

(i) අප දැන් ගැළවීම ලබා සිටින්නෙමු.
**( 8 වන පදය - " නුඹලා <u>ගැළවී සිටින්නාහුය</u> " )**

(ii) එය දෙවියන්වහන්සේ අපට දෙන දීමනාවකි නොහොත් නෑග්ගකි.
**( 8 වන පදය - " එය නුඹලාගෙන්ම නොව <u>දෙවියන් - වහන්සේගේ දීමනාවය</u> " )**

(iii) එය අපට ලැබෙන්නේ දේව අනුග්‍රහය නිසාය.
**( 8 වන පදය - " <u>අනුග්‍රහයෙන් නුඹලා ගැළවී</u> ..... " )**

(iv) එය ලබා ගත හැක්කේ ඇදහිල්ලෙන් පමණය.
**( 8 වන පදය - " <u>ඇදහිල්ල කරණකොටගෙන</u> නුඹලා ..... " )**

(v) ක්‍රියාවලින් කිසිවෙකුට ගැළවීම ලබා ගත නොහැකි වේ. **( 9 වන පදය - " කිසිවෙක් පාරට්ටුකර නොගන්නා පිණිස <u>ඒක ක්‍රියා වලින් නොවේ</u>. " )**

ගැළවීම යහපත් ක්‍රියාවලින් කිසිවෙකුට ලබා ගත නොහැකි බව තහවුරු කිරීම උදෙසා, **2 තිමෝති 1:9 සහ තීතස් 3:5** වෙතද ඔබගේ අවධානය යොමු කරමි.

**1 තිමෝති 1 : 9 :- " උන්වහන්සේ <u>අපේ ක්‍රියාවල ප්‍රකාරයට නොව</u> තමන්වහන්සේගේම <u>අභිප්‍රායේද</u> ...... <u>කරුණාවේද ප්‍රකාරයට අප ගළවා</u>, ශුද්ධවූ කැඳවීමකින් කැඳවාගත් සේක. "**

**තිතස් 3 : 5 :- " අප විසින්ම කළාවූ <u>ධර්මිෂ්ඨකමේ ක්‍රියා - වලින් නොව තමන්වහන්සේගේ දයාව ලෙස</u> නැවත ඉපදීම නමැති සේදීමෙන්ද, ශුද්ධාත්මයාණන්වහන්සේගේ අලුත් කිරීමෙන්ද උන්වහන්සේ අප <u>ගැළවූ සේක</u>. "**

**4. <u>ගැළවීම ලබා දී ඇති අපගේ යහපත් හැසිරීම</u> - <u>එපීස 2 : 10</u>**

ඇදහිල්ල කරණකොටගෙන ගැළවීම නමැති දීමනාව ලබන්නාවූ සැමදෙන, එම ගැළවීම ලබන්නේ ක්‍රිස්තුස් - වහන්සේ තුළින්ය. යහපත් ක්‍රියාවලින් අප කිසිකෙනෙකුට ' ක්‍රිස්තුස්වහන්සේ තුළට ' ඇතුල්වීමට නොහැකි බැවින්, යහපත් ක්‍රියාවලින් කිසිසේත් ගැළවීම ලබා ගත නොහැකි බව ඔබට පැහැදිලි වනවා ඇත.

මෙසේ යහපත් ක්‍රියා කිරීමෙන් කිසිවෙකුට ගැළවීම ලබා ගත නොහැකි අතර, ඇදහිල්ල තුළින් ගැළවීමට ඇතුලත්ව සිටින්නාවූ සැම දෙනාගේම ජීවිතවල යහපත් ක්‍රියා ඇතිවීම දෙවියන්වහන්සේගේ කැමැත්ත සහ සැලැස්ම වන බැවින්, එම යහපත් ක්‍රියා උන්වහන්සේම අප උදෙසා සකස් කර ඇති බව දේව වචනය ප්‍රකාශ කරයි.

**එපීස 2 : 10 :- " මක්නිසාද අප වනාහි යහපත් ක්‍රියා කරන පිණිස ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ මවනු ලැබ, දෙවියන් - වහන්සේගේ කර්මාන්තව සිටිමුව. <u>ඒ යහපත් ක්‍රියාවල අප හැසිරෙන පිණිස දෙවියන්වහන්සේ ඒවා කලින් සූදානම් කළ සේක</u>. "**

එපීස පොත තුළින් අපට පෙනීයන, අප උදෙසා දෙවියන්-වහන්සේ කර ඇති පුදුමාකාර සහ චමත්කාර ක්‍රියාකිරීම් සමහරක් මෙසේ සඳහන් කළ හැක.

(i) ලෝකය මැවීමට පෙර ක්‍රිස්තුස්වහන්සේ තුළ අපව තෝරා ගැනීම - **එපීස 1 : 4**

(ii) දෙවියන්වහන්සේගේ පුත්‍රයන්වීමට අපව පෙරනියම කිරීම - **එපීස 1 : 6**

(iii) දෙවියන්වහන්සේගේ ලේ කරණකොටගෙන අපට මිදීම ලබාදීම - **එපීස 1 : 7**

(iv) දෙවියන්වහන්සේගේ කැමැත්තේ රහස අපට දන්වාදීම - **එපීස 1 : 10**

(v) අපට උරුමයක් ලබා දීම - **එපීස 1 : 14**

(vi) ශුද්ධාත්මයාණන්වහන්සේගෙන් අප මුද්‍රාකිරීම - **එපීස 1 : 14**

(vii) ක්‍රිස්තුස්වහන්සේ සමඟ අප ජීවත් කිරීම - **එපීස 2 : 5**

(viii) ක්‍රිස්තුස්වහන්සේ තුළ ස්වර්ගීයවූ ස්ථානවල අප හිඳවීම - **එපීස 2 : 6**

(ix) අපට ගැළවීම ලබාදීම - **එපීස 2 : 8**

(x) අප උදෙසා යහපත් ක්‍රියා කලින් සූදානම් කිරීම - **එපීස 2 : 10**

දෙවියන්වහන්සේ මේ අයුරින් අප උදෙසා මේ මහත් දේ කර ඇති අතර, ගැළවීම ලබා ඇති අපගේ හැසිරීම කෙබඳු විය යුතුද කියා අප තේරුම්ගත යුතුවේ. එය පිළිබඳව දේව වචනයෙන් ප්‍රකාශවන්නාවූ, අදහස් කිහිපයක් ඔබ ඉදිරියේ තබමි.

(i) අපගේ ජීවිත යහපත් ක්‍රියාවලින් පිරුණාවූද දෙවියන් - වහන්සේට ගෞරවය ගෙන දෙන්නාවූද ජීවිත විය යුතුවේ.

**මතෙව් 5 : 16 :- " එසේම මනුෂ්‍යයන් විසින් නුඹලාගේ යහපත් ක්‍රියා දැක, ස්වර්ගයෙහි සිටින නුඹලාගේ පියාණන් - වහන්සේට ගෞරව කරන පිණිස නුඹලාගේ ආලෝකය ඔවුන් ඉදිරියේ බබළාවා. "**

**1 පේත්‍රුස් 2 : 12 :-**

**" ..... ඔවුන් <u>නුඹලාගේ යහපත් ක්‍රියා දැක</u>, විභාගකිරීමේ දවසේදී <u>දෙවියන්වහන්සේට ගෞරව කරන පිණිස</u>, ඔවුන් අතරේ නුඹලාගේ හැසිරීම ඔබින ලෙස පවත්වාපල්ලා. "**

(ii) අපගේ ජීවිත දෙවියන්වහන්සේගේ සැලැස්මට සහ කැමැත්තට අනුකූල විය යුතුවේ.

**එපීස 2 : 10 :- " ....... ඒ යහපත් ක්‍රියාවල අප හැසිරෙන පිණිස දෙවියන්වහන්සේ ඒවා කලින් සූදානම් කළසේක. "**

ප්‍රේමණීය සහෝදරයා, සහෝදරී අප සැමදේදීම දෙවියන්වහන්සේ අප උදෙසා සූදානම් කර ඇති මාර්ගයේ යා යුතු අතර, විශේෂයෙන්ම <u>ඔබගේ සේවය, ඔබගේ රැකියාව සහ ඔබගේ පවුල ගැන අනිවාර්යයෙන්ම දෙවියන්වහන්සේගේ කැමැත්තට විරුද්ධව කිසිසේත් ක්‍රියා නොකරන</u> ලෙස ඉතා ආදරයෙන් ඔබගෙන් ඉල්ලා සිටිමි.

(iii) අපගේ ජීවිතවල ලෞකික දේවලට වඩා, ස්වර්ගික දේවලට වැදගත් ස්ථානයක් දිය යුතුවේ.

**කොලොස්සි 3 : 1, 2 :- " ඉඳින් නුඹලා ක්‍රිස්තුස්වහන්සේ සමඟ නැගුටුවනලද්දහු නම් උසස් තැන්හි දේවල් සොයාපල්ලා ........ පොළොවේ තිබෙන දේ නොව උසස් - තැන්හි තිබෙන දේම සලකාපල්ලා. "**

(තව දුරටත් **මතෙව් 6:33, 6:19-21** ද, කියවා බලන්න)

(iv) අපගේ හැසිරීම යේසුස්වහන්සේගේ හැසිරීමමෙන් විය යුතුවේ.

**1 යොහන් 2 : 6 :- " උන්වහන්සේ තුළ පවතිමියි කියන තැනැත්තා විසින් <u>උන්වහන්සේ හැසුරුණාක්මෙන් හැසිරිය යුතුය</u>. "**

(තව දුරටත් **1 පේත්‍රුස් 2 : 21** ද, කියවා බලන්න)

ගැළවීමේ දීමනාව

නොමිලේ ලබා ඇත්තාවූ අප සැම,

අපගේ කැඳවීමට ඔබින ලෙස

යේසුස්වහන්සේ හැසුරුණාක්මෙන්

හැසිරීමට උත්සාහ කරමු.

දෙවියන්වහන්සේම, එසේ කිරීම උදෙසා

ඔබට ශක්තිය සහ මඟපෙන්වීම

ගෙන දෙන සේක්වා !!!

**සටහන**

# අපගේ අලුත් තත්වය



# එපීස අධ්‍යයනය 04

# අපගේ අලුත් තත්වය

**එපීස 2 : 11 - 22**

**<u>හැඳින්වීම</u> :-**

එපීස දෙවැනි පරිච්ඡේදය සමස්තයක් ලෙස ගත් විට, අප දකින්නේ, මනුෂ්‍යයාට හිමිව තිබුනාවූ දෙආකාර වෙන්වීමක් සහ ඒවා උදෙසා දෙවියන්වහන්සේ දුන්නාවූ විසඳුමයි.

මේ අනුව **එපීස 2 : 1 - 3** දක්වා සඳහන්වන්නේ, වරක් මුළු මනුෂ්‍යවර්ගයා සිටියාවූ තත්වය එනම් දෙවියන්වහන් - සේගෙන් වෙන්වී නොහොත් ආත්මික මරණයෙන් සිටියාවූ තත්වය වන අතර, **එපීස 2 : 11 - 12** දක්වා සඳහන්වන්නේ යේසුස්වහන්සේගේ පැමිණීමට ප්‍රථමයෙන් අන්‍යජාතීන් සිටියාවූ තත්වය එනම් දෙවියන්වහන්සේගේ තෝරාගත් සෙනඟගෙන් වෙන්වී සිටියාවූ තත්වයයි.

ඒ අන්දමින් **එපීස 2 : 3 - 10** දක්වා පෙන්නුම් කරන්නේ මුළු මනුෂ්‍යවර්ගයා තමන්වහන්සේ වෙත ළං කරගැනීම උදෙසා දෙවියන්වහන්සේ නොමිලේ ලබාදුන්නාවූ ''ගැළවීම'' නමැති විසඳුම වන අතර **එපීස 2 : 11 - 22** දක්වා උගන්වනු ලබන්නේ, අන්‍යජාතීන් සහ යුදෙව්වරුන් අතර තිබුනාවූ වෙන්වීම උදෙසා දෙවියන්වහන්සේ ලබා දුන්නාවූ විසඳුමයි.

දෙවියන්වහන්සේ මේ අන්දමින් අපට ලබාදී ඇත්තාවූ විසඳුම් තුළින්, අද අප සැම සිටින්නාවූ අළුත් තත්වය ඔබට පහදාදීම මෙම අධ්‍යයනයේ මූලික අරමුණයි.

<u>**අධ්‍යයනය :-**</u>

1. <u>**පෙර කාලයේදී අන්‍යජාතීන් (අප) සිටියාවූ තත්වය**</u> - <u>**එපීස 2 : 11, 12**</u>

**එපීස 2 : 11** වන පදයේ, ''පෙර කාලයේ '' ලෙස විස්තර කරනු ලබන්නේ, යේසුස්වහන්සේගේ පැමිණීමට පෙර කාලයයි. එම කාලයේ අන්‍යජාතිකයින්ගේ තත්වය වූයේ මෙයයි.

(i) ඔවුන් සිටියේ ඉශ්‍රායෙල් ජාතියෙන් වෙන්වෙලාය. යුදෙව්වන් විසින් හෙළාදකිනු ලැබුවාවූ අන්‍ය-ජාතිකයන්ට එදා යුදෙව්වරුන්ගෙන් ලැබුනේ නින්දා සහ අපහාසයි. එදා ඔවුන්ව **'' අචර්මිච්ඡේදිතයෝ '' (එපීස 2 : 11)** ලෙස යුදෙව්වරුන් විසින් හඳුන්වනු ලැබුවේ '' පහත් ජාතීන් '' යන අදහස ඇතුවයි.

(ii) ඔවුන් එදා සිටියේ, ක්‍රිස්තුස්වහන්සේගෙන් වෙන් - වෙලාය. **එපීස පළමුවැනි පරිච්ඡේදයේ,** සඳහන් සියලුම ආශිර්වාදවලට හිමිකම ඇත්තේ '' ක්‍රිස්තුස්වහන්සේ තුළයි ''. එබැවින් උන්වහන්සේගෙන් වෙන්ව සිටියාවූ අන්‍යජාතිකයින් සිටියේ, මෙම ආශිර්වාද කිසිත් නොමැතිවයි.

(iii) එදා ඔවුන් සිටියේ **ඉශ්‍රායෙල්ගේ නාගරිකත්වයට අන්‍යයන්ව, පොරොන්දුවේ ගිවිසුම්වලට විදේශීන්වයි. (එපීස 2 : 12)**

(iv) ඔවුන් සිටියේ ලෝකයේ බලාපොරොත්තුවක් නො - මැතිවයි.

පෙර කාලයේ සිටම යුදෙව්වරුන් මෙසියස්වහන්සේගේ පැමිණීම බලාපොරොත්තුවෙන් සිටිය නමුත්, අන්‍යජාතිකයන් සිටියේ, බලාපොරොත්තුවක් නොමැතිවයි. (දෙවියන්වහන්සේ උන්වහන්සේගේ සැලැස්මට අන්‍යජාතීන් ඇතුලත්කර තිබුණු නමුත්, යුදෙව්වරු අන්‍යජාතීන්ව හෙලා දකිමින්, ප්‍රතික්ෂේප කළ නිසා, ඔවුන් තුළ ඒ ගැන කිසිඳු දැනුමක් හෝ බලාපොරොත්තුවක් තිබුනේද නැත).

(v) ඔවුන් සිටියේ දෙවියන්වහන්සේ නොමැතිවයි.

පාවුල්තුමා, පෙර කාලයේදී අන්‍යජාතිකයන් වූ එපීසයේ ඇදහිලිවන්තයින් සිටියාවූ තත්‍වය මේ අයුරින් විස්තර කරමින්, ඔවුන්ට උපදෙස් දෙන්නේ " **නුඹලා ඒ කාලයේ .... සිටිය බව <u>සිහිකරපල්ලා</u>** " යනුවෙනි.

❖ අද දවසේ මමද ඔබගෙන් ඉල්ලා සිටින්නේ, ''ගැළවීමට පැමිණීමට පෙර '' ඔබ සිටියාවූ තත්‍වය සිහිකර, අද දවසේද මෙම තත්‍වයේම සිටින්නාවූ ඔබගේ මිතුරන්, අසල්වැසියන්, නෑදෑයින් වැනි අය සහ දේවස්ථානයට පැමිණෙන සමහරුන් සිහිකරමින්, එම තත්‍වයෙන් ඔවුන් මුදවාගැනීමට ක්‍රියාකරන ලෙසයි.

පෙර කාලයේදී අපද සිටියේ, ඔවුන් තවමත් සිටින්නාවූ තත්‍වයේ බවද, අද අප ගැළවීමට පැමිණ සිටින්නේ, යම් කෙනෙක් අප ගැන සිහිකර, අප උදෙසා යම් ක්‍රියා මාර්ගයක් ගත් නිසා බවද තේරුම් ගනිමින්, අපද අන් අය ''ගැළවීමට ගෙන ඒම'' උදෙසා ක්‍රියාකරමු.

❖ මෙහි සඳහන් කාලයේ, යුදෙව්වරුන් අන්‍යජාතිකයන් දෙස බැලුවේ ඉතා පිළිකුල් සහගතව වන අතර, **එපීස 2:11** වන පදය, එය මනා ලෙස පෙන්වාදෙයි.

මෙය තුළින් අපටද උගත හැකි පාඩමක් තිබේ. එනම් අප විසින් මෙආකාරයට මනුෂ්‍යයන්ගේ කුලය, ජාතිය, සමාජ මට්ටම සහ ආගම යනාදිය සලකමින් සමහරුන් පහත් ලෙස සැලකීමේ වරද, අප විසින් නොකල යුතු බවයි.

**එපීස 2:12** වන පදයේ අපට, අප සිටියාවූ තත්‍වය සිහිකරන ලෙස උපදෙස් දෙන අතර, එසේ සිහිකරන අප විසින් කල යුත්තේ,

(i) අපට දෙවියන්වහන්සේ ලබාදී ඇති තත්‍වය ගැන, උන්වහන්සේට ප්‍රශංසා කිරීම සහ

(ii) උන්වහන්සේගෙන් ''වෙන්ව සිටින'' මනුෂ්‍යයන්ට අනුකම්පාව සහ ආදරය දක්වීම වේ.

## 2. අප උදෙසා යේසුස්වහන්සේ කලාවූ දේ - එපීස 2 : 13-18

**එපීස 2 : 13 :-**

**" නුමුත් වරක් දුර සිටියාවූ නුඹලා දැන් ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ, උන්වහන්සේගේ ලේ කරණකොටගෙන ළංකරනු ලැබූවහුය. "**

(i) **දෙවියන්වහන්සේගෙන් දුර සිටියාවූ " අන්‍යජාතීන් " දෙවියන්වහන්සේට ළංකලා - එපීස 2 : 13**

(a) මෙසේ කළේ යේසුස්වහන්සේගේ ලේ කරණකොට - ගෙනයි.

**එපීස 1 : 7 :- " ඒ <u>ප්‍රේමවන්තයාණන්වහන්සේ තුළ</u>, උන්වහන්සේගේ කරුණාවේ සම්පතේ ප්‍රකාරයට, <u>උන්වහන්සේගේ ලේ කරණකොටගෙන</u> අපේ මිදීම වන අපේ වරද වලට කමාව අපට ඇත්තේය. "**

(b) මෙසේ කළේ යේසුස්වහන්සේ තුළට අපව ඇතුල් - කිරීමෙනුයි.

ප්‍රේමනීය සහෝදරයා සහෝදරී, ඔබ යේසුස්වහන්සේ තුළට ඇතුලත්ව සිටින බවට ඔබට සහතිකයක් නැත්නම්, වහාම පසුතැවිල්ලෙන්, ඔබගේ ජීවිතය උන්වහන්සේට බාරදී, උන්වහන්සේ ඔබව පිළිගත් බවද, ඔබ දැන් ඇතුල්ව සිටින්නේ "යේසුස්වහන්සේ තුළට " බවද අදහමින්, දෙවියන්වහන්සේට තුති පුදන්න.

(ii) **යුදෙව්වරුන් සහ අන්‍යජාතීන් වෙන් කළා වූ ' බිත්තිය ' බිඳ දැමුවා - එපීස 2 : 14**

මෙම කාලයේ යුදෙව්වරුන් සහ අන්‍යජාතීන් අතර තිබුනාවූ 'වෙන්වීමේ ' අධිකකම පෙන්නුම් කිරීම උදෙසා පාවුල්තුමා යෙරුසලමේ දේවමාලිගාවේ අන්‍යජාතීන්ගේ 'පිටත මලුව' වෙන්කරනු ලැබුවාවූ බිත්තිය පාවිච්චි කරයි.

පාවුල් මෙම ලිපිය එපීසවරුන්ට ලියන කාලයේදී, යෙරුසලමේ පිහිටා තිබුනේ, හෙරොද් විසින් ගොඩනගන ලද දේවමාලිගාවයි. එහි ඉදිකර තිබුනාවූ **" වෙන්කිරීමේ මැද බිත්තිය " (එපීස 2 : 14)** මීටර් 1 ½ ක් පමණ පලල් වූ අතර, එම බිත්තියේ තැනින් තැන තිබුණාවූ දැන්වීම් සඳහන් කළේ, මෙයින් ඔබ්බට අන්‍යජාතිකයෙක් පිවිසියහොත්, ඔහුට නියමවන්නේ මරණීය දණ්ඩනය බවයි. පාවුල්තුමා **එපීස 2 : 14** හි පෙන්වාදෙන්නේ යේසුස්වහන්සේගේ කුරුසි පූජාව තුළින් යුදෙව්වරුන් සහ අන්‍යජාතීන් අතර තිබුනාවූ මෙම ''වෙන්කිරීම'' උන්වහන්සේ නැති කළ බවයි. යේසුස්වහන්සේගේ මෙම පූජාව තුළින් සිදුවුනාවූ කාරණා හතරක්, පාවුල්තුමා **එපීස 2 : 14-18** දක්වා පදයන්හි සඳහන් කරයි.

ඒවා නම් :-

(a) **<u>යුදෙව්වරුන් අන්‍යජාතීන්ගෙන් වෙන්කිරීමට සමත්වූ නියෝග පැවැත්වීම අනිවාර්‍ය නොවන බව පෙන්නුම්කිරීම</u> - ( <u>එපීස 2 : 14</u> )**

**නිදසුනක් වශයෙන් :-** එදා යුදෙව්වරුන් අන්‍යජාතීන්ට ''අචර්මච්ඡේදිතයෝ '' ලෙස පිළිකුලින් ව්‍යවහාර කළේ, චර්මච්ඡේදනය කිරීම ව්‍යවස්ථාව අනුව අනිවාර්‍යවීම හේතුකොටගෙනයි.

**උත්පත්ති 17 : 14 :- " තමාගේ චර්මාග්‍ර මාංසය ඡේදය නොකරනලද අචර්මච්ඡේදිත පිරිමියෙක් ඇද්ද, ඒ තැනැත්තා තමාගේ සෙනඟ කෙරෙන් සිඳ දමනු ලබන්නේය "**

මෙනමුත් යේසුස්වහන්සේගේ කුරුස පූජාවෙන් පසු, මුල් සභාව මෙය අනිවාර්‍ය නොවන බව තීරණය කළ බව අපි දනිමු. මේ සම්බන්ධයෙන් යෙරුසලමෙහි පැවැත්වූ මන්ත්‍රණ සභාවේ නිර්දේශය, **ක්‍රියා 15 : 1-20** දක්වා කියවා බලන්න.

**ක්‍රියා 15 : 1 :- " යුද්ධයෙන් සමහර දෙනෙක් ඇවිත් මෝසෙස්ගේ නියෝගය ලෙස නුඹලා චර්මච්ඡේද්‍ය කරනු නොලැබුවහොත්, නුඹලාට ගැලවෙන්න නුපුළුවනැයි සහෝදරයන්ට ඉගැන්නුවෝය. "**

**ක්‍රියා 15 : 7 :-**

**" බොහෝ වාද හටගත් පසු පේ‍්‍රතෑස් නැගිට ඔවුන්ට කියනුයේ ........."**

**ක්‍රියා 15 : 11 :-**

**" එසේ නොව ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ අනුග්‍රහය කරණකොටගෙන ඔවුන් මෙන් අපත් ගළවනු ලබන බව විශ්වාස කරමු යයි කීවේය."**

ඉහත සඳහන් **ක්‍රියා 15 : 11** හි සඳහන් ආකාරයට, අප ගැළවීමට පැමිණ සිටිනතේ, **'ඇදහිල්ල කරණකොටගෙන ඒ අනුග්‍රහයෙන් ' ( එපීස 2 : 8)** බව පසුගිය අධ්‍යයනයේදී අප දුටිමු.

(b) **<u>යුදෙව්වරුන් සහ අන්‍යජාතිකයින් එක්කිරීම නොහොත් ඔවුන් අතර සමාදානය ඇති කිරීම - එපීස 2 : 15</u>**

මේ අයුරින් යේසුස්වහන්සේ යුදෙව්වරුන් සහ අන්‍යජාතිකයින් අතර සමාදානය ඇති කළේ, දෙගොල්ලන්ම **" අලුත් මනුෂ්‍යන් "** බවට පත්කිරීමෙනි.

**කොලොස්සි 3 : 9 - 11 :-**

**" 9 .... මක්නිසාද නුඹලා පරණ මනුෂ්‍යයා ..... අහක දමා .....**
**10 <u>අලුත් මනුෂ්‍යාව පැළඳගත්තහුය</u>.**
**11 එහි ග්‍රීකයෙක්වත් යුදෙව්වෙක්වත් , චර්මච්ඡේදයෙක්වත් අචර්මච්ඡේදයෙක්වත් ...... සිටිනවා නොව, ක්‍රිස්තුස් - වහන්සේ සියල්ලව, සියල්ලන් තුළ සිටින සේක. "**

**ගලාති 3 : 28 :-**

**" නුඹලා සියල්ලන් ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ එක්කෙ - නෙක්ව සිටින නිසා, යුදෙව්වෙක් හෝ ග්‍රීකයෙක් නැත්තේය, දාසයෙක් හෝ නිර්දාසයෙක් නැත්තේය, පුරුෂයෙක් හෝ ස්ත්‍රියෙක් නැත්තේය. "**

(c) **<u>යුදෙව්වරුන් හා අන්‍යජාතිකයින් යන දෙගොල්ලන්ම දෙවියන්වහන්සේ සමඟ සමගි කිරීම - එපීස 2 : 16</u>**

**රෝම 5 : 10 :-**

**" මක්නිසාද අප සතුරන්ව සිටියදීම දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන්ගේ මරණය කරණකොටගෙන, උන්වහන්සේ සමඟ අපි සමගිකරනු ලැබුවෙහි නම් ...... "**

(d) **<u>දෙගොල්ලන්ටම, ශුද්ධාත්මයාණන්වහන්සේ තුළ දෙවියන් - වහන්සේ ළඟට පැමිණීමේ පුළුවන්කම ලබාදීම</u> - <u>එපීස 2 : 18</u>**

ප්‍රේමණීය දේව දරුව, උන්වහන්සේ ඔබට ලබා දී ඇති මේ වරප්‍රසාදය පාවිච්චි කරමින් දිනපතාම දෙවියන්වහන්සේ වෙත පැමිණීම කිසිවිටක අතපසු නොකරන්න.

**3. <u>අද අප ලබා ඇත්තාවූ අලුත් තත්වය - එපීස 2 : 19 - 22</u>**

**එපීස 2:19** අරඹනු ලබන්නේ **" ඒ නිසා "** යන වචන වලින් වන අතර, එයින් අදහස්වන්නේ, ''ක්‍රිස්තුස්වහන්සේ අප උදෙසා කළාවූ දේ නිසා'' යියි උන්වහන්සේගේ කුරුසි පූජාව නිසා, අප සැම දූන් ලබා ඇත්තාවූ අලුත් තත්වය දෙස බලමු.

(i) **<u>ශුද්ධවන්තයන් සමඟ එක නුවර පුරවැසිකම - එපීස 2 : 19</u>**

**එපීස 2 : 19 :-**

**" ඒ නිසා නුඹලා තවත් විදේශීයෝවත් ආගන්තුකයෝවත් නොව, ශුද්ධවන්තයන් සමඟ එක නුවර වැසියෝව, දෙවියන්වහන්සේගේ පවුලේ අයවල්ව සිටින්නහුය. "**

(a) මෙම පදයේ ' ශුද්ධවන්තයන් ' ලෙස සඳහන් වචනය ඉංග්‍රීසි පරිවර්ථනයේ සඳහන්වන්නේ 'God's people' (NIV) **නොහොත් ''දෙවියන්වහන්සේගේ සෙනඟ''** ලෙසිනි. එබැවින් දෙවියන්වහන්සේගේ සෙනඟ සමඟ නොහොත් යුදෙව්වරුන් සමඟ අප එක නුවර පුරවැසියන් වන්නෙමු.

මෙම ඉමහත් වරප්‍රසාදයේ අනර්ඝකම වටහාගන්නා පිණිස, මෙය කියවන්නාවූ ඔබ අනාගතයේදී ආබ්‍රහම්, මෝසෙස්, එළියා, දාවිත්, පේත්‍රුස්, යොහන් වැනි ' ශුද්ධවන්තයන් ' සමඟ එක නුවර වැසියන් ලෙස ජීවත්වෙන්ට යන බව තේරුම් ගන්න.

(b) අප දෙවියන්වහන්සේගේ රාජ්‍යයේ, පුරවැසියන් මිස විදේශියෝවත් ආගන්තුකයෝවත් නොවෙමු.

**පිලිප්පි 3 : 20 :- " නුමුත් අපේ නාගරිකත්වය ස්වර්ග - යෙහිය. "**

මෙසේ අප දැන් ස්වර්ගයෙහි පුරවැසිකම, යේසුස් - වහන්සේගේ පූජාව තුළින් ලබා ඇති අතර, අප පෙර කාලයේ සිටියේ, **" ඉශ්‍රායෙල්ගේ නාගරිකත්වයට අන්‍යාන්වය " (එපීස 2 : 12).**

නමුත් අප දැන් දෙවියන්වහන්සේගේ රාජ්‍යයේ පුරවැසිකම ලබා ඇති හෙයින්, පුරවැසියෙකුට හිමි සියලුම වරප්‍රසාද අප ලබන්ට යන්නෙමු. අප විදේශ රටකට පදිංචිය උදෙසා ගියහොත්, බොහෝවිට අපට සිදුවන්නේ එම රටේ පුරවැසියන්ට හිමි ස්ථානයට වඩා, පහත් ස්ථානයක් භාරගන්නටය. නමුත් ස්වර්ගයේ අප ලබා ඇත්තාවූ පුරවැසිකම, කිසි කෙනෙකුට දෙවැනි නොවන්නාවූ, පුරවැසියෙකුට ඇත්තාවූ සියලුම අයිතිවාසිකම්, නිදහස, සහ ආරක්ෂාව යනාදිය හිමිවන්නාවූ පුරවැසිකමකි.

(ii) **<u>දෙවියන්වහන්සේගේ පවුලේ අය වීම (දේව දරුකම)</u> - <u>එපීස 2 : 19</u>**

**එපීස 4 : 19** වන පදයේ අග කොටස -

**" දෙවියන්වහන්සේගේ පවුලේ අයවල්ව සිටින්නහුය. "**

දෙවියන්වහන්සේ තමන්වහන්සේගේ රාජ්‍යයේ පුරවැසි - කමින් ඔබ්බට අපව ගෙනගොස්, උන්වහන්සේගේ පවුලේ දරුකම අපට ලබා දී ඇතිසේක.

**එපීස 1 : 6 :- " තමන්වහන්සේගේ කැමැත්තේ ප්‍රසන්නකමේ හැටියට යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කරණකොටගෙන <u>පුත්‍රයන් වීමට</u> අප පෙර නියමකළ සේක. "**

**එපීස 4 : 6 :-**

**" සියල්ලන් කෙරෙහිද සියල්ලන් කරණකොටගෙනද සියල්ලන් තුළද පවතින්නාවූ, සියල්ලන්ට <u>එකම පියාණන්වූ දෙවියන් - වහන්සේත්ය</u>. "**

අප සියල්ලන්ම දෙවියන්වහන්සේගේ දරුකමට ඇතුල්වීම, දෙවියන්වහන්සේගේ කැමැත්ත වන අතර, මෙය කියවන්නාවූ ඔබ සැම ඔබගේ ජීවිතය උන්වහන්සේට බාරදී උන්වහන්සේගේ දරුකමට ඇතුල්ව සිටිනවා ඇතැයි විශ්වාස කරමි.

දේව දරුව, ඔබගේ ස්වර්ගීය පියාණන්වහන්සේ ඔබට ලබා දී ඇති දේවල් කිහිපයක් ඔබට මතක් කිරීමට කැමැත්තෙමි. පියාණන්වහන්සේගේ ප්‍රේමය, ආශිර්වාද, මඟපෙන්වීම සහ ආරක්ෂාව යනාදිය නොමසුරුව උන්වහන්සේ ඔබට ලබා දී ඇති අතර, **<u>උන්වහන්සේ ඔබට වගකීම්ද බාරදී</u>** ඇති බව අමතක නොකරන්න. උන්වහන්සේ ඔබට සහ මට බාරදී ඇති එක වගකීමක් වන්නේ, **<u>යහපත් ගබඩාකාරයෙක්</u>** වීමටය. එලෙසම අප මෙලොව වසන්නේ **<u>උන්වහන්සේගේ තානාපතියන්</u>** <u>ලෙසය</u>.

**1 කොරින්ති 4 : 1, 2 :-**

**" මනුෂ්‍යයෝ අපට ක්‍රිස්තුස්වහන්සේගේ සේවකයන් මෙන්ද, <u>දෙවියන්වහන්සේගේ රහස්වල ගබඩාකාරයන්</u> මෙන්ද ගණන් ගනිත්වා. ඇරත් මෙහිදී ගබඩා කාරයන්ගෙන් ඕනෑ කරන්නේ එක එක මනුෂ්‍යයා <u>විශ්වාසව සිටීමය</u>. "**

**2 කොරින්ති 5 : 20 :-**

**" එබැවින් දෙවියන්වහන්සේ අප ලවා ඉල්වන්නාක්මෙන් අප <u>ක්‍රිස්තුස්වහන්සේ වෙනුවෙන් තානාපතියෝව සිට</u> : දෙවියන්වහන්සේ හා <u>සමගිවෙයල්ලා යයි</u> ක්‍රිස්තුස්වහන්සේ වෙනුවෙන් <u>නුඹලාගෙන් ඉල්ලමුව</u>. "**

දේව දරුවෙනි, අප සැම දෙවියන්වහන්සේගේ දරුවන් ලෙස හැසිරෙමු, ක්‍රියාකරමු, ජීවත්වෙමු !!!

උන්වහන්සේගේ තානාපතියන් ලෙසද, විශ්වාස වූ ගබඩාකාරයන් ලෙසද සේවයේ යෙදෙමු !!!

(iii) **<u>දෙවියන්වහන්සේගේ වාසය පිණිස ශුද්ධවූ මාලිගාවක් වීම - එපීස 2 : 21-22</u>**

යේසුස්වහන්සේගේ පැමිණීමට පෙර, දෙවියන්වහන් - සේගේ සෙනඟවූ ඉශ්‍රායෙල් ජාතියේ කේන්ද්‍රස්ථානය වූයේ යෙරුසලමේ දේවමාළිගාවයි. දෙවියන්වහන්සේගේ සෙනඟ ලෙස, ඉශ්‍රායෙල් ජාතියේ අනන්‍යතාවය තහවුරු කළාවූ ස්ථානය වූයේ මෙම දේවමාළිගාවයි.

නමුත් යේසුස්වහන්සේගේ සේවයෙන් පසු ජාත්‍යන්තර - වූද, ලොව පුරා පැතුරුනාවූ මහත් සමූහයක් දෙවියන් - වහන්සේගේ සෙනඟ සහ ස්වර්ගයේ පුරවැසිකමට ඇතුල්වනවා පමණක් නොව, ඔවුන් උන්වහන්සේගේ දරුකමට ඇතුල් වූහ.

දෙවියන්වහන්සේ උන්වහන්සේගේ දරුවන් " **අලුත් දේව මාළිගාවක්** " ලෙස නිර්මාණය කරමින්, උන්වහන්සේගේ වාසය පිණිස එකට ගොඩනගන බව **එපීස 2 : 22** අපට උගන්වයි.

දෙවියන්වහන්සේගේ මෙම මාළිගාව දෙස අපගේ අවධානය යොමු කරමු.

(a) **<u>එහි අත්තිවාරම වන්නේ ප්‍රේරිතයන් සහ ප්‍රොපේතවරුන් වේ - එපීස 2 : 20</u>**

මෙහි අර්ථය තේරුම් ගැනීම උදෙසා, ප්‍රේරිතයන් සහ ප්‍රොපේතවරුන් දෙවියන්වහන්සේ විසින් කැඳවනු ලැබුවේ කුමක් උදෙසාද කියා තේරුම් ගනිමු.

**ප්‍රේරිතයෙක්** යන වචනයේ අර්ථය වන්නේ -

" **යවනු ලබන්නෙක්** "යන්නය. එනම් ප්‍රේරිතයෙක් යනු දෙවියන්වහන්සේ විසින් හෝ යේසුස්වහන්සේ විසින් පත් කරනු ලැබ උන්වහන්සේගේ වචනය හෝ පණිවුඩය ලොව වෙත ගෙන ගියාවූ කෙනෙක් විය. මේ අතර **ප්‍රොපේතවරු** ප්‍රකාශ කළේ, දෙවියන්වහන්සේ ඔවුන්ට දුන්නාවූ වචනයය.

**නිදසුනක් වශයෙන් - 2 රාජාවලිය 7 : 1 බලන්න.**

**2 රාජාවලිය 7 : 1 :-**

**" එවිට එලීෂා කථාකොට : ස්වාමීන්වහන්සේගේ වචනය අසාපල්ලා ...... "**

එබැවින් දේව වචනය තුළින් අපට ඉතා පැහැදිලිව පෙනීයන්නේ, ප්‍රේරිතයන්ට සහ ප්‍රොපේතවරුන්ට පැවරුනාවූ මූලික වගකීමක්ද, ඔවුන්ගේ කැඳවීමද වූයේ, **දෙවියන්වහන්සේගෙන් ලැබුනාවූ පණිවිඩ ප්‍රකාශකිරීම නොහොත් ඉගැන්වීමයි.**

මේ අනුව අපට නිගමනය කළ හැකි වන්නේ, දෙවියන් - වහන්සේ නිර්මාණය කරන්නාවූ 'අලුත් දේව මාළිගාවේ' **<u>අත්තිවාරම වන්නේ දේව වචනය බවයි.</u>**

(b) **<u>කොණේ ප්‍රධාන ගල වන්නේ ක්‍රිස්තුස්වහන්සේය - එපීස 2 : 20</u>**

**එපීස 2 : 20 :-**

**" ...... ක්‍රිස්තුස්වහන්සේම එහි කොණේ ප්‍රධාන ගලව සිටින සේක. "**

**1 පේතෘස් 2 : 7 :-**

**" ...... ගෙවල් සාදන්නන් විසින් එපාකළ ගලම කොණේ ප්‍රධාන ගල කරන ලද්දේය. "**

අපගේ ස්වාමීවූ යේසුස්වහන්සේ කොණේ ප්‍රධාන ගල වන අතර අපි කවුරුත් හොඳහැටි දන්නා ආකාරයට උන්වහන්සේ **" ජීවමාන වචනය "** වන සේක.

**යොහන් 1 : 1 :-**

**" පටන්ගැන්මෙහිදී වාක්‍යාණෝ සිටිසේක, වාක්‍යාණෝ දෙවියන් - වහන්සේ සමඟ සිටිසේක, වාක්‍යාණෝ දෙවියන්වහන්සේව සිටිසේක. "**

**යොහන් 1 : 14 :-**

**" තවද වාක්‍යාණෝ මාංසවත්වී, කරුණාවෙන්ද සත්‍යයෙන්ද පූර්ණව, අප අතරෙහි වාසය කළසේක ..... "**

මේ අනුව අප අද දකින්නේ, " **මුළු ගොඩනැගිල්ල හොඳ හැටියට එකතුකරන " (එපීස 2 : 21)** ප්‍රධාන ගල වන්නේ යේසුස්වහන්සේ නොහොත්, **ජීවමාන වචනය බවයි.**

(c) **<u>දේව මාලිගාව සාදන්නාවූ ගල් වන්නේ දේව දරුවන්ය - එපීස 2 : 21, 22</u>**

**එපීස 2 : 21, 22** හි දේව දරුවන් දේව මාලිගාවෙහි ගල් ලෙස සෘජුව සඳහන් නොවන නමුත්, එම අදහස මේ පද තුළ අප දකිමු. මේ පිළිබඳව **1 පේත්‍රුස් 2 : 4, 5** දෙස දූන් බලමු.

**1 පේත්‍රුස් 2 : 4, 5 :-**

**" [4] මනුෂ්‍යයන් විසින් එපාකළ නුමුත් දෙවියන්වහන්සේ විසින් තෝරාගත්තාවූ අනර්ඝ ජීවමාන ගලක් වැනි උන්වහන්සේ වෙතට පැමිණ,**

**[5] <u>නුඹලාත් යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කරණකොටගෙන</u> දෙවියන්වහන්සේට ප්‍රසන්නවූ ආත්මික පූජා ඔප්පු කරන පිණිස ...... ආත්මික ගෘහයක් කොට ජීවමාන ගල් මෙන් ගොඩනගනු ලබන්නහුය. "**

ප්‍රේමණීය සහෝදරයා සහෝදරී දෙවියන්වහන්සේගේ වාසය පිණිස උන්වහන්සේ ගොඩනගන්නාවූ දේව මාළිගාවේ, **<u>අත්තිවාරම</u> <u>දේව වචනය</u> ලෙසද, කොණේ <u>ප්‍රධාන ගල</u> <u>ජීවමාන වචනය</u> ලෙසද, ගොඩනැගිල්ලේ <u>ජීවමාන ගල්</u> <u>දේව දරුවන්</u> ලෙසද, භාවිතා කරමින්,** දෙවියන්වහන්සේ ශුද්ධාත්මයාණන්වහන්සේ කරණ - කොටගෙන එම දේව මාළිගාව ගොඩනගන සේක.

දෙවියන්වහන්සේ මෙසේ නිර්මාණය කළ ඇති, දේව මාළිගාව තුළින්, අපට උගත හැකි දේ දෙස බලමු.

- මෙම දේව මාළිගාවේ, අත්තිවාරම සහ ප්‍රධාන ගල දේව වචනය සහ ජීවමාන වචනය වීම තුළින්, ඉතා පැහැදිලිව පෙනීයන්නේ,

  **දේව දරුවන්ගේ ජීවිත,**

  **දේව සභාව,**

  **දේව රාජ්‍යය,**

  **ඉදිකල යුත්තේ <u>අනිවාර්යයෙන්ම දේව වචනය මත බවයි</u>.**

  එබැවින් සෑම දේව දරුවෙකුගෙන්, මා ඉතා ඕනෑකමින්ද, ඉතා යටහත්වද අයැද සිටින්නේ, ඔබගේ ජීවිතය සහ ඔබ නමස්කාර කරන සභාව සැමවිටම දේව වචනය අනුව ගොඩනගන්නට කියාය.

- එදා යෙරුසලමේ දේව මාළිගාව අති තේජවන්තවූ, ශුද්ධවූ, ඉතා අලංකාරවූ, අතිශයින් ශක්තිමත්වූ ගොඩනැගිල්ලක් වූ අතර, අද දෙවියන්වහන්සේ නිර්මාණය කරන්නාවූ '' අලුත් දේව මාළිගාවද '' ඒ තරමටම හෝ ඊටත් වැඩියෙන් මෙම ගුණාංග සහිත විය යුතුවේ.

  එසේ වීම උදෙසා එහි '' ජීවමාන ගල් '' වන්නාවූ **අපගේ ජීවිත ශුද්ධවූ, ශක්තිමත්වූ, නොකැලැල්වූ ජීවිත විය යුතු වන බැවින්, මේ අයුරින් ජීවත්වීමට අප කැපවෙමු.**

- අපගේ දෙවියන්වහන්සේ, බොරු නොකියන නොවෙනස් වන්නාවූ දෙවියන්වහන්සේ වන සේක. එබැවින් උන්වහන්සේගේ වචනය ස්ථිරවන අතර, එය නොවෙනස් වේ.

  එමනිසා, අපට ඉතා පැහැදිලිව පෙනීයන්නේ, දෙවියන් - වහන්සේව උන්වහන්සේගේ වචනයෙන් වෙන්කල නොහැකි බවය. එබැවින් **උන්වහන්සේ වැඩවසන්නාවූ දේව මාළිගාවේ, උන්වහන්සේගේ වචනයට එකඟ නොවන කිසිවක් තිබිය නොහැක.**

එහි අත්තිවාරම සහ ප්‍රධාන ගල දේව වචනයම වන බැවින්, **එහි ජීවමාන ගල් වන අපගේ ජීවිතයද දේව වචනයට අනුකූල විය යුතුම බව ඔබට පැහැදිලි වනවා ඇත.**

එසේ නොවන්නේ නම් උන්වහන්සේට එහි වැඩවිසීමට එය බාධාවක් වේ. මෙය පිළිබඳව දෙවියන්වහන්සේම ඔබට මඟපෙන්වන සේක්වා !

**දේව දරුව, ඔබගේ අලුත් තත්වය වටහාගන්න.**

**එයට ඔබින ලෙස ජීවත්වන්න.**

**එසේ කිරීමට දෙවියන්වහන්සේ ඔබට**

**උපකාර කරන සේක්වා !!!**

# කිතුනු සභාවෙහි ලක්ෂණ



## එපීස අධ්‍යයනය 05

# කිතුනු සභාවෙහි ලක්ෂණ

**එපීස 3 : 1 - 12**

<u>හැඳින්වීම</u> **:-**

**එපීස දෙවැනි පරිච්ඡේදයේ,** අප දුටුවේ, දෙවියන්වහන්සේ සහ මුළු මනුෂ්‍ය වර්ගයා අතර තිබුනාවූ වෙන්වීමටද යුදෙව්වරුන් සහ අන්‍යජාතිකයන් අතර තිබුණාවූ වෙන්වීමටද දෙවියන්වහන්සේ සපයා දුන්නාවූ විසඳුමුයි.

උන්වහන්සේ කුරුසිය තුළින්, යුදෙව්වරුන් සහ අන්‍යජාතිකයින් අතර තිබුනාවූ **" වෙන්කිරීමේ මැද බිත්තිය බිඳ දමා "** ඔවුන් සියලුදෙනාට උන්වහන්සේගේ දරුවන් වීමට අවකාශ ලබාදී, උන්වහන්සේගේ වාසය පිණිස ඔවුන් **" අලුත් දේව මාළිගාවක් "** ලෙස ගොඩනගමින් සිටින බව **එපීස 2:22** අපට පෙන්වාදෙයි. මෙසේ **" අලුත් දේව මාළිගාවක් "** ලෙස දෙවියන්වහන්සේ විසින් එකට ගොඩනගනු ලබමින් පවතින්නේ කිතුනු සභාවයි. **එපීස 3:1-12** තුළින් අප බැලීමට යන්නේ, මෙම සභාව දෙසයි.

<u>අධ්‍යයනය</u> **:-**

1. <u>සභාවේ රහස</u>

**එපීස 3:1-12** දක්වා, තෙවරක්ම **" රහස "** යන වචනය සඳහන් වේ. **3, 4 සහ 9** වන පදවල සඳහන්වන්නාවූ **" රහස "** යන වචනයේ අර්ථයද, මෙසේ සඳහන්වන්නාවූ **" රහස "** කිමෙක්ද කියාද අප මුලින්ම වටහා ගැනීම වැදගත් වේ.

දේව වචනයේ මුල සිට අග දක්වාම අප දකින්නාවූ දෙයක් වන්නේ, මනුෂ්‍යයා විසින් තමන්ගේ උත්සාහයෙන් සොයා දැන ගත නොහැකිවූ දේවල් උන්වහන්සේ මනුෂ්‍යයාට එළිදරව් කිරීමයි. මේ අනුව **" රහස "** යනුවෙන් සාමාන්‍යයෙන් දේව වචනයේ අදහස්වන්නේ -
**" දෙවියන්වහන්සේ මින් පෙර එළිදරව් නොකලාවූ සත්‍යයක් "** යන්නයි.

මෙය තව දුරටත් ඔබට පැහැදිලි කිරීම උදෙසා, දේව වචනයෙන් නිදසුන් දෙකක් ඔබ ඉදිරියේ තබමි.

(a) **රෝම 11 : 25 :-**

" **......... මේ අභිරහස නුඹලා නොදැන සිටිනවාට නොකැමැත්තෙමි, එනම් අන්‍යජාතීන්ගේ සම්පූර්ණත්වය පැමිණෙන තුරු ඉශ්‍රායෙල්වරුන්ට තරමක් දුරට දැඩිකමක් පැමිණ තිබෙන බවය.** "

(b) **1 කොරින්ති 15 : 51, 52 :-**

" **මෙන්න, නුඹලාට රහසක් කියමි. අප සියල්ලෝම නොසැතපෙන්නෙමුව, නුමුත් අන්තිම හොරණෑව පිඹින කල මොහොතකින්, ඇසි පිය හෙළන ක්ෂණයකින්, අප සියල්ලෝම වෙනස් කරනු ලබන්නෙමුව .......** "

ඉහත සඳහන් පද දෙක තුළින්, " **රහස** " යන්නෙහි අර්තය, ඔබට ඉතා පැහැදිලිව පෙනෙනවා ඇතැයි සිතමි.

**එපීස 3 : 3 සහ 4** වන පදවල, රහසක් ගැන සඳහන් වන අතර **5 වන පදය,** මේ රහස පිළිබඳව වැදගත් කරුණු තුනක් පෙන්වාදෙයි.

**එපීස 3 : 5 :-**

" **එය උන්වහන්සේගේ ශුද්ධ ප්‍රේරිතයන්ටත් ප්‍රොපේත - වරුන්ටත් ආත්මයාණන්වහන්සේ කරණකොටගෙන දැන් එළිදරව් කර තිබෙන ලෙස, වෙන පරම්පරාවලදී මනුෂ්‍ය පුත්‍රයන්ට දන්වනු නොලැබුවේය ; .......** "

(i) දෙවියන්වහන්සේ රහස් එළිදරව් කරන්නේ ශුද්ධාත්ම-යාණන්වහන්සේ කරණකොටගෙනයි.

(ii) උන්වහන්සේ ප්‍රේරිතයන්ට සහ ප්‍රොපේතවරුන්ට දැන් මෙහි සඳහන් රහස එළිදරව් කර තිබේ.

(iii) මීට පෙර පරම්පරාවල් මෙම රහස නොදැන සිටියහ.

දෙවියන්වහන්සේ එළිදරව් කරන්නාවූ " **රහස්** " පිළිබඳව තව දුරටත් තේරුම් ගැනීම උදෙසා, පහත සඳහන් පද දෙක ගැන විමසිල්ලෙන් බලන ලෙස, ඔබට යෝජනා කරමි.

(i) **ආමොස් 3 : 7 :-**

**" සැබවින් ස්වාමී වූ දෙවියන්වහන්සේ තමන්ගේ රහස තමන් මෙහෙකරුවන්වූ අනාගතවක්තෘවරුන්ට එළිදරව් නොකර කිසිවක් නොකරන සේක. "**

(ii) **උත්පත්ති 18 : 17 :-**

**" ස්වාමීන්වහන්සේ මා කරන්ට යන දේ ආබ්‍රහම්ගෙන් සඟවම්ද ? (කී සේක). "**

දෙවියන්වහන්සේ ශුභාරංචිය කරණකොටගෙන <u>ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ</u>, අන්‍යජාතීන්ටද දූන් ලබාදී ඇති ආශිර්වාද තුනක් එළිදරව්කරමින්, **එපීස 3 : 6** වන පදයේ, සභාව පිළිබඳව රහස් තුනක් පෙන්වාදෙයි. එනම් ක්‍රිස්තුස්වහන්සේ තුළ සභාව මෙන්ම අන්‍යජාතීන්ටද අයිතිවන බැවින්, ඔවුන් ලබා ඇති ආශිර්වාද පිළිබඳව නොහොත් <u>සභාව පිළිබඳව රහස් තුනකි</u>. ඒවා නම්,

(i) අන්‍යජාතීන් ( යුදෙව්වරුන් සමඟ ) <u>හවුල් උරුමක්කාරයෝය</u> - **(රෝම 8 : 17 කියවා බලන්න)**

(ii) අන්‍යජාතීන් ( යුදෙව්වරුන් සමඟ ) ශරීරයේ (ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයේ) <u>හවුල් අවයවයන් වෙති</u>- **(<u>1 කොරින්ති 12 : 12, 13, 18, 26 කියවා බලන්න</u>)**

(iii) <u>අන්‍යජාතීන්</u> (යුදෙව්වරුන් සමඟ) <u>පොරොන්දුවේ හවුල්කාරයෝ වෙති</u>.

## 2. <u>" සභාව " යන්නෙහි අදහස</u>

" සභාව " යනු ගොඩනැගිල්ලක් නොවන බව අප කවුරුත් හොඳහැටි දන්නා අතර, **එපීස 3 : 6** හි පාවුල්තුමා විසින් ප්‍රකාශකරනු ලබන්නාවූ එක රහසක් වන්නේ, " සභාව " යනු " ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරය " බවය.

මෙය වැඩිදුරට තේරුම් ගැනීම උදෙසා, මෙම රහස ගැන වෙන බයිබල් කොටස් වෙතද ඔබගේ අවධානය යොමුකිරීමට කැමැත්තෙමි.

**එපීස 4 : 13 :-**

" **....... ශුද්ධවන්තයන්ගේ සම්පූර්ණවීම සඳහා සේවය කිරීමේ වැඩය පිණිසත්, <u>ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයේ</u> වර්ධනය වීම පිණිසත්ය.** "

**එපීස 4 : 16 :-**

" **උන්වහන්සේගේ <u>මුළු ශරීරය එකට සන්ධිකරනු ලැබ සවිවී</u>, එක එක කොට්ඨාසයේ ප්‍රමාණයේ <u>ක්‍රියාකිරීමේ හැටියට</u> සහකාරවූ එක එක සන්ධිය කරණකොටගෙන <u>ප්‍රේමයෙන් වර්ධනය වන ලෙස ශරීරය වැඩෙන්නේය</u>.** "

**කොලොස්සි 1 : 18 :-**

" **<u>උන්වහන්සේ සභාව නමැති ශරීරයට හිසව</u> සිටින සේක ....** "

ඉහත සඳහන් පද තුළින්, සභාව ගැන අපට උගත හැකි දේවල් කිහිපයක් දෙස බලමු.

(i) දෙවියන්වහන්සේ සභාව තුළ ප්‍රේරිතයන්, අනාගත - වක්තෘවරුන්, ශුභාරංචිය ප්‍රකාශ කරන්නන්, සභා පාලකයන් සහ ගුරුවරුන් පත් කළේ, සභාව නමැති ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරය වර්ධනය වීම පිණිසය. **(එපීස 4 : 11 - 13)**

එබැවින් ඉහත සඳහන් පත්කිරීම් අපගෙන් සමහරෙක් ලබා ඇත්නම්, අප තව තවත් යටහත්කම පැළඳගනිමු. මෙම කැඳවීම අපට දී ඇත්තේ දෙවි සමිඳුන්ම බවත්, උන්වහන්සේ එසේ කළේ " **ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයේ** " **වර්ධනයවීමත් බව ඒත්තු ගනිමින්, මුළු හදවතින් <u>එසේ කිරීමට අපගේ ජීවිත කැපකරමු</u>.**

(ii) ශරීරයේ සෑම කොටසක්ම, තමාට අයිතිව ඇති කොටස නිසි ලෙස ඉටු කළ යුතුවේ.

ප්‍රේමණීය සහෝදරයා, සහෝදරී අප සෑම දෙන ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරය නමැති සභාවේ කොටස් ලෙස දෙවියන්වහන්සේම පත්කර ඇති අතර, **අපගේ ජීවිතයෙන් ඉටුවිය යුතු ඉතාමත්ම වැදගත් කර්තව්‍යය වන්නේ, දෙවියන්වහන්සේ අපට පවරා ඇති කාර්යය ඉටුකිරීමයි.**

එබැවින් මා ඉතා යටහත්වද, ඉතා ආදරයෙන්ද ඔබගෙන් ඉල්ලා සිටින්නේ **දෙවියන්වහන්සේ ඔබට පවරා ඇත්තාවූ සේවය** නොහොත් කොටස **අඳුනාගෙන, මුළු හදවතින් සහ යාච්ඥාවේ බලයෙන්** එම සේවයේ **යෙදෙන්න** කියාය. අනුන්ට උන්වහන්සේ පවරා ඇති සේවය ගැන නොකැළඹෙන්න, ඒ ගැන ඊර්ෂියා නොකරන්න, ඔවුන්ගේ සේවය විනිශ්චය නොකරන්න.

මෙහි ඇති වැදගත්කම නිසාම මම නැවත වරක් ඔබට ප්‍රකාශකරන්නේ, **ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයේ අනවශ්‍ය කොටස් නැති බවත්, එබැවින් ඔබගේ කොටස ඔබ ඉටුකිරීමේ අත්‍යවශ්‍යතාවයත්ය.**

මේ සම්බන්ධයෙන් **මතෙව් 25 : 14 - 30** දක්වා සඳහන් - වන්නාවූ '' තලෙන්ත උපමාව '' වෙතට ඔබගේ අවධානය යොමුකර, 'නිෂ්ප්‍රයෝජන දාසයා' මෙන් ක්‍රියා නොකරන ලෙස ඔබගෙන් ඉල්ලා සිටිමි.

(iii) සභාව නමැති ශරීරයේ වැඩීමට අවශ්‍ය වන්නාවූ තව කරුණක් වන්නේ, ශරීරයේ කොටස් **'' එක එක සන්ධිය කරණකොටගෙන ප්‍රේමයෙන් වර්ධනය වීමයි. ''**

මේ පිළිබඳව තමාට මෙන් තමාගේ අසල්වැසියාට ප්‍රේමකිරීම වඩාත්ම උතුම් ආඥා දෙකින් එකක් ලෙස යේසුස්වහන්සේ සඳහන් කළ බව අප සැම දනිමු. **(මතෙව් 22 : 38 - 40)**

(iv) සභාව නමැති ශරීරයට හිස වන්නේ යේසුස් ක්‍රිස්තුස් වහන්සේයි.

ප්‍රේමණීය දේව දරුව, ඕනෑම ශරීරයක් නිසි අයුරින් ක්‍රියාකිරීමට නම්, එම ශරීරයේ සෑම කොටසක්ම, හිස වෙතින් පැමිණෙන්නාවූ අණට කීකරුවීම අත්‍යවශ්‍ය වේ. මේ අනුව ඉතා පැහැදිළිව පෙනීයන්නේ **සැමදේදීම සභාවට අයිති සැමකෙනෙක්ම, යේසුස්වහන්සේටත්, දේව වචනයටත්, සැමවිටම කීකරු විය යුතු බවයි.** මෙසේ ජීවත්වීමට ඔබට අවශ්‍ය ප්‍රඥාව, දේව මඟපෙන්වීම, සහ ඇදහිල්ල ලබාදෙන ලෙස සමිඳුන්ගෙන් ඉල්ලා සිටින්න.

## 3. <u>සභාවේ සාමාජිකත්වය</u>

ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරය ලෙස සභාව හඳුන්වාදෙනු ලැබීම අප ඉහත සඳහන් පදවලින් දුටු අතර, මෙම සභාවේ සාමාජිකත්වයට ඇතුල්වන්නේ කෙසේද ? නැතහොත් කවුරුන්ද ? යන්න අප ඉදිරියේ තිබෙන්නාවූ අති වැදගත් ප්‍රශ්නයක් වේ.

**" ශුභාරංචිය කරණකොටගෙන, ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ " (එපීස 3 : 6)** අපට පෙනීයන්නේ, " ක්‍රිස්තුස් - වහන්සේගේ ශරීරයට " නොහොත් සභාවට ඇතුල්වීම සිදුවන්නේ, යමෙක් ශුභාරංචිය අසා, ඇදහිල්ලට පැමිණ එම ඇදහිල්ල තුළින්, ශුද්ධාත්මයාණන්වහන්සේ තුළට බව්තීස්ම කරනු ලැබීමෙන් බව යන්නයි.

**රෝම 10 : 17 :- " මෙසේ ඇසීමෙන් ඇදහිල්ලද, <u>ක්‍රිස්තුස් - වහන්සේගේ වචනයෙන් ඇසීමද</u> පැමිණෙන්නේය. "**

**1 කොරින්ති 12 : 13 :- " .... <u>අපි සියල්ලෝ එකම ආත්ම - යාණන්වහන්සේ තුළ එකම ශරීරයට බව්තීස්ම කරනු ලැබ</u>, සියල්ලෝ එකම ආත්මයාණන්වහන්සේගෙන් පොවනු ලැබීමුව. "**

ඉහත සඳහන් අන්දමට, සභාවේ සාමාජිකත්වය අපට ලබාදෙන්නේ, නොහොත් යේසුස්වහන්සේගේ ශරීරයට අපව බව්තීස්ම කරන්නේ නොහොත් ඇතුලත් කරන්නේ ශුද්ධාත්මයාණන්වහන්සේ බැවින්, සභාවේ සාමාජිකත්වයට ඇතුල්වීමට විකල්ප ක්‍රම නැති බව ඉතා පැහැදිළිය.

ප්‍රේමණීය සහෝදරයා, සහෝදරී, ඔබ ශුද්ධාත්මයාණන් - වහන්සේ විසින් ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයට බව්තීස්මය ලබා ඇති බව ඔබ සැබවින්ම දන්නවාද ? මෙය ගැන ඔබට කිසිම සැකයක් ඇත්නම්, හැකි ඉක්මනින්, ඔබගේ දේවගැතිතුමා හෝ සභා පාලකතුමා හෝ පූජකතුමා හමුවී මෙම ප්‍රශ්නය නිරාකරනය කර, දේව දරුකමට ඇතුල්වන්න.

## 4. <u>සභාවේ සේවකයෝ</u>

**එපීස 3 : 7 :- '' දෙවියන්වහන්සේගේ බලයේ ක්‍රියාකිරීමේ ප්‍රකාරයට ...... මම ඒ ශුභාරංචියේ සේවකයෙක් කරනු ලැබුවෙමි. ''**

ශුභාරංචියේ සේවකයෙක් ලෙස ඔහුව පත්කරනු ලැබූ බව, පාවුල්තුමා ප්‍රකාශ කරන අතර, ඔහුව එම සේවය උදෙසා පත්කළේ දෙවියන්වහන්සේ බව අප දනිමු.

දේව දරුව, මෙය පැහැදිලිව තේරුම්ගන්න. අපගේ පියවූ දෙවියන්වහන්සේ, උන්වහන්සේගේ දරුකමට අපව තෝරා, කැඳවා, පත්කර ඇත්තේ උන්වහන්සේගේ සේවය උදෙසාය.

මෙයින් අදහස්කරනු ලබන්නේ සෑම දේව දරුවෙක්ම පූර්ණකාලීන සේවයට දෙවියන්වහන්සේ කැඳවා ඇති බව නොවන අතර, උන්වහන්සේම උන්වහන්සේගේ කැමැත්ත සහ සැලැස්ම අනුව අප සැමදෙනාම සභාව නමැති ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයේ කොටසක් ලෙස පත්කර, යම්කිසි වගකීම් අප සැමදෙනාට භාරදී ඇති බවයි.

අප සැමදෙනා දෙවියන්වහන්සේගේ ' සේවකයින් ' වන අතර, එම සේවය, දෙවියන්වහන්සේගේ කැමැත්ත නොසොයා, අප කැමති අයුරින් තෝරාගතහොත්, සමහරවිට අප තෝරාගත් ' අපගේ සේවය ' අපේ ආත්මික ගමනටද, ' සභාවේ සේවයටද ' බාධාවක් විය හැක. මෙහි භයානකකම ඔබ තේරුම්ගැනීම පිණිස ආචාර්ය ඩී.ජී.එස්. දිනකරන්, තමා විසින් ලියන ලද " An Insight into Heaven " යන පොතෙන් උපුටා ගන්නා ලද සිද්ධියක් ඔබ ඉදිරියේ තබමි.

ඔහු එම පොතේ 86 සහ 87 වන පිටුවල සඳහන් ආකාරයට 1967 ජූලි මස 2 වන දින (පාවුල්තුමා මෙන්) දෙවියන් - වහන්සේ ඔහුව ස්වර්ගයට ගෙන ගොස්, පූර්ණකාලීන සේවයට කැඳවූ අතර, ඔහු විසින් එම කැඳවීම ප්‍රතික්ෂේප කරන ලදී.

එසේ කිරීමට හේතුව දෙවියන්වහන්සේ ඔහුගෙන් විමසූවිට ඔහුගේ පිළිතුර වූයේ, දෙවියන්වහන්සේට පූර්ණකාලීනව සේවය කරන්නාවූ දාසයින් බොහෝ ප්‍රශ්නවලට මැදිව සිටින නමුත්, එවකට ඔහු සේවය කරමින් සිටි බැංකුව, ඉතා හොඳින් ඔහුව බලාගන්නා නිසා, බැංකු රැකියාව කරමින් දෙවියන්වහන්සේගේ සේවයේ යෙදී සිටීම, වඩා ප්‍රඥාවන්ත බවයි.

දෙවියන්වහන්සේ මෙම අවස්ථාවේදී ඔහුට පිළිතුරු දුන්නේ ''මාගේ පුතා, මම ඔවුන්ව පූර්ණකාලීන සේවයට කැඳවා නොගත්තෙමි '' යනුවෙන් ප්‍රකාශකරමිනි.

ප්‍රේමණීය දේව දරුවෙනි, මෙම සිද්ධිය කියවන ඔබ, දෙවියන්වහන්සේට සේවය කරන අතර, සැමවිටම දේව කැඳවීම අනුව සේවයේ යෙදෙන්න. විශේෂයෙන්ම දෙවියන්වහන්සේම පූර්ණකාලීන සේවයට ඔබව කැඳවන බවට ඔබට ඉතා පැහැදිලි සහතිකයක් නැත්නම්, ඉවසීමෙන්ද, ඇදහිල්ලෙන්ද, විශ්වාසවන්තවද ඔබගේ සේවයේ යෙදෙමින්, දෙවියන්වහන්සේ ඔබට පැහැදිලි සහතිකයක් දෙන තෙක් පූර්ණකාලීන සේවයට නොපිවිසෙන්න.

## 5. <u>සභාවේ සාමාජිකයන්ගේ ගතිගුණ</u>

(i) යේසුස්වහන්සේට 100% යටත්වීම

**එපීස 3 : 1 :- ''..... ක්‍රිස්තුස්වහන්සේගේ හිරකාරයාවූ පාවුල් .....''**

පාවුල්තුමා විසින් මෙම ලිපිය එපීස සභාව වෙත ලියන ලද්දේ, ඔහු රෝමයේ ' හිරකාරයෙක් ' ලෙස සිටි කාළ - යේදීය. එනමුත් ඔහු මෙහි සඳහන් කරන්නේ ඔහු ' ක්‍රිස්තුස්වහන්සේගේ හිරකාරයෙක් ' බවය. මෙයින් අපට පෙනීයන්නේ, ඔහු තමාව සලකාගත්තේ සම්පූර්ණයෙන්ම තම ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේට යටත්වූ කෙනෙක් ලෙස බවය.

ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයට අයිති අප සැමද, ශරීරයේ හිස වන්නාවූ උන්වහන්සේට 100% යටත්වද, කීකරුවද ජීවත්වීමට උත්සාහ කරමු.

(ii) සභාවේ අන් අය සමඟ, එකට බැඳී, සහයෝගයෙන්, එක අරමුණක් ඇතිව ක්‍රියාකිරීම

**එපීස 3 : 6** වන පදයේ, තෙවරක්ම '' හවුල් '' යන වචනය අප දකින අතර, මෙම පදයේ විශේෂයෙන්ම සඳහන්කරනු ලබන්නේ යුදෙව්වරුන් සහ අන්‍යජාතීන් අතර යේසුස්වහන්සේ තුළ තිබෙන්නාවූ හවුල්කාරකමයි.

යෙරුසලමේ දේවමාළිගාව තුළ, දැවැන්ත බිත්තියකින් වෙන්කර සිටියාවූ යුදෙව්වරුන් සහ අන්‍යජාතීන්, මේ අන්දමට '' හවුල්කරුවන් '' බවට පත්ව සිටිනවා නම්, අප පදිංචි පළාතේ යම්කිසි දේවස්ථානයක නමස්කාර කරන්නාවූ ඇදහිලිවන්තයන් අතර කෙතරම් සහෝදර ප්‍රේමයක් සහ සහයෝගයක් තිබිය යුතුද කියා ඔබට පැහැදිළි ඇතැයි සිතමි. ඒ අන්දමින්ම එක පළාතක පිහිටා තිබෙන්නාවූ දේවස්ථාන අතර, කෙතරම් කිට්ටු සබැඳියාවක් තිබිය යුතුද යන්න **එපීස 3 : 6** වන පදය අපට පෙන්වාදෙයි.

අප සැමද තරාතිරම් නොබලා, සභාවේ අන් අය සමඟ ප්‍රේමයෙන් එකට බැඳී, දෙවියන්වහන්සේගේ නාමයේ ගෞරවය සහ මහිමය උදෙසා සහයෝගයෙන් සේවය කරමු.

(iii) යටහත්කම

**එපීස 3 : 8 :-**

**'' සියලු ශුද්ධවන්තයින්ගෙන් ඉතා කුඩා තැනැත්තා වූ මට ... ''**

දේව දරුවෙක්, තම ස්වාමීන්වහන්සේට ළංවෙන්ට ළංවෙන්ට හෙතෙම වැඩි වැඩියෙන් යටහත්කම පැළඳගනියි.

පාවුල්තුමාගේ මේ ගති ලක්ෂණය වර්ධනයවීම පෙන්වීමට දේව වචනයෙන් පද කිහිපයක් ඔබ ඉදිරියේ තබමි.

**1 කොරින්ති 15 : 9 :- (ක්‍රි. ව. 55)**
**" මක්නිසාද මම <u>ප්‍රේරිතයන්ගෙන් ඉතා කුඩා තැනැත්තාය</u> .... "**

**එපීස 3 : 8 :- (ක්‍රි. ව. 60)**
**" <u>සියලු ශුද්ධවන්තයින්ගෙන් ඉතා කුඩා තැනැත්තාවූ මට</u> .... "**

**1 තිමෝති 1 : 15 (ක්‍රි. ව. 63 - 65)**
**" .... ඔවුන් අතරෙන් <u>මම ප්‍රධාන පව්කාරයාය</u>. "**

මේ පද තුනෙන් අප දකින්නේ, පාවුල්තුමා ආත්මිකව වැඩෙන්ට වැඩෙන්ට, ඔහු යටහත්කම වැඩි වැඩියෙන් පැළඳගත් බවයි.

අපද, පාවුල්තුමාගේ, මේ ආදර්ශය අනුගමනය කරමින්, යටහත්කම පැළඳගනිමු.

(iv) ශුභාරංචිය ප්‍රකාශ කිරීම

**එපීස 3 : 7 :- " මම ඒ ශුභාරංචියේ සේවකයෙක් කරනු ලැබුවෙමි. "**

(v) නිර්භීතකම

**එපීස 3 : 12 :- " ක්‍රිස්තුස්වහන්සේ තුළ අපේ ඇදහිල්ල කරණකොටගෙන නිර්භීතකමත් ..... "**

මෙම නිර්භීතකමේ නිදසුන් වශයෙන්, පාපයට විරුද්ධව නැගීසිටිමේ නිර්භීතකම, විරෝධතාවයන් ඉදිරියේ නිවැරදි දේ කිරීමේ නිර්භීතකම, රෝග සහ ප්‍රශ්න ඉදිරියේ නිර්භීතකම ඔබ ඉදිරියේ තැබීමට කැමැත්තෙමි.

## 6. <u>සභාවේ කැඳවීම - එපීස 3 : 8 - 11</u>

(i) **එපීස 3 : 8 :-** ක්‍රිස්තුස්වහන්සේගේ සොයා දැනගත නොහැකි සම්පත ගැන නොඇදහිලිවතුන්ට දේශනාකිරීම

ප්‍රේමණීය දේව දරුව, මෙම කැඳවීම අප සැමට ස්වාමීන්වහන්සේ දී ඇති අතර, මෙය "ශුභාරංචිය ප්‍රකාශකිරීමෙන් " ඔබ්බට යන බව තේරුම් ගන්න.

**එපීස 1 : 18 :- " .... ශුද්ධවන්තයන් තුළවූ උන්වහන්සේගේ උරුමයේ මහිමයේ සම්පත කිමෙක්ද කියාත් ..... "**

**එපීස 1 : 4 :-**

**" …….. සියලු ආත්මික ආශිර්වාදවලින් උන්වහන්සේ අපට ආශිර්වාද කළ සේක. "**

සැබවින්ම උන්වහන්සේ අපට මෙහි පවරන්නේ ශුභාරංචිය ප්‍රකාශකරන අතර, දේව දරුවන්ගේ උරුමයේ මහිමයේ සම්පත, සහ අපට හිමි 'ආත්මික ආශිර්වාද' ගැනද නොඇදහිලිවතුන්ට ප්‍රකාශ කිරීමයි.

මෙම දේ අත් නොදැක, ඒවා ගැන අවංකව ප්‍රකාශ කිරීම ඉතා අපහසුවේ. එබැවින් දේව දරුව නැගිටින්න !!! ඔබගේ **" සිත් නමැති ආත්මික ඇස් පහදන ලෙස " (එපීස 1 : 19)** සමිඳුන්ට යදින්න. සියලු ආත්මික ආශිර්වාද ඔබට හිමි බව තේරුම් ගනිමින් ඇදහිල්ලෙන් ''ක්‍රිස්තුස්වහන්සේ තුළ'' ඒවා භුක්තිවිඳින්න !!!

එවිට මහත් බලයෙන් යුක්තව, ඉහත සඳහන් කැඳවීම ඉටුකිරීමට ශක්තිය, දෙවි සමිඳුන්ම ඔබට දෙනවා ඇත.

(ii) **එපීස 3 : 9 :-** සැඟවී තිබුනාවූ රහසේ නියමය සියල්ලන්ට පෙන්වීම.

මෙහි සඳහන්වන්නාවූ '' රහස '' කිමෙක්ද කියා අපි **එපීස 3 : 6** වන පදයේ දුටිමු. මෙම පදයේ එම රහස එළිදරව් කර ඇති අතර, එම රහසට කොටස් තුනක් ඇති බවද, ඒ තුනේහිම '' හවුල් '' යන වචනය සඳහන් බවද පැහැදිළිය.

එසේනම් එම රහසේ නියමය සභාව විසින් '' සියල්ලන්ට පෙන්වීම '' නොහොත් සභාවේ ඒකත්වය සහ ශරීරයක අවයව මෙන් එකට ක්‍රියාකිරීම '' සැමදෙනා දැකීම '' දෙවියන්වහන්සේ සභාවට දී ඇති දෙවැනි කැඳවීමයි.

අද දවසේ මෙසේ එකට සහයෝගයෙන් ක්‍රියාකිරීම සභාව තුළ ලෝකයා විසින් සමහර අවස්ථාවන්හිදී නොදැකීම, කිතුනු සභාවේ වර්ධනයට බාධාවක්ව තිබේ.

(iii) **එපීස 3 : 11 :-** ස්වර්ගීය ස්ථානවල සිටින්නවුන්ට සභාව තුළින්, දෙවියන්වහන්සේගේ ප්‍රඥාව පෙනීයාම.

ස්වර්ගීය ස්ථානවල වැඩවසන්නාවූ, ආත්ම ලෝකයේ වෙසෙන්නාවූ මැවිල්ල පිළිබඳව අපට ඇති දැනුම සීමිත වන බැවින්, මෙම කැඳවීම සම්පූර්ණයෙන් තේරුම් ගැනීම පහසු නොවේ.

මෙනමුත්, දේව වචනයේ ඉතා පැහැදිලිව ප්‍රකාශ - කරන්නාවූ කරුණක් තුළින් මෙම කැඳවීම දෙස අපට බැලීමට පුළුවන.

**1 පේත්‍රුස් 1 : 12 :-**

" **...... ස්වර්ගයෙන් එවනලද ශුද්ධාත්මයාණන්වහන්සේ කරණකොටගෙන ශුභාරංචිය නුඹලාට ප්‍රකාශකළ තැනැත්තන් ලවා දැන් ඒවා දන්වන ලද්දේය, <u>ඒ දේවල් බලා දැනගන්ට දේව දූතයෝ ආශාවෙති</u>.** "

මෙම පදයෙන් පැහැදිළි වන්නේ, දෙවියන්වහන්සේ ශුද්ධාත්මයාණන්වහන්සේ තුළින් අපට එළිදරව් කර ඇති (සමහර) රහස් දේව දූතයන් නොදන්නා බවයි.

මේ අනුව අපට නිගමනය කළ හැක්කේ, **එපීස 3 : 6** වන පදයේ එළිදරව් කර ඇති රහස, එනම් ක්‍රිස්තුස් - වහන්සේ තුළ යුදෙව්වරුන් සහ අන්‍යජාතීන් එකට එක්කරනු ලැබ, සභාව එකට සහයෝගයෙන් ක්‍රියාකිරීම නිරීක්ෂණය කරන්නාවූ ආත්ම ලෝකය සභාව තුළින් දෙවියන්වහන්සේගේ අනේකවිධ ප්‍රඥාව දැනගන්ට යන බවයි.

මේ සම්බන්ධයෙන් අප අපගෙන්ම අසා ගත යුතු ප්‍රශ්නය වන්නේ, අප සභාව තුළ ඇත්තාවූ සහෝදර ප්‍රේමය සහ සහයෝගය ප්‍රමාණවත්ද ? යන්නයි.

## 7. සභාවේ බලය

**එපීස 3 : 7 :- " දෙවියන්වහන්සේගේ බලයේ ක්‍රියාකිරීමේ හැටියට .... "**

දේව දරුව, සභාව පිටුපස තිබෙන්නේ දේව බලයයි. සමහරවිට ඔබ ඉතා දුර්වල බවත්, සභාවද එසේම බවත්, එබැවින් ශුභාරංචිය ප්‍රකාශකිරීමෙන් මහත් ප්‍රතිඵල බලාපොරොත්තු විය නොහැකි බවත් ඔබ සිතන්ට පුළුවන. නමුත් සත්‍යය මෙය නොවේ. සභාව ගැන මෙයට අදාල සත්‍යයන් මේවාය.

| | |
|---|---|
| **(කොලොස්සි 1 : 18)** | සභාවේ හිස ස්වාමීවූ යේසුස් - වහන්සේ වන සේක. |
| **(මතෙව් 16 : 18)** | සභාව ගොඩනගන්නේ උන්වහන්සේම වන සේක. |
| **(මතෙව් 16 : 18)** | පාතාලයේ දොරටු සභාව පරාජය නොකරන්නේය. |
| **(1 යොහන් 4 : 4)** | සභාව තුළ සිටින ශුද්ධාත්ම - යාණන්වහන්සේ, යක්ෂයාට වඩා බලවත්වේ. |

මේ අනුව අප දකින්නේ යේසුස්වහන්සේ, දෙවියන් - වහන්සේගේ බලයෙන් ක්‍රියාකරමින් සභාව ගොඩනගමින් සිටින බවය.

අපගේ වගකීම වන්නේ ඇදහිල්ලෙන්ද, විශ්වාසවන්තවද අපගේ කොටස ඉටුකිරීමයි.

**එසේ කිරීමට**

**දෙවි පියාණන්වහන්සේ,**

**ඔබට ශක්තිය හා**

**බලය දෙන සේක්වා !!!**

## සටහන

# පාවුල්ගේ දෙවැනි යාච්ඤාව



# එපීස අධ්‍යයනය 06

# පාවුල්ගේ දෙවැනි යාච්ඤාව

**එපීස 3 : 14 - 21**

**හැඳින්වීම :-**

**එපීස** පොතේ පළමුවැනි පරිච්ඡේදය සහ තුන්වෙනි පරිච්ඡේදය අතර එක්තරා සමානත්වයක් අපට දක්නට ලැබේ. එනම්, මෙම පරිච්ඡේද දෙකේම මුල් කොටසේ, දෙවියන්වහන්සේ එළිදරව් කර ඇත්තාවූ 'රහස් ' පිළිබඳව සඳහන්වීම සහ අග කොටසේ, පාවුල්තුමා කළාවූ යාච්ඤාවක් සඳහන්වීම වේ.

මේ අන්දමින් පාවුල්තුමා යාච්ඤාකිරීමට පෙළඹෙන්නේ, දෙවියන්වහන්සේ දේව දරුවන්ට ලබාදී ඇත්තාවූ ආත්මික ආශිර්වාද මෙන්ම, උන්වහන්සේ සභාවට දී ඇත්තාවූ අතිවිශිෂ්ඨ කැඳවීම, අප සැම දෙනා තේරුම්ගැනීමේ වැදගත්කම නිසාය.

මෙම අධ්‍යයනයේදී අප ''යාච්ඤාව'' ගැන කරුණු කිහිපයක් දෙසද, **එපීස 3 : 16-19** දක්වා පාවුල්තුමා අප උදෙසා කරන්නාවූ '' යාච්ඤා ඉල්ලීම් '' දෙසද ඔබගේ අවධානය යොමු කරන්නේ, මෙසේ කිරීම තුලින් ඔබගේ යාච්ඤා ජීවිතය ශක්තිමත් වේය යන බලාපොරොත්තු - වෙනි.

**අධ්‍යයනය :-**

1. **පාවුල්තුමාගේ දෙවැනි යාච්ඤාව - එපීස 3 : 14 - 21**

මෙම යාච්ඤාව ඇරඹෙන්නේ **'' මේ නිසා ''** යන වචන - වලින් වන බැවින්, අප ඉදිරියෙහි ඇත්තාවූ පලමුවැනි ප්‍රශ්නය වන්නේ, **'' කුමක් නිසාද ? ''** යන ප්‍රශ්නයයි. මෙම ප්‍රශ්නයට පිළිතුර වන්නේ, **එපීස 3 : 6** හි දෙවියන් - වහන්සේ සභාව පිළිබඳව එළිදරව් කර ඇත්තාවූ තුන් ආකාර '' රහස '' සහ **එපීස 3 : 8-11** දක්වා සඳහන්කර ඇත්තාවූ සභාවේ තුන් ආකාර '' කැඳවීම '' සභාව විසින් ඉටුකිරීමේ වැදගත්කම **'' සභාව තේරුම් ගැනීම උදෙසා ''** යන්නයි.

## පාවුල්ගේ යාච්ඤාව ඇසුරෙන්, යාච්ඤාව ගැන අපට ඉගෙන ගත හැකි දේ

(i) **දෙවියන්වහන්සේ, උන්වහන්සේගේ අභිප්‍රායක් (කැමැත්තක්) අපට එළිදරව් කල විට, එය ඉටුකිරීම උදෙසා උන්වහන්සේට <u>යාච්ඤාකිරීමේ වගකීම අපට පැවරෙයි</u>**

පාවුල්තුමාට දෙවියන්වහන්සේ තමන්වහන්සේගේ ''රහස්'' නොහොත් ''අභිප්‍රාය'' නොහොත් ''කැමැත්ත'', එපීස පළමුවැනි සහ තෙවැනි පරිච්ඡේදවල එළිදරව් කිරීම සඳහන් කර ඇති අතර, පාවුල්තුමාගේ ප්‍රතිචාරය වූයේ ඒවා ඉටුකිරීම උදෙසා දේව දරුවන්ට අවශ්‍ය ශක්තිය, බලය සහ මඟපෙන්වීම ඉල්ලා දෙවියන්වහන්සේට යැදීමයි.

අප විසින්ද මෙම ආදර්ශය අනුගමනය කළ යුතුව ඇති අතර, මෙය වැඩිදුරට තේරුම් ගැනීම උදෙසා නිදසුන් දෙකක් ඔබ ඉදිරියේ තබමි.

<u>1 වැනි නිදසුන</u> :-

**2 පේත්‍රුස් 3 : 9** හි දෙවියන්වහන්සේ එළිදරව් කරන්නාවූ රහස වන්නේ, **'' සියල්ලන්ම පසුතැවිලි වනවාට මිස කිසිවෙක් විනාශවෙනවාට උන්වහන්සේ නොකැමති ''** බවයි.

දෙවියන්වහන්සේගේ කැමැත්ත **' සියල්ලන්ම පසුතැවිලිවීම '** බව මෙම බයිබල් පදය අනුව, දන්නාවූද, **' ඔබවහන්සේගේ කැමැත්ත වේවා '** කියමින් ස්වාමීන්වහන්සේගේ යාච්ඤාව නිතර ඔප්පුකරන්නාවූ අපගේ ප්‍රතිචාරය විය යුත්තේ කුමක්ද ?

නිසැකවම උන්වහන්සේගේ කැමැත්ත ඉටුවීම පිණිස අප සැමදෙනා, දේව දරුකමට ඇතුල්වී නොමැති අපගේ ඥාතීන්, හිතවතුන්, මිතුරු - මිතුරියන් සහ සතුරන් සහ වෙනත් අයගේ 'ගැළවීම' නැතහොත් 'පසුතැවිල්ලට පැමිණීම ' ගැන යාච්ඤා කළ යුතු බව වටහාගෙන ඒ අනුව ක්‍රියා කළ යුතුවේ.

2 වැනි නිදසුන :-

**එපීස 2 : 22** හි දෙවියන්වහන්සේ එළිදරව් කරන්නේ -

" **ඇදහිලිවන්තයින්, ආත්මයාණන්වහන්සේ කරණකොටගෙන දෙවියන්වහන්සේගේ වාසය පිණිස එකට ගොඩනගන්නාවූ ශුද්ධ වූ මාළිගාවක් බවයි.** "

එබැවින් මෙම සත්‍යය දන්වනු ලබන අප විසින් කළ යුත්තේ, සභාව තුළ ශුද්ධකමද එක්සත්කමද ඇති කරන ලෙස දෙවියන්වහන්සේට යැදීමයි.

දේව දරුව, පාවුල්තුමා මෙන්, අප සැමද විනාශවන්නාවූ මනුෂ්‍යයන්ගේ ගැළවීම උදෙසා දිනපතාම මුළු හදවතින් දෙවියන්වහන්සේට යදිමු.

(ii) **දෙවියන්වහන්සේගේ කැමැත්ත අනුව අප උන්වහන්සේට කරන්නාවූ යැදුම්වලට සවන්දෙන්ටද, පිළිතුරු සපයන්නටද දෙවියන්වහන්සේ පොරොන්දු වී ඇතිසේක.**
**- 1 යොහන් 5 : 14, 15**

**1 යොහන් 5:14,15** ඇති පොරොන්දුව අනුව අප දකින්නේ, දේව කැමැත්ත අනුව අප යාච්ඤා ඉල්ලීම් කරන අතර දෙවියන්වහන්සේ අප ඉල්ලන දේ අපට ලබා දෙන බවයි.

එමනිසා **2 පේතෘස් 3 : 9** හි සඳහන් දෙවියන්වහන්සේ එළිදරව් කර ඇති උන්වහන්සේගේ කැමැත්ත අනුව, අප අඳුනන්නාවූ ගැළවීමට පැමිණ නොමැති අය ගැන ඇදහිල්ලෙන් යාච්ඤා කරමු.

උන්වහන්සේ නිසැකවම, උන්වහන්සේගේ කාළයේදී, ඔබගේ ඉල්ලීම ඉටුකරනවා ඇත.

(iii) **දෙවියන්වහන්සේගේ කැමැත්ත දැනගැනීම පිණිස, දේව වචනය කියවීම, අපගේ යාච්ඤා ජීවිතයට ඉතා වැදගත්වේ.**

දෙවියන්වහන්සේ අපට විවිධ අන්දම්වලින් කතාකරන අතර, වඩාත්ම බහුලව උන්වහන්සේ අපට කතාකරන්නේ, දේව වචනයෙනි. එමනිසා අප සැමදෙනා, උන්වහන්සේ - ගේ හඬ අසන පිණිසද, උන්වහන්සේ අපට පෙන්වන්නාවූ නොහොත් එළිදරව් කරන්නාවූ සත්‍යයන් දැනගැනීම පිණිසද, දේව වචනය දිනපතා කියවීම අතිශයින් වැදගත්වේ.

මෙසේ උන්වහන්සේගේ කැමැත්ත අඳුනාගෙන ඒ අනුව යාච්ඤාකිරීම තුලින් සිදුවන්නේ, යාච්ඤාවලට පිළිතුරු ලැබීම අපගේ සාමාන්‍ය අත්දැකීමක් වීමයි.

මෙම හේතුවෙන් අපගේ ඇදහිල්ලද, සාක්ෂියද, කිතුනු ගමනද වැඩි වැඩියෙන් ඉතා සීඝ්‍රයෙන් වර්ධනය වී ශක්තිමත් වනවා ඇත.

දේව දරුව, සර්වපරාක්‍රමවූ, සර්වබලධාරී දෙවියන් - වහන්සේ යාච්ඤාව මගින් ඔබට ලබාදී ඇති, පුදුමාකාර බලය වටහාගන්න.

- මිල කළ නොහැකි ආත්ම බේරා ගැනීමට ඔබට හැකියාව ඇත.
- කැඩී බිඳී ඇති පවුල් ගලවාගැනීමට ඔබට හැකියාව ඇත.
- පාපයෙන් විනාශවන්නාවූ අප රටෙහි, පාපයට විරුද්ධව ධනාත්මක බලපෑමක් ඇති කිරීමට ඔබට හැකියාව ඇත.

අප විසින් කළ යුතුව ඇත්තේ මුලු හදවතින්, මෙවැනි දේ ගැන දෙවියන්වහන්සේට කන්නලව් කිරීම පමණකි. උන්වහන්සේ දේව වචනයේ අපට ලබාදී ඇති පොරොන්දු ඉටුකරන බව අදහමින්, උන්වහන්සේ අපට දී ඇත්තාවූ යාච්ඤා කිරීමට ආරාධනාව අදම පිළිගනිමු. දේව වචනය නමැති කඩුව අතැතිව යාච්ඤාව භාවිත කරමු !! **(එපීස 6 : 17, 18)**

❖ පාවුල්තුමාගේ යාච්ඤාවෙහිදී ඔහු පෙන්නුම් කරන්නාවූ අධික උද්යෝගය **එපීස 3 : 15** හි අප දකිමු.

**එපීස 3 : 15 :-**

**" ..... පියාණන්වහන්සේට මම මාගේ දණ නමා ..... "**

පාවුල්තුමා යුදෙව්වෙක් වූ අතර, යුදෙව්වරු යාච්ඤා කිරීමට පුරුදුව සිටියේ සිට ගෙනයි.

**( ලූක් 18 : 11 :-**

**" ඵරිසියා සිටගෙන තමා තුළ යාච්ඤාකරමින්......." )**

මේ අතර, **මතෙව් 26 : 39** හි සඳහන් වන්නේ යේසුස් - වහන්සේ ගෙත්සෙමන උයනේ යාච්ඤා කළේ මුහුණින් වැටී බවයි. **ලූක් 22 : 41** හි සඳහන් වන්නේ යේසුස් - වහන්සේ දණින් හිඳ ගෙත්සෙමනෙහි යාච්ඤා කළ බවයි.

මේ අනුව අපට පැහැදිළිව පෙනීයන්නේ යුදෙව්වෙක් දණින් වැටී හෝ මුහුණින් වැටී යාච්ඤා කිරීමට පෙළඹෙන්නේ හදවතෙන් නැගී එන්නාවූ බලවත් පිපාසය සහ උද්යෝගය නිසා බවයි.

ප්‍රේමණීය සහෝදරයා, සහෝදරී, පාවුල්තුමා කිතුනුවන් උදෙසා, එදා දණින් වැටී දෙවියන්වහන්සේට කන්නලව් කළ ලෙසම, අප සැමද විනාශවන්නාවූ ජනයා උදෙසා හඬමින් දෙවියන්වහන්සේට කන්නලව් කරමු.

ඔබ මෙසේ කරන අතර අපගේ දෙව්පියාණන්වහන්සේ ඔබගේ යාච්ඤාවලට පිළිතුරු දී, ඔබගේ ජීවිතයටද අතිශයින් ආශිර්වාද කරනවා ඇත.

## 2. පාවුල් දේව දරුවන් උදෙසා දෙවියන්වහන්සේගෙන් කළාවූ ඉල්ලීම් පහ - එපීස 3 : 16 - 19

(i) **එපීස 3 : 16 :- " උන්වහන්සේගේ ආත්මයාණන්වහන්සේ කරණකොටගෙන නුඹලාගේ අභ්‍යන්තර මනුෂ්‍යයා තුළ නුඹලා බලයෙන් ශක්තිමත් වන පිණිසත්, "**

පාවුල්තුමාගේ පළමුවැනි ඉල්ලීම වන්නේ -
**"දේව දරුවන්ගේ අභ්‍යන්තර මනුෂ්‍යයා ශුද්ධාත්ම බලයෙන් ශක්තිමත් වීමයි."**

සමහරවිට යමෙකුට මෙය ගැන ප්‍රශ්නයක් ඇති විය හැකිවේ. එය නම්, අප දේව දරුකමට ඇතුල්වන්නේ නැතහොත් ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයට බව්තීස්ම කරනු ලබන්නේ ශුද්ධාත්මයාණන්වහන්සේ විසින් වන හෙයින් උන්වහන්සේ අප සැම තුළ වාසය කරන සේක. අප තුළ උන්වහන්සේ මෙසේ දනුත් වැඩවසන බැවින් උන්වහන්සේ කරණකොටගෙන අභ්‍යන්තර මනුෂ්‍යයා තව දුරටත් ශක්තිමත් වන්නේ කෙසේද ? යන්නයි. එබැවින් 'අභ්‍යන්තර මනුෂ්‍යයාගේ ශක්තිමත්වීම' පිළිබඳව ඔබට කරුණු දෙකක් ඉදිරිපත් කරමි.

(a) ශුද්ධාත්මයාණන්වහන්සේ අප තුළ වැඩවසන බව සත්‍යයක් වන නමුත්, උන්වහන්සේගේ බලයෙන් අප ශක්තිමත් වන්නේ, උන්වහන්සේගේ පාලනයට අපගේ ජීවිත යටත්කරන ප්‍රමාණය අනුවයි.

❖ නිදසුනක් වශයෙන් අපගේ ජීවිතය කාමර රාශියක් ඇත්තාවූ නිවසකට සමාන කරමු. මෙම සැම කාමරයකම ඇති දොරවල් වල යතුරුද, එම කාමර වල ඇති අල්මාරි සහ සේප්පු යනාදියේද යතුරු ඇත්තේ අප සතුවය.

ශුද්ධාත්මයාණන්වහන්සේගේ බලයෙන් අප ශක්තිමත් වන ප්‍රමාණය රඳා පවතින්නේ, මෙම යතුරු වලින්, කුමන ප්‍රමාණයක් උන්වහන්සේගේ පාලනයට හෝ අයිතියට අප බාර දෙනවාද ? යන ප්‍රශ්නයට අප දෙන පිළිතුර අනුවය. දේව දරුව, සැම යතුරක්ම දෙවියන් - වහන්සේට භාරදෙන්න.

(b) ශුද්ධාත්මයාණන්වහන්සේගේ බලයෙන් අප ශක්තිමත් වීම උදෙසා වැදගත් වන්නාවූ තව දෙයක් වන්නේ, අප යක්ෂයාට විරුද්ධව නැගී සිටීමයි. මෙසේ නැගී සිට යක්ෂයා අප වෙත ගෙනෙන පරීක්ෂා අප විසින් පරාජය කරනු ලැබීමයි. (මේ පිළිබඳව **ලූක් 4 : 1, 13, 14** කියවා බලන්න).

**ශුද්ධාත්මයාණන්වහන්සේගෙන් පූර්ණවූ** යේසුස් - වහන්සේ, වනාන්තරයෙහි යක්ෂයා විසින් පරීක්ෂා කරනු ලැබූසේක. උන්වහන්සේ පරීක්ෂාවලින් ජයගෙන ගලීලයට හැරී ආවේ **ශුද්ධාත්මයාණන්වහන්සේගේ බලයෙන්** යුක්තවය. **(ලූක් 4 : 14)**

(ii) **එපීස 3 : 17 :- '' ඇදහිල්ල කරණකොටගෙන ක්‍රිස්තුස් - වහන්සේ නුඹලාගේ සිත් තුළ වාසය කරන පිණිසත්, ''**

දේව දරුවන් උදෙසා පාවුල්තුමා කරන්නාවූ දෙවැනි ඉල්ලීම වන්නේ -

**'' ක්‍රිස්තුස්වහන්සේ ඔවුන්ගේ සිත් තුළ වාසය කිරීමයි. ''**

'' ක්‍රිස්තුස්වහන්සේ අපගේ සිත් තුළ වාසය කිරීම '' තුලින් අපගේ ජීවිතවල ඇති වෙන්නාවූ ප්‍රතිඵල පහදාදීම උදෙසා **පිලිප්පි 2 : 5 - 9** දක්වා ඔබගේ අවධානය යොමු -කරමි. උන්වහන්සේ අපගේ සිත් තුළ වසන විට, අප වැඩි වැඩියෙන් යේසුස්වහන්සේ මෙන් වෙන්නෙමු. අප තුළ ඇතිවන්නාවූ මෙම පරිවර්ථනය පියවර පහක් ලෙස ඔබට පෙන්වාදීමට කැමැත්තෙමි.

(1) අප ක්‍රිස්තුස්වහන්සේට අපගේ සිත් භාර කිරීම - **එපීස 3 : 17**

(2) අපගේ සිත් ක්‍රිස්තුස්වහන්සේගේ සිත ලෙස වෙනස්වීම - **පිලිප්පි 2 : 5**

(3) යේසුස්වහන්සේගේ යටහත්කම /දාසයෙකුගේ ස්වරූපය අප පැළඳගැනීම - **පිලිප්පි 2 : 7**

(4) යේසුස්වහන්සේ දෙවියන්වහන්සේට කීකරු වූ ආකාරයට අපද 100% දෙවියන්වහන්සේට කීකරුවීම - **පිලිප්පි 2 : 8**

(5) දෙවියන්වහන්සේ යේසුස්වහන්සේව උසස් කළාක් මෙන්, උන්වහන්සේ අපවද උසස් කිරීම - **පිලිප්පි 2 : 9**

ප්‍රේමණීය සහෝදරයා, සහෝදරී, අප සැම දෙන ක්‍රිස්තුස්වහන්සේ තුළ, සියලු ආත්මික ආශිර්වාද වලට හිමිකම් ඇත්තාවූ දේව දරුවන් වමු. මෙම සියලුම ආශිර්වාදවලින් ඉතාමත්ම අනර්ඝ වූ ආශිර්වාදයක් වන්නේ, අප යේසුස්වහන්සේ මෙන් වීමයි. **මෙසේ අප වෙනස්වීමේ ප්‍රථම පියවර ලෙස අප දැන්ම, අපගේ සිත් යේසුස්වහන්සේට 100% භාරකරමු.**
**(රෝම 8 : 29, 1 යොහන් 3 : 2).**

(iii) **එපීස 3:17 :- " නුඹලා ප්‍රේමයෙහි මුල් ඇද පිහිටා සිට "**
- (Rooted & Grounded in Love)

ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයේ නොහොත් දෙවියන් - වහන්සේගේ පවුලේ අතිවිශිෂ්ඨ ලක්ෂණයක් වන්නේ ප්‍රේමයයි. එබැවින් අප මුලින්ම මේ ප්‍රේමය පිළිබඳව පද කිහිපයක් දෙස බලමු.

**1 යොහන් 4 : 7, 8 :- " ප්‍රේමවන්තයෙනි, අපි එකිනෙකාට ප්‍රේම කරමු. මක්නිසාද ප්‍රේමය දෙවියන්වහන්සේගෙන්ය ...... ප්‍රේම නොකරන්නා දෙවියන්වහන්සේව නාඳුනයි, මක්නිසාද දෙවියන්වහන්සේ ප්‍රේමයය. "**

**1 යොහන් 4 : 12 :- " ..... අපි එකිනෙකාට ප්‍රේමකරමු නම්, දෙවියන්වහන්සේ අප තුළ සිටිනසේක, උන්වහන්සේගේ ප්‍රේමයද අප තුළ සම්පූර්ණ වී තිබේ. "**

**1 යොහන් 4 : 16 :- "..... දෙවියන්වහන්සේ ප්‍රේමයය, ප්‍රේමයෙහි පවතින්නා දෙවියන්වහන්සේ තුළ සිටී, දෙවියන්-වහන්සේද ඔහු තුළ සිටිනසේක. "**

පාවුල්තුමාගේ තෙවැනි ඉල්ලීම වන්නේ -
කිතුනු අප **" ප්‍රේමයේ මුල් ඇද පිහිටා සිටීමයි ".** මෙහිදී කිතුනු ජීවිතය ගසකටද, එය පිහිටා තිබෙන්නාවූද, එහි මුල් සාරය ඇදගන්නාවූද භූමිය ප්‍රේමයටද සමාන කරනු ලබයි. පාවුල්තුමා මෙසේ අප ඉදිරියේ තබන්නාවූ උපමාවෙන්, කිතුනු ජීවිතයේ ප්‍රේමයට ඇත්තාවූ වැදගත්කම සක්සුදක් සේ ඔබට පැහැදිලි වනවා ඇත.

කිතුනු ජීවිතයක් තුළින් දෙවියන්වහන්සේගේ ප්‍රේමය ප්‍රකාශවන්නේ නොමැතිනම්, **" දෙවියන්වහන්සේ අප තුළද, අප දෙවියන්වහන්සේ තුළද සිටීම "** (**1 යොහන් 4:16**) එම ජීවිතයේ තිබෙනවාද යන්න ප්‍රශ්නයකි.

දේව දරුව, **1 යොහන් 4:7,8,12,16** යන පද යාච්ඤා - වෙන් කියවා, මෙනෙහි කර, මෙම ප්‍රශ්නය ඔබගෙන්ම අසාගන්න.

❖ **මා සැබැවින්ම දෙවියන්වහන්සේ තුළ (ක්‍රිස්තුස්වහන්සේ තුළ) වැඩවසනවාද ?**

(iv) **එපීස 3 : 18 :- " දෙවියන්වහන්සේගේ මුළු පූර්ණ - කමට පූර්ණවන පිණිස, "**

පාවුල්තුමා, දෙවියන්වහන්සේ වෙත ඉදිරිපත් කරන්නාවූ සතරවැනි ඉල්ලීම වන්නේ -
**" දෙවියන්වහන්සේ සම්පූර්ණව සිටින්නාක්සේම, අපවද සම්පූර්ණකමට ගෙන ඊමයි. "**

**මතෙව් 5 : 48 :- " එබැවින් නුඹලාගේ ස්වර්ගීය පියාණ - න්වහන්සේ සම්පූර්ණව සිටින්නාක්මෙන් නුඹලාත් සම්පූර්ණව සිටපල්ලා. "**

යේසුස්වහන්සේ **මතෙව් 5 : 48** හි ප්‍රකාශකරන වචන අප සැවොම හොඳ හැටි දන්නා අතර, අපට බොහෝවිට අමතකවන්නේ මෙම සම්පූර්ණත්වය පෙන්වාදීම උදෙසා, **මතෙව් 5 : 44** හි උන්වහන්සේ ප්‍රකාශකළ වචනයි.

**මතෙව් 5 : 44 :- " නුමුත් මම නුඹලාට කියමි : නුඹලාගේ සතුරන්ට ප්‍රේමකරපල්ලා, නුඹලාට පීඩාකරන්නන් උදෙසා යාච්ඤා කරපල්ලා ; "**

මේ අන්දමින් ඔබ සමහර අවස්ථාවල ක්‍රියාකරන බව නොඅනුමානය. මෙනමුත් මෙහි හඳුන්වාදෙන 'සම්පූර්ණත්වයෙන් ' ක්‍රියාකිරීම වන්නේ **සෑම අවස්ථා - වකදීම සෑම සතුරෙකුට ප්‍රේමකිරීමේ** සම්පූර්ණත්වය වේ.

මේ අන්දමින් සැමවිටම ක්‍රියාකිරීමට අපට නොහැකි නමුත්, යේසුස්වහන්සේ එසේ කළසේක. තවද දේව වචනය අපව කැඳවන්නේ උන්වහන්සේ මෙන් වීමටය **(රෝම 8:29).** දේව දරුව, මෙහි පාවුල්තුමා යදින ආකාරයට **'සම්පූර්ණවීමට' අපගේ ශක්තියෙන් අපට කිසිසේත් නොහැකි නමුත් <u>ක්‍රිස්තුස්වහන්සේ තුළ අපට එය පුළුවන</u>.**

**කොලොස්සි 2 : 9, 10 :- '' මක්නිසාද උන්වහන්සේ තුළ දේවත්වයේ සියලු සම්පූර්ණකම ශරීරාකාරයෙන් වාසය කරන්නේය. සියලු අධිපතිකමේද බලයේද හිස වන උන්වහන්සේ තුළ නුඹලා පූර්ණව සිටින්නහුය. ''**

එපීස 1 වැනි, 2 වැනි සහ 3 වැනි පරිච්ඡේද තුනේ තේමාව ලෙස අපගේ ප්‍රථම අධ්‍යයනයේදී හඳුන්වාදෙනු ලැබුවේ, ''ක්‍රිස්තුස්වහන්සේ තුළ අපට හිමි ආශිර්වාද' යන්නයි. පාවුල්තුමා මෙහි ඉල්ලන්නාවූ හතරවෙනි යාච්ඤා ඉල්ලීම, ''ක්‍රිස්තුස්වහන්සේ තුළ'' අපට හිමි ආශිර්වාදයකි. අප ''ක්‍රිස්තුස්වහන්සේ තුළ'' රඳා පවතිනවිට අප සැම - දෙන ශුද්ධාත්මයාණන්වහන්සේ විසින් උන්වහන්සේගේ ස්වරූපයට වෙනස්කරනු ලබමු.

**2 කොරින්ති 3 : 18 :- '' අපි සියල්ලෝද .... ආත්මයාණන් - වහන්සේ වන ස්වාමීන්වහන්සේ කෙරෙන් තේජසින් තේජසට එම ස්වරූපයට වෙනස්කරනු ලබමුව. ''**

(v) **එපීස 3 : 18, 19 :- '' ...... ක්‍රිස්තුස්වහන්සේගේ දැනගත නොහැකි ප්‍රේමය දැනගෙන එහි පළල, දිග, උස, ගැඹුර කිමෙක්ද කියා තේරුම්ගන්ට නුඹලාට පුළුවන් වන පිණිසත්,''**

පාවුල්තුමාගේ පස්වෙනි යාච්ඤා ඉල්ලීම වන්නේ -
'' **ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රේමය අපට තේරුම්ගැනීමට හැකි වීමය. ''**

මනුෂ්‍යවූ අපට ක්‍රිස්තුස්වහන්සේගේ අසීමිත ප්‍රේමය සම්පූර්ණයෙන්ම තේරුම්ගැනීමට නොහැකිවේ. මෙනමුත් පාවුල්තුමා උන්වහන්සේගේ ප්‍රේමයේ පළල, දිග යනාදිය සඳහන්කරමින් විස්තරකරන්නාවූ ප්‍රේමයේ ඉමහත්කම, අපගේ මනසට තේරුම්ගත හැකි ලෙස දේව ධර්මාචාර්‍ය - වරයෙක් ඉදිරිපත් කළ අන්දම ඔබ ඉදිරියේ තබමි.

(a) උන්වහන්සේගේ ප්‍රේමයේ පළල :- යුදෙව්වරුන් සහ අන්‍යජාතිකයන්ගෙන් සමන්විත වන්නාවූ, අද මෙලොව වසන **බිලියන 7ක් පමණ වන්නාවූ, සියලුම මනුෂ්‍යයන්ට ප්‍රේමකිරීමට තරම් පළල, (යොහන් 3 : 16)**

(b) උන්වහන්සේගේ ප්‍රේමයේ දිග :- ඒදන් උයනේ පටන් ලෝකාන්තිමය දක්වා **අතීතයේ විසුවාවූද, දැන් වෙසෙන්නාවූද, අනාගතයේ වසන්ට යන්නාවූද සියලුම මනුෂ්‍යයන්ට ප්‍රේමකිරීමට තරම් දිග, (කොරින්ති 13 : 8)**

(c) උන්වහන්සේගේ ප්‍රේමයේ ගැඹුර :- මනුෂ්‍ය ඉතිහාසයේ බිහිවූ **ලොකුම පව්කාරයාට ප්‍රේමකිරීමට තරම් ගැඹුරු,**

(d) උන්වහන්සේගේ ප්‍රේමයේ උස :- ඉහත සඳහන් පව්කාර - යාව ස්වර්ගය කරා ඔසවන තරම් උස්වූ ප්‍රේමයකි.

අප වැනි පව්කරුවන්ට ප්‍රේමකළාවූ, අපගේ ගැළවුම්කාරවූ ස්වාමීන්වහන්සේගේ මෙම ප්‍රේමය තේරුම්ගනිමින්, අපද අන් අයට පූජාවීමේ ප්‍රේමයකින් ප්‍රේමකරමු.

**3. <u>අපගේ යාච්ඤා අසන්නාවූ දෙවියන්වහන්සේගේ බලය</u> - <u>එපීස 3 : 20</u>**

**එපීස 3:16-19** දක්වා පාවුල්තුමා දෙවියන්වහන්සේ වෙත ගෙනෙන යාච්ඤා ඉල්ලීම් සඳහන් වන අතර **එපීස 3:14,15,20** හි සඳහන්වන්නේ දෙවියන් - වහන්සේගේ ගුණාංග දෙකකි.

(i) **එපීස 3 : 15 :-** දෙවියන්වහන්සේ මුලු කිතුනු පවුලේ පියාණන්වහන්සේ වන සේක.

(ii) **එපීස 3 : 20 :-** උන්වහන්සේ අප සැමදෙනාගේ යාච්ඤා ඉල්ලීම් ඉටුකිරීමට බලය ඇත්තාවූ තැනන්වහන්සේ වනසේක.

එබැවින් අපගේ දෙවියන්වහන්සේ **අපගේ යාච්ඤාවලට පිළිතුරු දීමට ආසාකරන්නාවූ ප්‍රේමයෙන් පරිපූර්ණවූ පියෙක්** වන අතර, උන්වහන්සේට ඇත්තාවූ බලය නිසා, එසේ පිළිතුරු දීමට උන්වහන්සේ සමත්වනසේක.

දෙවියන්වහන්සේට ඇත්තාවූ බලය / සමත්කම / හැකියාව පාවුල්තුමා විස්තර කරන ආකාරය **එපීස 3 : 20** ඇසුරෙන් බලමු.

**එපීස 3 : 20 :- " ඉතින් අප තුළ ක්‍රියාකරන්නාවූ බලයේ හැටියට, අපි ඉල්ලන නොහොත් සිතන සැම දේට වඩා ඉතා අධික ලෙස කරන්ට බලය ඇත්තාවූ තැනන්වහන්සේටම,… "**

(a) අප <u>ඉල්ලන දේ කිරීමට</u> උන්වහන්සේට <u>බලය</u> තිබේ.

(b) අප <u>සිතන දේ කිරීමට</u> උන්වහන්සේට <u>බලය</u> තිබේ.

(c) අප <u>ඉල්ලන නොහොත් සිතන සැමදේම කිරීමට</u> උන්වහන්සේට <u>බලය</u> තිබේ.

(d) ඉහත සඳහන් <u>සියල්ලට වඩා කිරීමට</u> උන්වහන්සේට <u>බලය</u> තිබේ.

(e) ඉහත සඳහන් සියල්ලට වඩා <u>ඉතා අධික ලෙස කිරීමට</u> උන්වහන්සේට <u>බලය</u> තිබේ.

එබැවින් දේව දරුවෙනි, අප සැම දෙන **එපීස 3 : 20** තදින් අල්ලාගෙන, මෙම අධ්‍යයනයේ 1 (i) සහ 1 (ii) යටතේ අප ඉගෙනගත්තාවූ දේ දෙස නැවත බලමු.

අප සැමදෙනාම දෙවිපියාණන්වහන්සේ තමන්වහන් - සේගේ දරුවන් ලෙස පත්කර ඇත්තේ, උන්වහන්සේගේ සේවයේ යෙදීමටයි. ඔබව උන්වහන්සේ කැඳවා ඇති සේවය නැතහොත් උන්වහන්සේගේ ශරීරයේ කුමන අවයවයක් ලෙස ඔබව පත්කර තිබෙනවාදැයි ඔබ දන්න බව විශ්වාස කරමි.

<u>උන්වහන්සේ මෙසේ **ඔබට පවරා ඇති සේවය** කෙතරම් විශාල වුවත්, කෙතරම් දුෂ්කර වුවත් ඒ දේ **ඔබ ඉල්ලනවාට නොහොත් සිතනවාට වඩා අධික ලෙස ඉටුකිරීමට උන්වහන්සේ බලා සිටින බව තේරුම් ගන්න**.</u>

ඔබට දෙවියන්වහන්සේ පෙන්වා ඇති, උන්වහන්සේගේ කැමැත්ත ඉටුකිරීම උදෙසා උන්වහන්සේගෙන් නිර්භීතව, ඇදහිල්ලෙන් ඉල්ලන්න. ඔබගේ ඉල්ලීම කෙතරම් විශාල වුවත්, උන්වහන්සේට එය ඉතා සුලු දෙයක් බව තේරුම් ගන්න.

ඔබගේ සේවය ගැන, ඔබගේ සිතේ ඔබම දමා තිබෙන්නාවූ සීමා ඉවත් කරන්න.

උන්වහන්සේට කළ නොහැකි දෙයක් නොමැති බව අදහමින්, මහත් උද්යෝගයෙන් යාච්ඤාකරන්න.

**මතෙව් 19 : 26 :- " යේසුස්වහන්සේ ඔවුන් දෙස බලමින් : ඒක මනුෂ්‍යයාට නම් නුපුළුවන ; නුමුත් දෙවියන්වහන්සේට සියල්ලම පුළුවනැයි කීසේක. "**

දේව දරුව, එදා දෙවියන්වහන්සේ මරියතුමියට දුන්නාවූ කැඳවීම, කිසි මනුෂ්‍යයෙකුට කළ නොහැකි දෙයක් බව ඈ දැන සිටියාය. නමුත් මෙය දෙවියන්වහන්සේගේ කැඳවීම බව වටහාගත්තාවූ ඇයගේ පිළිතුර **ලූක් 1 : 38** හි මෙසේ සඳහන් වේ.

**ලූක් 1 : 38 :- " බැලුව මැනව, ස්වාමීන්වහන්සේගේ දාසිය ; <u>ඔබගේ වචන ලෙස මට වේවයි කීවාය</u> ..... "**

**දෙවියන්වහන්සේ අපව කැඳවන අතර, අපද මරියතුමිය ලෙස පිළිතුරු දෙමු.**

එම කැඳවීම ඉටුකිරීම පිණිස අප සැමදෙන යේසුස්වහන්සේ මෙන් කරන ලෙස දෙවියන්වහන්සේගෙන් යදිමු. (පාවුල්තුමා **එපීස 3 : 16-19** හි කරන්නාවූ යාච්ඤාවේ, සඳහන් ඉල්ලීම් පහම මෙම ඉල්ලීම තුළ අන්තර්ගත වේ).

**මේ අයුරින් උන්වහන්සේට**

**සේවය කිරීමට**

**අපගේ ප්‍රේමණීය පියාණන්වහන්සේ ,**

**ඔබට පිහිට වන සේක්වා !!**

# සටහන

# කැඳවීමට ඔබින ලෙස හැසිරීම



# එපීස අධ්‍යයනය 07

# කැඳවීමට ඔබින ලෙස හැසිරීම

**එපීස 4 : 1-3, 17-26**

**හැඳින්වීම :-**

එපීස පොතේ පළමුවැනි අධ්‍යයනයෙහිදී අප දුටු ආකාරයට, මෙම පොතේ මුල් පරිච්ඡේද තුනේ තේමාව, **' ක්‍රිස්තුස්වහන්සේ තුළ අපට හිමි ආශිර්වාද '** ලෙසද, ඉතිරි තුනේ තේමාව **' ක්‍රිස්තුස්වහන්සේ තුළ ඇවිදීම හෝ හැසිරීම '** ලෙසද විස්තර කළ හැක.

මෙම හේතුව නිසාම එපීස පොතේ හතරවැනි පරිච්ඡේදය අරඹනු ලබන්නේ **'' එබැවින් ''** යන වචනයෙනි. දේව දරුවන්ට හිමිව ඇත්තාවූ දේව ආශිර්වාද, ඔවුන්ට හිමි ස්ථානය, සහ ඔවුන් ලබා ඇත්තාවූ කැඳවීම යනාදිය පෙන්වාදීමෙන් පසු, පාවුල්තුමා අපට අභියෝග කරන්නේ, අප ලබා ඇති අති උතුම් කැඳවීමට ඔබින ලෙස ජීවත්වෙන්න කියාය. මෙයින් අදහස් වන්නේ, **අපගේ හැසිරීම, අපගේ ක්‍රියාකිරීම, අපගේ ආකල්ප** යනාදියෙන්, අප ලබා ඇත්තාවූ අති උතුම් කැඳවීම, අන් අයට ප්‍රකාශ විය යුතු බවයි.

**අධ්‍යයනය :-**

1. **කැඳවීමට ඔබින ලෙස හැසිරීම, පිළිබඳව දේව වචනයේ වෙනත් ස්ථානවල සඳහන් ඉගැන්වීම් සමහරක්**

අපගේ කැඳවීමට ඔබින ලෙස හැසිරීමේ වැදගත්කම නිසාම, මෙය පෙන්නුම් කරන්නාවූ ඉගැන්වීම් කිහිපයක් සහ ආදර්ශයක් ඔබ ඉදිරියේ මුලින්ම තබමි.

(i) **ඒනොක්ගේ ආදර්ශය - උත්පත්ති 5 : 21 - 24**

**උත්පත්ති 5 : 22 :- '' ඒනොක් මෙතුසෙලා ඉපදෙවූ පසු අවුරුදු තුන්සියයක් දෙවියන්වහන්සේ සමඟ හැසුරුණේය..''**

**උත්පත්ති 5 : 1-21** දක්වා කියවා, එහි සඳහන් කරුණු තේරුම්ගත්විට අපට පෙනීයන්නේ, ඒනොක් ඉපදුනු විට **'' දෙවියන්වහන්සේගේ ස්වරූපයෙන් මවන ලද්දාවූ ''** **(උත්. 1 : 27)** ඒනොක්ගේ සීයාගේ, සීයාගේ, සීයා වූ ආදම් අවුරුදු 620 ක්ව සිටි බවයි.

නිසැකවම ආදම් තම පාපය නිසා ඒදන් උයනින් නෙරපනු ලැබූ පසු, ඔහුගේ පාපය ගැන අතිශයින් පසුතැවෙන්න ඇති. එබැවින් ඔහු ඔහුගේ දරුවන්ටද, දරුවන්ගේ දරුවන්ටද යනාදියෙන් ඔහුගෙන් බිහිවූ සෑම පරම්පරා - වකටම, ඒදන් උයන ගැනත්, ඔහු සහ දෙවියන්වහන්සේ අතර තිබුණාවූ සම්බන්ධකම ගැනත්, **දෙවියන්වහන්සේගෙන් ඔහු ලැබුවාවූ උතුම් කැඳවීම ගැනත්,** සාතන්ට රැවටී ඔහු පාපයට වැටුනු බවත්, බොහෝ විස්තර කියා දෙන්න ඇති.

**උත්පත්ති 5 : 1-24** දක්වා කියවන අපට නිගමනය කළ හැක්කේ, ඒනොක්ට කළින් විසුවාවූ සෑම පරම්පරාවක්ම, ආදම්ගෙන් මේ සියල්ල ඇසූ නමුත්, **" ආදම් ඒදන් උයනේදී, දෙවියන්වහන්සේ සමඟ හැසිරුනාසේම, හැසිරෙන්ට මම කැමතියි "** යන ඕනෑකම සහ කැපවීම, ඇතිවූයේ ඒනොක්ගේ හදවතේ පමණක් බවයි.

වෙනත් අන්දමකට මෙය විස්තර කරනවානම් -
**" ආදම් ඔහුගේ කැඳවීම අනුව හැසිරීමට අපොහොසත් වූ නමුත්, ඒ කැඳවීම අනුව හැසිරීමට මම සූදානම් "** යන සිතුවිල්ල ඒනොක්ගේ හදවතේ උපදින්ට ඇත. මෙහි ප්‍රතිඵලයද, ඒනොක් දෙවියන්වහන්සේගෙන් ලැබුවාවූ සිතා ගත නොහැකි තරම් විශාල වූ ආශිර්වාදය **හෙබ්‍රෙව් 11 : 5** මගින් අප දනිමු.

ආදම්, ඔහුගේ කැඳවීමට ඔබින ලෙස හැසිරීමට අපොහොසත් වූ නමුත්, ඔහුට පසු හයවන පරම්පරාවට අයිතිවූ ඒනොක්, ඒ කැඳවීමට ඔබින ලෙස ජීවත්වීමට තීරණය කළේය. ඔහුගේ තීරණයේ ප්‍රතිඵලයක් වශයෙන් **" ඒනොක් දෙවියන්වහන්සේ සමඟ හැසිරුනේය "** යන වචන දේව වචනයේ දෙවරක් සඳහන් වේ.

ප්‍රේමණීය දේව දරුව, එපීස පොතේ අධ්‍යයනයන් අංක 1 සිට 6 දක්වා, ඔබට හිමි ආශිර්වාදය සහ ඔබගේ කැඳවීම ගැන අධ්‍යයනය කළ ඔබ, ඒනොක් මෙන් **ඔබගේ කැඳවීමට ඔබින ලෙස ජීවත්වීමට දැන්ම තීරණය කරන්න.**

**හෙබ්‍රෙව් 11 : 5 :-**

" **ඇදහිල්ලෙන්, ඒනොක් මරණය නොදකින ලෙස ගෙනයනු ලැබුවේය ; දෙවියන්වහන්සේ ඔහු ගෙනගිය හෙයින් ඔහු සම්බනොවීය. ඔහුගේ ගෙනයාමට ප්‍රථම, ඔහු දෙවියන් - වහන්සේව ප්‍රසන්න කළ බවට සාක්ෂි ලැබුවේය.** "

මෙම පදය ඇසුරෙන් පැන නැගෙන ප්‍රශ්නයක් වන්නේ, **" ආදම් පව් නොකළා නම් මරණය නොදකිනවා නොවේද ? "** යන්නයි. ආදම් කැඳවීමට ඔබින ලෙස නොහැසිරීම තුළින් , මරණය හිමිකරගත් නමුත්, ඒනොක් ඇදහිල්ලෙන් දෙවියන්වහන්සේ සමග හැසිරෙමින් මරණය නුදුටුවා මෙන්, අප සැමද, **අපගේ කැඳවීමට ඔබින ලෙස හැසිරෙමින්, දෙවියන්වහන්සේ, ක්‍රිස්තුස්වහන්සේ තුළ අපට ලබාදී ඇති සියලු ආත්මික ආශිර්වාදවලට ඇතුල්වෙමු !!!**

(ii) **අප ලබා ඇති කැඳවීම ශුද්ධවූද, උතුම්වූද, ස්වර්ගීය කැඳවීමක් වේ**

**හෙබ්‍රෙව් 3 : 1 :- " එහෙයින්, ස්වර්ගීය කැඳවීමකට පංගු - කාරවූ ශුද්ධ වූ සහෝදරයෙනි, ..... "**

**පිලිප්පි 3 : 14 :- " ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ දෙවියන් - වහන්සේගේ උතුම් කැඳවීමේ දිනුම පිණිස දිනුම්පළ කරා දුවමි. "**

**2 තිමෝති 1 : 9 :- " උන්වහන්සේ ...... අප ගළවා, ශුද්ධවූ කැඳවීමකින් කැඳවාගත් සේක. "**

මෙම පද අනුව අප දකින්නේ, දෙවියන්වහන්සේගේ උතුම් කැඳවීම ලබා ඇත්තාවූ අප සැම, අතීතය අමතක කරමින් ඉදිරිය දෙසම බලමින්, විශ්වාසවන්තව, දිනුම්පළ කරා, (අවසානය දක්වා) අපගේ කැඳවීමට ඔබින ලෙස හැසිරෙමින්, දිවි යුතු බවය.

මේ අතරම ස්වර්ගීය කැඳවීමකට පංගුකාරවූ අපගේ හැසිරීම, අපට හැකිතරම් දුරට ස්වර්ගයේ පවතින්නාවූ හැසිරීමට සමානත්වයක් දක්විය යුතුය. එබැවින් ස්වර්ගයේ සිදුවන්නාවූ හැසිරීම දෙස අප බැලීම උචිත වේ.

**එළිදරව් 4 : 8 - 10 :-**

**" ඒ ජීවමාන සත්ත්වයන් සතරදෙනා ..... ස්වාමී වූ දෙවියන් - වහන්සේ ශුද්ධය, ශුද්ධය, ශුද්ධයයි රෑ දවල් නොනැවතී කියති ..... (ඔවුන් දෙවියන්වහන්සේට) ප්‍රශංසාවද ගෞරවයද ස්තුතියද දෙන කළ, වැඩිමහල්ලන් විසිහතර දෙනාද සිංහාසනයෙහි වැඩසිටින තැනන්වහන්සේ ඉදිරියෙහි වැටී......නමස්කාරකර, තමුන්ගේ ඔටුනු සිංහාස - නය ඉදිරියෙහි හෙළා : "**

මෙම පදවලින් අප දකින්නේ ස්වර්ගයේ අඛණ්ඩව සිදුවන්නේ, දෙවියන්වහන්සේට ප්‍රශංසාව, ගෞරවය සහ ස්තුතිය පුදකිරීම සහ තමන් සතු වඩාත්ම වටින්නාවූ දේ උන්වහන්සේ ඉදිරියේ හෙළමින් උන්වහන්සේ ඉදිරියේ වැටී උන්වහන්සේට නමස්කාර කරනු ලැබීම බවයි.

මේ අනුව අපට පෙනීයන්නේ ස්වර්ගීය කැඳවීමකට පංගුකාරවූ අපගේ ජීවිතවල, දෙවියන්වහන්සේට ප්‍රශංසාව, ගෞරවය, ස්තුතිය සහ නමස්කාරය පුදකිරීමේ වැදගත්කමයි.

ප්‍රේමණීය සහෝදරයා, සහෝදරී අප සැම, දෙවියන් - වහන්සේගේ කැඳවීමට ඔබින ලෙස හැසිරෙමින්, උන්වහන්සේට නිතරම ප්‍රශංසාව, ගෞරවය, ස්තුතිය සහ නමස්කාරය පුද කරමු.

(iii) **අපගේ හැසිරීම පිළිබඳව දේව වචනයෙන් ඉගැන්වීම් සමහරක්**

**2 කොරින්ති 5 : 7 :- " මක්නිසාද අප හැසිරෙන්නේ පෙනීමෙන් නොව ඇදහීමෙන්ය. "**

මෙම සත්‍යය ඔබගේ හදවතේ තදින් මුල් ඇදගන්නා බලාපොරොත්තුවෙන්, ඔබට සත්‍ය කථාවක් කීමට කැමැත්තෙමි.

චීනයට කිතු දහම ගෙන යෑම පිළිබඳව මහඟු සේවයක් ඉටුකළ හඩ්සන් ටේලර් මිෂනාරීතුමා, රුවල් නැව් මගින් චීනය කරා යාත්‍රා කරමින් සිටියදී, කිසිම සුළඟක් නොහමන තත්වයක් උදාවිය.

සුළං පොදක්වත් නැති හේතුවෙන් රුවල් නැව ඇදීගෙන ගියේ මිනීකන මනුෂ්‍යයන් වෙසෙන ගොඩබිමක් දෙසටය. නැවේ සිටි සියලුම අයගේ විනාශය ඉදිරියේ, නැවේ කපිතාන්වරයා හඩ්සන් ටේලර්තුමා වෙත ගොස්, උද්ගතව තිබුනාවූ තත්ත්වය ඔහුට කියාදී, සුළඟක් එවන මෙන් දෙවියන්වහන්සේට යාච්ඤා කරන ලෙස ඔහුගෙන් ඉල්ලුවේය.

මෙයට පිළිතුරු වශයෙන් එතුමා ප්‍රකාශකළේ, ඔහු යාච්ඤාකළ විට දෙවියන්වහන්සේ නිසැකවම සුළඟක් එවන්ට යන බැවින්, ඔහු යාච්ඤා කිරීමට පෙර නැවේ රුවල් එම සුළඟ උදෙසා සූදානම් කළ යුතු බවයි. මෙය අඥාන ඉල්ලීමක් ලෙස කපිතාන්වරයා සැලකූ හෙයින්, එම ඉල්ලීමට ඔහු අවනත වූයේ බොහෝ වේලා වාද කිරීමෙන් පසුවය.

කපිතාන්වරයා රුවල් සකස් කිරීම උදෙසා නැවියන්ට උපදෙස් දීමට පිටත්වූ අතර, හඩ්සන් ටේලර්තුමා දෙවියන්වහන්සේට කන්නලව් කිරීම ඇරඹුවේය. නමුත් ඔහුට වැඩිවේලා යාච්ඤා කිරීමට නොහැකිවූයේ, ඔහු වෙත දුව ආ කපිතාන් කළ ඉල්ලීම නිසාය. කපිතාන් - වරයාගේ ඉල්ලීම වූයේ, ''අනේ යාච්ඤාව නවත්වන්න, අවශ්‍ය ප්‍රමාණයටත් වඩා දනටමත් සුළං හමනවා'' යන්න විය.

දේව දරුව දන්ම ඔබගේ බයිබලය ඇර **මාර්ක් 11 : 23, 24** කියවන්න. ඉන්පසු ඔබගේ විශාලතම ඉල්ලීම ඇදහිල්ලෙන් දෙවියන්වහන්සේ වෙත ගෙන එන්න. මීළඟට ඔබ කළ යුත්තේ, **උන්වහන්සේ ඔබගේ ඉල්ලීම ඉටුකරන නිසා,** උන්වහන්සේට තුති පිදීමයි.

දෙවියන්වහන්සේගේ පොරොන්දුව අනුව, ඔබගේ ඉල්ලීම උන්වහන්සේගේ කැමැත්තට අනුකූල නම්, උන්වහන්සේ නිසි කාළයේ අනිවාර්‍යයෙන්ම ඔබගේ ඉල්ලීමට පිළිතුරු දෙනවා ඇත.

අප සැම **පෙනීමෙන් නොව ඇදහීමෙන් හැසිරෙමු.**

(a)**2 කොරි. 5:7 :- " (මක්නිසාද අප හැසිරෙන්නේ පෙනීමෙන් නොව ඇදහීමෙන්ය). "**

(b)**ගලාති 5:16 :- " නුමුත් <u>ආත්මයාණන්වහන්සේ කරණකොටගෙන හැසිරියල්ලා</u>, ...... "**

(c) **එපීස 5:15 :- " ඒ නිසා නුඹලා ...... ඥානවන්තයන් මෙන් <u>ප්‍රවේසමෙන් හැසිරෙන්ට</u> බලාගෙන, ......"**

(d) **කොලොස්සි 2:7 :- " ...... ඇදහිල්ලෙහි පිහිටා, <u>බොහෝ සෙයින් ස්තූතිදෙමින්</u> උන්වහන්සේ තුළ <u>හැසිරියල්ලා</u>. "**

(e) **1 යොහන් 1:7 :- " නුමුත් උන්වහන්සේ ආලෝකයෙහි සිටින්නා සේම අපිත් <u>ආලෝකයෙහි හැසිරෙමු</u> නම්, .."**

(f) **3 යොහන් 3 :- " නුඹ <u>සැබෑවෙහි</u> <u>හැසිරෙන</u> ලෙසම .... "**

(g) **එපීස 5:2 :-".... නුඹලාත් <u>ප්‍රේමයෙන්</u> <u>හැසිරියල්ලා</u>. "**

දේව දරුවෙනි, ඉහත පදවල සඳහන් අයුරින් අප සැම, **ආත්මයාණන්වහන්සේ කරණකොටගෙන, ප්‍රවේසමෙන්, ස්තූතිදෙමින්, ආලෝකයෙහිද, සැබෑවෙන්ද, ප්‍රේමයෙන්ද හැසිරෙමු.**

**2. <u>කැඳවීමට ඔබින ලෙස හැසිරීම - එපීස 4 : 1-3</u>**

(a) **<u>අප යටහත්කමින් හැසිරිය යුතුවේ - එපීස 4 : 2</u>**

අප " **<u>යටහත්කමින්</u>** " හැසිරිය යුතුබව, අප සැම නිතර අසන නුමුත්, මෙයින් අදහස්වන්නේ කෙබඳු හැසිරීමක්ද කියා අපට පැහැදිලි මඟපෙන්වීමක් නොමැති වන්නට හැක. එබැවින් යටහත්කමින් හැසිරීම උදෙසා අවශ්‍ය ඉතා වැදගත් සත්‍යයක් ඔබ ඉදිරියේ තබමි.

සැම මනුෂ්‍යයෙක් තුළ බොහෝවිට රැඳී තිබෙන්නාවූ එක් ගුණාංගයක් වන්නේ, **තමා නිවැරදියි කියා පෙන්වීමට / ඔප්පුකිරීමට ඇති ආශාවයි.** අප යටහත් - කමින් හැසිරීම උදෙසා මෙම ආශාව යටපත්කරගැනීම අතිශයින් වැදගත්වේ.

ප්‍රිය මිතුර, මෙම අති වටිනා සත්‍යය ගැන සිතා බලන්න. එය ඔබගේම ගුණාංගයක් කරගන්න. මෙසේ කිරීම තුළින් ඔබගේ නිවසේද, කාර්යාලයේද, සභාවේද පුදුමාකාර අන්දමින් තුරන්වන්නාවූ වාද බේද සංඛ්‍යාව ගැන ඔබම මවිතයට පත්වනු ඇත. දුර්වලවූ මා, දෙවියන්වහන්සේ මට උගන්වා ඇති අන්දමට උත්සාහ කරන්නේ, සැමවිටම නිවැරදිවූ දේද සත්‍යවූ දේද ප්‍රකාශකිරීමටයි. මෙවිට කවුරුන් හෝ මා කීවාවූ දේ නොපිළිගෙන එයට විරුද්ධ වුවහොත් මා කරන්නේ, **මා කීදේ නිවැරදි බව නොහොත් මා හරි බව ඔප්පුකිරීමට, මා තුළ ඇති ආශාව මැඩපවත්වා ගෙන නිහඬවීමයි.**

(b) **අප මොලොක් ගුණයෙන් හැසිරිය යුතුවේ - එපීස 4:2**
මෙයින් අදහස්වන්නේ, කිමෙක්ද කියා පැහැදිලි කර ගැනීම උදෙසා, **ගලාති 6 : 1** දෙස බලමු.

**ගලාති 6 : 1 :- " සහෝදරයෙනි, මනුෂ්‍යයෙක් යම් වරදකට අසුවුණත්, ආත්මිකවූ නුඹලා මෘදුකමේ ආත්මයෙන් යුක්තව එබඳු කෙනෙකු හරවා ගනිල්ලා ...... "**

(සභාවේ) මනුෂ්‍යයෙක් වැරදි දෙයක් කර අසුවුනවිට, ඔබ ඔහුව නිසි මගට හරවාගැනීමට උත්සාහයක යෙදී ඇත්නම්, ඔබගේ උත්සාහය කෙතරම් සාර්ථක වූවාදැයි සිතා බලන්න. බොහෝවිට යහපත් චේතනාවකින් යුක්තව අප මෙම ක්‍රියාවෙහි යෙදුනත්, අප නිතරම මෙහිදී අසාර්ථක වීමට හේතුව වන්නේ, **අප තුළ ඇති මොලොක් ගුණය නොහොත් මෘදුකම ප්‍රමාණවත් නොවීමයි.**

මොලොක් ගුණයෙන් හැසිරීම යනු, **අනුන්ගේ සිත් රිදවන්ට අකමැති ලෙස හැසිරීමයි.** මෙම ගුණය සහිතවූ විට අප වරදට අසුවූ අයට කථාකරන්නේ කරුණාවෙනි, ආදරයෙනි. මෙසේ අප ක්‍රියාකළ විට, අප තුළින් ක්‍රියාකරන්නාවූ **'මෘදුකමේ ආත්මය'** වරදට අසුවූ තැනැත්තා පසුතැවිල්ලට ගෙනෙනවා ඇත. මේ අතරම අප ඔහුට කථාකරන්නේ අකරුණාවන්තව නම්, ඔහුද සිත දැඩිකරගෙන ඔබට පිළිතුරු දෙනවා ඇති අතර, ඔහුව හරවා ගැනීමට ඔබ අපොහොසත් වනවා ඇත. කිතුනු අප සැම මොලොක් ගුණයෙන් හැසිරෙමින්, අනුන් නොරිදවා ක්‍රියාකිරීමට වෙර දරමු.

(c) **අප එකිනෙකා ගැන ප්‍රේමයෙන් ඉවසිය යුතුවේ - එපීස 4:2**

**කොලොස්සි 3 : 13 :- " එකිනෙකා ගැන ඉවසමින්, යමෙකුට විරුද්ධව යමෙකුගේ කාරණයක් ඇත්නම් එකිනෙකාට කමා වෙයල්ලා : ……. "**

ප්‍රේමයෙන් ඉවසන්නාවූ කිතුනුවා, අන් කිතුනුවන්ට කමා විය යුතුවේ.

**1 කොරින්ති 13 : 4 :- " ප්‍රේමය බොහෝ ඉවසිලිවන්තය, ගුණවන්තය ; ප්‍රේමය ඊර්ෂ්‍යාවෙන්නේ නැත, පාරට්ටු කරගන්නේ නැත, උඩඟුවන්නේ නැත, "**

ප්‍රේමය පිළිබඳව මෙහි සඳහන් ගුණාංග, අපගේම කරගනිමින්, අප එකිනෙකා ගැන ප්‍රේමයෙන් ඉවසා ක්‍රියාකරමු.

(d) **අප ආත්මයාණන්ගේ එකමුතුකම පවත්වාගන්ට උත්සාහ කළ යුතුවේ - එපීස 4 : 3**

**එපීස 4 : 2** හි සඳහන් හැසිරීම් රටාව සම්බන්ධයෙන් පාවුල්තුමා සඳහන් කරන්නේ **යටහත්කමෙන්, මොළොක් ගුණයෙන්** සහ **ප්‍රේමයෙන් ඉවසීමෙන් හැසිරෙන්ට කියාය.** මෙනමුත් **එපීස 4 : 3** ඔහු කියාසිටින්නේ එකමුතුකම පවත්වාගන්ට **උත්සාහකරන්ට කියාය.**

අප යමෙකුට **" මෙසේ උත්සාහ කරන්න "** කියා ප්‍රකාශ - කරන අතර, අදහස්වන්නේ සමහරවිට හෙතෙම කොතෙක් උත්සාහ කළත්, එම දෙය ඉටුකරගැනීමට ඔහු අපොහොසත් විය හැකි බවය.

එබැවින් පාවුල්තුමා අදහස් කරන **" ආත්මයාණන්ගේ එකමුතුකම පවත්වාගෙන යෑම ඉතා දුෂ්කරද ? "** යන ප්‍රශ්නය ඔබගෙන්ම අසාගන්න. මෙය කෙසේවූවත් සභාව තුළ, මෙම එකමුතුකම පවත්වාගෙන යෑමේ දුෂ්කරකම, සභා බෙදී නොහොත් කැඩීයාම තුළින් නිතරම අලුතින් බිහිවන්නාවූ සභාවන් මගින් අප දකිමු.

මෙම දුෂ්කරකම පැවතීමට හේතු තුනක් මා සඳහන් කරන්නේ, ඒවායින් ජය ගැනීමට සෑම සභාවක්ම සමත්වේය යන පැතුම හිතැතිවය.

(i) සභාව තුළ බේද ඇතිකිරීම උදෙසා, සාතන් නිතරම දියත්කරන උපක්‍රම.

(ii) සභාවේ සෑම කෙනෙක්ම " **ආත්මයාණන්වහන්සේ කරණකොටගෙන නොහැසිරීම** " **(ගලාති 5 : 16)** නැතහොත් සමහරෙක් " **මාංසයෙන් හැසිරීම** ".

(iii) කිතුනු අපගෙන් බහුතරයක් (සමහරවිට මමද මොවුන්ට ඇතුලත්වන අවස්ථා ඇත)" **මම වැරදියි, මට සමාවන්න** " යන වචන ප්‍රකාශ කිරීමට අකමැතිවීම, නොහොත් අපගේ උඩඟුකම.

දේව දරුව, ඉහත සඳහන් හේතු තුනට, තව නොයෙක් හේතු එකතු කිරීමට, නිසැකවම ඔබගේ අත්දැකීම් තුළින් ඔබට හැකිවනු ඇත. මෙනමුත් අපගේ දෙවි පියාණන්වහන්සේ, අපට කියාසිටින්නේ, සියලු බාධා මැද, " **සමාදානයේ බැම්මෙන් ආත්මයාණන්ගේ එකමුතුකම පවත්වාගන්ට උත්සාහ කරන්න** " කියාය.

අප සැමදෙන අපගේ සභාවන් තුළ මෙම එකමුතුකම පවත්වාගන්ට, මුලු හදවතින් බැඳෙමු. මුලු හදවතින් උත්සාහ කරමු.

## 3. අපගේ පරණ හැසිරීම සහ අලුත් හැසිරීම - එපීස 4 : 17 - 26

සාමාන්‍යයෙන් **එපීස 4:17-24** ඇසුරින් අලුත් වූ අපගේ වෙනස් හැසිරීම උගන්වනු ලබන නමුත්, ක්‍රිස්තුස් -වහන්සේ තුළ අලුත් කරනු ලැබූ අය ගත යුතු **ක්‍රියා - මාර්ග පහක්** ඉගැන්වීම උදෙසා, මා මේ කොටසට **එපීස 4 : 25, 26** ද ඇතුලත් කර තිබේ.

**එපීස 4 : 17-26** දක්වා, පාවුල්තුමා පෙන්වාදී ඇති ක්‍රියා - මාර්ග පහ වන්නේ,

(a) මෙසේ **නොහැසිරෙන්න (එපීස 4 : 2)**
(b) පරණ මනුෂ්‍යයා **පහකර දමන්න (එපීස 4 : 22)**
(c) අලුත් මනුෂ්‍යයා **පැළඳගන්න (එපීස 4 : 24)**
(d) බොරුකීම **අතහැර දමන්න (එපීස 4 : 25)**
(e) කෝපය පවතින්ට **ඉඩනාරිල්ලා (එපීස 4 : 26)**

මේ ක්‍රියාමාර්ග පහ දෙස ලුහුඬින් බලමු.

(a) **එපීස 4 : 17 :- " එබැවින් අන්‍යජාතීන් තමුන්ගේ සිත්වල නිෂ්ඵලකමින් හැසිරෙන්නාක් මෙන්, නුඹලා තවත් <u>නොහැසිරියල්ලා</u> යයි ...... "**

මනුෂ්‍යයාගේ සිත ගැන දේව වචනය මෙසේ සඳහන් කරයි - **" සියල්ලට වඩා සිත රැවටිලිකාරව තිබේ, ඒක දුෂ්ටවම තිබේ. ඒක කාට දැනගන්ට පුළුවන්ද ? "**

දේව දරුකමට ඇතුල්වීමට පෙර, අපද බොහෝවිට හැසිරුනේ අපගේ **" සිත්වල නිෂ්ඵලකමෙන්ය ".** මෙසේ යමෙක් ක්‍රියාකරන අතර, හෙතෙම නොදැනුවත්වම ඇදී යන්නේ පාපිෂ්ඨ දේ කරාය. මෙනමුත් දේව දරුවන්ව සිටින අපට, දෙවියන්වහන්සේ කියන්නේ - **" ක්‍රිස්තුස්වහන්සේගේ සිත "** ඇතිව ජීවත්වන්ට කියාය. එබැවින් අප සැම **අපගේ සිත්වල රැවටිලිකාරකම අනුව <u>නොහැසිරෙමු</u>.**

(b) **එපීස 4 : 22 :- " නුඹලාගේ ජීවිතයේ පළමු හැසිරීම ලෙස රැවටිල්ලේ තෘෂ්ණාවල් අනුව දූෂ්‍යවන්නාවූ පරණ මනුෂ්‍යයා <u>පහකර දමා</u> , ..... "**

අපගේ ජීවිත දෙවි සමිඳුන්ට කැපකර, ක්‍රිස්තුස්වහන්සේ තුළට ඇතුල්වී සිටින්නාවූ අප සැම, නිසැකවම බොහෝ අලුත් දේවල් අපගේ ජීවිතවලට ඇතුලත් කර ඇති බව නිසැකය. එදින පටන් දිනපතා දේව වචනය කියවීමට සහ යාච්ඤාකිරීමට, බයිබල් අධ්‍යයනයන්ට, යාච්ඤා රැස්වීම්වලට සහ නොයෙක් ශෛලවලට සහභාගී වීමට අප පුරුදුවන්ට ඇත. අපගේ පරණ පුරුදු බොහෝමයක්ද අතහරින්න ඇත.

මෙනමුත් මෙම පදය තුළින් පැන නැගෙන ප්‍රශ්නය වන්නේ, " **ඔබගේ වැරදි වුනාවූ පරණ පුරුදු සියල්ලම ඔබ අතහැරියාද ?** " යන්නයි.

**2 කොරින්ති 5 : 17 :- " එබැවින් යමෙක් ක්‍රිස්තුස්වහන්සේ තුළ සිටින්නේ නම් ඔහු අලුත් මැවිල්ලක්ය. <u>පරණ දේ පහව ගියේය</u> ; මෙන්න <u>සියල්ලම අලුත් වී තිබේ</u>. "**

(c) **එපීස 4 : 24 :- " සැබෑවේ ධර්මිෂ්ඨකමින්ද, ශුද්ධකමින්ද දෙවියන්වහන්සේට සමානව මවනලද්දාවූ අලුත් මනුෂ්‍යයා <u>පැළඳගන්නා</u> ලෙසය. "**

ආරම්භයේදී මනුෂ්‍යයා දෙවියන්වහන්සේ විසින් මවන ලද්දේ උන්වහන්සේගේ ස්වරූපයෙන්ය (**උත්පත්ති 1:27**). මෙනමුත් ආදම්ගේ අකීකරුකම නිසා මනුෂ්‍යයා දෙවියන්වහන්සේගෙන් ඈත්විය.

දෙවියන්වහන්සේ අපව කැඳවන්නේ, " **අලුත් මනුෂ්‍යයාව මැවූ තමන්වහන්සේගේ රූපය ලෙස සම්පූර්ණ දැන - ගැන්ම සඳහා අලුත්කරනු ලබන ඒ අලුත් මනුෂ්‍යයාව** " (**කොලොස්සි 3 : 10**) පැළඳගන්නා ලෙසය.

කිතුනු අප වෛරය, ක්‍රෝධය යනාදිය පහකරදැමීම පමණක් මදිය. මේවා වෙනුවට ප්‍රේමය, ඉවසිලිවන්තකම (**ගලාති 5 : 22**) ඇතුලු ශුද්ධාත්මයාණන්වහන්සේගේ ඵල, අප තුළ හට ගත යුතුවේ.

(d) **එපීස 4 : 25 :- " එහෙයින් බොරුකීම <u>අතහැරදමා</u>, එක් එක්කෙනා තම තමාගේ අසල්වැසියා සමඟ සැබෑව කථාකරපල්ලා. "**

බොරුවෙන් ඒවව රැවටුවාවූ සාතන්, 'බොරුවේ පියා' ලෙස යේසුස්වහන්සේ හඳුන්වා දුන්සේක (**යොහන් 8:44**).

ප්‍රේමණීය දේව දරුව, බොරුකීම ' කුඩා පාපයක් ' ලෙස නොසලකන්න. යක්ෂයාට ඔබගේ ජීවිතයේ ඉඩ නොදෙන්න.

**<u>බොරුකීම සම්පූර්ණයෙන්ම අතහැර දමන්න</u>.**

(e) **එපීස 4 : 26 :- " කෝපවුණත් පව් නොකරල්ලා. ඉර බසින තුරු නුඹලාගේ කෝපය <u>පවතින්ට ඉඩනාරිල්ලා</u>. "**

විවිධාකාර හේතූන් නිසා, විවිධාකාර අවස්ථාවල, සෑම මනුෂ්‍යයෙකුම පාහේ කුපිත වෙයි.

දේව වචනය අපට උගන්වන්නේ, එම කෝපයෙන් හැකි ඉක්මනින් මිදෙන්ට කියාය.

දේව දරුවෙනි, **කෝපයට ඔබව පාලනය කිරීමට කිසිසේත් ඉඩනොහරින්න.** කුපිත වූ විට නිහඬව සිටින්න. ඔබගේ මුවින් පරුෂ වචන නික්මෙන්ට ඉඩ නොහරින්න. මෙවැනි අවස්ථාවකදී නිහඬව හදවතින් සමිඳුන්ට යදින්න. උන්වහන්සේගේ පිහිට පතන්න. උන්වහන්සේට ඔබ සිටින අවස්ථාව භාරදී, උන්වහන්සේගේ සමාදානය සහ සතුට ඔබගේ හදවතේ අත්දකින්න.

**දෙව් සමිඳුන්, ඔබට දී ඇති**

**කැඳවීමට ඔබින ලෙස හැසිරීමටත්,**

**(ක්‍රිස්තුස්වහන්සේ තුළ) එසේ කිරීම තුළින්**

**උන්වහන්සේ ඔබට ලබාදී ඇති,**

**සියලු ආත්මික ආශිර්වාද**

**අත්දැකීමට දෙවියන්වහන්සේ**

**ඔබට වරම ගෙන දෙන සේක්වා !!!**


## සටහන

............................................................................................
............................................................................................
............................................................................................
............................................................................................
............................................................................................
............................................................................................
............................................................................................
............................................................................................
............................................................................................
............................................................................................
............................................................................................
............................................................................................
............................................................................................
............................................................................................
............................................................................................
............................................................................................
............................................................................................
............................................................................................
............................................................................................
............................................................................................
............................................................................................
............................................................................................
............................................................................................
............................................................................................
............................................................................................
............................................................................................

## සටහන

..............................................................................
..............................................................................
..............................................................................
..............................................................................
..............................................................................
..............................................................................
..............................................................................
..............................................................................
..............................................................................
..............................................................................
..............................................................................
..............................................................................
..............................................................................
..............................................................................
..............................................................................
..............................................................................
..............................................................................
..............................................................................
..............................................................................
..............................................................................
..............................................................................
..............................................................................
..............................................................................
..............................................................................
..............................................................................
..............................................................................

# සභාවේ ඒකත්වය



# එපීස අධ්‍යයනය 08

# සභාවේ ඒකත්වය

**එපීස 4 : 4 - 6**

<u>**හැඳින්වීම**</u> **:-**

**එපීස 4 : 4 - 6** දක්වා, පාවුල්තුමා ඉතා අනර්ඝ ලෙස පැහැදිලි කර දෙන්නේ කිතුනු සභාවේ ඒකත්වයයි. මෙම පද තුනෙහි, ඔහු ''එක'' යන වචනය සත් වරක් සඳහන් කරන අතර, ඒවා නම් :- <u>එක</u> බලාපොරොත්තුවත්, <u>එක</u> ශරීරයත්, <u>එක</u> ආත්මයාණන්වහන්සේත්, <u>එක</u> ස්වාමීන්වහන්සේත්, <u>එක</u> ඇදහිල්ලත්, <u>එක</u> බව්තීස්මයත්, <u>එකම</u> පියවූ දෙවියන්වහන්සේත් යන මේවාය.

ඉහත සඳහන් අන්දමට ''එක'' යන වචනය සත් වරක් සඳහන් වන අතර, තෙවරක්ම එසේ සඳහන්වන්නේ, ත්‍රිඑක දෙවියන්වහන්සේ නොහොත් දෙවියන්වහන්සේ, යේසුස් ක්‍රිස්තුස්වහන්සේ සහ ශුද්ධාත්මයාණන්වහන්සේ සම්බන්ධ යෙන්ය.ශුද්ධාත්මයාණන්වහන්සේගේ මඟපෙන්වීම අනුව පාවුල්තුමා ඉදිරිපත් කරන්නාවූ සභාවේ ඒකත්වය ඉදිරියෙහි, එම ඒකත්වය රැකගැනීමට කිතුනු නම දරන අපට පැවරෙන්නාවූ ඉමහත් වගකීම පහදාදීම, මේ අධ්‍යයනයේ මූලික අරමුණක් වේ.

<u>**අධ්‍යයනය**</u> **:-**

1. <u>**ත්‍රිත්ව දෙවියන්වහන්සේ පෙන්නුම් කරන්නාවූ ඒකත්වය මඟින් සභාවේ ඒකත්වය පැන නැගෙයි**</u>

අපගේ පියවූ දෙවියන්වහන්සේ එකම දෙවියන්වහන්සේ බවද, උන්වහන්සේ පියාණන්වහන්සේගෙන්ද, පුත්‍රයා - ණන්වහන්සේගෙන්ද, ශුද්ධාත්මයාණන්වහන්සේගෙන්ද සමන්විත වන්නාවූ, ත්‍රිඑක දෙවියන්වහන්සේ බව අප දේව වචනය තුළින් දකිමු.

ඇත්තේ එකම දෙවියන්වහන්සේත්, ක්‍රිස්තුස්වහන්සේත්, ශුද්ධාත්මයාණන්වහන්සේත් බව ප්‍රකාශකරන්නාවූ දේව වචනයේ පද කිහිපයක් දෙස බලමු.

**ද්විතීය 6 : 4 :- '' එම්බා ඉශ්‍රායෙල් අසාපන්න. <u>අපේ දෙවිවූ ස්වාමීන්වහන්සේ එකම ස්වාමීන්වහන්සේය</u>. ''**

**1 තිමෝ. 2 : 5, 6 :-**

**'' මක්නිසාද ඇත්තේ එක දෙවි කෙනෙක් සහ දෙවියන් - වහන්සේටත් මනුෂ්‍යයන්ටත් අතරේ එක මැදහත්කාර කෙනෙකුත්ය. උන්වහන්සේ ......... මනුෂ්‍යයාවූ ක්‍රිස්තුස් යේසුස්වහන්සේය. ''**

**එපීස 2 : 18 :-**

**'' මක්නිසාද උන්වහන්සේ කරණකොටගෙන අප දෙගොල්ලට එක ආත්මයාණන්වහන්සේ තුළ පියාණන්වහන්සේ ළඟට පැමිණීමේ පුළුවන්කම තිබේ.''**

'' ඇත්තේ එක'' ලෙස විස්තර කරනු ලබන්නාවූ ඉතිරි හතර කිතුනු අත්දැකීම් වන්නාවූ, ඇදහිල්ල, බව්තීස්මය, ශරීරය සහ බලාපොරොත්තුව යන පිළිවෙලට ඉදිරිපත් කිරීම මාගේ අදහසයි.

(a) **එක ඇදහිල්ලත්**

''එක ඇදහිල්ල'' යන්නෙන් අදහස් කරනු ලබන්නේ කිමෙක්ද කියා ඔබ අසන්ට පුළුවන. මෙහි සඳහන්වන්නාවූ ''එකම ඇදහිල්ල'' වන්නේ ශුභාරංචිය කෙරෙහි ඇදහිල්ල බව මාගේ විශ්වාසයයි.

මෙම ''ශුභාරංචිය කෙරෙහි ඇදහිල්ල'' **1 කොරින්ති 15:1-4** දක්වා, පාවුල්තුමා විස්තර කරයි.

**1 කොරින්ති 15 : 1 - 4 :-**

**'' තවද සහෝදරයෙනි, මම නුඹලාට දේශනාකළාවූ, නුඹලා පිළිගත්තාවූ, නුඹලා පිහිටා සිටින්නාවූ, නුඹලා ගැළවීමට පැමිණෙව්වාවූ ශුභාරංචිය නුඹලාට දන්වමි.**

**........ එනම්, ලියවිලිවල ප්‍රකාරයට අපේ පව් නිසා ක්‍රිස්තුස්වහන්සේ මැරුණු බවත්, උන්වහන්සේ තැන්පත්කරනු ලැබූ බවත්,**

**ලියවිලිවල ප්‍රකාරයට තුන්වෙනිදා උන්වහන්සේ නැගුටුවනු ලැබූ බවත්,**

**කේපස්ටද පසුව දොළොස් දෙනාටද පෙනුණු බවත්ය. ''**

ප්‍රේමණීය දේව දරුව, කිතුනු අපගේ <u>එකම ඇදහිල්ල</u> මෙය වන අතර, ඉහත පදවල සඳහන් <u>සියල්ලම සිදුවූයේ ශුද්ධ ලියවිල්ල අනුව</u> බව තේරුම්ගන්න. මෙම තේරුම්ගැනීම තුළින්, කිතුනු ජීවිතයට නොහොත් කිතුනු හැසිරීමට ඍජුව බලපාන්නාවූ කරුණු දෙකක් ඔබ ඉදිරියේ තබමි.

(i) ''එක ඇදහිල්ලක්'' ඇත්තාවූ අප හට, <u>එම ඇදහිල්ලට</u>, නැකත් වේලා බැලීම, අන් දෙවිවරුන්ට නමස්කාර කිරීම, වැනි ක්‍රියාවන්ද අවංකවූ අන් ආගමිකයන්ටද ගැළවීම ලැබෙනු ඇත වැනි අදහස්ද <u>කිසිසේත් එකතුකළ නොහැක</u>.

(ii) **1 කොරින්ති 15 : 1-4** යන කොටසෙහි සඳහන්වන්නාවූ ශුභාරංචියේ, සියල්ලම සිදුවූයේ ''<u>ලියවිලිවල ප්‍රකාරයට</u>'' බැවින්, එකම ඇදහිල්ලට ඇතුල්වී සිටින අපගේ <u>හැසිරීමේ පදනම</u> විය යුත්තේ දේව වචනයයි. නොඑසේනම් අප සැම ජීවත්විය යුත්තේ දේව වචනය නොහොත් ''ශුද්ධ ලියවිල්ල'' අනුවයි.

(b) **එක බව්තීස්මයත්**

'' එකම බව්තීස්මය'' පිළිබඳව, දේව වචනයේ සඳහන් - වන්නාවූ, අදාල පද කිහිපයක් දෙස බලමු.

**1 කොරින්ති 12 : 13 :-**

**'' මක්නිසාද යුදෙව්වරු නොහොත් ග්‍රීක්වරු වෙත්වා, දාසයෝ නොහොත් නිර්දාසයෝ වෙත්වා, අපි සියල්ලෝ එකම ආත්මයාණන්වහන්සේ තුළ එකම ශරීරයට බව්තීස්ම කරනු ලැබ, සියල්ලෝ එකම ආත්මයාණන්වහන්සේගෙන් පොවනු ලැබීමුව.''**

**ගලාති 3 : 27 :-**

**'' මක්නිසාද නුඹලාගෙන් ක්‍රිස්තුස්වහන්සේ තුළට බව්තීස්ම කරනු ලැබූ සියල්ලෝ ක්‍රිස්තුස්වහන්සේ පැළඳගත්තෝය.''**

**රෝම 6 : 3 :-**

**'' නොහොත් ක්‍රිස්තුස්වහන්සේ යේසුස්වහන්සේ තුළට බව්තීස්ම ලැබුවාවූ අප සියල්ලත් ...... ''**

ඉහත සඳහන් පදවලින් අපට පෙනීයන්නේ, ශුද්ධාත්ම - යාණන්වහන්සේ විසින් අපව ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළට බව්තීස්ම කර ඇති බවයි. ඕනෑම මනුෂ්‍යයෙක් ස්වාමීවූ යේසුස්වහන්සේ තම ගැළවුම්කාරයා ලෙස පිළිගෙන, තම ජීවිතය උන්වහන්සේට භාරදෙන අතර, ශුද්ධාත්මයාණන්වහන්සේ ඔහුව ක්‍රිස්තුස්වහන්සේ තුළට බව්තීස්ම කරන සේක.

පාවුල්තුමා මෙහි සඳහන්කරන්නාවූ ''එක බව්තීස්මය'', අප බාහිරව සිදුකරන්නාවූ දෙයකට වඩා, අප අභ්‍යන්තරයෙහි සිදුවන්නාවූ ආත්මික පරිවර්තනයයි.

මාගේ ප්‍රේමණීය සහෝදර සහෝදරියෙනි, ඔබ සැබවින්ම සමිඳුන්ට ඔබගේ ජීවිතය කැපකර, මෙම ''එකම බව්තීස්මය'' ලැබ, දේව දරුකමට ඇතුල්වී සිටිනවාද කියා ඔබගෙන්ම අවංකව විමසා බලන්න.

(c) **එක ශරීරයත්**

**එපීස 1 : 23 :- '' ඒ සභාව නම්, සියල්ලන් තුළ සියල්ල සම්පූර්ණකරන තැනන්වහන්සේගේ පූර්ණකම වන උන් - වහන්සේගේ ශරීරයය. ''**

**1 කොරින්ති 12 : 27 :- '' ඉඳින් නුඹලා ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයද, වෙන් වෙන් වශයෙන් එහි අවයවයෝද වෙති. ''**

**කොලොස්සි 1 : 18 :- '' උන්වහන්සේ සභාව නමැති ශරීරයට හිසව සිටිනසේක ...... ''**

දේව වචනය අපට පෙන්වාදෙන්නේ, සභාව යනු ක්‍රිස්තුස් වහන්සේගේ ශරීරය බවත්, මෙම සභාවට අයිති අප සැම වෙන් වෙන් වශයෙන් ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයේ අවයවයන් වන බවත්ය.

(d) **එක බලාපොරොත්තුවත්**

දේව දරුකමට ඇතුල්ව සිටින අප සැමදෙනාට බොහෝ බලාපොරොත්තු තිබේ. ඒවායින් ස්වල්පයක් පහත සඳහන්කිරීමට කැමැත්තෙමි.

(i) **සදාකාල ජීවනය තිබීම (යොහන් 3 : 36)**

(ii) **විනිශ්චයට පත් නොවීම (යොහන් 5 : 24)**

(iii) **ජරාවට නොපැමිණෙන්නාවූ, නොකිලුටුවූ, පහ නොවන්නාවූ උරුමයක්, අපට ස්වර්ගයෙහි තිබීම (1 පේත්‍රුස් 1 : 4)**

(iv) **දේව පුත්‍රයෙකුගේ උරුමය ලැබීම (ගලාති 4 : 7)**

(v) **ක්‍රිස්තුස්වහන්සේ හා සමඟ දෙවියන්වහන්සේගේ හවුල් උරුමක්කාරයෙක් වීම (රෝම 8 : 17)**

අපගේ පියවූ දෙවියන්වහන්සේ, නොවෙනස්වන්නාවූද බොරු නොකියන්නාවූද දෙවියන්වහන්සේ වන බැවින්, උන්වහන්සේගේ වචනය අනුව අප බලාපොරොත්තු - වන්නාවූ මේ සැමදේ සහ බොහෝ ආශිර්වාද නිසැකවම අප ලබන්ට යන්නෙමු.

එබැවින් මෙය කියවන්නාවූ ඔබ, උන්වහන්සේ **ඔබ උදෙසා සූදානම් කර ඇති උරුමය ගැන නිතරම උන්වහන්සේට ස්තූති ප්‍රශංසා පුදන්න** කියා මා ඉල්ලා සිටින්නේ, දෙවියන්-වහන්සේගේ පෙළඹවීම නිසා වේ.

❖ ත්‍රිත්ව දෙවියන්වහන්සේගේ ඒකත්වය සහ එකම ඇදහිල්ල, බව්තීස්මය, ශරීරය සහ බලාපොරොත්තුව අතර ඇත්තාවූ සම්බන්ධතා වෙත ඔබගේ අවධානය යොමුකිරීමට කැමැත්තෙමි.

(i) සභාව ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරය වන අතර, ඇත්තේ එකම ක්‍රිස්තුස්වහන්සේ පමණක් බැවින්, අනිවාර්ය - යෙන්ම ඇත්තේ එක ශරීරයක් විය යුතුමය.

(ii) මෙම ශරීරයට අප බව්තීස්ම කරනු ලබන්නේ එකම ශුද්ධාත්මයාණන්වහන්සේ විසින් බැවින්, ඇත්තේ එක බව්තීස්මයක්ද විය යුතුමය.

(iii) ඇත්තේ එකම ක්‍රිස්තුස්වහන්සේ පමණක් බැවින් උන් - වහන්සේ කෙරෙහි ඇදහිල්ල සහ බලාපොරොත්තුවද, එකක්ම විය යුතුවේ.

(iv) මේ අන්දමින් කිතුනු ඇදහිල්ල, බව්තීස්මය, ශරීරය සහ බලාපොරොත්තුව යන සියල්ල එකකට වඩා වීමට නොහැකිවන අතර, මේ හතරම සෘජුව ත්‍රිත්ව දෙවියන් - වහන්සේට සම්බන්ධ වේ. එබැවින්, ත්‍රිත්ව දෙවියන් - වහන්සේගේ ඒකත්වය තුළින් උන්වහන්සේට සෘජුවම සම්බන්ධවන්නාවූ මෙම කිතුනු අත්දැකීම්වල ඒකත්වය පැන නැගෙයි.

ප්‍රේමණීය දේව දරුව, කිතුනු සභාව වන ක්‍රිස්තුස් - වහන්සේගේ ''එක ශරීරය'' දෙස බලන ලෝකයා, එහි ඇති ඒකත්වය දකිනවාද නොහොත් කිතුනු සභාව තුළින් ''ඒකත්වය'' ලොවට ප්‍රකාශ වනවාද ? යන ප්‍රශ්නය ඔබගෙන්ම අසාගන්න.

මෙම ප්‍රශ්නයට අප අවංකව පිළිතුරු දුන්නොත් අප සැමගේ පිළිතුර වන්නේ ''කෙසේවත් නැහැ'' හෝ ඊට සමාන පිළිතුරක් විය හැකියි.

**එපීස 4 : 4 - 6** දක්වා කිතුනු සභාව පිළිබඳව අප ඉගෙන ගන්නාවූ ''දේව ධර්මය'' සහ ලෝකයා සභාව දකින ආකාරය එකිනෙකට වෙනස් වන අතර, **දේව දරුවන් වූ අප සැම, මෙහි වෙනසක් ඇති කිරීම උදෙසා, ක්‍රියා කළ යුතුවේ.**

## 2. සභාවේ ඒකත්වය පැවතීමේ වැදගත්කම සහ ඒ සම්බන් - යෙන් කිතුනුවාගේ වගකීම

### (A) සභාවේ සැමදෙනා නිසි අයුරින් අප සැලකිය යුතුය

පසුගිය අධ්‍යයනයේදී, අපගේ ''කැඳවීමට ඔබින ලෙස හැසිරීම'' උදෙසා, යටහත්කමින්ද, මොළොක් ගුණයෙන්ද, ඉවසිලිවන්තකමෙන්ද, ප්‍රේමයෙන්ද (**එපීස 4 : 2**) අප එකිනෙකා සැලකිය යුතු බව අප ඉගෙන ගතිමු. මෙසේ අප අන් අය සැලකීම තුළින් සභාවේ එකමුතුකම පවත්වාගෙන යෑමේ වැදගත්කමද අප තේරුම් ගතිමු. එම අධ්‍යයනයේදී, අපගේ හැසිරීම නොහොත් ක්‍රියා කිරීම තුළින් එකමුතුකම රැකගැනීම උදෙසා ඉතා වැදගත් බවද අප දුටිමු.

මේ අතර, සභාවේ තිබිය යුතු ඒකත්වය සහ එකමුතුකම **" ආත්මයාණන්ගේ එකමුතුකම " (එපීස 4 : 3)** වන බැවින්, එය ආත්මයාණන්වහන්සේ තුළින් මිස අපගේ ක්‍රියාවලින් ඉටු කළ නොහැකි බව යමෙක් තර්ක කිරීමට ඉඩ ඇත. මෙම අදහස වැරදි නොවන අතර, එය නිවැරදිද නොවේ. ඒකත්වය ඇතිකිරීම උදෙසා අපගේ ක්‍රියාකිරීම අතිශයින් වැදගත්වේ.

එය උදෙසා අපගේ ක්‍රියාකිරීම විය යුත්තේ, **යේසුස්වහන්සේට සම්පූර්ණයෙන්ම කැපවී, කීකරුවී, උන්වහන්සේ තුළ පැවතීමය.** අප මෙසේ ක්‍රියාකරන අතර, ශුද්ධාත්මයාණන්වහන්සේගේ ඵල වන **ප්‍රේමය, ප්‍රීතිය, සමාදානය, ඉවසිලිවන්තකම, කරුණාවන්තකම, යහපත් - කම, විශ්වාසකම, මෘදුකම සහ පමණ දැන ක්‍රියාකිරීම (ගලාති 5 : 22)** අපගේ ජීවිතවල වර්ධනය වනවා ඇත.

**එපීස 4 : 2** හි සඳහන් අපගේ **" කැඳවීමට ඔබින ලෙස හැසිරීමේ ගුණාංග "** වලින් බහුතරයක්, **ගලාති 5 : 22** හි සඳහන් ශුද්ධාත්මයාණන්වහන්සේගේ ඵල අතරෙහි සඳහන් වීම අපට පෙන්වාදෙන්නේ, යේසුස්වහන්සේ තුළ පවතිමින් අප ක්‍රියාකරන අතර, ''ආත්මයාණන්ගේ එකමුතුකම'' සභාවේ ඇති වන බවයි.

දේව දරුවෙනි, අප සැම දෙන -

(a) **" ආත්මයාණන්වහන්සේ කරණකොටගෙන හැසිරෙමු " (ගලාති 5 : 16)**

(b) (සභාවේදී) **" තරාතිරම් නොසලකා " (යාකොබ් 2 : 1-3)** හැසිරෙමු.

(c) ක්‍රිස්තුස්වහන්සේගේ ''එකම ශරීරයේ'' අවයවයක් ලෙස සභාවේ අන් අය සලකමින් හැසිරෙමු.
(කරුණාකර **1 කොරි. 12 : 21, 22, 26 කියවන්න**)

❖ අප අන් අය සලකන ආකාරය බොහෝවිට රඳා පවතින්නේ, අප අප දෙසම බලන්නාවූ ආකාරය මතයි.

**නිදසුනක් වශයෙන්,** අප අන් අය දෙස බලනවිට, අප නොදැනුවත්වම කරන්නාවූ දෙයක් වන්නේ, ඔවුන්ව අප සමඟ සසඳා බැලීමයි. එමනිසා සභාවේ බොහෝ දෙනා ගැන (නොදැනුවත්වම) අප සිතන්නේ, ''මම එයාට වඩා හොඳයි - දක්ෂයි - උගත් - පොහොසත්'' වැනි ආකාරයෙන්ය.

දේව දරුව, මෙම ප්‍රශ්නය ඔබ ඔබගෙන්ම අසාගන්න. **මම මාව දකින්නේ කුමන ආකාරයටද ?** මෙම ප්‍රශ්නයට ඔබ පිළිතුරු සපයන්ට මත්තෙන් දේව වචනයේ පද කිහිපයක් ඔබගේ මතකයට නැංවීමට කැමැත්තෙමි.

**එපීස 1 : 6 :-**
**'' .... පුත්‍රයන් වීමට අප පෙරනියම කළසේක. ''**

**එපීස 3 : 1 :-**
**'' .... ක්‍රිස්තුස්වහන්සේගේ හිරකාරවූ පාවුල් නම් මම .... ''**

**එපීස 3 : 8 :-**
**'' සියලු ශුද්ධවන්තයින්ගෙන් ඉතා කුඩා තැනැත්තාවූ මට... ''**

**යාකොබ් 1 : 1 :-**
**'' දෙවියන්වහන්සේගෙත් ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ - ගෙත් දාසයෙක්වූ යාකොබ්. ''**

කිතුනු සභාවේ බොහෝ දෙනා තමා දෙවියන්වහන්සේගේ පුත්‍රයෙක් ලෙස **(එපීස 1 : 6)** දකින නමුත්, '' හිරකාරයෙක් '', '' ඉතාම කුඩා තැනැත්තා '' හෝ '' දාසයෙක් '' ලෙස තමාව දකින්නේ ඉතා සුළුතරයක් වේ.

දේව දරුව, අප සැබවින්ම **'' අපගේ කිසිම සුදුසුකමක් නිසා නොව, දෙවියන්වහන්සේගේ අනුග්‍රහය නිසා සමාව ලබා ඇත්තාවූ පව්කාරයන් ''** බව තේරුම් ගන්න. සභාවේ සැම කෙනෙක්ම තමාව මෙලෙස දකිමින් -

**'' සියලු ශුද්ධවන්තයින්ගෙන් ඉතා කුඩා තැනැත්තා ''**

**(එපීස 3 : 8)** මම වෙමි, කියා සලකනවා නම්, සභාව තුළ ඒකත්වය ඇති කිරීමට, එය මහත් සේ ඉවහල් වනවා ඇත.

**නිදසුනක් වශයෙන්,** ඇමෙරිකාවේ ජනාධිපතිවරයෙක් වූ ඒබ්‍රහම් ලින්කන් පිළිබඳව, සත්‍ය සිදුවීමක් ඔබ ඉදිරියේ තබමි.

එක් අවස්ථාවකදී, දේශපාලකයෙකුගේ බලපෑම මත, ලින්කන් ජනාධිපතිතුමා විසින්, ඇමෙරිකාවේ යුද්ධ ලේකම්තුමා වෙත, රෙජිමේන්තුවක් වෙනත් ස්ථානයකට මාරුකර යවන ලෙස නියෝගයක් යවන ලදී. මෙය ලැබූ ලේකම් තුමාගේ ප්‍රතිචාරය වූයේ, '' මේ මහ මෝඩ නියෝගයක්, එම නිසා මම මෙයට කිසිසේත් අවනත වන්නේ නෑ '' යන්නයි. ලේකම්තුමා දක්වූ ප්‍රතිචාරය සැලවූ ජනාධිපතිතුමා පැවසුවේ, '' ඔහු එසේ පැවසුවා නම්, ඔහු නිවැරදි ඇති. මෙවැනි දේ ගැන ඔහුට හොඳ අවබෝධයක් තිබෙනවා '' යනුවෙනි. පසුව ඔහු විසින් ලේකම්තුමා කැඳවා, ඔහු සමඟ සාකච්ඡා කොට, තම වරද පිළිගෙන, එම නියෝගය ඉවත්කරගන්නා ලදී.

(බොහෝවිට කිතුනු සභාව තුළ අප ක්‍රියාකරන අන්දම මීට හාත්පසින් වෙනස් වේ)

(B) **සභාවේ ඒකත්වය පිළිබඳව දේව කැමැත්ත තේරුම්ගෙන, අප ඒ අනුව ක්‍රියා කල යුතුය**

**යොහන් 17 වන පරිච්ඡේදයේ,** යේසුස්වහන්සේ කළාවූ යාච්ඤාව ගැන සෑම කිතුනුවෙක්ම අසා තිබෙන බව නිසැකය. උන්වහන්සේ මෙම යාච්ඤාව කළේ තම ගෝලයන් උදෙසා පමණක් බව අප සිතන නමුත්, මෙම යාච්ඤාවට උන්වහන්සේ අප සෑමදෙනාද ඇතුලත් කළ බව දේව වචනයෙන් පෙනීයයි.

**යොහන් 17 : 20 - 22 :-**

**'' මොවුන් ගැන පමණක් නොව, <u>මොවුන්ගේ වචනය කරණකොටගෙන මා කෙරෙහි විශ්වාස කරන්නවුන්</u> ගැනත්, ඔවුන් සියල්ලන් ඒකත්වයක් වන පිණිස, පියවූ ඔබ මා තුළෙහිද මා ඔබ තුළෙහිද සිටින්නාක් මෙන්ම, .... <u>අප තුළ ඔවුන් ඒකත්වයක් වන පිණිසත් යාච්ඤාකරමි</u>. <u>අප ඒකත්වයක්ව සිටින්නා සේම ඔවුනුත් ඒකත්වයක් වන පිණිස</u>, ඔබ මට දුන් මහිමය ඔවුන්ට දුනිමි. ''**

අපගේ ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ, මහත් වුවමනාවකින් දෙවිපියාණන්වහන්සේගෙන් ඉල්ලා සිටින්නේ, මුල් ගෝලයින් පමණක් නොව, ඔවුන් තුළින් ඇදහිල්ලට පැමිණ බිහිවන්නාවූ සභාව ඒකත්වයක් කරන ලෙසය. උන්වහන්සේ ඉල්ලා සිටින්නේ පියාණන්වහන්සේ සහ පුත්‍රයාණන්වහන්සේ ඒකත්වයක්ව සිටින ලෙසම සභාව ඒකත්වයක් කරන ලෙසය.

**යොහන් 17 : 11 :-**

**" ශුද්ධවූ පියාණෙනි, අප ඒකත්වයක්ව සිටින්නාක් මෙන්ම ඔවුන්ද ඒකත්වයක් වන පිණිස, ඔබ මට දුන් ඔවුන් ඔබගේ නාමයෙන් ආරක්ෂා කළ මැනව. "**

දේව දරුව, දෙවියන්වහන්සේගේ කැමැත්ත වන්නේ ත්‍රිත්ව දෙවියන්වහන්සේ තුළ ඇත්තාවූ ඒකත්වය සභාව තුළද ඇතිවීමයි. යේසුස්වහන්සේ සභාව උදෙසා **යොහන් 17** හි කරන්නාවූ ඉල්ලීමද මෙය වන අතර, දෙවියන්වහන්සේ අපව කැඳවා ඇත්තේ යේසුස්වහන්සේ මෙන් වීමටයි. එබැවින් යේසුස්වහන්සේගේ මෙම යාච්ඤාවට අපද එක්විය යුතුවේ. **අප සැමද මුලු හදවතින් සභාවේ ඒකත්වය ඇතිකිරීමට සහ වර්ධනය කිරීමට කැප විය යුතුවේ.**

එබැවින් අප සැම, **" සමාදානයේ බැම්මෙන් ආත්මයාණන්ගේ එකමුතුකම පවත්වාගන්ට උත්සාහ කරන්න " (එපීස 4 : 3)** යන (දේව කැමැත්ත අනුව කරනු ලබන්නාවූ) ඉල්ලීම ඉටුකිරීම අතපසු නොකරමු.

(C) **සභාවේ ඒකත්වය ස්වර්ගීය ස්ථානවල වැඩවසන සියල්ලන්ට දෙවියන්වහන්සේගේ ප්‍රඥාව ප්‍රකාශවන නිසා, අප එම ඒකත්වය රැකගත යුතුය**

කරුණාකර **එපීස 3 : 6, 9-11** කියවන්න. මේ පිළිබඳව එපීස 5 වන අධ්‍යයනයෙහිදී, ඉගැන්වූ නිසා, නැවතත් එය විස්තරාත්මකව මෙහිදී ඉගැන්වීමට අදහස් නොකරමි. මෙනමුත් සභාවේ ක්‍රියාකාරිත්වය බලාසිටින්නාවූ සමූහයක් අප අවට සිටින බව ඔබට මතක්කර දීමට කැමැත්තෙමි. මේ සමූහයට අයිති වන්නාවූ වැදගත් කණ්ඩායම් හතරක් වන්නේ මේවාය.

(i) **ලෝකය**

- සැබවින්ම සභාව දෙස බලන්නාවූ ලෝකයා දකින්නේ කුමක්ද ?
- එක්සත්කමද නැතහොත් බෙදීමද ?
- සහයෝගයද නැතහොත් තරඟකාරීකමද ?
- යටහත්කමද නැතහොත් උඩඟුකමද ?

(ii) **අපගේ දරුවන් හෝ තරුණ පරපුර**

- ඔවුන් සභාව තුළ දකින්නේ මොනවාද ?
- වැඩිහිටියන් ප්‍රකාශකරන දේ ඔවුන් ඉටුකරන බව දකිනවාද ?
- සභාවේ හැසිරීම සහ ගෙදර හැසිරීම අතර බරපතල වෙනසක් දකිනවාද ?
- සභාවේ අප ආදරයෙන් කතාකරන අයව, ගෙදරදී දරුණු ලෙස විවේචනය කිරීම අසනවාද ?

(iii) **ස්වර්ගීය සේනාවන්**

- දෙවියන්වහන්සේගේ සදාකාල අභිප්‍රාය ප්‍රකාරයට, සභාව ක්‍රියා කිරීම දකිනවාද ?

(iv) **සාතන් සහ සාතන්ගේ දාසයන්**

- සභාව තුළ, දේව කැමැත්තට විරුද්ධ බොහෝ දේ, සිදුවනවා දකිමින් මොවුන් සතුටු වනවාද ?

දේව දරුව, සභාවේ ඒකත්වය ඇතිකිරීම සහ රැකගැනීම, අප සැමදෙනාගේ වගකීමක් වෙයි. විවිධාකාර හේතූන් නිසා, මෙය ඉතා දුෂ්කර වුවත්, එසේ කිරීමට අප උත්සාහ කරමු.

**සභාවේ ඒකත්වය උදෙසා යාච්ඤාකරමු.**

**දෙවියන්වහන්සේට සැමදේදීම යටත් වෙමු.**

**ශුද්ධාත්මයාණන්වහන්සේ කරණකොටගෙන හැසිරෙමු.**

**එසේ කිරීමට දෙවියන්වහන්සේම**

**ඔබට පිහිටවන සේක්වා !!**

## සටහන

..........................................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................

## සටහන

..............................................................................

..............................................................................

..............................................................................

..............................................................................

..............................................................................

..............................................................................

..............................................................................

..............................................................................

..............................................................................

..............................................................................

..............................................................................

..............................................................................

..............................................................................

..............................................................................

..............................................................................

..............................................................................

..............................................................................

..............................................................................

..............................................................................

..............................................................................

..............................................................................

..............................................................................

..............................................................................

..............................................................................

..............................................................................

..............................................................................

## සටහන

# ක්‍රිස්තුස්වහන්සේ අපට දී ඇත්තාවූ දීමනා



# එපීස අධ්‍යයනය 09

# ක්‍රිස්තුස්වහන්සේ අපට දී ඇත්තාවූ දීමනා

**එපීස 4 : 7 - 11**

**<u>හැඳින්වීම</u> :-**

පසුගිය අධ්‍යයනයේදී සභාවේ ඒකත්වය දෙස අප බැලූ අතර, කිතුනු අපට ඇත්තේ ත්‍රිත්වයක් වන්නාවූ එකම දෙවියන්වහන්සේත්, එකම ඇදහිල්ලත්, එකම බව්තීස්මයත්, එකම ශරීරයත්, එකම බලාපොරොත්තුවත් බව අප තේරුම් ගත්තෙමු.

මේ අතර, ඒකත්වයක් වන්නාවූ කිතුනු සභාව සමන්විත වන්නේ අනේකාකාර දීමනා විවිධාකාර ප්‍රමාණවලට ලබා ඇත්තාවූද, එලෙසම අත්දකින්නාවූද පුද්ගලයන්ගෙනි.

මෙම අධ්‍යයනය මඟින් අප අපගේ අවධානය යොමු කිරීමට යන්නේ, ක්‍රිස්තුස්වහන්සේ අපට ප්‍රධානය කර ඇති දීමනා දෙස සහ එම දීමනා ලබා ඇති අපට උන්වහන්සේ පවරන්නාවූ කැඳවීම් සහ වගකීම් දෙසය.

**<u>අධ්‍යයනය</u> :-**

1. **<u>දෙවියන්වහන්සේ සහ ක්‍රිස්තුස්වහන්සේ අපට දක්වන්නාවූ අනුග්‍රහය - එපීස 4 : 7</u>**

**එපීස 4 : 7:-**

**" නුමුත් අපෙන් එක් එක්කෙනාට ක්‍රිස්තුස්වහන්සේගේ දීමනාවේ ප්‍රමාණයේ හැටියට <u>අනුග්‍රහය</u> දෙන ලද්දේය. "**

කිතුනු අප සැම, දෙවියන්වහන්සේගේ අසීමිත අප්‍රමාණ ආශිර්වාද ලබා ඇත්තේ උන්වහන්සේගේ අනුග්‍රහය නිසාය. උන්වහන්සේගේ අනුග්‍රහය වැඩි දුරට තේරුම් ගන්නා පිණිස, එම අනුග්‍රහය නිසා අප ලබන්නාවූ සුවිශේෂ ආශිර්වාද දෙකක් ඔබට මතක් කර දීමට කැමැත්තෙමි.

(i) දෙවියන්වහන්සේගේ අනුග්‍රහය නිසා අප ලබා ඇති ගැළවීම

**එපීස 2 : 5, 6 :-**

" **..... අපගේ වරද කරණකොටගෙන අප මැරී සිටි කල්හි පවා, ක්‍රිස්තුස්වහන්සේ සමග අප ජීවත්කර - <u>නුඹලා ගැළවී සිටින්නේ අනුග්‍රහයෙන්ය</u> - උන්වහන්සේ සමග අප නැගුටුවා, ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ ස්වර්ගීය ස්ථානවල උන්වහන්සේ සමග අප හිඳවූ සේක.** "

**එපීස 2 : 8 :-**

" **මක්නිසාද ඇදහිල්ල කරණකොටගෙන <u>ඒ අනුග්‍රහයෙන් නුඹලා ගැළවී සිටින්නහුය</u> .....** "

දෙවියන්වහන්සේ තමන්වහන්සේගේ අනුග්‍රහය නිසා අපට ගැළවීම ලබාදී, පාපය නිසා ආත්මික මරණයට පත්ව සිටි අපව, " **යේසුස්වහන්සේ තුළ ස්වර්ගීය ස්ථානවල හිඳවූ සේක.** " **(එපීස 2 : 6)**

අදහන්නාවූ සැමදෙනාටම දෙවියන්වහන්සේගේ අනුග්‍රහය තුළින්, ගැළවීම ලැබෙන අතර, එම ගැළවීම සියලු දෙනාටම සම්පූර්ණයෙන්ම (එනම් එකම ප්‍රමාණයට) ලැබේ.

(ii) ක්‍රිස්තුස්වහන්සේගේ අනුග්‍රහය නිසා, සභාවේ සේවය සහ වර්ධනය උදෙසා උන්වහන්සේ ලබා දී ඇති දීමනා

**රෝම 12 : 6 :-**

" **එහෙයින් අපට දෙන ලද <u>අනුග්‍රහය ලෙස</u> <u>වෙන වෙන දීමනා</u> ඇත්තාවූ අපට ලැබුණේ අනාගත කීම නම්, අපේ ඇදහිල්ලේ ප්‍රමාණයට අනාගත වචන කියමු.** "

**එපීස 3 : 7, 8 :-**

" **දෙවියන්වහන්සේගේ බලයේ ක්‍රියාකිරීමේ ප්‍රකාරයට මට දෙන ලද උන්වහන්සේගේ ඒ <u>කරුණාවේ දීමනාව</u> හැටියට මම ඒ <u>ශුභාරංචියේ සේවකයෙක්</u> කරනු ලැබුවෙමි...... මේ <u>අනුග්‍රහය</u> දෙන ලද්දේ ......** "

ඉහත සඳහන් පද දෙක සහ **එපීස 4 : 7** අපට පෙන්නුම්කරන්නේ, ක්‍රිස්තුස්වහන්සේ සභාවේ සේවය සහ වර්ධනය උදෙසා අප '' එකිනෙකාට '' නොහොත් '' එක් එක්කෙනාට '' එනම් **අප සැමදෙනාට විවිධ දීමනා, විවිධ ප්‍රමාණයන්ට ප්‍රධානය කර ඇති බවයි.**

ප්‍රේමණීය දේව දරුව, දෙවියන්වහන්සේ ඔබ කෙරෙහි තබා ඇති විශ්වාසය සහ උන්වහන්සේ ඔබ වෙත පවරා ඇති වගකීම තේරුම් ගන්න.

(i) උන්වහන්සේ අප සැමදෙනාටම අඩුම වශයෙන් එක දීමනාවක් තිළිණ කර ඇත. එම දීමනාව භාවිතා කරමින්, උන්වහන්සේගේ රාජ්‍යය ගොඩනැගීමේ වගකීම, කිසිසේත් පැහැර නොහරින්න. **(මතෙව් 25:14-30 හි සඳහන් තලෙන්ත උපමාව දැන්ම කියවන්න)**

යේසුස්වහන්සේ ඉගැන්වූවාවූ තලෙන්ත උපමාවේ ''නිෂ්ප්‍රයෝජන දාසයා'' ලෙස ක්‍රියාකිරීමට යක්ෂයා ඔබ වෙත ගෙනෙන පරීක්ෂාවෙන් ජයගෙන, ඔබගේ දීමනාව, සේවය සහ සභාවේ වර්ධනය උදෙසා භාවිතා කරන්න.

(ii) උන්වහන්සේ ඔබට ලබා දී ඇති දීමනා ගැන උඩගු නොවන්න, පාරට්ටු නොකරන්න.

**1 කොරින්ති 4 : 7 :- '' මක්නිසාද නුඹට වෙනස්වන්ට සලස්වන්නේ කවුද? නුඹට ලැබුණ දේ හැර නුඹට ඇත්තේ කිමෙක්ද? ඉදින් එය ලැබුණානම් නොලැබුණාක්මෙන් පාරට්ටු කරගන්නේ මක්නිසාද ? ''**

බොහෝවිට ආත්මික දීමනා ලබා ඇති අප වෙත යක්ෂයා උඩගුකමේ පරීක්ෂාව ගෙන එයි. ප්‍රේමණීය දේව දරුව, යක්ෂයාට අසුනොවන්න. උඩගු නොවන්න. යටහත්කම පැළඳගන්න.

**1 පේත්‍රුස් 5 : 5 :- '' ...... නුඹලා සියල්ලෝම එකිනෙකාට මෙහෙකරන පිණිස යටහත්කම පැළඳ ගනිල්ලා. මක්නිසාද දෙවියන්වහන්සේ උඩගු අයට විරුද්ධව සිට යටහතුන්ට කරුණාව දෙනසේක. ''**

**2. <u>ආත්මික දීමනා අපට ප්‍රදානය කරන්නේ ස්වර්ගයට නැංගාවූ ක්‍රිස්තුස්වහන්සේය - එපීස 4 : 8</u>**

**එපීස 4 : 8 :-**

**" එහෙයින් උන්වහන්සේ කථාකොට : උන්වහන්සේ උසස්තැනට නැගුණු කල්හි වහල්කමට ගත්තවුන් වහල්කොට ගෙනගොස්, මනුෂ්‍යයන්ට තෑගි දුන්සේකැයි කියනසේක. "**

මෙම පදයෙන් ප්‍රකාශවන්නේ, කුරුසියෙහි මරුවා පරාජයකොට උත්ථානය වූවාවූ යේසුස්වහන්සේ, ස්වර්ගයට නැගුණු පසු, මනුෂ්‍යයන්ට තෑගි දුන් බවයි.

මෙය පෙන්වීම උදෙසා පාවුල්තුමා සඳහන්කරන්නේ **ගීතාවලිය 68 : 18** වන පදයයි.

**ගීතාවලිය 68 : 18 :-**

**" ඔබ උසස් ස්ථානයට නැගී ගියසේක, වහල්කමට ගත්තවුන් වහල්කමට ගෙන ගිය සේක ..... ඔබ ඔවුන් අතරේ තෑගි ලැබූසේක. "**

**ගීතාවලිය 68:7-18** දක්වා ගීතිකාකාරයා ලියන්නේ, දෙවියන්වහන්සේ තම සෙනඟ මිසරයේ වහල්කමින් මුදා, ඔවුන් පෙරටුව ගමන් කරමින්, ඔවුන්ගේ සතුරන් පලවා - හරිමින්, සියොන් කන්ද තම වාසස්ථානය කරගැනීමට කැමතිවී, එම උසස් ස්ථානයට නැගී ගිය බවයි.

පාවුල්තුමා, අපගේ ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ස්වර්ගයට නැගීම විස්තර කිරීම උදෙසා දෙවියන්වහන්සේ සියොන් කන්දේ ගොඩනඟන ලද, යෙරුසලමේ දේව මාළිගාවට නැගීම පිළිබඳව **ගීතාවලිය 68 : 18 වන පදය** සඳහන්කරන අතර, **" වහල්කමට ගත්තවුන් වහල්කමට ගෙනගොස් "** යන්නේ අර්ථය වටහාගැනීම වැදගත් වේ. මෙය උදෙසා **කොලොස්සි 2 : 15** දෙස බලමු.

**කොලොස්සි 2 : 13-15 :-**

**" ..... එසේය, උන්වහන්සේ අපේ සියලු වරද අපට කමාකළ සේක ; අපට විරුද්ධව, අපට එදිරිව තිබුණාවූ නියෝගවල ලියවිල්ල මකා දමා, ඒක කුරුසියෙහි ඇණගසා අහක් කළසේක. උන්වහන්සේ තමන් කෙරෙන් අධිපතීන්ද, බලයලත්තන්ද පහකොට, ප්‍රසිද්ධියෙන් ඔවුන් දක්වා, කුරුසිය කරණකොටගෙන ඔවුන්ගෙන් ජයගත් බව ප්‍රකාශකළ සේක. "**

මේ අනුව අප දකින්නේ, කුරුසිය කරණකොටගෙන, යේසුස්වහන්සේ මනුෂ්‍යයාව පාපයේ වහල්කමට හසුකරගෙන සිටියාවූ 'අධිපතීන්ද, බලයලත්තන්ද' පරදවා, වහල්කම ගෙන, ස්වර්ගයට නැගුණු බවයි.

❖ **ගීතා. 68 : 18** උපුටා ගන්නාවූ පාවුල්තුමා, එහි සඳහන් **" ඔබ ඔවුන් අතරේ තෑගි ලැබූ සේක "** යන වචන **" මනුෂ්‍යයන්ට තෑගි දුන් සේක "** ලෙස **එපීස 4 : 8** හි සඳහන් කරයි. ඔහු මෙසේ වෙනස් කිරීමක් කර ඇත්තේ මන්ද ? කියා අසන්නාවූ අප දකින්නේ, **ගීතාවලිය 68** ලියන ලද කාලයේ, සටනකින් ජයගත් රජකෙනෙක් බොහෝවිට ඔහු ලැබුවාවූ ''කොල්ලය'' තම සෙනඟට තෑගි කළ බවයි. මෙම හේතුව නිසා ''තෑගි ලැබූ සේක'' සහ ''තෑගි දුන්සේක'' යන දෙකම, සටනකින් ජයගත් රජකෙනෙකු පිළිබඳව කියැවෙන බව, නිවැරදි වේ. (**කරුණාකර 1 සාමුවෙල් 30:26 කියවා බලන්න**)

අපගේ රජතුමා වන්නාවූ, යේසුස්වහන්සේ අපගේ සතුරාව කුරුසිය මත පරාජය කොට, ස්වර්ගයට නැග දින 10 කට පසු, සභාව මත පෙන්තකොස්ත දින ශුද්ධාත්මයාණන් - වහන්සේ වැගිරෙව්ව බව ඔබට මෙහිදී මතක් කිරීමට කැමැත්තෙමි.

❖ එදා යුදෙව් සිනගෝගවල, පෙන්තකොස්ත මංගල්‍යය සම්බන්ධව **ගීතාවලිය 68** භාවිතා කළ බව, බයිබල් විචාරකයෝ පෙන්වා දෙති. මේ අනුව, ස්වර්ගයට නැංගාවූ යේසුස්වහන්සේ, දින දහයකට පසු '' පෙන්තකොස්ත '' දවසේදී ශුද්ධාත්මයාණන්වහන්සේ නමැති දීමනාව සභාවට දීම තුළින්, **එපීස 4 : 8** හි සඳහන් **" දීමනා දුන්සේක "** යන්නේ අරුත, අපට තව දුරටත් පැහැදිලි වේ.

## 3. <u>යේසුස්වහන්සේ එක් එක්කෙනාට ලබා දී ඇති දීමනා</u>

යේසුස්වහන්සේ සභාවේ එකිනෙකාට ලබා දී ඇති දීමනා සහ කැඳවීම් සඳහන් බයිබල් පද ඔබ ඉදිරියේ තබමි.

**1 කොරි. 12 : 8-10 ; 28-30 ; රෝම 12 : 6-8 ; 1 පේත්‍රුස් 4 : 10, 11 ; එපීස 4 : 11**

මේ පදවල සඳහන් දීමනා සහ කැඳවීම් මෙසේය.

| | | |
|---|---|---|
| (i) | ප්‍රඥාවේ වචනය | - **1 කොරි. 12 : 8** |
| (ii) | දැනගැනීමේ වචනය | - **1 කොරි. 12 : 8** |
| (iii) | ඇදහිල්ල | - **1 කොරි. 12 : 9** |
| (iv) | සුවකිරීමේ දීමනාව | - **1 කොරි. 12 : 9, 28** |
| (v) | ආශ්චර්ය කිරීම | - **1 කොරි. 12 : 10, 28** |
| (vi) | ධර්මවාක්‍ය කීම | - **1 කොරි. 12 : 10** |
| (vii) | ආත්මවල් විමසීම | - **1 කොරි. 12 : 10** |
| (viii) | නානා වර්ග භාෂා | - **1 කොරි. 12 : 10, 28** |
| (ix) | භාෂා තේරුම් කරදීම | - **1 කොරි. 12 : 10, 30** |
| (x) | ප්‍රේරිතයන් | - **1 කොරි. 12 : 28, එපීස 4 : 11** |
| (xi) | අනාගතවක්තෘවරුන් | - **1 කොරි. 12 : 28, එපීස 4 : 11** |
| (xii) | ගුරුවරුන් | - **1 කොරි. 12 : 28, එපීස 4 : 11** |
| (xiii) | උපකාර කිරීම | - **1 කොරි. 12 : 28** |
| (xiv) | ආණ්ඩු කිරීම | - **1 කොරි. 12 : 28, රෝම 12 : 8** |
| (xv) | අනාගතවාක්‍ය කීම | - **රෝම 12 : 6** |
| (xvi) | සේවය කිරීම | - **රෝම 12 : 7, 1 පේත්‍රුස් 4 : 1** |
| (xvii) | ඉගැන්වීම | - **රෝම 12 : 7** |
| (xviii) | උපදෙස් දීම | - **රෝම 12 : 8** |
| (xix) | දීම | - **රෝම 12 : 8** |
| (xx) | කරුණාව පෙන්වීම | - **රෝම 12 : 8** |
| (xxi) | කථා කිරීම | - **1 පේත්‍රුස් 4 : 11** |
| (xxii) | ශුභාරංචිය ප්‍රකාශ කරන්නන් | - **එපීස 4 : 11** |
| (xxiii) | සභා පාලකයන් | - **එපීස 4 : 11** |

මෙම ලැයිස්තුවෙහි අප ලබා ඇත්තාවූ දීමනා සහ කැඳවීම් 23 ක් සඳහන්වන අතර, මෙය සම්පූර්ණ ලැයිස්තුවක් නොවේ.

මෙහි සඳහන් දීමනා පිළිබඳව ඔබ දන්නා බැවින් ඒවා ගැන දීර්ඝ විස්තර කිරීමක් අනවශ්‍ය වන නමුත්, සමහර දීමනා ගැන ඉතා කෙටි පැහැදිලි කිරීම්, පහත දක්වමි.

**ප්‍රඥාවේ වචනය :-**
යම්කිසි අවස්ථාවකදී, ක්‍රියා කිරීම උදෙසා ලැබෙන විශේෂ දේව මඟපෙන්වීම. (යේසුස්වහන්සේව වරදට අසුකර ගැනීම පිණිස, ඵරිසිවරු ඇසූ ප්‍රශ්නවලට උන්වහන්සේ දුන් පිළිතුරු, මෙම දීමනාව පෙන්නුම් කරයි).

**දැනගැනීමේ වචනය :-**
යම්කිසි තැනැත්තෙක් හෝ තත්ත්වයක් පිළිබඳව ලැබෙන එළිදරව් කිරීමක් (**යොහන් 1:47,48** යේසුස්වහන්සේ නතානියෙල්ට කී වචන මෙම දීමනාව පෙන්නුම් කරයි).

**ඇදහිල්ල :-**
අප සැම දෙනාට ඇදහිල්ල තිබෙන අතර ශුද්ධාත්ම දීමනාවක් ලෙස ලබන ඇදහිල්ල, ''යම්කිසි අවස්ථාවක දෙවියන්වහන්සේ විශේෂ ලෙස ක්‍රියාකිරීමට යන බවට, ශුද්ධාත්මයාණන්වහන්සේ දෙන්නාවූ සහතිකයක් '' ලෙස විස්තර කළ හැක.

**ආශ්චර්ය කිරීම :-**
ශුද්ධාත්මයාණන්වහන්සේගේ බලය ක්‍රියාකිරීම තුළින් අධිස්වාභාවික දේ කිරීම.

**ධර්මවාක්‍ය කීම :-**
දෙවියන්වහන්සේගේ සෙනඟ වෙත, උන්වහන්සේගේ පණිවිඩ ලැබීමට සහ ප්‍රකාශකිරීමට උන්වහන්සේ දෙන හැකියාව.

**ආත්මවල් විමසීම :-**
යම්කිසි කෙනෙකුගේ වචන සහ හැසිරීම පොළඹවන්නාවූ ආත්මය හඳුනාගැනීමට, දෙවියන්වහන්සේ දෙන්නාවූ හැකියාව.

❖ දේව දරුව, දෙවියන්වහන්සේ දේව පුත්‍රකම ඔබට ලබාදී ඔබව කැඳවා ඇත්තේ උන්වහන්සේට සේවය කිරීම උදෙසාය. මෙම සේවය ඉටුකිරීම උදෙසා උන්වහන්සේ ඉහත සඳහන් දීමනාවලින් එකක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් නිසැකවම ඔබට ලබා දී ඇත.

එබැවින් කිතුනු අප දෙවියන්වහන්සේගෙන් ඇසිය යුතුද, පැහැදිලි පිළිතුරක් ලැබිය යුතුද ප්‍රශ්නයක් වන්නේ - ''පියාණෙනි ඔබවහන්සේ මා කැඳවන්නේ කුමන සේවයකටද ? '' යන ප්‍රශ්නයයි. අප තව දුරටත් අපගෙන්ම අසා ගත යුතු ප්‍රශ්නයක්ද තිබේ. එනම් - ''උන්වහන්සේ කැඳවා ඇති සේවය ඉටු කිරීම උදෙසා වැදගත් වන්නාවූ දීමනා කවරේද ? '' යන්නයි. උන්වහන්සේ කැඳවා ඇති සේවය, කිරීම උදෙසා ඔබ ඉතා වැදගත් හෝ ඉතා ප්‍රයෝජනවත් සේ සලකන දීමනා ඔබ ලබා නැත්නම්, උන්වහන්සේගේ ගෞරවය උදෙසා සාර්ථකව ඉටු කිරීම පිණිස, එම දීමනා දෙවියන්වහන්සේගෙන් ඉල්ලන්න.

## 4. <u>ක්‍රිස්තුස්වහන්සේ සභාවට දී ඇත්තාවූ තෑගි වන්නාවූ විශේෂ කැඳවීම් / පත්කිරීම් - එපීස 4 : 11</u>

**එපීස 4 : 11 :-**

**'' උන්වහන්සේ සමහරුන් ප්‍රේරිතයන්ද සමහරුන් අනාගත - වක්තෘවරුන්ද සමහරුන් ශුභාරංචිය දේශනාකරන්නන්ද සමහරුන් සභාපාලකයන්ද සමහරුන් ගුරුවරුන්ද කොට දුන්සේක. ''**

### (i) <u>ප්‍රේරිතයන්</u>

ප්‍රේරිතයෙක් යන්නෙන් අදහස්වන්නේ ''යවන ලද්දෙක් '' වන අතර, මෙහි සඳහන්වන්නේ මූලික වශයෙන්ම ''ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රේරිතයින් '' බව නිගමනය කළ හැක.

මේ අනුව මෙහි සඳහන් වන ප්‍රේරිතයන් වන්නේ (යූදස් වෙනුවට මත්තියස් ඇතුලත් වන්නාවූ) ගෝලයන් දොළොස්දෙනා, පාවුල්, යේසුස්වහන්සේගේ සහෝදර - යෙක්වූ යාකොබ් සහ සමහරවිට තව දෙතුන් දෙනෙකු පමණකි.

ප්‍රේරිතයෙකුගේ කැඳවීම වැඩි දුරට තේරුම්ගැනීම උදෙසා **එපීස 2 : 20** දෙස බලමු.

**එපීස 2 : 20 :-**

'' **නුඹලා ප්‍රේරිතයන්ගේත් ප්‍රොපේතවරුන්ගේත් අත්තිවාරම මත ඉදිකරනු ලැබ සිටින්නහුය.** ''

අපගේ ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ඉහත සඳහන් ප්‍රේරිතයන්ව තෝරා ඔවුන්ට අධිකාරිය පැවරූ අතර, ඔවුන් සැම දෙනාම උත්ථානයවූ ස්වාමීන්වහන්සේව දුටු අය වූහ. **(ක්‍රියා 1 : 21, 22)** ඔවුන්ට උන්වහන්සේ පැවරූ මූළික වගකීමක් වූයේ '' අත්තිවාරම් ඉදිකිරීම '' නොහොත් පුරෝගාමී සේවයකි. '' **යෙරුසලමේහිද, මුළු යුදයෙහිද, සමාරියෙහිද, පොළොවේ සීමාව දක්වාද** '' **(ක්‍රියා 1 : 8)** ශුභාරංචිය පතලකිරීමේ පුරෝගාමී සේවයකි.

❖ අද දවසේ මෙම අරුත අනුව '' ප්‍රේරිතයන් '' සභාවේ නොමැති නමුත්, දෙවියන්වහන්සේ අද දවසේද ප්‍රේරිත සේවාවන් සහ කැඳවීම් දෙන සේක. එබැවින් පුරෝගාමී මිෂනාරී සේවාවන්ට, ශුභාරංචිය නොපැතුරුනාවූ පෙදෙස්වල '' සභා පැළකිරීමේ '' සේවය යනාදි සේවාවන්ට දෙවියන්වහන්සේ කැඳවන්නාවූ අය, ප්‍රේරිත සේවයකට කැඳවනු ලැබූ කෙනෙක් ලෙස, සැලකිය හැක.

(ii) **<u>අනාගතවක්තෘවරුන්</u>**

**යෙරමියා 23 : 18 :-**

'' **එසේ කීමට ස්වාමීන්වහන්සේගේ මන්ත්‍රණයෙහි පිහිටා සිට උන්වහන්සේගේ වචනය දුටුවේවත් ඇසුවේවත් කවුද ? උන්වහන්සේගේ වචනයට ඇහුම්කන්දී ඇසුවේ කවුද ?** ''

දේව වචනය අනුව, අනාගතවක්තෘවරයෙක් යනු දෙවියන්වහන්සේගේ වචනය අසා හෝ දැක, එයට ඇහුම්කන්දී, එය ප්‍රකාශකරන තැනැත්තෙක්ය. අනාගත - වක්තෘවරුන්ගේ නම් පහක් සඳහන් කරන ලෙස, ඉල්ලනු ලැබුවහොත්, කිතුනුවන්ගෙන් 95%කට වැඩි සංඛ්‍යාවක් සඳහන්කරන්නේ පරණ ගිවිසුමේ ඇති නම් පහක්ය.

බොහෝ කිතුනුවන්, නව ගිවිසුමේ සඳහන් අනාගත - වක්තෘවරුන්ගේ නම් එකක්වත් පැවසීමට අසමත්වනවා නමුත්, නව ගිවිසුමේ අප දකින්නේ ප්‍රොපේතවරුන් (අනාගතවක්තෘවරුන්) මුල් සභාවේ ප්‍රබල සේවයක යෙදුනු බවයි.

**ක්‍රියා 11 : 27, 28 :- " ඒ දවස්වලදී යෙරුසලමෙන් ප්‍රොපේතවරු අන්තියෝකියට ආවෝය. ඔවුන්ගෙන් අගබස් නම් කෙනෙක් නැගිට, ….. "**

**ක්‍රියා 13 : 1 :- " අන්තියෝකියේ පිහිටි සභාවෙහි ප්‍රොපේතවරු සහ ගුරුවරු සිටියෝය ; එනම් බාණීබස් ….. නීගර් ….. ලූකියස් …..මානායින් ද සාවුල්ද යන අයවල්ය. "**

එබැවින් **එපීස 4 : 11** හි සඳහන්වන්නාවූ අනාගත - වක්තෘවරුන්, එදා ප්‍රේරිතයන් සමඟ එකට පුරෝගාමී සේවයක යෙදුනාවූ නව ගිවිසුමේ සඳහන් ''ප්‍රොපේතවරු'' බව නිගමනය කළ හැක. (**එපීස 3 : 5, 2 : 20** යන පද මෙය සනාථ කරයි).

❖ ඉහත සඳහන් කරුණු අනුව අද දවසේ ''ප්‍රොපේතවරුන් '' සභාව තුළ නොමැති නමුත්, '' ධර්ම වාක්‍ය කීමේ '' දීමනාව ඇත්තාවූද ''අනාගතවාක්‍ය කීමේ '' දීමනාව ඇත්තාවූද, සභාවේ අතිවිශිෂ්ඨ සේවාවන් වල යෙදෙන්නාවූ, ප්‍රොපේත සේවයකට කැඳවනු ලැබුවාවූද, දේව දාසයන් බොහෝ දෙනෙක් සභාව තුළ සිටීම ගැන දෙවි පියාණන්වහන්සේට, තුති පැසසුම් පුදමි.

(iii) **ශුභාරංචිය ප්‍රකාශකරන්නන්**

**මාර්ක් 16 : 20 :- " ඔවුන් පිටත්ව ගොස්, සියලු තැන්වලම දේශනා කළෝය. ස්වාමීන්වහන්සේද ඔවුන් සමඟ ක්‍රියාකරමින් ඔවුන් අතින් සිදුවූ ලකුණුවලින් වචනය ස්ථිර කළ සේක. "**

කිතුනු සභාවේ වර්ධනය උදෙසා, මෙම කැඳවීම ඉතාමත්ම වැදගත්වන අතර, මෙම කැඳවීම ඇත්තාවූ අයට ඉතාමත් අවශ්‍ය දීමනාවක් වන්නේ ''සුව කිරීමේ දීමනාවයි ''.

යේසුස්වහන්සේගේ සේවය දෙස බලන අතරද, උන්වහන්සේ ප්‍රකාශ කළ වචන " ලකුණු වලින් ස්ථිර වූ " බව අප දනිමු.

**ලූක් 4 : 40, 41 :-**

**" ..... රෝගවලින් පීඩිතවූ ..... සියල්ලෝම උන්වහන්සේ වෙතට ඔවුන් ගෙනාවෝය. උන්වහන්සේ ඔවුන් සුවපත් කළ සේක. යක්ෂයෝද .... බොහෝ දෙනෙකුගෙන් දුරුවුණෝය. "**

දේව දරුව, මෙම කැඳවීම ඔබ ලබා ඇත්නම්, "යක්ෂයන් දුරු කිරීමේ බලය " සහ " සුව කිරීමේ දීමනාව " සමිඳුන්ගෙන් ඉල්ලා යාච්ඤා කරන්න.

(iv) **<u>සභා පාලකයන්</u>**

සභා පාලකයෙකුට බොහෝ වගකීම් පැවරෙන අතර, ඔහුගේ අති වැදගත් වගකීමක් වන්නේ, දෙවියන්වහන්සේ පවරා ඇති බැටළුවන්ට එඬේරෙක් වීමයි.

**යොහන් 21 : 17 :-**

**" උන්වහන්සේ තුන්වෙනි වර ඔහුට කථාකොට : යොහන්ගේ පුත්‍රවූ සීමොන්, නුඹ මට ආදරේදැයි ඔහුගෙන් ඇසූසේක ..... යේසුස්වහන්සේ ඔහුට කථාකොට : <u>මාගේ බැටළුවන් පෝෂණය කරපන්න</u> ..... "**

**ක්‍රියා 20 : 28 :-**

**" දෙවියන්වහන්සේ විසින් තමන්ගේම රුධිරයෙන් මිලේට ගත් තමන්ගේ <u>සභාව පෝෂණය කරන්ට</u> ශුද්ධාත්මයාණන් - වහන්සේ යම් රැළෙක්හි නුඹලා නායකයන් කොට නියමකළ සේක්ද, ඒ <u>මුළු රැළ ගැනත්, නුඹලාම ගැනත් ප්‍රවේසම් වෙයල්ලා</u>. "**

**1 පේත්‍රුස් 5 : 2, 3 :-**

**" නුඹලා අතරෙහි සිටින දෙවියන්වහන්සේගේ රැළ බලාගනිමින්, බලාත්කාරය නිසා නොව දේව කැමැත්ත ලෙස සතුටු සිතින්ද, නින්දිත ලාභය නිසා නොව මනාප සිතකින්ද, නුඹලාගේ භාරයට දෙන ලද්දවුන් කෙරෙහි ..... <u>ආදර්ශව සිටිමින්ද එය රැක බලා ගනිල්ලා</u>. "**

ඉහත සඳහන් පදවල ඇත්තාවූ දේ ඉතා පැහැදිලි බැවින්, තව දුරට ඒවා විස්තර කිරීම අනවශ්‍ය වේ.

මේ අතර, සභාපාලකයන් පමණක් නොව, සභාවේ විවිධාකාර නායකත්වයට පත්ව සිටින සැම දෙන තමාට අදාල ප්‍රමාණයට අනුන් පෝෂණය කිරීමේත්, ඔවුන්ට ආදර්ශයක් වීමේත් වැදගත් සේවය විශ්වාසවන්තව කළ යුතුය.

(v) <u>**ගුරුවරුන්**</u>

කිතුනු සභාවේ, අද ඇත්තාවූ එක මූලික අවශ්‍යතාවයක් වන්නේ, දේව වචනයෙන් සභාව පෝෂණය කරන්නාවූ ගුරුවරුන්ය.

**2 තිමෝති 2 : 15 :-**

" **සැබෑවේ වචනය හරි ආකාර පහදා දෙන්නාවූ, ලජ්ජාවන්ට ඕනෑ නැත්තාවූ වැඩකාරයෙක්ව, දෙවියන්වහන්සේට ඒත්තු වුණාවූ කෙනෙකු මෙන් පෙනෙන්ට උත්සාහ කරපන්න.** "

අපගේ සැම දේවස්ථානයකම මෙවැනි ගුරුවරුන් පත්කරන ලෙස දෙවි සමිඳුන්ගෙන් යදිමු.

❖ ප්‍රේමණීය දේව දරුව, ඉහත සඳහන් කැඳවීම් පහෙන් අන්තිම තුනට අදාල වන්නාවූ මූලික වගකීම් වන, විනාශවන්නවුන්ට ශුභාරංචිය ප්‍රකාශකිරීම සහ දෙවියන් - වහන්සේ අපට පවරන අයව දේව වචනයෙන් පෝෂණය කිරීම, අප සැමදෙනාටම යම්කිසි ප්‍රමාණයකට කළ හැක.

දෙවියන්වහන්සේ උදෙසා අපට කළ හැකි දේ කිරීම අප ඇදහිල්ලෙන් අරඹමු.

එය උදෙසා දේව මඟපෙන්වීම සොයමු.
එය උදෙසා අවශ්‍ය ශුද්ධාත්ම දීමනා,
යාච්ඤාවෙන් ඉල්ලා සිටිමු.
අප ලබා ඇති දීමනා භාවිතා කරමු.

මේ අයුරින් අප උන්වහන්සේට සේවය කිරීම, අපට හැකි අයුරින් අරඹන අතර, ආදර්ශමත් ජීවිතයක් ගතකිරීමේ වැදගත්කම තේරුම් ගනිමු.

**දෙවියන්වහන්සේ**

**ඔබට ලබා දී ඇති දීමනා,**

**උන්වහන්සේගේ සභාවේ**

**වර්ධනය උදෙසා යොදවමින්,**

**උන්වහන්සේගේ නාමය ගෞරවයට හා**

**මහිමයට පත්කිරීමට,**

**දෙවියන්වහන්සේ**

**ඔබට පිහිටවනසේක්වා !!!**

සටහන

.....................................................................................................
.....................................................................................................
.....................................................................................................
.....................................................................................................
.....................................................................................................
.....................................................................................................
.....................................................................................................
.....................................................................................................
.....................................................................................................
.....................................................................................................
.....................................................................................................
.....................................................................................................
.....................................................................................................
.....................................................................................................
.....................................................................................................
.....................................................................................................
.....................................................................................................
.....................................................................................................
.....................................................................................................
.....................................................................................................
.....................................................................................................
.....................................................................................................
.....................................................................................................
.....................................................................................................
.....................................................................................................
.....................................................................................................

# ක්‍රිස්තුස්වහන්සේ සභාවට දීමනා දුන්නේ ඇයි ?



# එපීස අධ්‍යයනය 10

# ක්‍රිස්තුස්වහන්සේ සභාවට දීමනා දුන්නේ ඇයි ?

**එපීස 4 : 12 - 16**

**<u>හැඳින්වීම</u> :-**

පසුගිය අධ්‍යයනයෙහිදී, ක්‍රිස්තුස්වහන්සේ සභාවට ලබාදී ඇති දීමනා සහ තෑගි දෙස අප බැලුවෙමු. මෙම අධ්‍යයනය මගින් අප බලන්ට යන්නේ, උන්වහන්සේ එසේ දුන්නේ, කුමක් උදෙසාද ? කියාය. **එපීස 4 : 12-16** දක්වා කියවන අපට පෙනීයන්නේ, එහි **දොළොස්** වන පදය ඇරඹෙන්නේ, " **එසේ දුන්නේ** " යනුවෙන් වන අතර **දහතුන්** වන පදය අවසන්වන්නේ, " **ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයේ වර්ධනයවීම පිණිසත්ය** " යන වචන වලින් බවය.

ඒ අන්දමට සමානව **පහළොස්** වන පදයද අවසාන වන්නේ, ' **වැඩෙන පිණිසත්ය** ' යන වචන වලිනි. මේ අනුව අපට නිගමනය කළ හැක්කේ ක්‍රිස්තුස්වහන්සේ සභාවට අයත් ' **එක් එක්කෙනාට** ' **(එපීස 4 : 7)** දීමනා ලබා දුන්නෙත්, සභාවේ ' **පස් වැදෑරුම් සේවය** ' පිහිටුවේත් සභාවේ වර්ධනය උදෙසා බවය.

ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරය වන්නාවූ සභාවේ වර්ධනය උදෙසා, උන්වහන්සේ ලබා දී ඇත්තාවූ ' **දීමනා සහ තෑගි** ' භාවිත කළ යුතු අන්දම පහදා දීම, මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වේ.

**<u>අධ්‍යයනය</u> :-**

දේව දරුවන් වන අප සැම, ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරය නමැති සභාවට අයිති වන්නාවූ අවයවයන් වෙමු.

**1 කොරින්ති 12 : 12 :- " මක්නිසාද ශරීරය එකක්ව බොහෝ අවයව ඇතුවාක්මෙන්ද, ශරීරයේ අවයව සියල්ල බොහෝ වුවත් එක ශරීරයක්ව තිබෙන්නාක් මෙන්ද, ක්‍රිස්තුස්වහන්සේත් එසේව සිටින සේක. "**

**1 කොරින්ති 12 : 14 :- " මක්නිසාද ශරීරය එක අවයවයක් නොව බොහෝ අවයවයෝය. "**

එබැවින් අප මුලින්ම අපගේ අවධානය යොමුකිරීමට යන්නේ, විවිධාකාර දීමනා ලත් අප සැම, එක ශරීරයකට අයත් අවයවයන් ලෙස එකට බැඳී, අප ලබා ඇති දීමනා එම ශරීරයේ නොහොත් සභාවේ වර්ධනය උදෙසා භාවිතා කරන්නේ කෙසේද ? යන ප්‍රශ්නයට පිළිතුරු සැපයීමටය.

නොඑසේනම් ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයේ අවයවයන් වන්නාවූ අප සැම, අප ලබා ඇත්තාවූ දීමනා භාවිතා කළ යුතු අන්දම පිළිබඳව, දෙවියන්වහන්සේගේ සැලැස්ම තේරුම් ගැනීමටයි.

## 1. <u>ශරීරයේ සියළු අවයවයන්, සහයෝගයෙන් එකට ක්‍රියාකිරීම දේව කැමැත්ත වේ - 1 කොරි. 12 : 12 - 27</u>

ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරය නමැති සභාවේ ක්‍රියාකිරීම සම්බන්ධයෙන්, දෙවියන්වහන්සේගේ කැමැත්ත පහදාදීම උදෙසා, ඉතා ලුහුඬින් කරුණු දහයක් ඔබ ඉදිරියේ තබමි.

(i) අවයවයන් බොහෝ ඇත්තාවූ ශරීරය (සභාව), **(1 කොරි. 12 : 12, 14, 27)** **<u>එකම සභාවයි</u>** **(එපීස 4 : 4)**

ලෝකයේ බොහෝ කිතුනු නිකායන්ද, ප්‍රාදේශීය 'සභාවන්ද', විවිධාකාර 'දේවස්ථානද' පිහිටා තිබෙන අතර, දේව වචනය **' එකම සභාව '** පිළිබඳව ප්‍රකාශ කර ඇත්තේ, මෙවැනි වදන්ය.

**1 කොරි 12 : 13 :- "... අපි සියල්ලෝ එකම ආත්මයාණන්-වහන්සේ තුළ, එකම ශරීරයට බව්තීස්ම කරනු ලැබ, සියල්ලෝ එකම ආත්මයාණන්ගෙන් පොවනු ලැබීමුව. "**

(ii)සභාව නමැති ශරීරයට ඇත්තේ **<u>එකම හිසයි</u>.** එනම් අපගේ ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේයි.

**එපීස 4 : 15 :- "....... හිසව සිටින ක්‍රිස්තුස්වහන්සේ උදෙසා ...... "**

දේව දරුව, ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයේ අවයවයන් වන්නාවූ **<u>අප සැම</u>, <u>සැමවිටම කීකරු විය යුත්තේ</u>, <u>අපගේ හිස වන්නාවූ ක්‍රිස්තුස්වහන්සේට</u>** බව, කිසිසේත් අමතක නොකරන්න.

(iii) සභාව නමැති ශරීරයට බලය දෙන්නේ ශුද්ධාත්ම - යාණන්වහන්සේය.

(iv) ශරීරයේ වෙන වෙන අවයවයන්ට වෙන වෙන කාර්‍ය්‍යයන් භාරවී තිබේ.

(v) සෑම අවයවයකටම **භාර වී ඇත්තාවූ කාර්‍ය්‍යයන් ඉතා වැදගත්වේ.**

**1 කොරි. 12 : 22 :-**

**" එසේය, ශරීරයේ වඩා ඕනෑකරන්නේ වඩා දුර්වලව පෙනෙන අවයවයෝය. "**

දේව දරුව, සභාව තුළ දෙවියන්වහන්සේ ඔබට පවරා ඇත්තාවූ කාර්‍ය්‍යය, කිසිසේත් අවතක්සේරු නොකරන්න. එය නොවැදගත් කාර්‍ය්‍යයක් ලෙස සභාවේ සමහරුන් සැලකුවත්, එය ඔබට පැවරුවේ, ඔබට ප්‍රේමකරන්නාවූ ඔබගේ පියාණන්වහන්සේ බව තේරුම්ගෙන, විශ්වාස - වන්තව එහි නිරතවෙන්න.

**1 කොරි. 12 : 18 :-**

**" නුමුත් දෙවියන්වහන්සේ තමන්ගේ කැමැත්ත ලෙස ඒ සියලු අවයවයන් වෙන වෙනම ශරීරයේ තැබූ සේක. "**

(vi) ශරීරය පිළිබඳව තීරණ ගනු ලබන්නේ එහි හිස වන්නාවූ ක්‍රිස්තුස්වහන්සේ විසිනි.

(vii) එක එක අවයවයන්ට බලය නිකුත් කරන්නේ ශරීරයේ හිසයි.

(viii) සෑම අවයවයකටම මඟපෙන්වන්නේ ශරීරයේ හිසයි.

(ix) ශරීරයේ සියලු අවයවයන් එකට ක්‍රියා කළ යුතුයි.

**1 කොරි. 12 : 21 :-**

**" නුඹ මට ඕනෑ නැතැයි අතට කියන්ට ඇසටවත් ...... නුපුළුවන. "**

(x) ශරීරයේ සියලු අවයවයන් එකිනෙකාට ගෞරවයෙන් සැලකිය යුතුවේ.

දෙවියන්වහන්සේ **1 කොරි. 12 : 12** සිට **27** දක්වා, උන්වහන්සේගේ අනර්ඝ වචන මගින්, විවිධ දීමනා ලබා ඇත්තාවූ දේව දරුවන් වන අප, ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරය වන්නාවූ සභාවේ, අවයවයන් ලෙස ක්‍රියා කළ යුතු අන්දම පිළිබඳව මඟපෙන්වා ඇත.

මෙනමුත් උන්වහන්සේගේ මඟපෙන්වීමට පටහැනිව, අප ක්‍රියාකිරීම හේතුකොටගෙන, සභාව බොහෝවිට අනවශ්‍ය ප්‍රශ්න, බාධා සහ පසුබෑම්වලට මුහුණදීම, අප නිතර දකිමු. මෙම තත්ත්වයෙන් සුළු ප්‍රමාණයකින් හෝ නිදහස්වීම උදෙසා, ඉතා යටහත්ව පහත සඳහන් යෝජනා ඔබ ඉදිරියේ තබමි.

(i) දෙවියන්වහන්සේ පවරා ඇති වැඩය කිරීමට යමෙක් අපොහොසත්වීම, **සභාවේ වර්ධනයට බාධාවකි. එබැවින් සභාව තුළ දෙවියන්වහන්සේ ඔබට පවරා ඇති වැඩය යාච්ඤාවෙන්ද, විශ්වාසවන්තවද ඉටුකිරීම, කිසිවිටක අත්-නොහරින්න.**

(ii) දෙවියන්වහන්සේ ඔබට පවරා ඇති වැඩය වෙනුවට, උන්වහන්සේ වෙනත් අවයවයකට පවරා ඇති වැඩක් කිරීමට යමෙක් උත්සාහ කරන්නේද, එය **ඉහත සඳහන් දෙයට වඩා සභාවට බාධාවකි.** මෙය තුළින් බොහෝවිට ඇතිවන්නේ අනවශ්‍ය තරඟකාරීකම, නොයෙක් බේද සහ සිත් රිදීම්ය. එබැවින් කිසිවිටක දෙවියන්වහන්සේ අන් අයට පවරා ඇති සේවයක් ඔබගේ කැමැත්ත අනුව, ඔබගේ ශක්තියෙන් කිරීමට තැත් නොකරන්න. දෙවියන් - වහන්සේ ඔබට පවරා ඇති කාර්යය වෙත ඔබගේ සියලු දීමනාද ශක්තියද යොමුකරමින්, **උන්වහන්සේගේ කැමැත්ත සහ මඟපෙන්වීම අනුව සේවයේ යෙදෙන්න.**

(iii) වෙන අයෙකුගේ සේවයට (තමාට එම සේවය උදෙසා කැඳවීමක් නොමැති නමුත්) ආශාවී, ඔහු ගැන ඊර්ෂ්‍යාවට පත්වී, ඔහුගේ සේවයට බාධා කිරීමට යමෙක් පෙළඹෙනවාද, ඔහු ඉතා පහසුවෙන්ම යක්ෂයාගේ අතකොලුවක් බවට පත්වනවා ඇත. හදවතේ සාමය සහ සමාදානය ඔහුට අහිමි වනවා ඇත. ඔහුගේ ක්‍රියාකිරීම **සභාවට ඉමහත් බාධාවක්ද වනවා ඇත.**

දේව දරුව, යක්ෂයාට කිසිවිටක ඉඩ නොදෙන්න. අන් අයෙකුගේ සේවය ගැන ඊර්ෂ්‍යාවට පත් නොවන්න.

**දෙවියන්වහන්සේ ඔබට පැවරූ සේවය ගැන උන්වහන්සේට තුති ප්‍රශංසා පුදමින්, එම සේවය තුළ උන්වහන්සේ ඔබට දෙන්නාවූ සතුටද, සමාදානයද, ආශිර්වාදද අත්දකින්න.**

ප්‍රේමණීය සහෝදරයා, සහෝදරී, ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයේ අවයවයන් වන්නාවූ අප සැම, උන්වහන්සේ අපට ලබාදී ඇති දීමනා ගැන, කිසිසේත් උඩඟු නොවෙමු.

**<u>යටහත්කම පැළඳගනිමු</u>,**
**<u>හිසට කීකරුව සේවයේ යෙදෙමු</u>.**
**<u>විශ්වාසවන්තව, අපට පවරා ඇති කාර්‍යයන් ඉටුකරමු</u>.**
**<u>සැමවිටම දෙවියන්වහන්සේට ගෞරවය සහ මහිමය දෙමු</u>.**

**2. <u>ක්‍රිස්තුස්වහන්සේ සභාවට ලබා දී ඇති පස් වැදෑරුම් සේවයේ වැදගත්කම - එපීස 4 : 11</u>**

**එපීස 4 : 11** හි සඳහන්වන්නාවූ ප්‍රේරිතයන්, අනාගත - වක්තෘවරුන්, ශුභාරංචිය ප්‍රකාශකරන්නන්, සභා පාලකයන් සහ ගුරුවරුන්, පස් වැදෑරුම් කැඳවීම හෝ පත්කිරීම හෝ සේවය හෝ තෑග්ග ලෙස ව්‍යවහාර කිරීමට හැක. වර්තමාන සභාවේ ක්‍රියාකිරීම උදෙසා වඩා අදාළ වන්නේ පසුව සඳහන් සේවාවන් තුන වන බැවින්, මෙම කොටසේ අවධානය යොමු කරනු ලබන්නේ එම සේවාවන් තුන වෙත පමණකි.

(a) **<u>ශුභාරංචිය ප්‍රකාශකරන්නන්</u>**

දෙවියන්වහන්සේ සමහර දේව දරුවන්ව, '**ඉවැන්ජලිස්ත සේවයට**' විශේෂ කැඳවීමක් දී, '**ශුභාරංචිය ප්‍රකාශ කරන්නන්** ' ලෙස ඔවුන් පත්කරන සේක. මෙනමුත් මෙයින් අදහස්වන්නේ, ශුභාරංචිය ප්‍රකාශ කිරීම, ආත්ම දිනාගැනීම, මනුෂ්‍යයින් ගැළවීම වෙත පැමිණවීම වැනි සේවාවන්, මොවුන්ට පමණක් සීමාවන්නාවූ සේවාවන් යන්න නොවේ.

දෙවියන්වහන්සේ <u>අප සැම දෙනා කැඳවා ඇත්තේ</u>, **මතෙව් 28 : 19, 20** හි සඳහන් '' <u>මහා නියෝගයේ</u> '' <u>කොටස්කාරයන් වීමටය</u>.

උන්වහන්සේගේ කැමැත්ත වන්නේ <u>අප සැම දෙනා</u> යේසුස්වහන්සේගේ සාක්ෂිකාරයන් බවට පත්වී **(ක්‍රියා 1:8)** <u>මනුෂ්‍යයන් ගැළවීම වෙත පැමිණවීමය</u>.

මෙය ඔබ තව දුරට තේරුම් ගැනීම උදෙසා **2 තිමෝති 4:5** වෙත ඔබගේ අවධානය යොමු කරමි.

**2 තිමෝති 4 : 5 :- " ...... ශුභාරංචිය ප්‍රකාශකරන්නෙකුගේ වැඩේ කරපන්න. "**

**2 තිමෝති 4 : 1 සිට 5** දක්වා අපට පෙනීයන්නේ වචනය දේශනාකිරීම, සැමවිටම සේවයේ යෙදී සිටීම, ඉගැන්වීම, තරවටුකිරීම, අවවාද කිරීම, අනුශාසනා කිරීම යනාදිය සමඟම **' ශුභාරංචිය ප්‍රකාශකරන්නෙකුගේ '** සේවයද කරන ලෙස පාවුල්තුමා තිමෝතියස්ට **' අණ කිරීමය '.**
**(2 තිමෝති 4 : 1 අග)**

මේ අනුව තහවුරුවන්නේ, **'ශුභාරංචිය ප්‍රකාශකරන්නෙකු - ගේ සේවය'** අප සැමදෙනාම කළ යුතු වන අතර, දෙවියන්වහන්සේ සමහරුන්ට මෙම සේවයට විශේෂ කැඳවීමක්ද, පත්කිරීමක්ද ලබා දී ඇති බවයි. මෙම සේවය උදෙසා දෙවියන්වහන්සේ විශේෂයෙන් පත් කර ඇති අයට උන්වහන්සේ **' සුවකිරීමේ දීමනාවද '**, **' යක්ෂයාගේ ක්‍රියාකිරීම් වලට විරුද්ධව බලවත්ව නැගී සිටීමට හැකියාවද '** ලබා දෙන බව, අපට බොහෝවිට පෙනීයයි. මේ අතර ඔවුන්ගේ සේවය තුළින් උන්වහන්සේ බොහෝ මනුෂ්‍යයන් දේව දරුකම වෙත ගෙන ඒම අප දකිමු.

(b) **සභාපාලකයන්**

පසුගිය අධ්‍යයනයේදී අප තේරුම්ගත් ආකාරයට, මෙම සේවය, එඬේරෙකුගේ සේවයට සමාන කළ හැක. එබැවින් මෙම සේවය වැඩි දුරට තේරුම් ගැනීම උදෙසා **ගීතාවලිය 23 : 1 - 6** දෙස බැලීම යෝග්‍ය වේ.

**ගීතාවලිය 23** මගින්, එඬේරෙකුගේ සේවයට අයිති - වන්නාවූ නොයෙක් දේ, පැහැදිලිව පෙනීයයි. ඒවායින් සමහරක් වන්නේ -

(i) එඬේරා බැටළුවන්ට අවශ්‍ය පෝෂණය සපයයි.
(ii) හෙතෙම තම බැටළුවන්ව ආත්මිකව ශක්තිමත් කරයි.
(iii) ඔහු විසින් බැටළුවන් නිසි මාර්ගවල ගෙන යනු ලබයි.
(iv) එඬේරා බැටළුවන්ට මඟපෙන්වයි.
(v) හෙතෙම ඔවුන් ආරක්ෂා කරයි.
(vi) ඔහු බැටළුවන්ට සහනය ලබාදෙයි.
(vii) එඬේරා බැටළුවන්ගේ සියළු ප්‍රශ්නවලට පිළිතුරු සපයයි.
(viii) ඔහු බැටළුවන්ට සැනසීම සහ සිත් සමාදානය ලබාදෙයි.

**ගීතාවලිය 23** ලිව්වාවූ දාවිත්, බැටළු එඬේරෙක් විය. බැටළු රැළක් බලාගැනීමට සුපුරුදුව සිටියාවූ ඔහු, දෙවියන්වහන්සේ තම සෙනඟගේ එඬේරා ලෙස, ඔවුන් උදෙසා කරන්නාවූ දේ මෙම ගීතිකාවේ සඳහන් කරයි. සභාපාලකයෙකුගේ සේවය එඬේරෙකුගේ සේවයට සමාන වන බැවින්, එඬේරෙකුගේ සේවය පිළිබඳව ඉහත සඳහන්කරනු ලැබුවාවූ දේ සභාපාලකයන් විසින් ඉටු කළ යුතුය.

මේ සම්බන්ධයෙන් පාවුල්තුමා එපීස සභාවේ වැඩිමහල්ලන්ට පැවසූ දේ දෙස බලමු.

**ක්‍රියා 20 : 28 :- '' දෙවියන්වහන්සේ විසින් තමන්ගේම රුධිරයෙන් මිලේට ගත් තමාගේ සභාව පෝෂණය කරන්ට ශුද්ධාත්මයාණන්වහන්සේ යම් රැළක්හි නුඹලා නායකයන් කොට නියම කළ සේක්ද, ඒ මුළු රැළ ගැනත් නුඹලාම ගැනත් ප්‍රවේසම් වෙයල්ලා. ''**

**ක්‍රියා 20 : 31 :-'' එබැවින් මා තුන් අවුරුද්දක් මුළුල්ලෙහි රෑ දාවල් දෙකේ කඳුළුවලින් යුක්තව සියල්ලන්ට නිරතුරු අවවාද දුන් බව සිහිකොට, අවදිව සිටපල්ලා. ''**

එපීස සභාවේ නායකයන් ගැන, ඔවුන්ගේ ''එඬේරා'' වූ පාවුල්තුමා ක්‍රියාකළ අන්දමද (**''රෑ දාවල් දෙකේ කඳුළුවලින් යුක්තව ''**) ඔවුන්ට තම සෙනඟ බලාගැනීම සහ තමන්ම ගැනද (**''ප්‍රවේසම් වෙයල්ලා''**) පාවුල්තුමා දුන් උපදෙස්ද, සියලු සභාපාලකයින්ට මහඟු ආදර්ශයක් වේ.

(c) **ගුරුවරුන්**

ගුරුවරයෙකුගේ කැඳවීම වන්නේ, දෙවියන්වහන්සේගේ වචනය නිවැරදිව සභාවට ඉගැන්වීමයි. සභාවන් දෙස බලන අතර අපට පෙනීයන්නාවූ එක් දෙයක් වන්නේ, සෑම සභාවකම, ආත්මික බිළිඳුන් මෙන්ම ආත්මික වර්ධනයේ විවිධාකාර ස්ථානවල සිටිනවුන්ද ඇති බවයි.

දෙවියන්වහන්සේ පත්කරන්නාවූ ගුරුවරුන් සභාවේ ඇති අවශ්‍යතාවයන් අනුව සභාවේ සැමදෙනා පෝෂණය කිරීම ගැන සැලකිලිමත්වීම වැදගත්වේ. ඔවුන් විසින් බිළිඳුන්ට කිරි සැපයීම මෙන්ම (**1 පේත්‍රුස් 2 : 2**) වැඩිහිටියන්ට දෘඩ ආහාර (**1 කොරි 3 : 2**) සැපයීමද කළ යුතුවේ.

❖ සෑම ප්‍රාදේශීය සභාවකම ශුභාරංචිය ප්‍රකාශකරන්නන් සහ ගුරුවරුන් දක්නට නොලැබේ. මෙනමුත් සෑම කිතුනු සමූහයක් තුළම, ඉහත සඳහන් කළාවූ සේවාවන් තුනම සිදුවිය යුතුය. එනම් :

**සෑම කිතුනු සමූහයක් තුළම,**
**ශුභාරංචිය ප්‍රකාශ කරනු ලැබීම,**
**බැටළුවන් පෝෂණය සහ උපස්ථානය කරනු ලැබීම,**
**සහ දේව වචනය නිවැරදි ඉගැන්වීම, සිදුවිය යුතුමය.**

ප්‍රේමණීය දේව දරුව, ඔබ අයිතිවන්නාවූ ප්‍රාදේශීය සභාවේ මේ දේ ඉටුකරනවාද ?

එසේ සිදුනොවන්නේ නම්, පහත සඳහන් ක්‍රියාමාර්ග ගන්නා මෙන් ඔබගෙන් යටහත්ව ඉල්ලා සිටිමි.

(i) දෙවියන්වහන්සේ ඔබව කැඳවා ඇති සේවය ඔබ අඳුනාගෙන, එහි නිරතව සිටිනවාද කියා ඔබගෙන්ම විමසා බලන්න. ඔබ එසේ නොකරන බව උන්වහන්සේ ඔබට පෙන්වනවා නම්, ඔබගේ සභාපාලකතුමා සමඟ දෙවියන් - වහන්සේ ඔබට පෙන්වන්නාවූ දේ යාච්ඤාවෙන් යුක්තව බෙදාගෙන ඔහුගේ මඟපෙන්වීම ලබාගෙන, ක්‍රියාකරන්න.

(ii) ඔබගේ සභාවේ ඉහත සඳහන් සේවාවන් ස්ථාපිත කිරීම ඉල්ලා, සමිඳුන්ට යදින්න. දෙවියන්වහන්සේ ඔබට මඟපෙන්වන ආකාරයට, මෙසේ යාච්ඤා කිරීම උදෙසා, සභාවේ තව අය එකතු කරගනිමින්, එක්සත් යාච්ඤාවේ යෙදෙන්න.

(iii) ඔබගේ සභාවේ, දෙවියන්වහන්සේගේ දීමනා/කැඳවීම් ලත් අය, සුදුසු ස්ථානවලට යොදා ඇතිදැයි සෝදිසි කර බලන්න.

එවැනි අය ඔබේ සභාවේ සිටිත්නම් දෙවියන්වහන්සේ ඔබට දෙන්නාවූ මඟපෙන්වීම අනුව එවැනි අයට කතාකර ඔවුන් දිරිමත් කරන්න, ඔවුන් ගැන යාච්ඤා කරන්න, සභා පාලකතුමා සමඟ සාකච්ඡා කරන්න.

## 3. <u>පස්වැදෑරුම් සේවය තුළින්, ක්‍රිස්තුස්වහන්සේ අපේක්ෂා කරන්නාවූ ප්‍රතිඵල - එපීස 4 : 12-16</u>

(a) **කිතුනුවන්ගේ ආත්මික වර්ධනය - එපීස 4 : 12**

**එපීස 4 : 12 :-**

**" එසේ දුන්නේ ඇදහීමේද දෙවියන්වහන්සේගේ පුත්‍රයා දැනගැනීමේද එකමුතුකමටත්, සම්පූර්ණ පුරුෂකමටත්, ක්‍රිස්තුස්වහන්සේගේ සම්පූර්ණවූ උස මහතේ ප්‍රමාණය - ටත් අප සියල්ලන් පැමිණෙනතෙක්, "**

අපගේ ආත්මික වර්ධනය පිළිබඳව, වැදගත්වන්නාවූ පියවර හතරක්, මෙම පදයෙහි සඳහන්ව තිබේ.

(i) **ඇදහීමට පැමිණීම**

සැම ඉරුදිනකම අප රට පුරා ඇති දේවස්ථානවලට ඇදී එන්නාවූ සැමදෙනාම පැමිණෙන්නේ, ඔවුන් තුළ දෙවියන්වහන්සේ කෙරෙහි යම්කිසි ඇදහීමක් තිබෙන බැවිනි. දෙවියන්වහන්සේ කෙරෙහි යම්කිසි ඇදහීමක් ඇතිවී, උන්වහන්සේව නමස්කාර කිරීමට දේව සභාවකට පැමිණීම, ඔවුන්ගේ ආත්මික ගමනේ ප්‍රථම පියවර ලෙස හැඳින්විය හැක.

(ii) **දෙවියන්වහන්සේගේ පුත්‍රයා දැනගැනීම**

මෙම ගමනේ මීළඟ පියවර වන්නේ, දෙවියන්වහන්සේ ගැන හෝ උන්වහන්සේගේ පුත්‍රයා වන යේසුස්වහන්සේ ගැන දැනගැනීම නොවේ.

එම පියවර වන්නේ **දෙවියන්වහන්සේව සහ උන්වහන්සේ - ගේ පුත්‍රයාණන්වහන්සේව දැනගැනීමයි.**

මෙසේ දැනගැනීම උදෙසා අප උන්වහන්සේට අපගේ ජීවිත භාරදෙමින්, **උන්වහන්සේ සමඟ සම්බන්ධකමකට ඇතුල් විය යුතුවේ.**

(iii) **සම්පූර්ණ පුරුෂකමට පැමිණීම**

ඉහත සඳහන් පියවර මගින්, අප දේව දරුවන් බවට පත්වන නමුත්, අප පත්වන්නේ, " **ආත්මික බිළිඳුන්** " බවටය. අප මින් ඉදිරියට යමින් සම්පූර්ණ පුරුෂකමට පැමිණීම, කිතුනු ගමනේ තෙවැනි පියවරයි.

මෙම පියවර ඇදහිල්ලෙන් ශක්තිමත්වී, නොසැලී, විශ්වාසවන්තව දෙවියන්වහන්සේ සමඟ ඇවිදින ස්ථානයට අප පැමිණීම ලෙස සැලකිය හැකි වේ.

(iv) **ක්‍රිස්තුස්වහන්සේගේ සම්පූර්ණවූ උස මහතේ ප්‍රමාණයට පැමිණීම**

දේව කැමැත්ත වන්නේ, අප සැම යේසුස්වහන්සේ මෙන් වීමය. (**රෝම 8 : 29**)

මෙය උදෙසා අපට ගත හැකි ඉතා වැදගත් පියවරක් වන්නේ, දෙවියන්වහන්සේගේ ශක්තියෙන් යේසුස් - වහන්සේව අනුගමනය කිරීමය.

**1 පේත්‍රුස් 2 : 21 :-**

" **....... මක්නිසාද ක්‍රිස්තුස්වහන්සේ නුඹලා නිසා වධවිඳ, නුඹලා උන්වහන්සේගේ අඩිපාරේ යන පිණිස නුඹලාට ආදර්ශයක් දී ගියසේක.** "

(b) **කිතුනුවන් සේවය උදෙසා සූදානම් කිරීම - එපීස 4 : 13**

බොහෝ කිතුනුවන් පුරුදුවී සිටින්නේ, දේව සේවයේ යෙදීම, විශේෂ කැඳවීම් ලබා ඇත්තාවූ අයට සීමාවූ දෙයක් සේ සැලකීමටය. මෙනමුත් දේව වචනය අපට පෙන්වා - දෙන්නේ මීට හාත්පසින්ම වෙනස් වූ දෙයකි.

**එපීස 4 : 13** මගින් ප්‍රකාශවන්නේ, ක්‍රිස්තුස්වහන්සේ පස්වැදෑරුම් සේවය සභාවේ ඇතිකිරීමෙන් අපේක්ෂා කරන්නාවූ තවත් ප්‍රතිඵලයක් වන්නේ, (සෑම දේව දරුවෙක්ම) **" සේවය කිරීමේ වැඩය "** උදෙසා සූදානම් කරනු ලැබීම බවයි. බයිබලයේ ඉංග්‍රීසි පරිවර්තනයේ මේ සම්බන්ධව සඳහන් වචන වන " to prepare God's people for works of service (NIV) " මගින් මෙය ඉතා පැහැදිලිව ප්‍රකාශ කර ඇත.

(c) **කිතුනුවන් වැරදි ඉගැන්වීම් මගින් මුලා නොවීම - එපීස 4 : 14**

අපගේ සතුරා සැමවිටම බලාසිටින්නේ, දේව දරුවන් මුලා කිරීමටයි. ' අන්තිම කාලයේ ' මෙම රැවටිලිකාර ක්‍රියාකිරීම් ලෝකයේ අතිශයින් වැඩිවීමට යන බව යේසුස්වහන්සේද ප්‍රකාශ කළ සේක.

**මතෙව් 24 : 24 :-**

**" මක්නිසාද බොරු ක්‍රිස්තුස්වරුද, බොරු අනාගතවක්තෘවරුද නැගිට, පුළුවන්නම් තෝරාගනු ලැබූවන් පවා මුළා කරන ලෙස මහත් ලකුණුද පුදුමද දක්වන්නෝය. "**

පේත්‍රුස්තුමා බොරු ගුරුවරුන් පිළිබඳව, කර ඇති ප්‍රකාශය දෙස බලමු.

**2 පේත්‍රුස් 2 : 1 :-**

**" ....... එලෙසම විනාශක ධර්මභේද රහසින් උපදවමින්ද තමුන්ව මිලේටගත් ආචාර්ින්වහන්සේව එපා කරමින්ද තමුන් පිටට ශීඝ්‍ර විනාශය පමුණුවාගන්නාවූ බොරු ගුරුවරු නුඹලා අතරෙත් වන්නෝය. "**

ක්‍රිස්තුස්වහන්සේ පස්වැදෑරුම් සේවය සභාවේ පිහිටුවීමෙන්, ඇති තව ප්‍රතිඵලයක් නම්, කිතුනුවන් වැරදි ඉගැන්වීම් මගින් මුලා නොවීමයි.

**" මනුෂ්‍යයන්ගේ වංචාවෙන්ද ප්‍රයෝගයෙන්ද රැවටිලි සහිත උපාමාරුවෙන්ද හටගන්න සියලු ආකාර ඉගැන්වීම් නමැති සුළඟින් ඈත මෑත විසිවෙමින් ගෙනයනු ලබන්නාවූ බාලයන් නොවන පිණිසත්, " (එපීස 4 : 14)**

(d) **කිතුනුවන් සැමවිටම, ඇත්ත ප්‍රකාශකරන්නාවූ සෙනඟක් වීම - එපීස 4 : 15**

**එපීස 4 : 15 :-" ....ප්‍රේමයෙන් යුක්තව ඇත්ත කථාකරමින්, .... "**

අප හොඳ හැටි දන්නා ආකාරයට, මනුෂ්‍යයා ආරම්භයේදී පාපයට වැටුනේ, යක්ෂයාගේ ප්‍රයෝගකාරී කම නිසයි. යක්ෂයා ප්‍රකාශ කළ අසත්‍ය වචන නිසයි.

යේසුස්වහන්සේ යක්ෂයා පිළිබඳ කළාවූ ප්‍රකාශනයක් **යොහන් 8 : 44** හි සඳහන්වන්නේ -

**" ....... යක්ෂයා ...... බොරුකාරයෙක්ය, බොරුවේ පියාය "** ලෙසය.

එසේ වී නමුත්, කිතුනු සභාව තුළ සමහර අවස්ථාවලදී ඇත්ත නොව බොරුකීම අපට අසන්ට ලැබේ. **" මාර්ගයද, සැබෑවද, ජීවනයද මමය." (යොහන් 14 : 6)** කියා ප්‍රකාශකළ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ අනුගාමික - යන් වන්නාවූ අප අතරේ මෙසේ සිදුවීම ඉමහත් කණගාටුවට කරුණකි. ප්‍රේමණීය දේව දරුව, අපගේ පියාණන්වහන්සේ අපව කැඳවා තිබෙන්නේ,

**සැමවිටම ඇත්ත කතාකිරීමටය.**

**සැමවිටම ප්‍රේමයෙන් කතා කිරීමටය.**

**එපීස 4 : 12-16** දක්වා දෙවියන්වහන්සේ අපට උගන්වන්නේ දෙවියන්වහන්සේ සභාවෙන් බලාපොරොත්තු වන්නාවූ අතිශයින් වැදගත් දේවල් රැසකි.

මේවා සභාව තුළ ඇතිකිරීම උදෙසා, උන්වහන්සේ පස්වැදෑරුම් සේවය ස්ථාපිත කළ සේක.

උන්වහන්සේ මෙම අධ්‍යයනය තුළින් පෙන්වාදුන් ලෙස, අප සැමදෙන,

**ආත්මිකව වර්ධනය වී,**

**සේවයෙහි නිරත වී,**

**දේව වචනය තදින් අල්ලාගෙන,**

**සැමවිටම ඇත්ත කථාකරමින්,**

**ක්‍රිස්තුස්වහන්සේ අපට පවරා ඇති සේවයෙහි**

**විශ්වාසවන්තව යෙදී සිටිමු.**

**එසේ කිරීමට,**

**දෙවිපියාණන්වහන්සේම**

**ඔබට පිහිටවන සේක්වා !!!**

## සටහන

# අලුත් මනුෂ්‍යයා
# පැළඳගැනීම - 01



# එපීස අධ්‍යයනය 11

## අලුත් මනුෂ්‍යයා පැළඳගැනීම - 01

**එපීස 4 : 25 - 28**

**<u>හැඳින්වීම</u> :-**

**එපීස 4 : 24 :-**

**" සැබෑවේ ධර්මිෂ්ඨකමින්ද ශුද්ධකමින්ද දෙවියන්වහන්සේට සමානව මවනලද්දාවූ අලුත් මනුෂ්‍යයා පැළඳගන්නා ලෙසය."**

මෙම පදයේ පාවුල්තුමා අප සැමට අනුශාසනා කරන්නේ - " අලුත් මනුෂ්‍යයා පැළඳගන්නා ලෙසය ". මෙම අලුත් මනුෂ්‍යයා " දෙවියන්වහන්සේට සමානව මවනලද්දාවූ " බවද ඔහු සඳහන් කරයි. මේ පිළිබඳව **උත්පත්ති 1 : 26** දෙස බලමු.

**උත්පත්ති 1 : 26 :-**

**" තවද දෙවියන්වහන්සේ අපගේ ස්වරූපයෙන් අපගේ සමාන - ත්වය ලෙස මනුෂ්‍යයා සාදම්හ ; ...... "**

ආදම්ගේ වැටීමට පෙර, ඔහු දෙවියන්වහන්සේගේ සමානත්වය දරමින්, දෙවියන්වහන්සේ සමඟ ඒදන් උයනේ ඇවිදිමින්, කථාකරමින්, උන්වහන්සේගේ කැමැත්ත අනුව ජීවත්වූ බව අප දනිමු. ඉහත සඳහන් පදය **(එපීස 4 : 24)** මඟින් පාවුල්තුමා පෙන්වාදෙන්නේ, ක්‍රිස්තුස්වහන්සේ තුළ අපගේ අලුත් ජීවිතය කුමනාකාර විය යුතුද යන්නයි.

**2 කොරින්ති 5 : 17 :-**

**" එබැවින් යමෙක් ක්‍රිස්තුස්වහන්සේ තුළ සිටින්නේ නම් ඔහු අලුත් මැවිල්ලක්ය. පරණ දේ පහව ගියේය ; මෙන්න සියල්ලම අලුත් වී තිබේ. "**

" පරණ මනුෂ්‍යයා පහකර දමා, අලුත් මනුෂ්‍යයා පැළඳ - ගත්තාවූ " අපගේ ජීවිතවල මහත් වෙනස්කමක් ඇතිවිය යුතුම වේ. **එපීස 4 : 25-28** දක්වා කොටසෙහි සඳහන්වන අපගේ හැසිරීමේ නොහොත් ක්‍රියාකිරීමේ ඇතිවිය යුතු අතිශයින් වැදගත් වෙනස්කම් තුනක් දෙස, මෙම අධ්‍යයනයෙන් අප ඉගෙනගන්නට යන්නෙමු.

**අධ්‍යයනය :-**

පාවුල්තුමා අප ඉදිරියෙහි තබන්නාවූ ඉගැන්වීම් තුනෙහි පොදු ලක්ෂණ තුනක් ඇත. ඒවා නම් ;

(a) සෑම ඉගැන්වීමක්ම අප එක් එක්කෙනා අතර ඇති සම්බන්ධකම් පිළිබඳ වීම,

(b) සෑම අනුශාසනාවකටම සෘණාත්මක කොටසක්ද (තහනමක්), ධනාත්මක කොටසක්ද (අණක්) ඇතුලත්වීම,

(c) මේ අයුරින් අප ක්‍රියා කළ යුත්තේ මන්ද කියා පෙන්වා-දෙන්නාවූ හේතු සඳහන්වීම,

යන පොදු ලක්ෂණ තුනය.

## 1. බොරු කීම අත්හැරදමා සැබෑව කථාකිරීම - එපීස 4 : 25

**එපීස 4 : 25 :- '' එහෙයින් බොරුකීම අතහැරදමා, එක් එක්කෙනා තම තමාගේ අසල්වැසියා සමඟ සැබෑව කථාකරපල්ලා. මක්නිසාද අපි එකිනෙකාගේ අවයවයෝය. ''**

(i) **බොරුකීම අතහැර දැමීම**

වර්තමාන සමාජය වෙත අප මොහොතක් අපගේ අවධානය යොමු කළහොත්, මනුෂ්‍යයන් නොමඟ - යැවීමට මාධ්‍යය භාවිතා වන අයුරු අපට පැහැදිලිව පෙනෙනවා ඇත. අප දිනපතා නරඹන්නාවූ ' වෙළඳ දැන්වීම් ' මේ සම්බන්ධයෙන් කදිම නිදසුනකි.

අප වෙසෙන්නාවූ සමාජයට වැළඳී ඇති මෙම ' බොරුකීමේ රෝගය ' කිතුනු අපටද වැළඳීලාද ? යන ප්‍රශ්නය අප අපගෙන්ම අසා ගතයුතු ප්‍රශ්නයක් වේ.

අපගේ ප්‍රාදේශීය දේවස්ථානයට පැමිණෙන්නාවූ ඇදහිලිවන්තයෙකුගෙන්, ඉහත සඳහන් ප්‍රශ්නය ඇසුවහොත්, නිසැකවම ඔහුගේ පිළිතුර වන්නේ, '' කෙසේවත් නෑ '' හෝ ඊට සමාන පිළිතුරකි. එබැවින් කිතුනු අප (නොදැන) ' බොරු කියන ' අවස්ථා කිහිපයක් ඔබ ඉදිරියේ තබමි.

(a) අතිශයෝක්තිය -

බොහෝවිට 'අතිශයෝක්තිය' බොරු-කීමක් ලෙස අප තේරුම් නොගන්නා නමුත්, එය එක් ආකාරයක බොරුකීමකි.

(b) නිහඬව සිටීම -

අප ඉදිරියේ යම් කෙනෙක් තව කෙනෙකුට අසත්‍යය වන්නාවූ යමක් ප්‍රකාශ කළහොත්, අප එය අසත්‍යයක් බව දැන දැනත්, නිහඬව සිටිනවා නම්, අපද එම 'බොරුකීමට' හවුල් වන්නෙමු.

(c) සත්‍යයෙන් කොටසක් ප්‍රකාශකිරීම -

මෙවැනි ' බොරුකීම් ' අපගෙන් බොහෝ දෙනෙක් විසින් කරනු ලැබේ. අප විසින් මෙවැනි අවස්ථාවන්හිදී කරනු ලබන්නේ, යම්කිසි දෙයක් පිළිබඳව අපට වාසිජනක කොටස් පමණක් ප්‍රකාශකර, අවාසි කොටස් නොකිය සිටීමයි.

ඉහත සඳහන් අයුරින් නිදසුන් විශාල ප්‍රමාණයක් ඔබට පෙන්වාදීමට වඩා යෝග්‍ය වන්නේ, 'බොරුකීම' යන්නට පහත සඳහන් අර්ථය ඔබ ඉදිරියේ තැබීම යයි විශ්වාස කරමි. එනම්, " **ඕනෑම කෙනෙකු නොමඟ යැවීම උදෙසා, අප ගන්නාවූ සෑම පියවරක්ම, බොරුකීමය** " යන්නයි.

**<u>දේව දරුවෙනි</u>, <u>බොරුකීම සම්පූර්ණයෙන් අත්හරින්න</u>.**

(ii) **අසල්වැසියා සමඟ සැබෑව කථාකිරීම**

'බොරුකීම අතහැරදැමීම' අපගේ වෙනස්වීමට අයිති 'පරණ මනුෂ්‍යයා පහකර දැමීම' **(එපීස 4 : 22)** යන කොටස ලෙස විස්තර කළ හැක. නමුත් මෙය අපගේ වෙනස්වීමේ එක කොටසක් පමණකි. බොරුකීම අතහැර, ' අසල්වැසියා සමඟ සැබෑව කථාකිරීම ' අප ගතයුතු ධනාත්මක පියවරයි. මෙහිදී ' අසල්වැසියන් ' ලෙස සඳහන් කරනු ලබන්නේ ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරය නමැති සභාවට අයිති සැමදෙනා බව, " **මක්නිසාද අපි එකිනෙකාගේ අවයවයෝය,** " **(එපීස 2 : 25)** යන වචන වලින් පැහැදිලි වේ.

කිතුනු සභාවට අයිති අප සැම බොරුකීම සම්පූර්ණ - යෙන්ම අතහැර, එකිනෙකා සමඟ සැබෑව කථාකරමු. මෙයට අදාලවන්නාවූ පද දෙකක් ඔබ ඉදිරියේ තබමි.

**සෙකරියා 8 : 16 :- '' නුඹලා විසින් කටයුතු දේ මේවාය - එකිනෙකා තම තමුන්ගේ අසල්වාසියා සමඟ සැබෑව කථාකරපල්ලා ; ...... ''**

**එපීස 4 : 15 :- '' ප්‍රේමයෙන් යුක්තව ඇත්ත කථාකර - මින්, ...... ''**

මේ අයුරින් අප සභාවේ සැමවිටම ඇත්ත නොහොත් සැබෑව කථා කළ යුතුව ඇති අතර, බොහෝවිට සභාවේ අප හැසිරෙන්නේ මෙලෙස නොවේ.

**නිදසුනක් වශයෙන්**, දේව නමස්කාරයට පැමිණෙන යම්කිසි කෙනෙක් අඳින්නාවූ ඇඳුම් හෝ භාවිතකරන සමහර වචන දේව දරුවෙකුට නොහොබිනා බව ඔබ සිතන්ට පුළුවන. මෙවැනි අවස්ථාවක බොහෝ කිතුනුවන් ක්‍රියාකරන්නේ පහත සඳහන් අන්දම්වලින් එකක් අනුවය.

(a) ඒ ගැන කිසිවක් කතා නොකර සිටීම.

(b) ගෙදරදී තම පවුල සමඟ හෝ, අන් මිතුරන් සමඟ, මෙවැනි අය විවේචනය කිරීම.

(c) කෝපයෙන් යුක්තව, මෙවැනි අයට සැරෙන් කථාකිරීම.

සැබවින්ම දේව වචනය අපට පෙන්වාදෙන්නේ මේ ක්‍රියාමාර්ග තුනම වැරදි බවය. අප විසින් කළ යුත්තේ **මෙවැනි අයට ඉතා ආදරයෙන්, ඇත්ත කතාකරමින් ඔවුන්ගේ වරද නිවැරදි කිරීමට ඔවුන්ට උපකාර කිරීමය.**

(iii) **ඉහත සඳහන් ලෙස ක්‍රියා කිරීමට හේතුව**

අප මෙසේ ක්‍රියා කළ යුත්තේ, '' අප එකිනෙකාගේ අවයවයන් '' වන බැවිනි.

**රෝම 12 : 5 :- '' බොහෝ දෙනෙක්වූ අපිත් ක්‍රිස්තුස් - වහන්සේ තුළ එසේම එක ශරීරයක්ව, වෙන් වෙන් වශයෙන් ඔවුනොවුන්ගේ අවයවයෝ වෙමුව. ''**

2. <u>**කෝපයට පත්නොවී ඉවසීමෙන් ක්‍රියාකිරීම**</u>- <u>**එපීස 4 : 26, 27**</u>

**එපීස 4 : 26, 27 :- " කෝපවුණත් පව් නොකරල්ලා, ඉර බසින තුරු නුඹලාගේ කෝපය පවතින්ට ඉඩ නාරිල්ලා. යක්ෂයාට ඉඩා නොදෙල්ලා. "**

(i) **කෝපයට පත්නොවීම**

**එපීස 4 : 26 :- " කෝපවුණත් පව් නොකරල්ලා ......"** යන වචන මඟින් අපට ඉතා පැහැදිලිව පෙනීයන්නේ, කිතුනු අප කෝපයට පත්වුවත්, එම කෝපය පාපයක් බවට පත්වීම අපට වළක්වා ගත හැකි බවය. මේ අතරම දෙවියන්වහන්සේ සහ ක්‍රිස්තුස්වහන්සේ උදහසට පත්වූ බව දේව වචනයෙහි සඳහන් වේ.

**එපීස 5 : 6 :- " හිස් වචනවලින් නුඹලා රවටන්ට කිසි - වෙකුට ඉඩ නොදෙල්ලා. මක්නිසාද මේ දේවල් නිසා <u>දෙවියන්වහන්සේගේ උදහස අකීකරුකමේ පුත්‍රයන් පිටට පැමිණෙන්නේය</u>. "**

**මාර්ක් 3 : 5 :- " උන්වහන්සේ ඔවුන්ගේ සිත් දැඩිකම නිසා <u>දුක්වී, උදහසින් ඔවුන් වටකර බලා</u> : නුඹේ අත දිගුකරන්නැයි ඒ මනුෂ්‍යයා කී සේක. "**

අපගේ මැවුම්කාර දෙවියන්වහන්සේ සැමවිටම ධර්මිෂ්ඨව ක්‍රියා කරන්නාවූ දෙවියන්වහන්සේ වන සේක. උන්වහන්සේ කරන කිසිම ක්‍රියාවක් අධර්මිෂ්ඨ නොවන සේක. එබැවින් **එපීස 5 : 6** හි සඳහන්වන්නාවූ දෙවියන් - වහන්සේගේ උදහස ධර්මිෂ්ඨ වන්නාවූ, නිවැරදි වන්නාවූ එකක් බව අප දනිමුව.

මේ අයුරින්ම **මාර්ක් 3 : 5** හි සඳහන්වන්නාවූ යේසුස් - වහන්සේගේ උදහසද ධර්මිෂ්ඨ උදහසක් වේ. එබැවින් **එපීස 5 : 6 සහ මාර්ක් 3 : 5** යන පදවලින් අපට නිගමනය කළ හැක්කේ, සැම " කෝපයක්ම " පාපයක් ලෙස නොසැලකිය යුතු බවය. මෙලෙස දෙවියන් - වහන්සේගේ කෝපය කිසිවිටක පාප සහිත හෝ වැරදි නොවන අතර, <u>**මනුෂ්‍ය වූ අප තුළ ඇතිවන්නාවූ කෝප වැරදි කෝප සහ නිවැරදි කෝප ලෙස වර්ග කළ හැක**</u>.

ඉහත සඳහන් පද දෙක තුළින් අපට හඳුනාගත හැකි තවත් දෙයක් වන්නේ, දෙවියන්වහන්සේ උදහසට පත්කරන්නාවූ, සභාව තුළ ඇතිවිය හැකි මනුෂ්‍ය ක්‍රියාකාරකම් දෙකකි.

(a) **හිස් වචන වලින් මනුෂ්‍යයන් මුලාකිරීම (එපීස 5 : 6)**

(b) **සිත් දැඩිකම නිසා අසරණවූවන්ට පිහිටවීමට විරුද්ධවීම (මාර්ක් 3 : 5)**

(කරුණාකර **මාර්ක් 3 : 1 - 5** දක්වා කියවන්න)

මගේ ප්‍රේමණීය සහෝදරයා, සහෝදරී, දේව උදහස ඇතිකරන්නාවූ මෙවැනි දේ වලට, ඔබගේ ප්‍රාදේශීය සභාව තුළ කිසිසේත් ඉඩ නොහරින්න.

ඉහත සඳහන් පදවල අප දුටු අයුරින්, දෙවියන්වහන්සේ සහ ක්‍රිස්තුස්වහන්සේ, සභාවේ සිදුවුනාවූ මෙම ක්‍රියා හේතුවෙන් උදහසට පත්වූ සේක.

දේව දරුව, යේසුස්වහන්සේගේ අනුගාමිකයන් වන අපද, සභාවෙහි මෙවැනි දේ සිදුවන අතර, උදහසට පත්විය යුතු නොවේද ?

❖ **<u>නිවැරදි කෝපය</u> :-** වර්තමාන කිතුනු සභාව තුළ ' නිවැරදි කෝපය ' පවතින්නේ ඉතාමත් අඩු මට්ටමකය. අප අවට සමාජයේ සිදුවන්නාවූ අසාධාරණය, දූෂණය, වංචාව, මුලාකිරීම් යනාදියට විරුද්ධව හඬක් නැගීම සභාවට අසීරු දෙයකි. මෙනමුත් සභාව තුළ සිදුවන්නාවූ මෙවැනි දේ නිසැකවම ' නිවැරදි කෝපයක් ' අප තුළ ඇති කළ යුතුය. මෙනමුත් සභාව තුළ ස්වාමීන්වහන්සේගේ නාමය නිගාවට පත්කරන්නාවූ දේ සිදු වූ විට පවා එයට විරුද්ධව සාධාරණ කෝපයක් බොහෝවිට දැකීමට නොලැබීම, ඉතා කණගාටු සහිත කරුණකි.

❖ **<u>වැරදි කෝපය</u> :-** වැරදි කෝපය සාමාන්‍යයෙන් හටගන්නේ, අපගේ උඩගුකම, ආත්මාර්ථකාමීකම, ඊර්ෂ්‍යාව වැනි දේ නිසාය. මෙවැනි හේතූන් නිසා කෝපය ඇතිවූ විට, බොහෝ අවස්ථාවලදී මෙම කෝපය වර්ධනයවී, වෛරය, ක්‍රෝධය සහ පළිගැනීමේ ක්‍රියා බවටද පරිවර්තනය විය හැක.

ප්‍රේමණීය සහෝදරයා, සහෝදරී , අප සැම වැරදි කෝපයෙන් වැළැක්වී සිටීමට මුලු හදවතින් උත්සාහ කරමු. මේ අතරම **එපීස 5 : 6 සහ මාර්ක් 3 : 5** හි අප දුටු අයුරින්, **සභාවේ පාපයන් පිළිබඳව නිහඬව නොසිටිමු.**

(ii) **කෝපයට පත් වුවත් පව් නොකිරීම**

**යාකොබ් 1 : 19, 20 :-**

**" මාගේ ප්‍රේමවන්ත සහෝදරයෙනි, නුඹලා මේක දන්නහුය. නුමුත් එක එක මනුෂ්‍යයා ඇසීමට ඉක්මන් වේවා, <u>කථාකිරීමටත්</u> උදහස්වීමටත් <u>ප්‍රමාද වේවා</u>. මක්නිසාද <u>මනුෂ්‍යයාගේ උදහසින් දෙවියන්වහන්සේගේ ධර්මිෂ්ඨකම ඉෂ්ට නොවන්නේය</u>. "**

(a) **<u>අප කෝපයට පත්වූවිට, අප නිහඬව සිටීමට උත්සාහ කළ යුතුය</u>.**

අපගේ කෝපය " වැරදි කෝපයක් " වුවත්, " නිවැරදි කෝපයක් වුවත්, එම කෝපය සංසිඳෙන තෙක් නිහඬව සිටිමු. **අපට ප්‍රේමයෙන් සැබෑව කතාකිරීමට හැකි වන තෙක් නිහඬව සිටිමු. <u>සැබෑව වුවත් කෝපයෙන් ප්‍රකාශකිරීමෙන් වළකිමු</u>. (මනුෂ්‍යයාගේ උදහසින් දෙවියන්වහන්සේගේ ධර්මිෂ්ඨකම ඉෂ්ඨ නොවන බව (යාකොබ් 1 : 20) අමතක නොකරමු)**

(b) **<u>හැකි ඉක්මණින් අපගේ කෝපය සංසිඳුවා ගනිමු</u>**.

**" ඉර බසින තුරු නුඹලාගේ කෝපය පවතින්ට ඉඩ නාරිල්ලා." (එපීස 4 : 26)**

"ඉර බසින තුරු" යන වචනවල අරුත පැහැදිලිව තේරුම්ගැනීම උදෙසා, **ද්විතීය 24 : 14,15** වෙත ඔබගේ අවධානය යොමුකරමි.

**ද්විතීය කථාව 24 : 14, 15 :-**

**" ....... යම් දිළිඳුවූ අසරණවූ කුලීකාරයෙකුට පීඩා නොකරන්න ....... <u>ඉර බසින්ට පළමුවෙන් ඔහුගේ දවසේ කුලිය ඔහුට දීපන්න</u> ...... "**

මෙම පදයෙන් අපට පෙනීයන්නේ, " ඉර බසින තුරු " යන්නේ අදහස වන්නේ, " ප්‍රමාද නොවී " යන්න බවයි.

එබැවින් අප කෝපවූ විට මෙලෙස ක්‍රියාකරමු.

- ❖ කෝපයෙන් කථාකිරීමෙන් වළකිමු.
- ❖ කෝපය සංසිඳුවා ගැනීම උදෙසා දෙවියන්වහන්සේගේ පිහිට යාච්ඤාවෙන් අයදිමු.
- ❖ අපගේ කෝපය '' වැරදි කෝපයක් '' නම් දෙවියන් - වහන්සේගෙන් ඒ ගැන සමාව ඉල්ලා සිටිමු.
- ❖ අපගේ කෝපය හේතුවෙන් අප කවරෙකුට හෝ වරදක් කළා නම්, ඔහුගෙන් සමාව ඉල්ලා සිටිමු.
- ❖ **මෙම සියල්ලම '' ප්‍රමාද නොවී '' හැකි ඉක්මණින් කරමු.**

(iii) **යක්ෂයාට ඉඩ නොදීම**

**'' යක්ෂයාට ඉඩ නොදෙල්ලා '' (එපීස 4 : 27)**

ඉහත සඳහන් අයුරින්, අප ඉක්මණින් අපගේ කෝපය සංසිඳුවාගෙන ක්‍රියා නොකරන විට සිදුවන්නේ, මෙම කෝපය අපගේ සිත්වල මුල් ඇද ගැනීමයි.

අපගේ හදවත්වල පවතින මේ කෝපය ඉතා ඉක්මණින් ක්‍රෝධය, වෛරය සහ පළිගැනීමේ චේතනා අප තුළ ඇති කරයි. දේව දරුව, මේවා යක්ෂයාගේ ක්‍රියා බව තේරුම් ගන්න. **යක්ෂයාට මෙලෙස ඔබගේ හදවතේ ක්‍රියාකිරීමට ඉඩ නොදෙන්න.**

යටහත්වී, දෙවියන්වහන්සේ සමඟ සහ ඔබගේ සහෝදරයා සමඟ සමගිවී, දෙවියන්වහන්සේගේ සමාදානය ඔබගේ හදවතට ඇතුල්වීමට ඉඩහරින්න.

## 3. සොරකම අතහැර, වැඩ කරමින්, හිඟ අයට දීම - එපීස 4 : 28

**එපීස 4 : 28 :- '' සොරකම් කළාවූ අය තවත් සොරකම් නොකෙරේවා. ඒ වෙනුවට, හිඟ අයට දෙන්ට පුළුවන් වන පිණිස, තමාගේ අත්වලින් යහපත් වැඩ කරමින් වීර්‍යය කෙරේවා. ''**

(i) **සොරකම අතහැරීම**

මෙම වදන් කියවන්නාවූ සැමදෙනාගේම ප්‍රතිචාරය වන්නේ, '' මම නම් කිසිදාක සොරකම් කරන්නේ නෑ '' වන බව නිසැකය.

මෙනමුත් බොහෝවිට කිතුනු අප දන හෝ නොදන විවිධාකාර ''සොරකම්වල'' යෙදෙමු. මේවායින් සමහරක් වන්නේ,

(a) ප්‍රමාදවී කාර්යාලයට යෑම - අප නිතර අපගේ සේවා - ස්ථානයට ප්‍රමාදවී යන්නෙමු නම්, එම ස්ථානයේදී අප නිකරුනේ කාලය නාස්ති කරන්නෙමු නම්, අප සොරකම් කිරීමේ වරදට නොදනම පත්වී සිටින්නෙමු.

(b) ප්‍රමාදවී දේව නමස්කාර මෙහෙයට පැමිණීම.

(c) නිසි ප්‍රමාණයට ආදායම් බදු නොගෙවීම.

(d) විදේශගතව සිට නැවත මව් බිම කරා එන විට, විවිධ මාර්ග මගින් නියමිත රේගු බදු ගෙවීමෙන් වැලකීම.

(e) මිතුරෙකුගෙන් ණයට මුදල් ඉල්ලා ගෙන, එය නැවත ගෙවීමට '' අමතක කිරීම ''

(f) දෙවියන්වහන්සේට නොදීම.

**මලාකි 3 : 8 :-**

**'' මනුෂ්‍යයෙක් දෙවියන්වහන්සේගෙන් කොල්ල කනවා ඇද්ද? නුඹලා නම් මාගෙන් කොල්ලකන්නහුය. එහෙත් : අපි කෙසේ ඔබවහන්සේගෙන් කොල්ල කෑවෙමුදැයි නුඹලා අසන්නහුය. ඔතුවලින් සහ එසවීම් පූජාවලිනුත්ය. ''**

මෙම ලැයිස්තුවට, තව බොහෝ දේ එකතුකිරීමට, ඔබට හැකි බව නිසැකය. මේ සෑම දෙයක්ම පාහේ ඉතා '' හොඳ කිතුනුවන් '' ලෙස සලකනු ලබන්නාවූ බොහෝ දෙනෙක් විසින් පවා කරනු ලබති. මෙසේ කරන අය ඒවා සලකන්නේද '' ඉතා සුලු වැරදි '' ලෙසය. යක්ෂයාගේ මෙම බොරුවට නොරැවටෙමු. **සෑම '' සොරකමක්ම '' සම්පූර්ණයෙන්ම අතහරිමු.**

❖ ඉහත සඳහන් අයුරින් '' සොරකම් කිරීමෙහි '' අප යෙදෙන්නේ, එසේ කිරීම, '' වාසිදායක '' යයි සිතමිනි. දේව දරුව, යක්ෂයාගේ මේ බොරුවට නොරැවටෙන්න.

**අප කරන සෑම සොරකමක්ම අපට ගෙන දෙන්නේ වාසියක් නොව පාඩුවක්ය. (මලාකි 3 : 8 - 10** කියවා බලන්න).

දෙවියන්වහන්සේගෙන් අප සොරකම් කරන විට, අපගේ ආශිර්වාද අප අහිමි කරගන්නා බව මෙම පදවලින් පැහැදිලි වේ.

දෙවියන්වහන්සේගෙන් පමණක් නොව, අප **ඕනෑම කෙනෙකුගෙන්, ඕනෑම දෙයක් සොරකම් කරන අතර, අප දෙවියන්වහන්සේගේ ආශිර්වාද අහිමි කරගන්නෙමු. මෙයින් සිදුවන අලාභයේ ප්‍රමාණය අපට තක්සේරු කිරීමට පවා නොහැකිය.**

(ii) **යහපත් වැඩක යෙදෙන්න**

සෑම පුරුෂයෙක්ම යම්කිසි වැඩක යෙදිය යුතු බව අපි දන්නෙමු. එමනිසා මේ සම්බන්ධයෙන් වැඩි දුර නොලියා, දේව වචනයෙන් පද දෙකක් පමණක් ඔබ ඉදිරියේ තබමි.

**1 තෙසලෝනික 4 : 12 :- '' ....... නුඹලාගේම කාරණා බලාගන්න මෙන්ද, නුඹලාගේ අත්වලින් වැඩකරන මෙන්ද නුඹලාට අවවාද කරමුව. ''**

**2 තෙසලෝනික 3 : 10 :- '' මක්නිසාද යමෙක් වැඩ කරන්ට කැමති නැත්නම් ඔහු කෑම නොකා සිටීවා කියා අපි නුඹලා සමඟ සිටිද්දීම පවා නුඹලාට අණ කෙළෙමුව. ''**

(iii) **හිඟ අයට දෙන්න**

පරණ ගිවිසුම කියවන අප දකින්නේ, දුගී, අසරණ, අග හිඟකම් ඇත්තාවූ, දුර්වල අය පිළිබඳව දෙවියන්වහන්සේ දක්වන්නාවූ විශේෂ සැලකිල්ලයි.

'' විදේශිකයන්ට, පියා නැත්තන්ට සහ වැන්දඹුවන්ට '' උපකාර කරන ලෙස දේව වචනය නිතරම උගන්වයි. දේව දරුව, දෙවියන්වහන්සේගේ මේ '' දීමේ හදවත '' අප තුළද තිබිය යුතුවේ.

**මතෙව් 5 : 41 :- '' නුඹෙන් ඉල්ලන්නාට දීපන්න, ....... ''**

දේව දරුවෙනි, අපගෙන් ''ඉල්ලන්නාවූ'' දුගීන්ට අසරණයින්ට සහ හිඟ අයට නොමසුරුව දීම, අප විසින් කළ යුතු දෙයකි.

❖ මෙම අධ්‍යයනයේ මූලික පණිවිඩය වන්නේ පරණ මනුෂ්‍යයා පහකර දමා, අලුත් මනුෂ්‍යයා පැළඳගැනීමේ වැදගත්කමයි.

අප මෙසේ කළවිට, අපගේ ජීවිතවල ඇතිවන්නාවූ පරිවර්තනය, පුදුමාකාරය. මෙම චමත්කාර වෙනස්වීම වැඩිදුරට පෙන්වාදීම උදෙසා **එපීස 4 : 28** වෙත අවධානය යොමු කරමු.

| <u>පරණ මනුෂ්‍යයා</u> | <u>අලුත් මනුෂ්‍යයා</u> |
|---|---|
| කෙසේ හෝ **තමා ලබා ගැනීම** | මුදල් උපයා **හිඟ අයට දීම** |
| තමා උදෙසා ජීවත්වීම | යේසුස්වහන්සේ මෙන්, අනුන් උදෙසා ජීවත්වීම |

ප්‍රේමණීය සහෝදරයා, සහෝදරී, ක්‍රිස්තුස්වහන්සේ තුළ සිටින්නාවූ අපගේ ජීවිතවල ඇති පරිවර්තනය, අපගේ හැසිරීමෙන් අන් අයට ප්‍රකාශ විය යුතුය.

මෙය උදෙසා, අප සැමදෙන,

**පරණ මනුෂ්‍යයා පහකර දමා,**

**අලුත් මනුෂ්‍යයා පැළඳගෙන,**

**අපගේ පියාණන්වහන්සේට**

**ගෞරවය ගෙනදෙමින්**

**ලෝකයේ ආලෝකය වෙමු !!!**

## සටහන

## සටහන

## සටහන

# අලුත් මනුෂ්‍යයා පැළඳගැනීම - 02



# එපීස අධ්‍යයනය 12

## අලුත් මනුෂ්‍යයා පැළඳගැනීම - 02

**එපීස 4 : 29 - 32**

**හැඳින්වීම** :-

**එපීස 4 : 25-28** දක්වා කොටසෙහි, අලුත් මනුෂ්‍යා පැළඳගත් කෙනෙකුගේ ජීවිතයේ ඇති විය යුතු, ඉතා වැදගත් වෙනස්වීම් තුනක් වෙත අපි අපගේ අවධානය යොමු කළෙමු.

මෙම අධ්‍යයනය තුළින් **එපීස 4 : 29-32** දක්වා කොට - සෙහි සඳහන්වන්නාවූ, '' පරණ මනුෂ්‍යයා පහකර දමා '', ''අලුත් මනුෂ්‍යයා පැළගත්තාවූ'' අපගේ ජීවිතවල ඇති විය යුතු මහත් වෙනස්කම් දෙකක් වෙත ඔබගේ අවධානය යොමු කරනු ලැබේ.

**අධ්‍යයනය** :-

1. **දුෂ්‍ය කථා අතහැරදමා යහපත් දේ කථා කිරීම** - **එපීස 4 : 29, 30**

(i) **දුෂ්‍ය කථා අතහරින්න**

**එපීස 4 : 29 :- '' නුඹලාගේ මුඛයෙන් කිසි දුෂ්‍ය කථාවක් නික්මෙන්ට ඉඩ නෑර, අසන්නන්ට ප්‍රයෝජන ලැබෙන පිණිස ඕනෑකරන වර්ධනවීම සඳහා යහපත් දේම කියාපල්ලා. ''**

(a) ඉහත සඳහන් පදයෙහි ''දුෂ්‍ය'' ලෙස පරිවර්තනය කර ඇති SAPROS යන ග්‍රීක් වචනය, **මතෙව් 7 : 17, 18, 12 : 33** යන පදවල නරක ගස් සහ නරක එල විස්තර කිරීමට භාවිතා කර ඇති වචනයම වේ.

**මතෙව් 7 : 17, 18 :- '' එසේම හොඳ ගස් හොඳ එල දරයි; නුමුත් නරක ගහ නරක එල දරයි. හොඳ ගහක නරක එලවත් නරක ගහක හොඳ එලවත් හටගන්ට බැරිය. ''**

**මතෙව් 12 : 33 :- '' ගහත් ඒකේ එලත් යහපත්යයි පිළිගනිල්ලා ; නොහොත් ගහත් ඒකේ එලත් නරක යයි පිළිගනිල්ලා. මක්නිසාද ගහ ඒකේ එලවලින් ඇඳින ගනු ලැබේ. ''**

අපගේ ස්වාමීවූ යේසුස්වහන්සේ, මෙහිදී අපට ඉතා පැහැදිලිව උගන්වන්නේ, අපගේ කථාව දූෂ්‍ය නොහොත් ''නරක'' නම්, එයින් පෙන්නුම් කරන්නේ, අපගේ අභ්‍යන්තරයද ඒ ආකාරයටම දූෂ්‍යව පවතින බවයි.

ප්‍රේමණීය දේව දරුව, මෙය තදින් අල්ලාගන්න. දේව දරුකමට ඇතුල්ව සිටින්නාවූ, මෙම ඉගැන්වීම අධ්‍යයනය කරන්නාවූ ඔබ කිසිවෙක් කාමමිථ්‍යාචාරය, දරුණු අපරාධ, සොරකම, බේබදුකම වැනි පාපවල යෙදෙන කෙනෙක් යයි නොසිතමි. මේ අතරම, **කිතුනු අප සැම වඩාත්ම සාර්ථකව යක්ෂයා පාපයට අසුකර ගන්නේ, අපගේ මුඛය මගින්** බව මම විශ්වාස කරමි.

**එබැවින් සෑම දූෂ්‍ය කථා හෝ '' අපවිත්‍ර කථා '' හෝ '' කැත කථා '' සම්පූර්ණයෙන්ම අතහැර දැමීමට අදම, අදිටන් කර ගනිමු.**

අපගේ මුඛයෙන් කිසි දූෂ්‍ය කථාවක් නික්මෙන්ට ඉඩ නාරිමු.

(b) නරක එල වලින් කිසිකෙනෙකුට ප්‍රයෝජනයක් නැති ලෙසම දූෂ්‍ය කථාද නිෂ්ඵල වේ. අප නිෂ්ඵල වචන නොහොත් දූෂ්‍ය කථාවල යෙදෙන අතර, දෙවි සමිඳුන් ඒ ගැන ප්‍රසන්න නොවන සේක.

**මතෙව් 12 : 36 :- '' තවද මනුෂ්‍යයන් කියන්නාවූ සියලු නිෂ්ඵල වචන ගැන විනිශ්චය දවසේදී උත්තර දෙන්ට වෙන්නේ යයි නුඹලාට කියමි. ''**

**දේව දරුව, දූෂ්‍ය කථාවල යෙදීමේ පාපයෙන් මිදෙන්න.**

එසේ නැතිනම් විනිශ්චය දවසේදී ඒ ගැන අප හට දුක්වීමට සිදුවනවා ඇත.

(c) අපගේ මුවින් නික්මෙන්නාවූ වචන තුළ ඇත්තාවූ බලය ඉමහත්ය.

**(යාකොබ් 3 : 2, 5, 6, 9-11 කරුණාකර කියවන්න)**

**යාකොබ් 3 : 6 :-**

**" එය අප අවයවයන් අතරේ අධර්මිෂ්ඨකමේ ලෝකයක්ය. ඒක මුළු ශරීරය කිලුටු කොට, සකල ලෝකයට ගිනි අවුලවයි, ඒකට ගිනි ඇවිලෙන්නේ නිරයෙන්ය. "**

නවීන ලෝකයේ, අති බලවත් අවි ආයුධ ඇති නමුත්, වඩාත්ම සංඛ්‍යාවකට වඩාත්ම දුක සහ වේදනාව ගෙන දෙන්නාවූ අවිය, " දිව " ලෙස සැලකිය හැක.

**" සකල ලෝකයට ගිනි අවුලවන දිවට ගිනි ඇවිලෙන්නේ නිරයෙන් "** බව දේව වචනයේ සඳහන් වෙයි.

දේව දරුව, දුෂ්‍ය කථාවල යෙදෙමින්, යක්ෂයාට ඔබගේ දිව භාවිතකිරීමට ඉඩ නොහරින්න.

(d) **හිතෝපදේශ 18 : 21 :- " මරණයත් ජීවනයත් දිවේ වසඟ - යෙහි ඇත්තාහ. "**

**හිතෝපදේශ 12 : 18 :- " කඩුවෙන් අනින්නාක් මෙන් රළු බස් කීමක් තිබේ ; එහෙත් ඥානවන්තයාගේ දිව සුවය හට ගන්වන්නේය. "**

කිතුනු අප සැම, සකල ජනතාවට ''ජීවනය'' සහ ''සුවය'' ගෙන දීම උදෙසා, අපගේ දිවවල් පාවිච්චි කරමු.

(e) ඉහත සඳහන් අයුරින්, අපගේ වචන සහ කථා දුෂ්‍ය බවට පත්වීම වලක්වා ගැනීම පිණිස, අප යමෙකුට කථාකිරීමේදී මෙම ප්‍රශ්න අපගෙන්ම අසා ගනිමු.

(A) මා කියවන්නාවූ දේ **සත්‍යයද ?**

**එපීස 4 : 15 :- " ....... ප්‍රේමයෙන් යුක්තව ඇත්ත කථා කරමින් ...... "**

සත්‍යයට එකතු කරමින් (අතිශයෝක්තිය) හෝ අඩුකරමින් (අපට වාසි දේ පමණක් කීම) හෝ කොටස් සඟවමින් (මුලා කිරීම උදෙසා) කථා කිරීමෙන් වැලකීම උදෙසා, මෙම ප්‍රශ්නය අපගෙන්ම අසාගැනීම ඉතා වැදගත්වේ.

(B) මා කියන්නාවූ දේ **අසන්නාට අවශ්‍යද? ප්‍රයෝජනවත්ද ?** බොහෝවිට අසන්නාට දැනගැනීමට පවා අවශ්‍ය නොවන්නාවූ දේ, නිකරුනේ කීමෙන් වලකිමු.

(C) මෙසේ කීමට, **මාගේ අරමුණ කුමක්ද ?** දේව දරුව, බොහෝවිට ''දූෂ්‍ය කථා'' අපගේ මුවින් පිටවන්නේ, වැරදි අරමුණක් ඇතිව අප කථාකරනවිට බව අමතක නොකරන්න.

(D) මා කියන දේ ප්‍රකාශකිරීමට **මෙය හරි ස්ථානයද ?** නිවැරදි දේ, වැරදි ස්ථානයක (වැරදි අයට) ප්‍රකාශකිරීම, යක්ෂයාගේ අතට ''අවි ලබාදීමක්'' විය හැකි බව තේරුම් ගන්න.

(E) මෙය කීමට දැන් **හරි වේලාවද ?** අසන තැනැත්තා දුකින්, වේදනාවෙන්, අසරණ වී, කුපිතව යනාදී අවස්ථාවන් වල සිටින විට අපගේ වචන ඔහුගේ තත්ත්වය පිළිබඳව විශේෂයෙන් සංවේදී විය යුතු බව වටහාගන්න.

(ii) **යහපත් දේ කියන්න**

**එපීස 4 : 29 :- '' ..... අසන්නන්ට ප්‍රයෝජන ලැබෙන පිණිස ඕනෑකරන වර්ධනවීම සඳහා යහපත් දේම කියාපල්ලා. ''**

දෙවියන්වහන්සේ අපව කැඳවන්නේ, අන් අයට ප්‍රයෝජනවත් වන්නාවූද, ඔවුන්ගේ ආත්මික වර්ධනය ගෙන දෙන්නාවූද අයුරින් කථා කිරීමටයි. මෙසේ කථා කිරීමට, ඔබට උපකාර කිරීම උදෙසා, විවිධ අවස්ථාවන් කිහිපයක් ඔබ ඉදිරියේ තබමි.

(a) <u>යමෙකුව සත්‍ය කරා මඟපෙන්වීම උදෙසා කථාකිරීම</u>

**හොෂෙයා 4 : 6 :- '' මාගේ සෙනඟ දැනගැනීම නැතිකමෙන් නාස්තිවී සිටිති. ''**

බොහෝවිට මනුෂ්‍යයන් විනාශය කරා යන්නේද, ආත්මිකව වැටෙන්නේද, (දේව වචනය ගැන) ඔවුන්ගේ දැනගැනීම මද නිසාය. මෙවැන්නවුන්ට සත්‍ය ඉගැන්වීම උදෙසා, අපගේ වචන පාවිච්චි කරමු. නිවැරදි මඟපෙන්වීම (දේව වචනය අනුව) ඔවුන්ට ලබා දෙමු.

(b) <u>සමාදානය ඇති කිරීම උදෙසා කථා කිරීම</u>
දෙදෙනෙක් අතර ප්‍රශ්නයක් හෝ ගැටළුවක් හටගත් විට, ඔවුන්ව සමාදානය කිරීම උදෙසා අපගේ මුඛය භාවිත කරමු.

**මතෙව් 5 : 9 :- " සමාදානය කරන්නෝ ආශිර්වාද ලද්දෝය; මක්නිසාද ඔව්හු දෙවියන්වහන්සේගේ පුත්‍රයෝ යයි කියනු ලබන්නෝය. "**

(c) <u>දුකින් සිටින්නවුන් සනසන්නාවූ දයාවන්ත වචන කථා - කිරීම</u>

**මතෙව් 5 : 7 :- " දයාවන්තයෝ ආශිර්වාද ලද්දෝය ; මක්නිසාද ඔව්හු දයාව ලබන්නෝය. "**

(d) <u>මනුෂ්‍යයන් දිරිමත් කරන්නාවූ, උනන්දු කරන්නාවූ, ඔවුන්ට බලාපොරොත්තු ගෙන දෙන්නාවූ වචන කථා කිරීම</u>
අපගේ සභාවල පවා බලාපොරොත්තු බිඳ වැටුනාවූ, අධෛර්යයට පත්වූවාවූ අය අපට මුණගැසේ. මෙවිට අප විසින් කළ යුතුව ඇත්තේ ඔවුන් විවේචනය කිරීම නොව, දෙවියන්වහන්සේගේ පොරොන්දු වෙත ඔවුන් යොමු - කරමින්, ඔවුන්ගේ ඇදහිල්ල ශක්තිමත් කරමින්, ඔවුන්ට බලාපොරොත්තු ගෙන දීමය. (මෙය උදෙසා මා නිතරම ඉතා යහපත් ප්‍රතිඵල සහිතව පාවිච්චි කරන්නාවූ බයිබල් පදයක් වන්නේ **රෝම 8 : 28** වන පදයයි).

(e) <u>කෝපය සංසිඳුවන්නාවූ වචන කථා කිරීම</u>
යමෙක් කෝපයට පත් වූ විට, අප ආඥානව කථාකිරීම තුළින්, ඔහුගේ කෝපය තවත් අධික විය හැකිය. එබැවින් මෙවැනි කෙනෙකුට කථාකිරීමට පෙර, අප ඔහු ගැන යාච්ඤා කිරීමද, යටහත්කම සහ ඉවසිල්ල පැළඳගැනීමද අතිශයින් වැදගත් වේ.

දේව දරුව, ඉහත සඳහන් අවස්ථාවන් පහට, ඔබ තවත් අවස්ථා යාච්ඤාවෙන් එකතුකර, **" ඔබගේ දිව සුවය හටගැන්වීම " (හිතෝපදේශ 12 : 18)** උදෙසා පාවිච්චි කරන්න. ඔබ මෙසේ කරන අතර, ඔබට ප්‍රේමකරන්නාවූ ඔබගේ පියාණන්වහන්සේ, ඔබට වැඩි වැඩියෙන් ආශිර්වාද කරනවා ඇත.

**කොලොස්සි 4 : 6 :- " ..... නුඹලාගේ කථාව නිතරම ලුණෙන් රසවත්ව, අනුග්‍රහයෙන් යුක්තව තිබේවා. "**

(iii) **දෙවියන්වහන්සේගේ ශුද්ධාත්මයාණන්වහන්සේට දුක් නොදෙන්න**

**එපීස 4 : 30 :-**

" **දෙවියන්වහන්සේගේ ශුද්ධාත්මයාණන්වහන්සේට දුක් නොදෙල්ලා ; මක්නිසාද උන්වහන්සේ තුළ නුඹලා මිදීමේ දවසට මුද්‍රා කරනු ලැබූවහුය.** "

අප පසුගිය අධ්‍යයනයේදී දුටු ආකාරයට, අලුත් මනුෂ්‍යයා පැළඳගත් අපගේ හැසිරීමේ වෙනස්වීම් උගන්වන්නාවූ **එපීස 4 : 25 සිට එපීස 5 : 4 දක්වා** කොටසෙහි එම වෙනස්වීම් ඇතිකරගැනීමේ වැදගත්කම පෙන්වා - දෙන්නාවූ හේතුව පැහැදිලි කරයි.

මේ අනුව අප දූෂ්‍ය කථා අතහැරිය යුත්තේ, **දූෂ්‍ය කථා ශුද්ධාත්මයාණන්වහන්සේට දුක් දෙන බැවින්ය.** මෙහි වැදගත්කම නිසාම, ශුද්ධාත්මයාණන්වහන්සේට දුක්දීම පිළිබඳව දෙවියන්වහන්සේ මාගේ හදවතේ තැන්පත් කළ ඉගැන්වීම ඉතා යටහත්වද, ගෞරවයෙන්ද ඔබ ඉදිරියේ තබමි.

දේව දරුකමට ඇතුල්වී ඇති අප සැම, පරණ මනුෂ්‍යයා පහකර දමා ජීවත්වීමට උත්සාහ කරන්නෝ වෙමු. මේ අතර අපගේ පරම හතුරා වන යක්ෂයා නිරතුරු උත්සාහ කරන්නේ, පරණ මනුෂ්‍යයා අප තුළ අවදිකර, අපව පාපයට ඇද දැමීමටය. මෙසේ කිරීම උදෙසා යක්ෂයා භාවිතාකරන්නාවූ උපක්‍රමය වන්නේ, අපව පරීක්ෂාවට ලක් කිරීමය.

**එපීස 4 : 26 :-**

" **කෝපවුණත් පව් නොකරපල්ලා. ඉර බසිනතුරු නුඹලාගේ කෝපය පවතින්ට ඉඩ නාරිල්ලා. යක්ෂයාට ඉඩ නොදෙල්ලා.** "

පසුගිය අධ්‍යයනයේ අප තේරුම් ගත් ආකාරයට, සැම කෝපයක්ම පාපයක් නොවේ. මෙනමුත් අප තුළ නිවැරදි කෝපයක් ඇති වූ විට පවා, යක්ෂයා උත්සාහ කරන්නේ, එම කෝපය මඟින් අපව පරීක්ෂාකොට අපව පාපය කරා ගෙන යෑමටය.

ශුද්ධාත්මයාණන්වහන්සේගේ ආනුභාවයෙන්, පාවුල්තුමා **එපීස 4 : 26** හි දෙන අනුශාසනා පහත අයුරින් ප්‍රකාශ කළ හැක.

**" කෝපවුණත්, යක්ෂයාට ඉඩ නොදී (යක්ෂයාගේ පරීක්ෂාවට අසුනොවී) පාපයට නොවැටී සිටපල්ලා. "**

නමුත් බොහෝවිට අප ක්‍රියාකරන්නේ මේ අයුරින් නොවේ. කෝප වූ විට අප බොහෝවිට අන් අයට නින්දා, අපහාස සහ බැන වැදීම (දූෂ්‍ය කථා කීම) තුළින් සිදුවන්නේ අප ''යක්ෂයාට ඉඩදී, පාපයට වැටීමය''.

**ලූක් 6 : 45 :- " යහපත් මනුෂ්‍යයා තමාගේ සිතෙහි වූ යහපත් සම්පතෙන් යහපත් දේද, නපුරු මනුෂ්‍යයා නපුරු සම්පතෙන් නපුරු දේද පිටතට ගෙනෙන්නේය. "**

දේව වචනයෙන් අප දකින්නේ, අපගේ මුවින් දූෂ්‍ය කථා පිටවන්නේ, අපගේ අභ්‍යන්තර නොහොත් අපගේ සිත කිලුටු වූ විට බවයි. එබැවින් දේව දරුවන් වූ අප දූෂ්‍ය කථාවල යෙදෙන විට, එයින් පෙනීයන්නේ අප යක්ෂයාගේ පරීක්ෂාවලට අසුවී, පරණ මනුෂ්‍යයාගේ ක්‍රියාවලට අපගේ ජීවිතවල නැවත ඉඩ දෙන බවයි.

- ❖ **අප යක්ෂයාට පරාජය වී, පරණ මනුෂ්‍යයාගේ ක්‍රියාවල නැවත යෙදෙන බවට, ප්‍රථම සාක්ෂිය නිකුත්වන්නේ, අපගේ වචන වලිනි.**
- ❖ **මෙම පරාජය, අපට ප්‍රේමකරන්නාවූ දෙවියන්වහන්සේගේ ශුද්ධාත්මයාණන්වහන්සේට දුක සහ වේදනාව ගෙනදෙයි.**

<u>දේව දරුව, දෙවියන්වහන්සේද ශුද්ධාත්මයාණන්වහන්සේද ඔබට අතිශයින් ප්‍රේමකරන නිසා, ඔබ නැවත පරණ මනුෂ්‍යයා පැළඳගන්නා විට ශුද්ධාත්මයාණන්වහන්සේ දුක් වනසේක</u>.

**නිදසුනක් වශයෙන්,** අකීකරු පුත්‍රයාගේ උපමාව ගැන මොහොතකට සිතා බලන්න. ඌරු කොටුවට වැටුණාවූ අකීකරු පුත්‍රයා, නැවත ගෙදර පැමිණිවිට පියා ඔහුට දක්වන්නාවූ අසීමිත ප්‍රේමයද, පියාට ඇතිවන්නාවූ ඉමහත් සතුටද අප දකිමු.

මෙම පුතා ටික දිනකට පසු, ඔහු වැටී සිටියාවූ ඌරු කොටුව කරා නැවත ගමනක් අරඹන්නේ නම්, පියාට ඇති වන වේදනාව කෙතරම් අධිකදැයි සිතා බලන්න.

**අප දුෂ්‍ය කථාවල යෙදෙන අතර, අප පෙන්නුම් කරන්නේ, අප නැවත පරණ මනුෂ්‍යයා වෙත (ඌරු කොටුව වෙත) ආකර්ශනය වන බවයි. මෙසේ වෙන්ට ඉඩ නොහරිමු. ශුද්ධාත්මයාණන්වහන්සේට දුක් නොදෙමු.**

**එපීස පොතේ හතරවන පරිච්ඡේදයේ,** අපගේ කථාව ගැන උගන්වන්නාවූ දේ, ඔබගේ පහසුව සඳහා සාරාංශ කිරීමට කැමැත්තෙමි.

1. **එපීස 4 : 15** - සැමවිටම ප්‍රේමයෙන් යුක්තව ඇත්ත කථා කරන්න.
2. **එපීස 4 : 25** - බොරුකීම සම්පූර්ණයෙන්ම අතහැර දමන්න.
3. **එපීස 4 : 25** - අසල්වැසියා සමග සැබෑව කථාකරන්න.
4. **එපීස 4 : 26** - කෝප වී කථා නොකරන්න. එසේ කළවිට යක්ෂයාට ඔබ ඉඩ දෙනවා ඇත. ඌට ඔබ අසුවනවා ඇත.
5. **එපීස 4 : 29** - කිසි දුෂ්‍ය කථාවක නොයෙදෙන්න.
6. **එපීස 4 : 29** - අසන්නන්ට ප්‍රයෝජනවත් වන්නාවූ යහපත් දේ කියන්න.
7. **එපීස 4 : 30** - යක්ෂයාට ඉඩදී, දුෂ්‍ය කථාවල යෙදී, ශුද්ධාත්මයාණන්වහන්සේට දුක් නොදෙන්න.

**2. <u>තික්තකම යනාදිය අතහැරදමා, එකිනෙකාට කමාවීම</u> - <u>එපීස 4 : 31, 32</u>**

(i) **තික්තකම පහකර දමන්න**

**එපීස 4 : 31 :- " සියලු තික්තකමත් කෝපයත් උදහසත් කෝලාහලත් අපහාසත් සියලු ක්‍රෝධත් නුඹලා කෙරෙන් පහකරනු ලැබේවා. "**

(මෙයට සමාන වූ **කොලොස්සි 3 : 8** ද කියවා බලන්න).

මෙහි සඳහන්වන්නාවූ වැරදි ආකල්ප සහ ක්‍රියා වැඩියෙන් තේරුම් ගැනීම උදෙසා, ග්‍රීක් භාෂාවේ ඒවාට සමාන වචන දෙස බැලීම පිටුවහලක් වේ.

(a) **තික්තකම** - BITTERNESS (**E**nglish)
PIKRIA (**G**reek)

දිගුකල් පවතින්නාවූ ප්‍රතිවිරෝධය, පැරණි ආරවුල් ගැන නිතර සිතීම, පළිගැනීමේ චේතනා සහ අපහාස සිත තුළ තුඩුදීම යනාදිය මෙයට ඇතුලත් වේ.

**හෙබ්‍රෙව් 12 : 15 :- "...... තික්තකමේ මුලක් හටගෙන එයින් නුඹලා කලඹා, බොහෝ දෙනෙක් කිලුටු නොවන පිණිසද, "**

(b) **කෝපය** - WRATH (**E**) - THUMOS (**G**)

සිතේ යටපත්කරගෙන තිබෙන තරහ. මෙය අලු යට සැඟවුනු ගිනිපෙලෙල්ලක් මෙන් හදිසියේ ඇවිලෙයි. එනමුත් ඉක්මණින් සංසිඳෙයි.

(c) **උදහස** - ANGER (**E**) - ORGĒ - (**G**)

මෙය කෝපයට බොහෝසෙයින් සමාන වෙයි. මේ දෙක අතර ඇති මූලික වෙනස වන්නේ, කෝපය හදිසියේ ඇවිලෙන නමුත්, උදහස ඇත්තා එය පිටස්තරව ප්‍රකාශවීම සාර්ථකව පාලනය කිරීමයි.

(d) **කෝලාහල** - CLAMOUR (**E**) - KRAUGĒ (**G**)

කෑ ගසමින්, පරුෂ වචන කියමින්, සන්ඩු දබර වීම.

(e) **අපහස** - SLANDER (**E**) - BLASPHĒMIA (**G**)
අන් අය නැති තැන, ඔවුන් ගැන විවිධ කට කථා ප්‍රකාශ කිරීම.

(f) **ක්‍රෝධය** - MALICE (**E**) - KAKIA (**G**)
මෙම වචනය දේව වචනයේ භාවිතා වන්නේ, '' කරදර '' සහ '' නපුරුකම '' යන අදහස පෙන්නුම් කිරීමටයි.

**මතෙව් 6 : 34 :- '' ..... දවසේ කරදර** (KAKIA) **ඒ දවසට සෑහෙයි. ''**

**1 කොරි. 14 : 20 :- '' ..... නපුර** (KAKIA) **සම්බන්ධයෙන් බිළින්දෝ වෙයල්ලා. ''**

ඉහත සඳහන් වචන හයට, යටහිතින් තරහෙන් සිටීම, ඇවිලෙන ගින්නක් වැනි කෝපය, ප්‍රසිද්ධියේ බැනවැදීම, සහ පිටතින් සඟවාගත් වෛරය වැනි සියල්ල ඇතුලත් වන අතර, **දෙවියන්වහන්සේ අපව කැඳවන්නේ - මේ සියල්ල අපගේ ජීවිතවලින් පහකර දැමීමටය.**

(ii) **එකිනෙකා කෙරෙහි ගුණවන්තව අනුකම්පා ඇතුව සිටින්න**

**එපීස 4 : 32 :-**

**'' නුඹලා එකිනෙකා කෙරෙහි ගුණවන්තව අනුකම්පා ඇතුව සිට, ක්‍රිස්තුස්වහන්සේ තුළ දෙවියන්වහන්සේ නුඹලාට කමාවුණ ලෙසම නුඹලාත් එකිනෙකාට කමාවෙයල්ලා. ''**

පරණ මනුෂ්‍යයාගේ ක්‍රියාකිරීම පැනනැඟෙන්නේ ඔහුගේ ඇතුළතින් නොහොත් ඔහුගේ සිතින්ය. (**මාර්ක් 7 : 21**). මේ අයුරින්ම අලුත් මනුෂ්‍යයාගේ ක්‍රියාකිරීමද පැනනැඟෙන්නේ ඔහුගේ අලුත්වුනාවූ නොහොත් පරිවර්තනය වූවාවූ සිතින්ය.

**එපීස 4 : 23, 24 :-**

**'' <u>නුඹලා නුඹලාගේ චිත්තාත්මයෙන් අලුත් කරනු ලැබ</u>, ...... අලුත් මනුෂ්‍යයා පැළඳගන්නා ලෙසය. ''**

**රෝම 12 : 2 :-**

**" නුඹලා මේ ලෝකයේ ආකාරයට සමාන නොවී, දෙවියන් - වහන්සේගේ කැමැත්ත ..... දැනගන්නා පිණිස සිත අලුත් කර ගැනීමෙන් අන්‍යාකාර ඇත්තෝ වෙයල්ලා. "**

එබැවින් අපද අපගේ සිත් අලුත් කරගනිමින්, දෙවියන් - වහන්සේගේ කැමැත්ත අනුව අලුත් මනුෂ්‍යයාගේ ක්‍රියා අපගේ ජීවිතවලින් ලොවට ප්‍රකාශ කරමු.

(a) **ගුණවන්තව** (KINDLY) **ක්‍රියාකරමු.**

**1 කොරි. 13 : 4 :- " ප්‍රේමය බොහෝ ඉවසිලිවන්තය, ගුණවන්තය. "**

**ලූක් 6 : 35 :- " නුමුත් නුඹලාගේ සතුරන්ට ප්‍රේමකරපල්ලා ...... මක්නිසාද කෘතෝපකාර නොසලකන්නන්ටද, දුෂ්ඨයන්ටද උන්වහන්සේ කරුණාවන්තව සිටින සේක. "**

**මතෙව් 5 : 44, 45 :- " ....... නුඹලාට පීඩාකරන්නන් උදෙසා යාච්ඤා කරපල්ලා, මෙසේ නුඹලා ස්වර්ගයෙහි සිටින නුඹලාගේ පියාණන්වහන්සේගේ පුත්‍රයෝ වන්නෝය ...... "**

**මතෙව් 5 : 48 :- " එබැවින් නුඹලාගේ ස්වර්ගීය පියාණන්වහන්සේ සම්පූර්ණව සිටින්නාක්මෙන් නුඹලාත් සම්පූර්ණව සිටපල්ලා. "**

සෑම මනුෂ්‍යයෙක්ම කුඩා දරුවන් සලකන්නේ ගුණවන්තවය (Everyone is kind to children). අප අපගේ සභාවන් වල සිටින ''ආත්මික දරුවන් '' වද එලෙසම ගුණවන්තව සලකමු.

(b) **අනුකම්පාවෙන් ක්‍රියා කරමු.**

අප සැමදෙන, උණුවන්නාවූ හදවතක් ඇතිව, අනුන් ගැන කැක්කුමක් ඇතුව ක්‍රියාකරමු.

(iii) **එකිනෙකාට කමාවෙන්න**

කමාවීම ගැන, කිතුනු අප සැම බොහෝ දේශනා අසා ඇති බව නිසැකය. එබැවින් එකිනෙකාට කමාවීම පිළිබඳව බයිබල් පද කිහිපයක් ඔබගේ මතකයට කැඳවීමට සීමා වෙමි.

**මතෙව් 6 : 14, 15 :- '' මක්නිසාද නුඹලා මනුෂ්‍යයන්ට ඔවුන්ගේ වරද කමා කරන්නහු නම්, නුඹලාගේ ස්වර්ගීය වූ පියාණන්වහන්සේ නුඹලාටත් කමා කරන සේක. නුමුත් නුඹලා මනුෂ්‍යයන්ට ඔවුන්ගේ වරද කමා නොකරන්නේ නම්, නුඹලාගේ පියාණන්වහන්සේත් නුඹලාගේ වරද කමා නොකරන සේක. ''**

**(මතෙව් 18 : 21 - 35 කියවන්න)**

**මතෙව් 18 : 35 :- '' නුඹලාත් එකිනෙකා තම තමාගේ සහෝදරයාට සිතින් කමා නොකරනවා නම් ස්වර්ගයෙහි සිටින මාගේ පියාණන්වහන්සේද නුඹලාට එසේම කරනවා ඇතැයි කීසේක. ''**

**මතෙව් 5 : 23, 24 :- '' එබැවින් නුඹේ පඬුර පූජාසනය ළඟ පුදන කල්හි, නුඹේ සහෝදරයා නුඹ කෙරෙහි යම් විරුද්ධයක් ඇති බව එහිදී නුඹට සිහිවී නම්, නුඹේ පඬුර පූජාසනය ඉදිරියෙහි තබාගොස්, පළමුකොට නුඹේ සහෝදරයා හා සමගිවී, පසුව ඇවිත් නුඹේ පඬුර පුදාපන්න. ''**

ප්‍රේමණීය සහෝදරයා, සහෝදරී, මෙම අධ්‍යයනය තුළින් අප ඉගෙන ගත්තාවූ ඉතා වැදගත් කරුණු දෙකක්, ඔබගේ ජීවිතයට සහමුලින්ම අදාළ කරගන්නා ලෙස ඔබගෙන් යටහත්ව ඉල්ලා සිටිමි.

ඒවා නම්,

❖ '' අපගේ කථාව නිතරම ලුණෙන් රසවත්ව, අනුග්‍රහයෙන් යුක්තව තබා ගනිමු. '' **(කොලොස්සි 4 : 6)**

❖ '' පරණ මනුෂ්‍යයාගේ ක්‍රියා වෙත නැවත ඇදී ශුද්ධාත්ම-යාණන්වහන්සේට දුක් නොදෙමු. ''

**මෙසේ ජීවත්වීමට**

**දෙවි පියාණන්වහන්සේ**

**ඔබට පිහිටවන සේක්වා !!!**

සටහන

........................................................................................
........................................................................................
........................................................................................
........................................................................................
........................................................................................
........................................................................................
........................................................................................
........................................................................................
........................................................................................
........................................................................................
........................................................................................
........................................................................................
........................................................................................
........................................................................................
........................................................................................
........................................................................................
........................................................................................
........................................................................................
........................................................................................
........................................................................................
........................................................................................
........................................................................................
........................................................................................
........................................................................................
........................................................................................
........................................................................................

දේව දරුවන්ගේ පිරිසිදු ජීවිත



# එපීස අධ්‍යයනය 13

# දේව දරුවන්ගේ පිරිසිදු ජීවිත

**එපීස 5 : 1 - 5**

**<u>හැඳින්වීම</u> :-**

පරණ මනුෂ්‍යයා පහකර දමා, අලුත් මනුෂ්‍යයා පැළඳගත්තාවූ දේව දරුවන්ගේ ජීවිත තුළ සිදුවිය යුතු වෙනස්වීම් පහක් **එපීස 4 : 25 - 32** දක්වා සඳහන් වේ. පසුගිය අධ්‍යයන දෙකේ අප අපගේ අවධානය යොමු කළේ අපගේ ජීවිතවල සිදුවිය යුතු මෙම වෙනස්වීම් පහ වෙතය.

මෙම අධ්‍යයනය තුළින්, අප බැලීමට යන්නේ - ' දේව දරුවන්ගේ පිරිසිඳු ජීවිත ' කුමන ආකාර විය යුතුද ? යන ප්‍රශ්නය දෙසයි. අනිවාර්යයෙන්ම අපගේ ජීවිත පවිත්‍රවූ ජීවිත විය යුතු අතර, එසේ ජීවත්වීමට මෙම අධ්‍යයනය උපකාරවේය යන්න අපගේ දෘඩ විශ්වාසයයි.

**<u>අධ්‍යයනය</u> :-**

**1. දෙවියන්වහන්සේගේ ප්‍රිය දරුවන්ගේ හැසිරීම - එපීස 5:1, 2**

**එපීස 5 : 1 :- " එබැවින් නුඹලා ප්‍රිය දරුවන් මෙන් <u>දෙවියන්වහන්සේ අනුව යන්නෝ වෙයල්ලා</u>. "**

(i) **" දෙවියන්වහන්සේ අනුව යන්නෝ වෙයල්ලා. "**

" දෙවියන්වහන්සේ අනුව යන්නෝ වෙයල්ලා " ලෙස සඳහන් මෙම වචන ඉංග්‍රීසි බසින් සඳහන්වන්නේ -

" Be imitators of God " (NIV) යනුවෙනි. මේ අනුව, එම වචනවල අදහස වන්නේ, **' දෙවියන්වහන්සේ අනුගමනය කරන්න '** යන්නයි. එබැවින් අපගේ සිතේ පැනනගින්නාවූ ප්‍රථම ප්‍රශ්නය වන්නේ, සර්වපරාක්‍රම, සර්වබලධාරී, මහෝත්තමවූ දෙවියන්වහන්සේව, අප අනුගමනය කරන්නේ කෙලෙසද ? යන ප්‍රශ්නයයි. ඒ අතරම අපගේ ස්වාමීවූ යේසුස්වහන්සේ සම්පූර්ණයෙන්ම දේව කැමැත්ත අනුව ජීවත්වූ බැවින්, උන්වහන්සේව අනුගමනය කිරීම මගින්, අප " දෙවියන්වහන්සේ අනුගමනය කරන්න " යන අණට, කීකරු වන බවද, අපට පැහැදිලිව පෙනේ.

එමනිසා මා අදහස් කරන්නේ, 'දෙවියන්වහන්සේ අනුගමනය කිරීම ' තේරුම් ගැනීම පිණිස, දේව වචනයේ සඳහන් සත්‍යයන් දෙකක් සහ යේසුස්වහන්සේගේ ක්‍රියාවක් ඔබ ඉදිරියේ තැබීමටයි.

(a) **යොහන් 3 : 16 :-**

**" මක්නිසාද දෙවියන්වහන්සේ ස්වකීය ඒකජාතක පුත්‍රයාණන් දෙන තරම් ලෝකයාට ප්‍රේම කළ සේක. එසේ කළේ උන්වහන්සේ කෙරෙහි අදහාගන්න සැමදෙනම විනාශ නොවී සදාකාල ජීවනය ලබන පිණිසය. "**

මෙම පදය අපට පෙන්වාදෙන්නේ, දෙවියන්වහන්සේ **සෑම මනුෂ්‍යයෙකුටම ප්‍රේමකරමින්, ඔවුන් සැමදෙනාට ඇදහිල්ල තුළින් සදාකාල ජීවනය ලැබීමට අවස්ථාව දී ඇති බවයි.**

මේ අනුව ' දෙවියන්වහන්සේව අප අනුගමනය ' කරන - වානම්, අපද, අපගේ මිතුරන්ට මෙන් සතුරන්ටද ප්‍රේම කළ යුතුය.

**මතෙව් 5 : 44 :-**

**" ..... නුඹලාගේ සතුරන්ට ප්‍රේම කරපල්ලා, නුඹලාට පීඩා කරන්නන් උදෙසා යාච්ඤාකරපල්ලා ; මෙසේ නුඹලා ස්වර්ගයෙහි සිටින නුඹලාගේ පියාණන්වහන්සේගේ පුත්‍රයෝ වන්නෝය. "**

මෙම පදයේ, **" ප්‍රිය දරුවන් මෙන් දෙවියන්වහන්සේ අනුව යන්නෝ වෙයල්ලා " (එපීස 5 : 1)** යන්නෙහි අරුත, ඉතා පැහැදිලිව පෙන්වාදෙයි.

(b) **1 යොහන් 1 : 9 :-**

**" අපේ පාපවල් කියාදෙමු නම්, අපේ පව් අපට කමා කරන්ටත් ..... උන්වහන්සේ විශ්වාසව ධර්මිෂ්ඨව සිටින සේක. "**

මෙම පදය අපට පෙන්වාදෙන්නේ, දෙවියන්වහන්සේ වඩාත්ම දරුණු පව්කාරයාට පවා, කමාවන්ට සූදානම් බවයි. එබැවින්, 'දෙවියන්වහන්සේව අප අනුගමනය ' කරනවා නම්, අපද ' අපට වැරදි කරන අයට ' අනිවාර්‍ය - යෙන්ම කමා කළ යුතු වේ.

**ලූක් 23 : 34 :-**

**" ..... පියාණෙනි, ඔවුන්ට කමා වුව මැනව ; මක්නිසාද ඔවුන් කරන්නේ මොකද කියා ඔව්හු නොදනිතියි කී සේක. "**

යේසුස්වහන්සේ, උන්වහන්සේව කුරුසියෙහි ඇණ ගැසූවන් උදෙසා දෙවියන්වහන්සේට කන්නලව් කිරීම, අප අනුගමනය කළ යුතු ආදර්ශයකි.

(c) **මතෙව් 8 : 3 :-**

**" උන්වහන්සේ අත දිගුකොට ඔහු පිට තබා : මම කැමැත්තෙමි ; පවිත්‍ර වෙයන්නැයි කී සේක. "**

කුෂ්ඨ රෝගියෙක් යේසුස්වහන්සේ විසින් සුවකරනු ලැබීමේ මෙම සිද්ධිය සඳහන්වන්නාවූ **මතෙව් 8 : 1-3 දක්වා කියවන්න.**

එදා සමාජයේ කුෂ්ඨ රෝගියෙකු මත කිසිම මනුෂ්‍යයෙක් අත නොගැසුවා පමණක් නොව, එවැනි රෝගියෙක් ළඟට යෑම පවා හැකිතරම් දුරට මඟහැරියේය.

මේ අතර යේසුස්වහන්සේ වෙත පැමිණි මෙම කුෂ්ඨ රෝගියාගේ සිතේ සැඟවී තිබුනු අදහස වූයේ ''උන්වහන්සේ මා පිට අත තැබුවොත් මට සුවය ලැබෙනවා ඇත'' වැනි අදහසක් බව **" ස්වාමිනි, ඔබ කැමති සේක්නම් මා පවිත්‍ර කරන්ට ඔබට පුළුවන "** යන ඔහුගේ වචන නිසා නිගමනය/සැක කළ හැකිය.

මෙම රෝගියාගේ හදවත දුටු යේසුස්වහන්සේට ඔහුව එක වචනයකින් සුව කිරීමට හැකිවූ නමුත්, **උන්වහන්සේගේ දයානුකම්පාව නිසා,** උන්වහන්සේ ඔහු පිට අත තැබූ සේක.

දේව දරුව අපගේ සභාවට පැමිණෙන්නාවූ අසරණ වූ, ප්‍රතික්ෂේප කරන ලද්දාවූ මනුෂ්‍යයන්ව අප, යේසුස් - වහන්සේ / දෙවියන්වහන්සේව අනුගමනය කරමින්, දයානුකම්පාවෙන් සලකමු.

(ii) " **ප්‍රේමයෙන් හැසිරියල්ලා** "

**එපීස 5 : 2 :- " ක්‍රිස්තුස්වහන්සේ නුඹලාට ප්‍රේමකොට, මිහිරි සුවඳක් පිණිස ....... අප වෙනුවට තමන්ම පාවා දුන්නාක් මෙන්ම, නුඹලාත් ප්‍රේමයෙන් හැසිරියල්ලා. "**

" නුඹලාත් ප්‍රේමයෙන් හැසිරියල්ලා " ලෙස සඳහන් මෙම වචන ඉංග්‍රීසි බසින් සඳහන්වන්නේ, " Live a life of Love " (NIV) යනුවෙනි. මේ වචනවල අදහස වන්නේ, " **ප්‍රේමයේ ජීවිතයක් ගත කරන්න** " යන්න වන අතර, එවැනි ජීවිතයක නිදසුනක් වශයෙන් පාවුල්තුමා අප ඉදිරියේ තබන්නේ යේසුස්වහන්සේගේ ජීවිතයයි. උන්වහන්සේගේ ප්‍රේමය නිසා, අප උදෙසා තම ජීවිතය කුරුසියේ පූජාකිරීමයි.

ප්‍රේමණීය දේව දරුව, දෙවියන්වහන්සේ අපව කැඳවා ඇත්තේ, ප්‍රේමයේ ජීවිතයක් ගත කිරීමටයි. දෙවියන් - වහන්සේටද, අසල් වැසියන්ටද, එකිනෙකාටද, සතුරන්ටද ප්‍රේමකිරීමටයි.

(a) **දෙවියන්වහන්සේට ප්‍රේම කිරීම**

**මතෙව් 22 : 37 :- " තාගේ මුළු හෘදයෙන්ද, තාගේ මුළු ආත්මයෙන්ද, තාගේ මුළු බුද්ධියෙන්ද, තාගේ දෙවිවූ ස්වාමීන්වහන්සේට ප්‍රේමකරව. "**

❖ අප යමෙකුට ප්‍රේමකරනවා නම්, ඒ තැනැත්තා උදෙසා බොහෝ දේ පූජාකිරීමට අප සූදානම්ව සිටිය යුතුය.

එබැවින් දෙවියන්වහන්සේට ප්‍රේමකරන්නාවූ අප සැම,

- උන්වහන්සේ උදෙසා, දුෂ්කරතා, බාධා, නින්දා සහ අපහාස විඳින්ට සූදානම් විය යුතුය.
- අපගේ විවේකය, පහසුව, පුද්ගලික ආසාවන් යනාදිය පූජාකිරීමට සූදානම් විය යුතුය.
- අපගේ ශරීර " **ශුද්ධවූ, දෙවියන්වහන්සේ විසින් පිළිගත හැකිවූ යාගයක් කොට ඔප්පුකිරීමට " (රෝම 12 : 1)** සූදානම්ව සිටිය යුතුය.

❖ අප දෙවියන්වහන්සේට ප්‍රේමකරනවා නම්, උන්වහන්සේ ද්වේශකරන දේවලට අපද, ද්වේශ කළ යුතුය. බොරු කීම, කාමමිථ්‍යාචාරය සහ තණ්හාව වැනි පාපවලට අප සැබැවින්ම ද්වේශ කළ යුතුය.

❖ අප දෙවියන්වහන්සේට ප්‍රේමකරනවා නම්, අප උන්වහන්සේට කීකරු විය යුතුය.

**යොහන් 14 : 21 :-**

**" යමෙක් මාගේ ආඥා පිළිගෙන රක්ෂාකෙරේද, මට ප්‍රේම - කරන්නේ ඔහුය. මට ප්‍රේමකරන්නා මාගේ පියාණන් විසින් ප්‍රේම කරනු ලබන්නේය ..... "**

**මතෙව් 7 : 21 :-**

**" ස්වර්ගයෙහි සිටින මාගේ පියාණන්වහන්සේගේ කැමැත්ත කරන්නා මිස මට : ස්වාමිනි, ස්වාමිනියි කියන සියල්ලෝම ස්වර්ග රාජ්‍යයට ඇතුල් නොවන්නෝය. "**

(b) **අසල්වැසියාට ප්‍රේම කිරීම**

**මතෙව් 22 : 39 :-**

**" .... එනම් තට මෙන් තාගේ අසල්වැසියාට ප්‍රේමකරව යනුය. "**

මෙහි ' අසල්වැසියා ' යනුවෙන් අදහස් වන්නේ කවරෙක්ද කියා වටහා ගැනීම පිණිස **ලූක් 10 : 25 - 37** කියවීම උචිත වේ. මේ කොටස තුළ සඳහන් වන්නාවූ " යහපත් සමාරියයා ගැන උපමා කථාව " මගින් යේසුස් - වහන්සේ පෙන්වාදෙන්නේ, අපගේ උපකාර, ආධාර යනාදිය අවශ්‍ය කෙනෙක් අපට මුණ ගැසෙන විට ඔහු අපගේ ' අසල්වැසියා ' වන බවය.

දේව දරුව, යම්කිසි පිහිටක් පතා අපගේ නිවෙස්වලට මෙන්ම අපගේ සභාවන් වෙත පැමිණෙන මනුෂ්‍යයන්ට ප්‍රේම කරමින් ඔවුන්ට පිහිට වෙමු.

(c) **එකිනෙකාට ප්‍රේම කිරීම**

**1 යොහන් 3 : 23 :- " උන්වහන්සේගේ ආඥාව නම් උන්වහන්සේගේ පුත්‍රවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නාමය කෙරෙහි ඇදහීමත් උන්වහන්සේ අපට අඥා කළ ලෙස, <u>එකිනෙකාට ප්‍රේම කිරීමත්ය</u>. "**

**යොහන් 13 : 34 :- " මා නුඹලාට ප්‍රේම කළාක් මෙන් නුඹලාත් එකිනෙකාට ප්‍රේමකරන ලෙස, <u>එකිනෙකාට ප්‍රේමකරපල්ලාය කියා අලුත් ආඥාවක් මම නුඹලාට දෙමි</u>. "**

**2. <u>දේව දරුවන්ගේ ජීවිතවල කිසිසේත් නොතිබිය යුතු දේ</u> - <u>එපීස 5 : 3 - 4</u>**

(i) **වේශ්‍යාකම, අපවිත්‍රකම සහ තණ්හාව තුරන්විය යුතුවේ**

**එපීස 5 : 3 :- " නුමුත් වේශ්‍යාකමද සියලු ආකාර අපවිත්‍ර - කම හෝ තණ්හාවද නුඹලා අතරේ සඳහන් කරන්ට පමණවත් එපා ; එය ශුද්ධවන්තයන්ට නුසුදුසුය. "**

අප මොහොතකට **එපීස 5 : 1, 2** යන පද සහ **එපීස 5 : 3** වැනි පදය අතර ඇති එකඟතාවය තේරුම්ගැනීමට උත්සාහ කරමු.

**එපීස 5 : 1, 2** යන පද අපට කියාදෙන්නේ, දෙවියන් - වහන්සේ සහ යේසුස්වහන්සේ මෙන් ' <u>ආත්ම පරිත්‍යාග</u> ' (<u>Self Sacrifice</u>) <u>කිරීමේ ජීවිත</u> ගතකරන්ට කියාය. මේ අතර **එපීස 5 : 3** වැනි පදය අපට කියාදෙන්නේ ආත්මාර්ථ - කමින් පිරුනාවූ, තමන්ගේම පාපිෂ්ඨ ආශාවන් පසුපස ගිජුලෙස හඹායන්නාවූ (Self Indulgence) ජීවිත සම්පූර්ණ - යෙන්ම අතහරින්ට කියාය.

**එපීස 5 : 1 වැනි සහ 2 වැනි පද, ප්‍රේමකිරීමට අපව පොළඹවයි. එහි 3 වැනි පදය, කාම රාගයෙන් ක්‍රියා නොකිරීමට අපට උගන්වයි.**

**එපීස 5 : 3** වැනි පදයේ **" වේශ්‍යාකමද සියලු ආකාර අපවිත්‍රකම "** ලෙස පරිවර්තනය කර ඇත්තාවූ වචන, " විවාහයෙන් පිටස්තර සෑම ලිංගික සංවාසයක්ම " ලෙස බයිබලයේ ග්‍රීක් පිටපත්වලින් තේරුම් ගත හැක.

මේ අතර එම පදයෙහි සඳහන් " **තණ්හාව** " , **නික්මයාම 20 : 17** වැනි පදය අපට පෙන්වාදෙයි. මේ අනුව අප දකින්නේ " **වේශ්‍යාකම, අපවිත්‍රකම සහ තණ්හාව** " යන්නාවූ දේවල් තුන තුළින්ම මනුෂ්‍යයා කරන්නේ, තමාගේ මාංශයේ තෘෂ්ණාවත් උදෙසා අන් අයගේ ශරීර පාවිච්චි කිරීම බවයි.

**දේව දරුව, මෙසේ කිරීම දෙවියන්වහන්සේ ඔබගෙන් බලාපොරොත්තු වන්නාවූ ජීවිතයට සම්පූර්ණයෙන්ම ප්‍රතිවිරුද්ධය.**

මෙවැනි හැසිරීමක බරපතලකම නිසා, පාවුල්තුමා ඒ ගැන ලියන්නේ ඒවා ගැන " **නුඹලා අතරේ සඳහන් කරන්ට පමණවත් එපා** " යනුවෙනි.

**1 තෙස. 4 : 3 - 7 :-**

" **දෙවියන්වහන්සේගේ කැමැත්ත නම්, නුඹලා ශුද්ධව සිටීමය. - <u>නුඹලා වේශ්‍යාකමින් වැළකී</u>, ............ දෙවියන්වහන්සේ නාඳුනන්නාවූ ජාතීන් මෙන් <u>කාමරාගයෙහි නොව</u>, <u>ශුද්ධකමෙහිත් ගෞරවයෙහිත් තබාගන්ට දැනගන සිටීමත්</u>, මේ කාරණය ගැන කිසිවෙක් තමාගේ සහෝදරයා රවටා වාසියක් නොගැනීමත්‍ය. ......... ස්වාමීන්වහන්සේ <u>එබඳු වූ සියල්ල ගැන පළිගන්න කෙනෙක්ය</u>. <u>දෙවියන්වහන්සේ අප කැඳෙව්වේ අපවිත්‍රකමට නොව ශුද්ධකමටය</u>.** "

දේව දරුව, කිසි අන්දමකින්, ඉහත සඳහන් දේ සම්බන්ධයෙන් යක්ෂයාට ඔබව ගිලගන්ට ඉඩ නොහරින්න. පවිත්‍ර වූ, ශුද්ධ වූ ජීවිත ගත කරන්න.

(ii) **කැතකම්, මෝඩ කථා සහ නීච කවටකම් තුරන්විය යුතුවේ**

**එපීස 5 : 4 :-** " **කැතකම්ද මෝඩ කථාද, නීච කවටකම්ද යන මේවාත් නුසුදුසුය. ඒවා නොව ස්තුති කිරීම් පවත්වාපල්ලා.** "

සෑම ලිංගික පාපයන්ගෙන් සම්පූර්ණයෙන්ම අප ඈත් විය යුතුම වේ. දේව දරුවන් වූ අපට මෙය අනිවාර්‍යය වේ. දේව දරුවන්ගෙන් අති බහුතරයක්, මේ අයුරින් ජීවත් වන බව නිසැකය.

මෙනමුත් සමහර කිතුනුවන්ගේ මුවින් පිටවන්නාවූ **" කැත (කථා), මෝඩ කථා සහ නීච කවටකම් "** මගින් අපට පෙනීයන්නේ, යේසුස්වහන්සේ කාමමිථ්‍යාචාරය ගැන කී වදන් ඔවුන්ට අමතක වී තිබෙන බවය.

**මතෙව් 5 : 28 :-**

**" නුමුත් මම නුඹලාට කියමි : ස්ත්‍රියෙකු දෙස රාගයෙන් බලන කවරෙක් නුමුත් එවේලේම ඈ සමඟ සිතින් කාමමිථ්‍යාචාරය කළේය. "**

**මාර්ක් 7 : 21 - 23 :-**

**" මක්නිසාද ඇතුළතින් එනම් මනුෂ්‍යයන්ගේ සිතින් නපුරු සිතිවිලි, වේශ්‍යාකම්, සොරකම්, මිනීමැරුම්, කාමමිථ්‍යා - චාරකම්, ........ නික්මෙයි. මේ සියලු නපුරු දේ ඇතුළතින් නික්මී මනුෂ්‍යයා අපවිත්‍ර කෙරේ යයි කීසේක. "**

ඉහත සඳහන් වදන් පවසන ලද්දේ, අපගේ ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ විසිනි. එම වචන මගින් ඉතා පැහැදිලිව ප්‍රකාශවන්නේ, දේව දරුවන් ලිංගික පාපයන්ගෙන් ඈත් වී, ඒවා ගැන කැත කථා, මෝඩ කථා සහ කැත විහිලු කිරීමෙන්ද සම්පූර්ණයෙන්ම ඈත් විය යුතු බවත්ය.

❖ අප ලිංගික දේ සම්බන්ධයෙන් සැඟවුනු අදහස් ඇත්තාවූ (Double Meaning) වචන ප්‍රකාශ කරන අතර, අප සැබවින්ම ප්‍රකාශ කරන්නේ, අපගේ හදවත් තුළ ඇත්තාවූ අපවිත්‍රකමය.

❖ අප ''නීච කවටකම්'' කරන විට, සමහරවිට අප ඒ සමඟම නොහොඹිනා යෝජනා පවා කරමින්, එය විහිලුවක් කියා පවසන නමුත්, අප යේසුස්වහන්සේ කී අයුරින් ''සිතින් කාම මිථ්‍යාචාරයෙහි'' යෙදෙනවා වෙන්ට පුළුවන.

**දේව දරුව, වේශ්‍යාකම, අපවිත්‍රකම, සහ තණ්හාව මෙන්ම, ඒවා ගැන කැත කථා සහ කැත විහිලු 100% අතහරිමු.**

(iii) **ඒවා නොව ස්තූති කිරීම් ඇති විය යුතුවේ**

අපගේ වචනවල ඇත්තාවූ බලය, ඉහත සඳහන් අයුරින් නොව, දෙවියන්වහන්සේට ස්තුති කිරීම උදෙසා භාවිතා කරමු.

ඉහත සඳහන් වචන (**''ස්තූති කිරීම් පවත්වාපල්ලා''**) සඳහන් වී ඇත්තේ, ලිංගික පාප ගැන පාවුල්තුමා උගන්වන්නාවූ බැවින්, අප සැමදේදීම දෙවියන් - වහන්සේට ප්‍රශංසා සහ ස්තුති පුදන අතර, **අපගේ ලිංගිකත්වය ගැන උන්වහන්සේට තුති පිදීමට අමතක නොකරමු.**

**1 තෙස. 5 : 18 :- '' ...... සියල්ලේදී ස්තූති කරපල්ලා. මක්නිසාද ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ නුඹලා ගැන දෙවියන්වහන්සේගේ කැමැත්ත මේය. ''**

මනුෂ්‍යයා දෙවියන්වහන්සේගෙන් ලබා ඇත්තාවූ ඉතාමත්ම අනර්ඝ ආශිර්වාදයක් වන්නේ, අපගේ '' පවුල් ජීවිතය '' වේ. මේ ගැන උන්වහන්සේට තුති පිදීමට අප කිසිසේත් අමතක නොකරමු.

3. **අපවිත්‍ර අයට දේව රාජ්‍යයේ උරුමයක් නොලැබේ - එපීස 5 : 5**

**එපීස 5 : 5 :- '' මක්නිසාද වේශ්‍යාකම් කරන්නෙකුටවත්, අපවිත්‍ර තැනැත්තෙකුටවත්, රූප වඳින්නෙක්වූ ලෝභ - යෙකුටවත් ක්‍රිස්තුස්වහන්සේගේද දෙවියන්වහන්සේගේද රාජ්‍යයෙහි උරුමයක් නොලැබෙන බව නුඹලා සත්තක ලෙස දැන සිටින්නහුය. ''**

මෙම පදයේ අප දකින්නේ **එපීස 5 : 3** වැනි පදයේ සඳහන්වන්නාවූ තණ්හාව ඇත්තකු, '' රූප වඳින්නෙක්වූ ලෝභයෙකුට '' සමාන කිරීමය. මෙහි අරුත පැහැදිලිව තේරුම් ගැනීම උදෙසා **කොලොස්සි 3 : 5** වන පදය දෙස බලමු.

**කොලො. 3 : 5 :- '' එබැවින් පොළොවේ තිබෙන නුඹලාගේ අවයවයන්, එනම් වේශ්‍යාකමත්, අපිරිසිදුකමත්, කාම රාගයත්, නපුරු තෘෂ්ණාවත්, රූප වැඳීම වූ තණ්හාවත් නසාපල්ලා. ''**

**එපීස 5 : 3, එපීස 5 : 5** සහ **කොලොස්සි 3 : 5** යන පද එකට සසඳා බලනවිට අපට පෙනීයන්නේ,

**ලෝභයෙක්, තණ්හාව ඇත්තෙක් සහ රූප වඳින්නෙක් අතර වෙනසක් නැති බවයි.** මෙසේ වන්නේ මන්ද කියා සිතා බලමු.

- ❖ තණ්හාව ඇත්තෙකුගේ අරමුණ වන්නේ කෙසේ හෝ තමා ආසා කරන දේ ලබාගැනීම සහ එය තමාගේම කර ගැනීමය. මෙසේ ලබාගන්නාවූ දේ ඔහු අන් අයට කිසිවිටක නොදෙයි, ඉතා ලෝභකමින් එය රැක ගනියි.

  මේ අයුරින් **තණ්හාව ඇත්තා ලෝභයෙක් බවට පත්වෙයි.**

- ❖ යම් කිසි දෙයක් කෙරෙහි තණ්හාව ඇත්තා එම දේ ලබා ගැනීම උදෙසා විවිධ මාර්ග භාවිත කරයි. එම දේ ලබා ගැනීම උදෙසා ඔහුගේ ඇති තදබල ආශාව නිසා, වැරදි මාර්ග සහ ක්‍රම පවා ඔහු යොදා ගනියි. ඔහුගේ තණ්හාව වැඩිවෙත්ම ඔහු නොදැනුවත්වම, එම දේ ලබාගැනීම ඔහුගේ ජීවිතයේ ප්‍රථම ස්ථානයට පත් වෙයි.

  අපගේ ජීවිතවල ප්‍රථම ස්ථානය සැමවිටම දිය යුත්තේ දෙවියන්වහන්සේට වන අතර, තණ්හාව නිසා වෙන දෙයකට එම ස්ථානය අප දෙන විට, දේව වචනය අපව විස්තර කරන්නේ '' රූප වඳින්නෙක් '' ලෙසය.

  දේව දරුව, ඔබ කිසිසේත් වේශ්‍යාකම් කරන්නෙක් හෝ අපවිත්‍ර තැනැත්තෙක් නොවන බව මම විශ්වාස කරමි.

  මෙනමුත් තණ්හාවට අප ඉඩ දුන්විට, අප නොදැනුවත්වම '' රූප වඳින්නෙක් '' ලෙස ක්‍රියා කිරීමට ඉඩ ඇත.

**දේව වචනය පවසන්නේ, මෙබඳු කෙනෙකුට දේව රාජ්‍යයේ උරුමයක් නොලැබෙන බවයි.**

ප්‍රේමණීය සහෝදරයා, සහෝදරී,

- අප සැම, යක්ෂයාගේ මෙම මර උගුලට අසු නොවෙමු.
- අන් සතු දේට ආසා නොකරමු.
- තණ්හාවට ඉඩ නොදෙමු
- දෙවියන්වහන්සේ අපට ලබා දී ඇති දේ වලින් සතුටු වෙමු.
- දෙවියන්වහන්සේට ඒ දේ ගැන නිතරම ස්තුති කරමු.

(**එපීස 5 : 3 - 5** දක්වා කොටසේ, අවධානය යොමුවන්නේ, '' කාම රාගයන් සහ නපුරු තෘෂ්ණාවන් '' වෙත බැවින්, ඉහත සඳහන් උපදෙස් විශේෂයෙන්ම අදාළ වන්නේද මෙයට බව තේරුම් ගන්න).

❖ **එපීස 5 : 5** හි සඳහන් '' රූප වැඳීම '' විශේෂයෙන් අදාළ වන්නේ '' කාම රාගය සහ නපුරු තෘෂ්ණාවන් '' වෙත වන අතර, දෙවියන්වහන්සේට අප දිය යුතු ස්ථානය අන් ඕනෑම දෙයකට අප දෙන අතරද අප '' රූප වැඳීමෙහි '' නිරත වන්නෙමු.

ඔබගේ රැකියාව, අධ්‍යාපනය, ක්‍රීඩා, සංගීතය, රූපවාහිනිය නැරඹීම, දරුවන් හෝ වෙන ඕනෑම දෙයක් ඔබගේ ජීවිතයේ ප්‍රථම ස්ථානය ගන්නේ නම්,

**අදම එයින් මිදෙන්න.**
**ඔබගේ ජීවිතයේ ප්‍රථම ස්ථානය සමිඳුන්ට භාරදෙන්න.**

මෙහි ඇති වැදගත්කම නිසාම තණ්හාව සහ දෙවියන් - වහන්සේගේද යේසුස්වහන්සේගේද ආදර්ශය මේ අයුරින් ඔබ ඉදිරියේ තබමි.

| | | |
|---|---|---|
| **තණ්හාවේ අරමුණ** | - | **කෙසේ හෝ තමා ආසා කරන දේ ලබාගෙන, ඒවා තබා ගැනීම (තමාටම ප්‍රේම කිරීම)** |
| **දේව ආදර්ශය** | - | **අනුන්ට ප්‍රේමකිරීම සහ නොමසුරුව අනුන් උදෙසා දීම.** |

දේව දරුවෙනි, අප සැම තණ්හාවේ මාර්ගයේ නොව, යේසුස්වහන්සේ ගිය මාර්ගයේ, එනම් දීමේ මාර්ගයේ ගමන් කිරීමට අදිටන් කර ගනිමු.

**ක්‍රියා 20 : 35 :-**

**" ගැනීමට වඩා දීම ආශිර්වාදයකැයි ස්වාමීවූ යේසුස්වහන්සේම කී වචන ….. "**

**දෙවියන්වහන්සේව අනුගමනය කරමින්,**

**දීමේ ආශිර්වාදය අතිශයින් භුක්ති විඳින්නාවූ,**

**අති වාසනාවන්ත ජීවිත ගතකිරීමට**

**දෙවියන්වහන්සේ ඔබට පිහිටවන සේක්වා !!**

## සටහන

..........................................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................

## සටහන

# ස්වාමීන්වහන්සේ ප්‍රසන්න වන ආකාරයට හැසිරීම



# එපීස අධ්‍යයනය 14

# ස්වාමීන්වහන්සේ ප්‍රසන්න වන ආකාරයට හැසිරීම

**එපීස 5 : 6 - 10**

**<u>හැඳින්වීම</u> :-**

පසුගිය අධ්‍යයනයන් තුනේදී අපගේ අවධානය යොමු වූයේ, අලුත් මනුෂ්‍යයා පැළඳගත්තාවූ දේව දරුවන්ගේ ජීවිතවල ඇති විය යුතු පරිවර්තනය මගින් ලොවට ප්‍රකාශ විය යුතු පිරිසිඳු ජීවිත දෙසයි.

මෙම අධ්‍යයනය එම පවිත්‍ර ජීවිතයේ තවත් පියවරක් වෙත අපව යොමුකරයි. එනම් **' ස්වාමීන්වහන්සේ තුළ ආලෝකයට ඇතුල්ව සිටින අපගේ හැසිරීම '** වෙතයි. මෙම අධ්‍යයනය අපව පොළඹවන්නේ **' ආලෝකයේ දරුවන් ලෙස, දෙවියන් - වහන්සේ ප්‍රසන්න වන ආකාරයට '** හැසිරීමටයි.

මේ අයුරින් ආලෝකයේ රාජ්‍යයේ දරුවන් ලෙස, 'ආලෝකය මනුෂ්‍යයන් ඉදිරියේ බබළවන්නාවූ ' ජීවිත ගත - කිරීමට මෙම අධ්‍යයනය ඔබට ධෛර්‍ය සහ ශක්තිය ලැබේවා යන්න අපගේ පැතුමයි.

**<u>අධ්‍යයනය</u> :-**

**1. <u>හිස් වචන වලට නොරැවටෙන්න - එපීස 5 : 6</u>**

**එපීස 5 : 6 :-**

**" හිස් වචන වලින් නුඹලා රවටන්ට කිසිවෙකුට ඉඩ නොදෙල්ලා. මක්නිසාද මේ දේවල් නිසා දෙවියන්වහන්සේගේ උදහස අකීකරුකමේ පුත්‍රයන් පිටට පැමිණෙන්නේය. "**

(i) **" හිස් වචනවලට නොරැවටෙන්න "**

මෙහි අරුත තේරුම් ගැනීම උදෙසා, මෙම වචන සඳහන්වන්නාවූ පසුබිම සලකා බැලීම ඉතා වැදගත්වේ. **එපීස 5 : 1 - 2** යන පද අපට අනුශාසනා කරන්නේ, දෙවියන්වහන්සේව අනුගමනය කිරීමටත්, යේසුස් - වහන්සේ මෙන් ප්‍රේමයෙන් හැසිරීමටත් කියාය.

මේ අතර **එපීස 5 : 3 - 5** යන පද අපට උගන්වන්නේ වේශ්‍යාකම, අපවිත්‍රකම සහ තණ්හාව යන පාපවලින් අප සම්පූර්ණයෙන්ම ඉවත් විය යුතු බවත්, එසේ කරන කිසිවෙකුට **" දෙවියන්වහන්සේගේ රාජ්‍යයේ උරුමයක් කිසිසේත් නොලැබෙන "** බවත්ය.

දේව දරුව, මේ දෙවියන්වහන්සේගේ වචනයයි. උන්වහන්සේ ඉතා පැහැදිලිව **එපීස 5 : 3 - 5** දක්වා ඉහත සඳහන් සත්‍යය ප්‍රකාශ කරන සේක. එබැවින් **" හිස් වචන "** තුළින්, '' නෑ නෑ එසේ වන්නේ නෑ '' කියා කිසි කෙනෙකුට ඔබව රවටන්ට නොහොත් මුලා කරන්ට ඉඩ නොදෙන්න.

**එපීස 5 : 6** වන පදය අපට උගන්වන්නේ, '' කාම රාගය සහ නපුරු තෘෂ්ණාවන් '' තුළින් නැගී එන්නාවූ මෙම පාප, වැරදි නොවන බව පෙන්වීමට උත්සාහ කරන්නාවූ අයවලුන්ගේ **" හිස් වචනවලින් නුඹලා රවටන්ට <u>කිසිවෙකුට</u> ඉඩ නොදෙන්ට "** කියාය.

දේව දරුවන් නොවන්නාවූ, '' ලෝකයේ මනුෂ්‍යයන් '' විවිධ හේතූන් මත මෙසේ කිරීමට උත්සාහ කිරීම පුදුමයක් නොවේ. මෙනමුත් කිතුනු නම දරන අය පවා, දෙවියන්වහන්සේ ද්වේශකරන්නාවූ මෙවැනි පාපයන් සාධාරණය කිරීමට උත්සාහ කිරීම, අතිශයින් කණගාටු සහිතය.

දෙවියන්වහන්සේ මට ලබා දී ඇති මඟපෙන්වීම අනුව, ' හිස් වචන ' යන්න මේ අයුරින් නිර්වචනය කරමි.

**මනුෂ්‍යය බුද්ධියෙන් පැන නැගෙන්නාවූ, දෙවියන්වහන්සේගේ වචනයට විරුද්ධ වන්නාවූ අදහස් ප්‍රකාශ කරන්නාවූ වචන, " හිස් වචන " වේ.**

බයිබලයේ සඳහන් ලෙස, මෙලොව ප්‍රථමයෙන්ම '' හිස් වචන '' ප්‍රකාශ කළේ මනුෂ්‍යයෙක් නොව, යක්ෂයාගේ පෙළඹවීම මත සර්පයාය. එම හිස් වචන වන්නේ, **" නුඹලා ඇත්තටම නසින්නේ නැත " (උත්පත්ති 3 : 4)** යනුවෙන් සර්පයා එදා ඒවට ප්‍රකාශ කළ වචනයි. එබැවින් අප දකින්නේ '' හිස් වචනවල '' උල්පත යක්ෂයා බවයි.

දේව දරුව, යක්ෂයාට ඔබව මුලා කිරීමට කිසිසේත් ඉඩ නොදෙන්න.

<u>යක්ෂයාගේ පෙළඹවීම මත</u>, දේව දරුවන් මුලා කිරීම උදෙසා, <u>ප්‍රකාශ කරනු ලබන්නාවූ වචන තුළින්</u> <u>ඔබව මුලා කිරීමට කිසිවෙකුට ඉඩ නොදෙන්න</u>.

**ගලාති 1 : 8 :- " නුමුත් අප විසින් නුඹලාට ප්‍රකාශ කළ ශුභාරංචිය හැර වෙන ශුභාරංචියක් අපවත් ස්වර්ගයෙන් දේව දූතයෙක්වත් නුඹලාට ප්‍රකාශ කරතොත් ඔහු ශාපලද්දෙක් වේවා. "**

(ii) **අකීකරුකමේ පුත්‍රයන් පිටට දෙවියන්වහන්සේගේ උදහස පැමිණෙනවා ඇත**

" අකීකරුකමේ පුත්‍රයන් " යනු කවුරුන්ද කියා වටහා - ගැනීම, ඉහත සඳහන් අනතුරු ඇඟවීම තේරුම් ගැනීම උදෙසා වැදගත්වේ.

මෙහි "අකීකරුකමේ පුත්‍රයන් " ලෙස සඳහන් අය වන්නේ,

(a) හිස් වචනවලින් රැවටී, එම පාපයන්හි නිරත වන අය

**<u>හෝ</u>**

(b) හිස් වචනවලින් මෙම පාපයන්හි යෙදීමට අනුන් පොළඹවන අය

**<u>හෝ</u>**

(c) ඉහත සඳහන් කණ්ඩායම් දෙකට අයිති සැම දෙන විය හැක.

මේ අතර මෙම වචන සඳහන් පසුබිම දෙස බලනවිට අපට තව දුරටත් නිගමනය කළ හැකිවන්නේ, " අකීකරුකමේ පුත්‍රයන් " යනු දේව වචනය අසා එයට අකීකරුවන අය බවයි.

ප්‍රේමණීය සහෝදරයා, සහෝදරී, මෙය තේරුම් ගන්න. **<u>මෙවැනි අය පිටට දේව උදහස අනිවාර්යයීයෙන්ම පැමිණෙනවා ඇත</u>.**

**හෙබ්‍රෙව් 10 : 26, 27 :-**

**'' මක්නිසාද සැබෑව දැන ගැනීම ලැබුවායින් පසු අපි කැමැත්තෙන්ම පව් කරමු නම්, විනිශ්චය ගැනත් විරුද්ධකාරයන් දවා දමන්ට යන උදහස් ගින්න ගැනත් භයානක බලා සිටීමක් මිස, පව් ගැන තවත් පූජාවක් ඉතිරිව නැත. ''**

**හෙබ්‍රෙව් 10 : 30, 31 :-**

**'' පළිගැනීම මට අයිතිය, මම්ම ප්‍රතිඵල දෙන්නෙමියි කියාද, ස්වාමීන්වහන්සේ තමන්ගේ සෙනඟ විනිශ්චය කරන සේක කියාද කී තැනන්වහන්සේ අපි දනිමුව. ජීවමානවූ දෙවියන් - වහන්සේගේ අත්වලට අසුවීම භයානක දෙයක්ය. ''**

දේව දරුව, '' දෙවියන්වහන්සේ අපට ප්‍රේමකරන නිසා, උන්වහන්සේ අපට සමාවනවා, උන්වහන්සේ උදහස් වන්නේ නෑ, '' <u>වැනි හිස් වචනවලට රැවටී, විනාශය කරා ගමන් නොකරන්න</u> !!

**2. <u>හිස් වචන ප්‍රකාශ කරන අය සමඟ පංගුකාරයෝ නොවන්න</u> - <u>එපීස 5 : 7</u>**

**එපීස 5 : 7 :- '' එබැවින් ඔවුන් සමඟ පංගුකාරයෝ නොවෙල්ලා. ''**

මෙම පදයෙහි '' පංගුකාරයෝ නොවෙල්ලා '' යනුවෙන් අදහස් කරනු ලබන්නේ, ඔවුන් සමඟ කිසිම සම්බන්ධකමක් නොපවත්වන්න, යන අදහස නොවේ. එහි අදහස වන්නේ හිස් වචන ප්‍රකාශකරන්නාවූ අය සමඟද, ඔවුන්ගේ වචනවලට මුලාවී ඉහත සඳහන් පාපවල නිරතවන්නන් සමඟද, එකඟ නොවන්න/ඔවුන්ට සහයෝගය නොදෙන්න. යන අදහස වේ.

දේව දරුව, මෙවැනි දේව උදහස අවුලුවන්නාවූ අය, ඔබගේ හිත මිතුරන් සහ ඥාතීන් අතරේ පවා සිටිය හැක. ඔවුන් සමඟ ඔබට ඇති මේ සම්බන්ධකම නිසා, ඔවුන් සමඟ එකඟවෙමින්, යක්ෂයාට සහයෝගය නොදෙන්න.

**යක්ෂයාට විරුද්ධව සිටින්න (යාකොබ් 4 : 7).**

දෙවියන්වහන්සේ අපව තෝරා ඇත්තේ, මනුෂ්‍යයින් ප්‍රසන්න කිරීමට නොවේ. උන්වහන්සේව ප්‍රසන්න කිරීමටයි. යේසුස්වහන්සේගේ අඩිපාරේ යෑමටයි.

හිස් වචන ඉදිරියේ යේසුස්වහන්සේ ක්‍රියා කළ එක් අවස්ථාවක් පහත සඳහන් ලෙස ඔබගේ මතකයට මා නංවන්නේ, උන්වහන්සේ ක්‍රියා කළ ආකාරයට ක්‍රියා කිරීමට, ඔබව පෙළඹවීමේ අදහසිනි.

❖ **මතෙව් 16 : 15 - 23** දක්වා කියවන්න.

මෙම කොටසේ **16 වන පදයේ** සඳහන්වන්නේ, යේසුස් - වහන්සේ ගැන පේත්‍රුස් කළ ප්‍රකාශනයක් වන අතර, එයට පිළිතුරු වශයෙන් යේසුස්වහන්සේ කියා සිටියේ පේත්‍රුස්ට මෙම එළිදරව් කිරීම දුන්නේ, දෙවියන්වහන්සේ බවයි. **(මතෙව් 16 : 17)**

එබැවින් මෙම පද දෙකෙන් අපට ඉතා පැහැදිලිව පෙනී - යන්නේ, යේසුස්වහන්සේගේ ප්‍රධාන ගෝලයා ලෙස සලකනු ලබන්නාවූ පේත්‍රුස්, මේ අවස්ථාවේදී ප්‍රකාශ කළේ දෙවියන්වහන්සේගේ වචන බවත්, යේසුස්වහන්සේම ඔහු ආශිර්වාද ලද්දෙක් බව පැවසූ බවත්ය.

නමුත්, මේ අන්දමින් දෙවියන්වහන්සේගේ වචන ප්‍රකාශ කළ පේත්‍රුස් **22 වන පදයේ** ප්‍රකාශ කරන්නේ, ''හිස් වචන'' නොහොත් යක්ෂයා විසින් පොළඹවන ලද වචනය. යේසුස්වහන්සේ මේ අවස්ථාවේදී පේත්‍රුස්ට කියා සිටින්නේ, **'' සාතන් මා පස්සට යව, නුඹ මට බාධාවක්ය '' (මතෙව් 16 : 23)** කියාය.

දේව දරුව, යේසුස්වහන්සේව සෑමවිටම අනුගමනය කිරීමට උත්සාහ කරන්න. ඔබගේ වඩාත්ම හිතවත් මිතුරා වුවත්, යක්ෂයා විසින් පොළඹවනු ලැබ, '' හිස් වචන '' ප්‍රකාශ කළහොත්, **'' ඔහු සමඟ පංගුකාරයෙක් නොවන්න '' (එපීස 5 : 7).**

දේව දරුවෙනි, අප සැම දෙන,

- **යේසුස්වහන්සේව අනුගමනය කරමු.**
- **හිස් වචන ප්‍රකාශ කරන්නන් සමඟ කිසිසේත් එකඟ නොවෙමු.**
- **ඔවුන් ඉදිරියේ, දේව වචනය ප්‍රකාශ කරමු.**
- **දේව වචනය මුලුමනින්ම අදහමු**
- **දේව වචනය පිළිපදිමු**
- **අපගේ ප්‍රඥාව අනුව එයට එකතු නොකරමු, එයින් අඩු නොකරමු.**

**3. <u>දෙවියන්වහන්සේ ප්‍රසන්න වන අයුරින් හැසිරෙන්න</u> - <u>එපීස 5 : 8 - 10</u>**

(i) **'' ආලෝකයේ දරුවන් මෙන් හැසිරෙන්න '' - එපීස 5 : 8**

දේව වචනය අපට පෙන්වාදෙන්නේ, දෙවියන් - වහන්සේට අපගේ ජීවිත භාර දෙමින්, දේව දරුකමට ඇතුල්වීමට පෙර, අප සැම දෙන ජීවත්වූයේ යක්ෂයාගේ කැමැත්ත අනුව බවයි.

**එපීස 2 : 2 :-**

**'' පෙර කාලයේ නුඹලා මේ ලෝකයේ ව්‍යවහාරය ලෙසත්, අකීකරුකමේ පුත්‍රයන් තුළ දැන් ක්‍රියාකරන්නාවූ ආත්මය වන ආකාශයේ බලයේ අධිපතියාගේ කැමැත්තේ හැටියටත්, ඒවායෙහි හැසුරුණාහුය. ''**

මෙනමුත් ඇදහිල්ල කරණකොටගෙන දෙවියන් - වහන්සේගේ අනුග්‍රහයෙන් ගැළවීම ලබා ඇත්තාවූ අප සැම දෙවියන්වහන්සේගේ රාජ්‍යයට නොහොත් ආලෝකයේ රාජ්‍යයට දැන් ඇතුල්ව සිටිමු.

**එපීස 5 : 8** වන පදය පෙන්වාදෙන්නේ, පෙර කාලයේ '' යක්ෂයාගේ කැමැත්ත අනුව අප හැසුරුණ '' නමුත්, දැන් එය '' දෙවියන්වහන්සේගේ කැමැත්ත '' අනුව සිදුවිය යුතු බවත්ය.

ක්‍රිතුනුවාගේ ඇදහීම සහ හැසිරීම අතර තිබිය යුතු සම්බන්ධතාවය දෙස බලමු. ගැළවීමට පැමිණෙන්ට පෙර අප දෙවියන්වහන්සේගේ කැමැත්තෙන් ඈත්ව හැසුරුණු අතර, අප කෙතරම් උත්සාහ කළත්, යහපත් ලෙස හැසිරීම මගින් අපට ගැළවීම ලබා ගත නොහැකි වේ. අප ගැළවීමට ඇතුල්වන්නේ ඇදහිල්ල කරණකොටගෙනය.

**එපීස 2 : 8 - 9 :- " මක්නිසාද <u>ඇදහිල්ල කරණකොටගෙන ඒ අනුග්‍රහයෙන් නුඹලා ගැළවී සිටින්නහුය</u>. එය නුඹලාගෙන්ම නොව දෙවියන්වහන්සේගේ දීමනාවය. කිසිවෙක් පාරට්ටුකර නොගන්නා <u>පිණිස ඒක ක්‍රියාවලින් නොවේ</u>. "**

මෙසේ ඇදහිල්ලෙන් ගැළවීම ලබා ඇති <u>අපගේ හැසිරීම, දේව දරුවන්ට ඔබින ලෙස වෙනස් විය යුතුවේ</u>.

**යාකොබ් 2 : 17 :- " එසේම ඇදහිල්ල ක්‍රියා නැතුව තනියම තිබේ නම් මැරිලාය. "**

**යාකොබ් 2 : 20 :- " නුමුත්, හිස්වූ මනුෂ්‍යය, ක්‍රියා නැති ඇදහිල්ල නිෂ්ඵල බව නුඹ දැනගන්ට කැමතිද ? "**

මෙම පද අපට පෙන්වාදෙන්නේ, අපගේ ඇදහිල්ල අපගේ හැසිරීමේ ඉමහත් වෙනස්වීමක් ඇති කළ යුතු බවය. මෙසේ අපගේ හැසිරීමේ වෙනස්වීමක් සිදුවී නොමැතිනම්, අපගේ ඇදහිල්ල නිෂ්ඵලවූද, මැරුණාවූද ඇදහිල්ලක් බවද ඒ පද පහදා දෙයි.

ආලෝකයේ දරුවන් ලෙස හැසිරීම පිළිබඳව, තව පද තුනක් ඔබ ඉදිරියේ තබමි.

**1 යොහන් 1 : 5, 6, 7 :-**

**" ...... දෙවියන්වහන්සේ ආලෝකය බවත්, උන්වහන්සේ තුළ කිසිම අන්ධකාරයක් නැති බවත්ය. අපි උන්වහන්සේ සමඟ පංගුකාරකම ඇතැයි කියමින් අන්ධකාරයෙහි හැසිරෙමු නම්, අපි බොරු කියනවා මිස සැබෑව නොකරමුව. නුමුත් උන්වහන්සේ ආලෝකයෙහි සිටින්නා සේම, අපිත් ආලෝක - යෙහි හැසිරෙමු නම් ....... උන්වහන්සේගේ පුත්‍රවූ යේසුස් - වහන්සේගේ ලේද සියලු පාපවලින් අප පවිත්‍රකරන්නේය. "**

(ii) **යහපත්කමින්, ධර්මිෂ්ඨකමින් සහ සැබෑකමින් හැසිරෙන්න - එපීස 5 : 9**

**එපීස 5 : 9 :- " ආලෝකයෙන් ඵල නම් සියලු ආකාර යහපත්කමත්, ධර්මිෂ්ඨකමත්, සැබෑකමත්ය. "**

අපගේ හැසිරීමේ තිබිය යුතු ගුණාංග තුනක් මෙහි දක්වෙන අතර, මේ ගුණාංග තුනම දෙවියන් - වහන්සේගේත් යේසුස්වහන්සේගේත් ගුණාංග බව අප දනිමු. එබැවින් නැවත වරක් **එපීස 5 : 9** වන පදය අපට සිහිපත් කරන්නේ, ආලෝකයේ රාජ්‍යයේ දරුවන් වන්නාවූ අප, ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරය වන බවත්, දිනෙන් දිනම අප වැඩියෙන් උන්වහන්සේ මෙන් විය යුතු බවත්ය.

**රෝම 8 : 29 :- "....... තමන්වහන්සේගේ පුත්‍රයා බොහෝ සහෝදරයන් අතරේ කුලුඳුලා වන පිණිස ඒ පුත්‍රයාගේ ස්වරූපයට සමානවෙන්ට පූර්වයෙන් නියම කළ සේක. "**

(iii) **ස්වාමීන්වහන්සේ ප්‍රසන්න වන අයුරින් හැසිරෙන්න - එපීස 5 : 10**

**එපීස 5 : 10 :- " ස්වාමීන්වහන්සේට ප්‍රසන්නව තිබෙන්නේ කිමෙක්ද කියා විභාගකරපල්ලා. "**

මෙම අධ්‍යයනයේ ඉතාමත්ම වැදගත් කොටසකට අප දැන් ඇතුල්වී සිටිමු. **එපීස 5 : 10** වන පදය, අපෙන් ඉල්ලා සිටින්නේ ස්වාමීන්වහන්සේ ප්‍රසන්න වන්නේ කුමන දේවලටද කියා විභාගකරන්ට නොහොත් සොයා බලන්ට කියාය. එයින් අදහස් වන්නේ, අප උන්වහන්සේ ප්‍රසන්න වන්නේ කුමකින්ද කියා විභාගකොට සෑහීමට පත්වීම නොවේ. එයින් අදහස්වන්නේ, ඒ දේ අප සොයා බලා, දැනගෙන, ඒවා අනුව උන්වහන්සේ තුළ ප්‍රසන්න ජීවිත ගත කිරීමයි.

**1 තෙස. 4 : 1 :- " ඉතින් සහෝදරයෙනි, නුඹලා කොයි ආකාර හැසිර <u>දෙවියන්වහන්සේ ප්‍රසන්න කරන්ට</u> ඕනෑද කියා නුඹලා අපගෙන් දැනගත් ලෙසද, <u>නුඹලා හැසිරෙන ලෙසද</u> ..... අවවාද කරමුව. "**

**2 කොරි. 5 : 9 :- " එහෙයින් ..... <u>උන්වහන්සේට ප්‍රසන්නවූ තැනැත්තන් වීම අපේ අභිප්‍රාය කරගනිමුව</u>. "**

දේව දරුවෙනි, අප සැම දෙනාද පාවුල්තුමා මෙන්, දෙවියන්වහන්සේට ප්‍රසන්න වූ තැනැත්තන් වීම, අපගේ අභිප්‍රාය කර ගනිමු. මෙසේ කිරීමට ඔබට උපකාර කිරීම උදෙසා, දෙවියන්වහන්සේ ප්‍රසන්න කරන්නාවූ දේවල් සමහරක් ඔබ ඉදිරියේ තබමු.

❖ **<u>ස්වාමීන්වහන්සේ ප්‍රසන්නව තිබෙන දේ සමහරක්</u>**

(a) **උන්වහන්සේගෙන් අප ප්‍රඥාව ඉල්ලා සිටීම - 1 රාජා. 3:10**

**1 රාජාවලිය 3 : 10 :- " සාලමොන් මේ දේ ඉල්ලූ නිසා ස්වාමීන්වහන්සේ ඊට ප්‍රසන්න වූ සේක. "**

සාලමොන් රජතුමා දෙවියන්වහන්සේගෙන් ප්‍රඥාව ඉල්ලා සිටීමේ සිද්ධිය අප හොඳහැටි දනිමු. දෙවියන්වහන්සේ සාලමොන්ව ඉශ්‍රායෙල් ජාතියේ රජතුමා ලෙස පත් කළ අතර, සාලමොන් දෙවියන්වහන්සේගෙන් ඉල්ලා සිටියේ, එම කාර්‍යය නිසි ලෙස ඉටුකිරීම පිණිස තමාට ප්‍රඥාව ලබා දෙන ලෙසයි.

ප්‍රිය සහෝදරයා, සහෝදරී, දෙවියන්වහන්සේ උන්වහන්සේගේ සැම දරුවෙකුටම විවිධ සේවාවන්, කැඳවීම්, වගකීම් භාර කරන සේක. <u>උන්වහන්සේ පැවරුවාවූ දේ උන්වහන්සේගේ කැමැත්ත සහ මගපෙන්වීම අනුව ඉටුකිරීම උදෙසා</u>, <u>උන්වහන්සේගෙන් ප්‍රඥාව ඉල්ලා සිටිමු</u>. **අප මෙසේ කරන අතර උන්වහන්සේ අප ගැන ප්‍රසන්න වන සේක.**

උන්වහන්සේ අප ගැන ප්‍රසන්න වනවා පමණක් නොව උන්වහන්සේ නිසැකවම අපට අවශ්‍ය ප්‍රඥාව අපට ලබා දෙන සේක.

**යාකොබ් 1 : 5 :- " නුමුත් නුඹලාගෙන් යමෙකුට ප්‍රඥාව අඩුනම්, වරද නොතබන්නාවූ, බොහෝකොට සියල්ලන්ට දෙන්නාවූ දෙවියන්වහන්සේගෙන් ඔහු ඉල්ලාවා. එවිට ඔහුට එය දෙනු ලැබේ. "**

(b) **ඇදහිල්ලෙන් දෙවියන්වහන්සේ වෙත ළංවීම - හෙබ්‍රෙව් 11: 6**

**හෙබ්‍රෙව් 11 : 6 :-**

**" නුමුත් ඇදහිල්ල නැතුව උන්වහන්සේව ප්‍රසන්න කරන්ට නුපුළුවන. මක්නිසාද දෙවියන්වහන්සේ වෙතට ළඟාවන්නා ...... උන්වහන්සේ විපාක දෙන කෙනෙකු බවත් විශ්වාස කරන්ට ඕනෑය. "**

දේව දරුව, ඔබ යාච්ඤාවෙන් දෙවියන්වහන්සේ වෙත ළංව, ඔබගේ ඉල්ලීම ඉදිරිපත් කරන අතර, ඇදහිල්ලෙන් ළංවෙන්න. ඇදහිල්ල නැතිව උන්වහන්සේ ප්‍රසන්න කරන්ට කිසිවෙකුට නුපුළුවන.

**මාර්ක් 11 : 24 :-**

**" එබැවින් නුඹලාට කියමි - නුඹලා යාච්ඤාකොට ඉල්ලන මොන දෙයක් වුවත් ඒ සියල්ල නුඹලාට ලැබුණේ යයි අදහාපල්ලා, ඒවා නුඹලාට ලැබෙන්නේය. "**

(c) **දරුවන් දෙමව්පියන්ට කීකරු වීම - කොලොස්සි 3 : 20**

**කොලො. 3 : 20 :-**

**" දරුවෙනි, සියලු කාරණාවලදී මවුපියන්ට කීකරු වෙයල්ලා, මක්නිසාද ඒක ස්වාමීන්වහන්සේට ප්‍රසන්නය. "**

(d) **වයස්ගත වූ දෙමව්පියන් බලාගැනීම - 1 තිමෝති 5 : 4**

**1 තිමෝති 5 : 4 :-**

**" .... ඔව්හු පළමුකොට තමුන්ගේම පවුල ගැන භක්තිවන්ත ලෙස හැසිරෙමින් ස්වකීය මවුපියන්ට ප්‍රත්‍යුපකාර කරන්ට ඉගෙනගනිත්වා. මක්නිසාද ඒක දෙවියන්වහන්සේ ඉදිරියේ ප්‍රසන්නව තිබේ. "**

(e) **යහපත්කම් කිරීම සහ අනුන්ට බෙදා දීම - හෙබ්‍රෙව් 13 : 16**

**හෙබ්‍රෙව් 13 : 16 :-**

**" නුමුත් යහපත්කම් කරන්ටත් අනුන්ට බෙදා දෙන්ටත් මතක නැති නොකරල්ලා. මක්නිසාද එයාකාර පූජාවලට දෙවියන් - වහන්සේ ප්‍රසන්න වන සේක. "**

(f) **දෙවියන්වහන්සේගේ නාමයට ප්‍රශංසා කිරීම - ගීතා. 69 : 30, 31**

**ගීතා. 69 : 30, 31 :-**

**" ගීතිකාවකින් දෙවියන්වහන්සේගේ නාමයට ප්‍රශංසා කරන් - නෙමි, ස්තුති කරමින් උන්වහන්සේ උසස් කරන්නෙමි ...... ස්වාමීන්වහන්සේ මීට ප්‍රසන්න වන සේක. "**

(g) **දේව දාසයන්ට සැපයීම - පිලිප්පි 4 : 17, 18**

**පිලිප්පි 4 : 17, 18 :-**

**" මා තෑග්ග සොයනවා නොව, නුඹලාගේ ගණනට වැඩිවන්නාවූ ඵල සොයමි. නුමුත් මට සියල්ල ලැබී, පූර්ණව සිටිමි. නුඹලා විසින් එවන ලද දේවල් එපප්‍රොදිතස්ගෙන් ලැබ පිරී සිටිමි. "**

**ඒවා දෙවියන්වහන්සේට මිහිරි සුවඳක්ව, ප්‍රියවූ, ප්‍රසන්නවූ පූජාවක්ව තිබේ.**

දෙවියන්වහන්සේ ප්‍රසන්නවූ දේවල් හතක් මෙහි සඳහන් කර ඇති අතර, මා ඔබගෙන් ඉල්ලා සිටින්නේ, ඔබම දේව වචනය විභාගකරමින්, දෙවියන්වහන්සේ ප්‍රසන්නවූ දේවල් තව සොයන්ට කියාය. දේව දරුව, එසේ සොයමින්, ඒවාද ඉහත සඳහන් හතට එකතු කර ගනිමින්, දෙවියන්වහන්සේ ප්‍රසන්න වන්නාවූ ජීවිතයක් ගතකිරීම ඔබගේ අභිප්‍රාය කරගන්න.

**එසේ ජීවත්වීමට**

**දෙවියන්වහන්සේ**

**ඔබට පිහිට වන සේක්වා !!!**

සටහන

.........................................................................................

.........................................................................................

.........................................................................................

.........................................................................................

.........................................................................................

.........................................................................................

.........................................................................................

.........................................................................................

.........................................................................................

.........................................................................................

.........................................................................................

.........................................................................................

.........................................................................................

.........................................................................................

.........................................................................................

.........................................................................................

.........................................................................................

.........................................................................................

.........................................................................................

.........................................................................................

.........................................................................................

.........................................................................................

.........................................................................................

.........................................................................................

.........................................................................................

.........................................................................................

සටහන

..............................................................................
..............................................................................
..............................................................................
..............................................................................
..............................................................................
..............................................................................
..............................................................................
..............................................................................
..............................................................................
..............................................................................
..............................................................................
..............................................................................
..............................................................................
..............................................................................
..............................................................................
..............................................................................
..............................................................................
..............................................................................
..............................................................................
..............................................................................
..............................................................................
..............................................................................
..............................................................................
..............................................................................
..............................................................................
..............................................................................

සටහන

..........................................................................................

..........................................................................................

..........................................................................................

..........................................................................................

..........................................................................................

..........................................................................................

..........................................................................................

..........................................................................................

..........................................................................................

..........................................................................................

..........................................................................................

..........................................................................................

..........................................................................................

..........................................................................................

..........................................................................................

..........................................................................................

..........................................................................................

..........................................................................................

..........................................................................................

..........................................................................................

..........................................................................................

..........................................................................................


..........................................................................................

..........................................................................................

..........................................................................................

..........................................................................................

# ස්වාමීන්වහන්සේගේ කැමැත්ත අප ආලෝකයේ හැසිරීමයි



# එපීස අධ්‍යයනය 15

## ස්වාමීන්වහන්සේගේ කැමැත්ත
## අප ආලෝකයේ හැසිරීමයි

**එපීස 5 : 8 - 17**

**<u>හැඳින්වීම</u> :-**

එපීස පොත අධ්‍යයනය කිරීමේ ආරම්භයේදීම, අප තේරුම්ගත්තාවූ දෙයක් වූයේ, එම පොතෙහි **පරිච්ඡේද 1-3** දක්වා තේමාව වන්නේ, **" ක්‍රිස්තුස්වහන්සේ තුළ අපට හිමි ආශිර්වාද"** වන අතර **පරිච්ඡේද 4-6** දක්වා තේමාව වන්නේ, **" ක්‍රිස්තුස්වහන්සේ තුළ ඇවිදීම "** වන බවය.

එබැවින් **එපීස 5 : 8 - 17** දක්වා කොටසේද අප නැවත වරක් බැලීමට යන්නේ, කිතුනුවාගේ හැසිරීම නොහොත් " ආලෝකයේ හැසිරීම " දෙසයි.

**<u>අධ්‍යයනය</u> :-**

1. **ආලෝකයේ දරුවන් මෙන් හැසිරීම**

(i) **එපීස 5 : 8 :- " .......... ආලෝකයේ දරුවන් මෙන් හැසිරියල්ලා. "**

ආලෝකයේ දරුවන් මෙන් හැසිරීම පිළිබඳව දේව වචනයේ වෙනත් පද දෙසද බලමු.

(a) **1 පේත්‍රුස් 2 : 9 :-**

**" නුමුත් අන්ධකාරයෙන් තමන්ගේ විස්මපත් ආලෝකයට නුඹලා කැඳවාගත් තැනන්වහන්සේගේ උත්කෘෂ්ටතාවන් දක්වන පිණිස නුඹලා වනාහි තෝරාගත් වංශයක්ද, රාජකීය පූජකයෝද, ශුද්ධවූ ජාතියක්ද, දෙවියන්වහන්සේ සන්තක සෙනඟක්ද වන්නහුය. "**

මෙම පදය පෙන්වාදෙන්නේ, දෙවියන්වහන්සේ අපව තෝරාගෙන අපව අන්ධකාරයේ සිට ආලෝකය කරා ගෙන ආවේ, **(අපගේ ජීවිතයෙන් නොහොත් අපගේ හැසිරීමෙන්)** උන්වහන්සේගේ උත්කෘෂ්ටතාවය දක්වන පිණිස බවය.

(b) **1 යොහන් 1 : 5 , 6 :-**

**" ..... දෙවියන්වහන්සේ ආලෝකය බවත් උන්වහන්සේ තුළ කිසිම අන්ධකාරයක් නැති බවත්ය. අපි උන්වහන්සේ සමඟ පංගුකාරකම් ඇතැයි කියමින් අන්ධකාරයෙහි හැසිරෙමු නම් අපි බොරු කියනවා මිස සැබෑව නොකරමුව. "**

අප සැම දෙන ප්‍රකාශකරන්නාවූ දෙයක් වන්නේ - දෙවියන්වහන්සේ අපගේ ''පියා'' වන බවත්, අප උන්වහන්සේගේ දරුවන් වන බවත්ය. මෙම පදය අපට පෙන්වාදෙන්නේ, මෙසේ පවසන අප අන්ධකාරයෙහි හැසිරෙන්නෙමු නම්, අප බොරුකාරයන් වන බවය.

දේව දරුවෙනි, අන්ධකාරයෙහි නොහැසිරෙමු, ආලෝකයේ දරුවන් මෙන් හැසිරෙමු.

(c) **යොහන් 8 : 12 :-**

**" ...... මා අනුව එන්නා අන්ධකාරයෙහි නොහැසිර ජීවනයේ ආලෝකය ලබන්නේ යයි කීසේක. "**

ඉහත සඳහන් පද අනුව, දේව වචනය අපට පෙන්වාදෙන වැදගත් කරුණු සමහරක් මේවාය.

- අප පෙර කාලයේ සිටියේ අන්ධකාරයේය.
- දෙවියන්වහන්සේ අපව උන්වහන්සේගේ ආලෝකයට කැඳවාගත් සේක.
- දැන් අප දෙවියන්වහන්සේට අයිති සෙනඟක් වන්නෙමු.
- එබැවින් අප කිසිසේත් අන්ධකාරයෙහි නොහැසිරිය යුතුය.
- මෙය උදෙසා අප ආලෝකයේ දරුවන් මෙන් හැසිරිය යුතු වේ.
- අපගේ හැසිරීමෙන් දෙවියන්වහන්සේගේ උත්කෘෂ්ට-භාවය ලෝකයාට ප්‍රකාශ විය යුතුය.

## 2. ආලෝකයව සිටීම

**එපීස 5 : 8 :- '' මක්නිසාද වරක් නුඹලා අන්ධකාරයව සිටිය නමුත්, දැන් ස්වාමීන්වහන්සේ තුළ <u>ආලෝකයව සිටින්නහුය</u> ...... ''**

පාවුල්තුමා මෙහි ඉදිරිපත්කරන්නේ අතිශයින් වැදගත්වූ ගැඹුරු සත්‍යයකි. ඔහු මෙහි පෙන්වාදෙන්නේ, කිතුනුවන් ආලෝකයෙහි හැසිරෙනවුන් පමණක් නොව, ඔවුන් **ස්වාමීන්වහන්සේ තුළ ආලෝකයව සිටින බවය.** අප කවුරුත් දන්නා ආකාරයට අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස් - වහන්සේ '' ලෝකයේ ආලෝකය '' වන සේක.

**යොහන් 8 : 12 :- '' එබැවින් යේසුස්වහන්සේ නැවත ඔවුන්ට කථාකරමින් : මම ලෝකයේ ආලෝකයය ..... ''**

යේසුස්වහන්සේ ලෝකයේ ආලෝකය බව අප සැවොම දන්නෙමු. අපද දැන් සිටින්නේ උන්වහන්සේ තුළය. එබැවින් අප සැවොම දැන් සිටින්නේ ලෝකයේ ආලෝකය වන යේසුස්වහන්සේ තුළය. එම නිසා ''ලෝකයේ ආලෝකය '' තුළ සිටින අපද '' ආලෝකයව සිටින්නෙමු. ''

**මතෙව් 5 : 14 :- '' නුඹලා ලෝකයේ ආලෝකයය. කන්දක් මුදුනෙහි තිබෙන නුවරක් සඟවන්ට නොහැකිය. ''**

❖ දුර්වලවූ මනුෂ්‍යයන් වන්නාවූ අප ' ආලෝකයව සිටින්නේ ' මොන අයුරින්ද කියා පැහැදිලි කිරීම උදෙසා, නිදසුනක් ඔබ ඉදිරියේ තැබීමට කැමැත්තෙමි.

**<u>නිදසුන</u> :-**

ලෝකයේ ආලෝකය වන්නාවූ යේසුස්වහන්සේ හිරුට සමාන කරමු. හිරුගෙන් නික්මෙන්නාවූ අති දීප්තිමත් ආලෝකය මුලු ලොවට එළිය ගෙන දෙයි.

උන්වහන්සේ තුළ ආලෝකයව සිටින්නාවූ අප සඳට සමාන කළ හැක. රාත්‍රි කාලයේ සඳ ලොවට සීමිත ආලෝකයක් ගෙන දෙන අතර, එම ආලෝකය දිස්වන්නේ සඳ තුළින් නොවේ.

එම ආලෝකය අප වෙත පැමිණෙන්නේ, හිරුගේ ආලෝකය සඳ මත පතිත වී, ලොව වෙත පරාවර්තනය වීම මගිනි. දේව දරුවන් වන්නාවූ අප සැම තුළින්ද යේසුස්වහන්සේගේ ආලෝකය පරාවර්තනය විය යුතුයි.

මෙම නිදසුන තවත් පියවරක් ඉදිරියට ගෙන යෑමට කැමැත්තෙමි. එනම් සඳ අප වෙත පරාවර්තනය කරන්නාවූ ආලෝකය දිනෙන් දින වෙනස් වී, ''පුර හඳ දිනයේදී, උපරිම ආලෝකය ලබාදෙයි. අප සැමද සැමදිනම, සැමවිටම යේසුස්වහන්සේගේ ආලෝකය උපරිම ලෙස පරාවර්තනය කරන්නාවූ ''පුර හඳ'' මෙන් වීම උදෙසා ''සැමවිටම ආලෝකයෙහි හැසිරෙමු.''

**මතෙව් 5 : 16 :- '' එසේම මනුෂ්‍යයන් විසින් නුඹලාගේ යහපත් ක්‍රියා දැක ස්වර්ගයෙහි සිටින නුඹලාගේ පියාණන් - වහන්සේට ගෞරව කරන පිණිස නුඹලාගේ ආලෝකය ඔවුන් ඉදිරියේ බබළාවා. ''**

❖ මනුෂ්‍යයන් වන්නාවූ අප '' ආලෝකයක්ව '' සිටීම පහදා දීම උදෙසා **2 පේත්‍රුස් 1 : 3 සහ 4** වෙතද ඔබගේ අවධානය යොමුකරමි.

**2 පේත්‍රුස් 1 : 3 , 4 :- '' මක්නිසාද .... උන්වහන්සේගේ දිව්‍ය බලයෙන් ජීවිතයටත් <u>දේව භක්තියටත් අදාළ වූ සියලු දේ අපට දී තිබේ</u>. ඒ කරුණකොටගෙන උන්වහන්සේ තමන් අනර්ඝවූ ඉතා උතුම්වූ පොරොන්දු අපට දී තිබේ ; .... ඒ පොරොන්දු කරුණකොටගෙන <u>දේව ස්වභාවට පංගුකාරයන් වන පිණිසය</u>. ''**

මෙම පද අනුව අපට පෙනීයන්නේ දෙවියන්වහන්සේ අප තෝරා, කැඳවා, ගැළවීම ලබාදී, අපට ඉතා අනර්ඝ වූ පොරොන්දු ලබා දී ඇත්තේ, අප **'' දේව සභාවට පංගුකාරයන් වන පිණිස ''** බවය. **දෙවියන්වහන්සේ ආලෝකය බවත්, (1 යොහන් 1 : 5) යේසුස්වහන්සේ ලෝකයේ ආලෝකය බවත් (යොහන් 8 : 12)** අප දනිමු. ත්‍රිඑක දෙවියන්වහන්සේගේ මේ ස්වභාවයට පංගුකාරයන් වන අපද, එබැවින් **ආලෝකයව සිටින්නෙමු (එපීස 5 : 8).**

(iii) **ආලෝකයේ ඵල අප තුළ වර්ධනයවීම**

**එපීස 5 : 9 :- '' ආලෝකයේ ඵල නම්, සියලු ආකාර යහපත්කමත් ධර්මිෂ්ඨකමත් සැබෑකමත්ය. ''**

මෙම පදයේ සඳහන්, ආලෝකයේ ඵල ඔබට පැහැදිලි කිරීම උදෙසා, කොරී ටෙන් බූම් (Corrie Ten Boom) නමැති ඕලන්ද දේව දාසියගේ ජීවිතයේ අත්දැකීමක් ඔබ ඉදිරියේ තබමි.

කොරීගේ පියාගේ ව්‍යාපාරය වූයේ ඔරලෝසු අලුත්වැඩියා කිරීම වූ අතර, ඔහුගේ සාප්පුවේ ඉතා වටිනා ඔරලෝසු විකිණීම උදෙසා තිබුණි. එක් වකවානුවක පියාගේ ව්‍යාපාරය ඉතා පහත් තත්ත්වයකට වැටීම හේතුවෙන්, ''බූම්'' පවුල ආර්ථිකව මහත් දුෂ්කරතාවයට වැටී තිබුණි. දෙවියන්වහන්සේට ඉමහත් සේ ප්‍රේම කළාවූ මෙම පවුල, යාච්ඤාවෙන් දෙවියන්වහන්සේට කන්නලව් කළේය.

එක් දිනක් ඉතා ධනවත් මහත්මයෙක් එම සාප්පුවට පැමිණ, එහි තිබුනාවූ වඩාත්ම වටිනා ඔරලෝසුව මිලදී-ගැනීමට කැමති විය. හෙතෙම අවශ්‍ය මුදල කොරීගේ පියාට භාරදී, එම ඔරලෝසුව රැගෙන පිටත්වන්ට සූදානම්ව, ''බූම්'' මහතාට ප්‍රකාශකළේ, ඔහු සතුව මෙවැනිම ඔරලෝසුවක් තිබෙන නමුත් එය ක්‍රියාවිරහිතව ඇති බවත් එය ඔහු මිලදී ගත් සාප්පුවේ කිසිවෙකුට අලුත්වැඩියා කිරීමට නොහැකි නිසා, මෙම ඔරලෝසුව ඔහු ගත් බවත්ය.

'' එම ඔරලෝසුව මට පෙන්වන්න '' කියා ඉතා යටහත්ව ඉල්ලූ කොරීගේ පියා, එම ඔරලෝසුව රැගෙන ඉතාම කෙටි වේලාවකින් එය අලුත්වැඩියා කර කලින් ලබා ගත් මුදල්ද, ඔරලෝසුවද ඒ මහතාට භාරදී, විකුණන ලද ඔරලෝසුව නැවත ලබා ගත්තේය.

එම මහතා පිටත්ව ගිය පසු, මේ පවුලේ ආර්ථික ප්‍රශ්නයට විසඳුම තමා ළඟටම පැමිණි නමුත්, එම විසඳුම තම පියා විසින් අතහරිනු ලැබීම බලා සිටි කොරී මහත් උදහසින් තම පියාට බැන වැදුනේය. එවිට කොරීගේ පියා ඉතා සන්සුන්ව ඇයගෙන් මෙසේ ප්‍රශ්න කළේය.

මම එම ඔරලෝසුව අලුත්වැඩියා නොකර මාගේ ලාභය ගැන පමණක් සිතුවා නම්, දෙවියන්වහන්සේ මා ගැන ප්‍රසන්න වේද? උන්වහන්සේගේ නාමය මහිමයට පත්වේද? ඉන් පසු ඔහු කොරීට කීවේ, මුලු ලොවේ අයිතිකාරයා වන මාගේ පියාට අපගේ ආර්ථික ප්‍රශ්නය විසඳීම ඉතා සුලු දෙයක්. එම නිසා උන්වහන්සේව විශ්වාස කරන්න, එම මුදල් ගැන කරදර නොවන්න කියාය.

මෙම සත්‍ය කථාව තුළ **එපීස 5 : 9** වන පදයෙහි සඳහන් ආලෝකයේ එල තුනම කොරිගේ පියාගේ ජීවිතයේ අප දකිමු. ඔහුගේ යහපත්කම, ධර්මිෂ්ඨකම සහ සැබෑකම අප දකිමු. **දේව දරුව, මේ එල අපගේ ජීවිතවලද ප්‍රකාශවන අයුරින් අපද ආලෝකයෙහි හැසිරෙමු.**

## 2. ආලෝකයේ හැසිරීමේ සෘණාත්මක කොටස - එපීස 5 : 11-13

ආලෝකයේ හැසිරීමේ ධනාත්මක කොටසේ අප දකින්නේ, ක්‍රිස්තුස්වහන්සේ තුළ සිටිමින් උන්වහන්සේගේ ආලෝකයේ අප හැසිරෙන විට අපට හිමිවන්නාවූ ජීවිතය ඉතා ප්‍රීතිමත් වූද සන්සුන්වූද ජීවිතයක් බවයි.

මෙවැනි ජීවිතයක් ගතකිරීමට අප කවුරුත් ප්‍රිය කරන නමුත්, ආලෝකයේ හැසිරීමේ සෘණාත්මක කොටසින් බැහැරවීමට අපට නොහැකිවේ. දෙවියන්වහන්සේගේ කැමැත්ත, මෙම කොටස අප ජීවිතයෙන් ඉටුවීමය. උන්වහන්සේගේ කැමැත්ත අනුව **එපීස 5 : 11-13** යන කොටස, අපගේ ජීවිතවලට ආදේශ කර ගනිමු.

### (i) අන්ධකාරයේ ක්‍රියාවලට හවුල් නොවෙමු

**එපීස 5 : 11 :- " අන්ධකාරයේ එල නැති ක්‍රියාවලට හවුල් නොවී ..... "**

අන්ධකාරයේ ක්‍රියාවලට හවුල්වීමට අප පෙළඹෙන්නේ කෙසේද කියා අප මුලින්ම වටහාගත යුතු වේ. බොහෝවිට අප නොදැනම අන්ධකාරයේ ක්‍රියාකිරීමට අප පෙළඹෙන්නේ, දෙවියන්වහන්සේට අකීකරු වන්නාවූ අය සමඟ පංගුකාරකම් පැවැත්වීම තුළිනි. මෙසේ පංගුකාරකම් පැවැත්වීමේ භයානක කම පෙන්වාදෙන **එපීස 5 : 6, 7** දෙස බලමු.

**එපීස 5 : 6, 7 :-**

**'' ....... මේ දේවල් නිසා දෙවියන්වහන්සේගේ උදහස අකීකරු - කමේ පුත්‍රයන් පිටට පැමිණෙන්නේය. එබැවින් ඔවුන් සමග පංගුකාරයෝ නොවෙල්ලා. ''**

මෙය පිළිබඳව **2 කොරි. 6 : 14** දෙසද බලමු.

**2 කොරි. 6 : 14 :-**

**'' නොඇදහිලිකාරයන් සමග අසම ලෙස සම්බන්ධ නොවෙල්ලා. ධර්මිෂ්ඨකමෙත් අධර්මිෂ්ඨකමෙත් ඇති සහභාගිකම මොකද? නොහොත් අන්ධකාරය සමඟ ආලෝකයේ ඇති පංගුකාරකම මොකද ? ''**

ප්‍රේමණීය දේව දරුව, පාපයෙන් පිරුණාවූ මේ ලෝකයේ අප ජීවත්වන අතර, දෙවියන්වහන්සේට දූන දූනම අකීකරු - වන්නාවූ බොහෝ දෙනා අපට මුණගැසෙනවා ඇත. දේව වචනය අපට උගන්වන්නේ ඔවුන් සමග කථා නොකරන්න, ඔවුන්ට වෛර කරන්න කියා නොවේ.

දේව වචනය අපට උගන්වන්නේ ඔවුන් සමග ඉතා කිට්ටු සම්බන්ධකම්, පංගුකාරකම්, එකඟකම් යනාදියෙන් වැළකී සිටින්න කියාය. මේ සම්බන්ධයෙන් දේව වචනයට අප අකීකරු වන විට, අප අන්ධකාරයේ ක්‍රියාවලට ඇදී යාමේ උපද්‍රවයට ඉතා ළංව සිටින බව කිසිසේත් අමතක නොකරන්න.

(ii) **අන්ධකාරයේ ක්‍රියාවලට දොස් තබමු**

**එපීස 5 : 11 :-**

**'' අන්ධකාරයේ ඵල නැති ක්‍රියා වලට ..... දොස් තබාපල්ලා ; ''**

මෙම පදයේ දොස් තබාපල්ලා යන වචනය, ඉංග්‍රීසි පරිවර්තනයේ සඳහන් වන්නේ " Expose " කියාය. මෙහි අර්ථය වන්නේ ''එළිදරව් කරන්න'' යන්නයි. දේව දරුව, මෙය පහසු කාරියක් නොවේ. අන්ධකාරයේ ක්‍රියාවල යෙදෙන අයගේ ක්‍රියා, ආලෝකයේ හැසිරෙන්නාවූ ඔබ ප්‍රකාශ කළ විට, නොහොත් එළිදරව් කළ විට ඔබට විරුද්ධව යක්ෂයා ක්‍රියා කරනවා ඇත. ඔබට සතුරන් ඇතිවීමද නිසැකය.

ලෝකයේ මනුෂ්‍යයන් මේ අයුරින් ඔබට විරුද්ධවීම පුදුමයක් නොවේ. මෙනමුත් කිතුනු සභාවේද අප සමහර අවස්ථාවලදී මෙවැනි හැසිරීම් දැකීම මහත් කණගාටුවට කරුණකි.

**දේව දරුව, මෙම නිසා අධෛර්යයට පත් නොවන්න.**

**දේව වචනයට කීකරුවන්න.**

**සභාවේ පාපය ඇති වූ විට එයට දොස් තබන්න.**

**පාපය නොසඟවන්න.**

**යොහන් 3 : 19 - 21 :-**

**" විනිශ්චය නම් මේය - ලෝකයට ආලෝකය පැමිණ තිබෙන නමුත්, මනුෂ්‍යයන්ගේ ක්‍රියා නපුරු බැවින් ඔවුන් ආලෝකයට වඩා අන්ධකාරයට ඇලුම් වූ බවය.**

**<u>නපුරුකම් කරන සෑමදෙනාම ආලෝකයට වෛරවී</u>, තමුන්ගේ ක්‍රියා වැරදි බව ඔප්පු නොවන පිණිස ආලෝකයට නොඑති.**

**නුමුත් සැබෑව කරන්නා තමාගේ ක්‍රියා දෙවියන්වහන්සේ තුළ කළ බව ප්‍රකාශවෙන පිණිස ආලෝකයට එන්නේයයි කීසේක. "**

අපගේ ස්වාමීන්වහන්සේ වදාළ මේ වචන වලින් අපට පෙනීයන්නේ, (ලෝකයේ මෙන්ම සභාවේද) **" නපුරුකම් කරන සැම දෙනාම ආලෝකයට වෛරවන "** බවයි.

එබැවින් ඔබට විවිධාකාර බාධා සහ විරෝධතා ඇතිවන විට පුදුමයට පත් නොවන්න. ඒ ගැන සතුටුවන්න. මක්නිසාද අන්ධකාරයේ ක්‍රියාවල යෙදෙනවුන්, ඔබට හතුරුවීමෙන් බොහෝවිට පෙනීයන්නේ, ඔබ ආලෝකයේ හැසිරෙන බවය.

මේ සම්බන්ධයෙන් ඉතා වැදගත් කරුණක් ඔබට මතක් කරමි. එනම්, ඔබ මෙසේ ''දොස් තැබීම'', වෛරයෙන් නොව ප්‍රේමයෙන් යුතුව කිරීමේ වැදගත්කමය. **ප්‍රේමයෙන් යුක්තව ඇත්ත කථා කළ යුතු බව (එපීස 4 : 15)** කිසිවිටක අමතක නොකරන්න.

(iii) **ඔබගේ ආලෝකය මගින් අන්ධකාරයේ ක්‍රියා ප්‍රකාශවනවා ඇත - එපීස 5 : 13**

**එපීස 5 : 13 :- " නුමුත් දොස් තබනු ලබන සියලු දේ ආලෝකය කරණකොටගෙන ප්‍රකාශවන්නේය. "**

ප්‍රේමණීය සහෝදර, සහෝදරී, ආලෝකයේ දරුවන් වන්නාවූ අපට දෙවියන්වහන්සේ පවරා ඇති ඉතා වැදගත් කාර්යයන් දෙකක් තිබේ.

(a) ආලෝකයේ දරුවන්ට ඔබින ලෙස **ආලෝකයේ හැසිරීම (එපීස 5 : 8)**

(b) දේව ස්වභාවයේ පංගුකාරයන් ලෙස **(2 පේත්‍රුස් 1 : 4) ආලෝකයක් වීම.**

දේව දරුවන් වන්නාවූ ඔබ සැම, නිසැකවම ආලෝකයේ හැසිරීමට උත්සාහ කරන බව මම විශ්වාස කරමි.

මෙනමුත් **ආලෝකයක් වීමේ** වැදගත්කම අප බොහෝවිට තේරුම් නොගැනීම හේතුකොටගෙන ආලොකයේ හැසිරීමේ සෘණාත්මක කොටස අතපසු කිරීමට අප පුරුදුව සිටිමු.

❖ **මෙහි වැදගත්කම අද වටහා ගන්න.**

ආලෝකය තිබෙන තැන අඳුර පවතින්නට නොහැකිය. එම ස්ථානයෙන් අඳුර දුරු විය යුතුමය. එබැවින් **ඔබ ආලෝකයව සිටින විට,** ඔබ අවට අඳුර දුරුවීම සිදුවනවා ඇත.

(අඳුර යනු ආලෝකය නොමැතිවීමයි. එබැවින් ආලෝකයව සිටින්නාවූ ඔබ අඳුරු ස්ථානයකට ගිය විට එම ස්ථානය වෙනස්වීම ඇරඹෙනවා ඇත).

❖ ඉහත සඳහන් සත්‍යය ඔබ රැකියාව කරන ස්ථානයට අදාළ කරගන්න. ආලෝකයේ හැසිරෙන්නාවූ, ආලෝකයක් වන්නාවූ දේව දරුවෙක් වන්නාවූ ඔබ එම ස්ථානයේ සේවය කිරීම නිසා ප්‍රතිඵල දෙකක් එම ස්ථානයේ (සුළුවෙන් හෝ) දෙවියන්වහන්සේ අරඹයි.

(a) උන්වහන්සේ ඔබටද, එම සේවාස්ථානයටද ආශිර්වාද කිරීම අරඹන සේක.

(b) එම ස්ථානයේ අන්ධකාරයේ ක්‍රියා, අවම කිරීමට උන්වහන්සේ ඔබව පාවිච්චි කරන සේක.

දේව දරුව, ඔබ මේ වචන කියවා, යටිසිතින් සිනාසෙන්ට පුළුවන. මෙනමුත් ඉහත සඳහන් දේ, අත්දැක තිබෙන්නාවූ මා, ඉතා යටහත්ව ඉල්ලා සිටින්නේ, දෙවියන්වහන්සේ ප්‍රකාශ කරන දේ අදහා ඒ දේ පිළිපදින්ට කියාය. ඔබ එසේ කරන අතර නිසැකවම ඉහත සඳහන් වචනවල සත්‍යතාවය ඔබ අත්දකිනවා ඇත.

## 3. ඥානවන්තයන් ලෙස හැසිරීම - එපීස 5 : 15 - 17

කිතුනු ජීවිතය නොහොත් කිතුනු ගමන සහ කිතුනු හැසිරීම ගැන අප එපීස පොතෙන් උගත් කරුණු දෙස බලමු.

(a) අපගේ හැසිරීම ලෝකයේ ව්‍යවහාරය අනුව නොවිය යුතුය - **එපීස 2 : 2**
(b) එය අපගේ සිත්වල නිෂ්ඵලකමින් නොවිය යුතුය - **එපීස 4 : 17**
(c) එය අපගේ කැඳවීමට ඔබින ලෙස විය යුතුය - **එපිස 4 : 1**
(d) එය ප්‍රේමයෙන් විය යුතුය - **එපීස 5 : 2**
(e) එය ආලෝකයේ දරුවන් මෙන් විය යුතුය - **එපීස 5 : 8**

### (i) ප්‍රවේසමෙන් - එපීස 5 : 15

පාවුල්තුමා **එපිස 5 : 15** හි කියා සිටින්නේ ප්‍රවේසමෙන් හැසිරෙන්ට කියාය.

**එපීස 5 : 15 :- " ඒනිසා නුඹලා ඥානය නැත්තෝ මෙන් නොව ඥානවන්තයන් මෙන් ප්‍රවේසමෙන් හැසිරෙන්ට බලාගෙන, ….. "**

මෙහි ප්‍රවේසමෙන් යනුවෙන් අදහස් කරන්නේ, **විමසිල්ලෙන්, උනන්දුවෙන්, කල්පනාකාරීව, අවධානය යොමුකරමින්** වැනි අදහස්ය.

මොහොතක් ඔබගේ රැකියාව, ඔබගේ හෝ ඔබගේ දරුවන්ගේ අධ්‍යාපනය, ඔබගේ නිවස, ඔබගේ පවුල, ඔබගේ ඇඳුම්, ඔබගේ පෙනුම යනාදිය පිළිබඳව ඔබ ක්‍රියාකරන අන්දම ගැන සිතා බලන්න. නිසැකවම ඔබ මේ සැම දෙයක් ගැනම '' ප්‍රවේසමෙන් '' ක්‍රියාකරන බව ඔබටම වැටහෙනවා ඇත.

**දේව දරුව, කිතුනු ජීවිතය ගැනද මේ අයුරින්ම '' ප්‍රවේසමෙන් '' ක්‍රියා කරන්න. දැඩි උනන්දුවෙන් ඉතා කල්පනාකාරීව, මුලු අවධානය යොමුකරමින්,**

- **ඔබගේ නමස්කාරය ගැන,**
- **යාච්ඤා ජීවිතය ගැන,**
- **බයිබලය කියවීම, මෙනෙහි කිරීම, අධ්‍යයනය කිරීම ගැන,**
- **ඔබගේ සේවය ගැන,**

**සැමවිටම මෙලෙසම ප්‍රවේසමෙන් ක්‍රියාකරන්න.**

ඉහත සඳහන් දේ, ඔබගේ ජීවිතයට අදාළ කර ගැනීම උදෙසා, අඥානයා සහ ඥානවන්ත තැනැත්තා අතර ඇති වෙනස්කම් කිහිපයක්ද ඔබ ඉදිරියේ තබමි.

**<u>අඥාන තැනැත්තා</u> :-**

(a) අන් අය කියන සැමදේ, පිළිගනියි.
(b) ඔහු කරන වැරදි වලින්, ඉගෙන නොගනියි.
(c) තමාට හැකිදේ සහ නොහැකි දේ නොදනියි.

**<u>ඥානවන්ත තැනැත්තා</u> :-**

(a) දේව භය ඇතිව ක්‍රියා කරයි.
(b) සැම අවස්ථාවක්ද, තමාවද විභාග කර බලයි.
(c) අත්දැකීම් වලින් ඉගෙන ගනියි.

ප්‍රිය මිතුර, නිසැකවම ඔබට මේ ලැයිස්තු දෙකට තව බොහෝ දේ එකතු කළ හැක. එසේ කිරීම අතපසු නොකරන්න. යාච්ඤාවෙන් එසේ කරන්න. **ඉන්පසු ඒවා අනුගමනය කරමින් ප්‍රඥාවන්තයින් මෙන් ප්‍රවේසමෙන් හැසිරෙන්න.**

(ii) **කාලය හොඳ හැටි පාවිච්චි කරන්න - එපීස 5 : 16**

කාලය හොඳ හැටි පාවිච්චි කරන්නා, ඔහුට ලැබෙන්නාවූ ප්‍රස්තාවන් අල්ලා ගනියි.

බොහෝවිට '' සාර්ථක '' සහ '' අසාර්ථක '' පුද්ගලයින් අතර ඇත්තාවූ ප්‍රධාන වෙනසක් වන්නේ -
'' ප්‍රස්තාව අල්ලාගැනීමට '' ඔවුන් පෙන්වන්නාවූ හැකියාව සහ උනන්දුවයි.

**රෝම 13 : 12 :-**

**'' රාත්‍රිය බොහෝසේ ඉකුත්ව ගියේය, දවාල ළඟය. එබැවින් අන්ධකාරයේ ක්‍රියා අහක දමා, ආලෝකයේ ආයුධ පැළඳ ගනිමු. ''**

අප ස්වාමීන්වහන්සේගේ දෙවැනි ඊම ඉතා ළඟ බව කිතුනු සභාවේ බහුතරයක් පිළිගන්නාවූ මේ කාලයේ, ප්‍රිය සොයුර, මෙම ප්‍රස්තාව අල්ලා ගන්න.

- විනාශවන සෙනඟට යේසුස්වහන්සේව හඳුන්වා දෙන්න.
- උන්වහන්සේ ගැන සාක්ෂි දරන්න.
- ලෝකයේ ආලෝකයක් ලෙස ජීවත්වන්න.
- ස්වර්ගයේ වස්තු රැස් කර ගන්න.
- දෙවියන්වහන්සේ ප්‍රසන්න වන ලෙස හැසිරෙන්න.
- ප්‍රේමයෙන් හැසිරෙන්න.

මෙම ප්‍රස්තාව ඔබ අල්ලාගෙන, ඉදිරි කාලය දෙවියන් - වහන්සේගේ ගෞරවය සහ මහිමය උදෙසා භාවිත කළහොත් -

**'' යහපත්වූ විශ්වාසවූ දාසය, ඒ යහපත : ස්වල්ප දේ ගැන නුඹ විශ්වාස වූවෙහිය, බොහෝ දේ කෙරෙහි නුඹ අධිපති කරමි. '' (මතෙව් 25 : 21)**

යන වචන ස්වාමීන්වහන්සේ ඔබට පවසනවා ඇත.

(iii) **දෙවියන්වහන්සේගේ කැමැත්ත සොයා එයට කීකරුවන්න - එපීස 5 : 17**

**එපීස 5 : 17 :- " නුඹලා අනුවණයෝ නොවී, ස්වාමීන් - වහන්සේගේ කැමැත්ත කිමෙක්ද කියා තේරුම් ගනිල්ලා. "**

දේව දරුව, මෙය තේරුම් ගන්න.

දෙවියන්වහන්සේ ඔබ උදෙසා සූදානම් කළාවූ සහකාරියට වඩා හොඳ, රැකියාවට වඩා හොඳ, සැලැස්මට වඩා හොඳ කිසිම දෙයක් ඔබට සොයා ගත නොහැකි බව තේරුම් ගන්න. උන්වහන්සේ ඔබ උදෙසා සූදානම් කර ඇති යහපත් ක්‍රියාවල හැසිරෙමින්, (**එපීස 2 : 10**) අති වාසනාවන්තවූද, ආශිර්වාදලත්වූද ජීවිතයක් ගත කරන්න.

ප්‍රිය සොයුර, සොයුරිය,

**ඥානවන්ත දේව දරුවෙක් ලෙස**

**දෙවියන්වහන්සේගේ කැමැත්ත**

**තේරුම් ගනිමින් ජීවත් වෙන්න.**

**සැමවිටම ආලෝකයේ හැසිරෙමින්**

**ලෝකයට ආලෝකයක් වන්න.**


**මෙසේ කිරීමට දෙවි පියාණන්වහන්සේ ඔබට**

**පිහිටවන සේක්වා !!!**

## සටහන

........................................................................................
........................................................................................
........................................................................................
........................................................................................
........................................................................................
........................................................................................
........................................................................................
........................................................................................
........................................................................................
........................................................................................
........................................................................................
........................................................................................
........................................................................................
........................................................................................
........................................................................................
........................................................................................
........................................................................................
........................................................................................
........................................................................................
........................................................................................
........................................................................................
........................................................................................
........................................................................................
........................................................................................
........................................................................................
........................................................................................

# ශුද්ධාත්මයාණන්වහන්සේගෙන් පූර්ණවීම



## එපීස අධ්‍යයනය 16

# ශුද්ධාත්මයාණන්වහන්සේගෙන් පූර්ණවීම

**එපීස 5 : 18 - 21**

**<u>හැඳින්වීම</u> :-**

මෙම අධ්‍යයනයෙන්, අපගේ අවධානය යොමු කරනු ලබන්නේ මුද්‍රිකපානය බීම සහ බීමත්කම පිළිබඳවා දේව වචනයේ ඇති ඉගැන්වීම් කිහිපයක් දෙස සහ ආත්මයාණන්ගෙන් පූර්ණවීම තුළින් අපගේ හැසිරීමේ සිදුවිය යුතු වෙනස්කම් කිහිපයක් දෙසය.

මත්පැන් පානය කිරීම හේතුකොටගෙන සමහර කිතුනු පවුල් පවා ඉතා අසරණ තත්ත්වයකට පත්ව ඇති මේ කාලයේ, ඔබ සැමට මෙම අධ්‍යයනය මඟින් දෙවි සමිඳුන්ගේ හඬ ඇසේවා, යන්න අපගේ පැතුමයි.

**<u>අධ්‍යයනය</u> :-**

**1. <u>මුද්‍රිකපානය බීම සහ බීමත්කම - එපීස 5 : 18</u>**

(a) **එපීස 5 : 18 :- '' මුද්‍රිකපානයෙන් මත් නොවෙල්ලා, එයින් අනාචාරකම් හටගන්නේය. ''**

මෙම පදයෙහි සඳහන්වන්නේ, '' මුද්‍රිකපානයෙන් මත් නොවෙල්ලා '', මිස '' මුද්‍රිකපානය බීම නොකරපල්ලා '' නොවන බව ඔබට පෙන්වාදීමට කැමැත්තෙමි.

(b) (i) **ගණන් කථාව 6 : 2, 3 :- '' පුරුෂයෙක් හෝ ස්ත්‍රියෙක් හෝ ස්වාමීන්වහන්සේට කැපවී සිටීම පිණිස භාරයක් එනම් නසරීයෙකුගේ භාරයක් වෙන කල, ඔහු මුද්‍රික - පානයෙන්ද මද්‍යපානයෙන්ද වැළකී සිටිය යුතුය ; ... ''**

මෙම පදවලින් අපට පෙනීයන්නේ, දෙවියන් - වහන්සේගේ සේවය උදෙසා කැපවුනාවූ, ''නසරීයෙකු'' ලෙස කැපවූ සෑම දෙන ඔවුන්ගේ කැපවී සිටීමේ සියලු දවස්වල මුද්‍රිකපානයෙන් සම්පූර්ණයෙන්ම වැළකී සිටිය යුතු බවයි.

(ii) **ගණන් 15 : 5 :- " පාන පූජාවක් පිණිස මුද්‍රිකපාන හිනකින් සතරෙන් කොටසක් ...... ඔප්පු කරන්න. "**

දෙවියන්වහන්සේ නොයෙක් පූජා පිළිබඳව මෝසෙස්ට අණපනත් දුන් සේක. එම පූජාවන් අතර මුද්‍රිකපාන ඔප්පු කිරීම සඳහන්වීම අප මෙහි දකිමු.

(iii) **යොහන් 2 : 1-10** යන කොටසෙහි සඳහන්වන්නාවූ කානාන්හි සරණ මංගල්‍යය උත්සවයේදී, යේසුස් - වහන්සේ වතුර මුද්‍රිකපානයට හැරවීමේ හාස්කම අප හොඳට දනිමු.

(iv) **1 තිමෝති 5 : 23 :- " මින් මතු වතුරම බොන්නෙක් නොවී, නුඹේ ආමාශය උදෙසාද, නොයෙක්විට පැමිණෙන නුඹේ දුර්වලකම් නිසාද, මුද්‍රිකපානය ටිකක් භාවිත කරපන්න. "**

පාවුල්තුමා තිමෝතියස්ට මෙහි දෙන්නාවූ උපදෙස්වලින් පෙනීයන්නේ, මුද්‍රිකපානය ඖෂධයක් වශයෙන් භාවිත කරන ලද බවය.

(v) **ලූක් 10 : 34 :- " ..... ඔහු දැක අනුකම්පාකොට, ළඟට ගොස්, ඔහුගේ තුවාලවලට තෙල්ද මුද්‍රිකපානයද වත්කොට තුවාල බැඳ , ..... "**

යේසුස්වහන්සේ වදාළ ''යහපත් සමාරියා'' ගැන උපමා කථාවෙන් පෙනීයන්නේ, ඒ කාලයේ මුද්‍රිකපානය, තුවාලවලට දැමුවාවූ බෙහෙතක් ලෙසද භාවිතා කළ බවයි.

මෙම උපමාවේ අප දකින්නාවූ තව දෙයක් වන්නේ ''යහපත් සමාරියයා'' සතුව මුද්‍රිකපානය තිබුණු බවයි. මේ අනුව එවකට මනුෂ්‍යයන් දුර ගමන් යන අතර මුද්‍රික - පානය ගෙන යෑමට පුරුදුව සිටි බවද අපට නිගමනය කළ හැකිවේ.

ඉහත සඳහන් බයිබල් කොටස් පහෙන්ම අප දකින්නේ, මුද්‍රිකපානය විවිධාකාර කටයුතු උදෙසා භාවිතා කරනු ලැබූ බවද, එය පානය කිරීම තහනම් කරනු ලැබුවේ දෙවියන්වහන්සේගේ සේවය උදෙසා කැපවීමක් කළාවූ අයට පමණක් බවය.

මේ අයුරින්, මුද්‍රිකපානය බීමෙන් වළකින ලෙස, කිතුනු අපට දේව වචනය ඍජුව ප්‍රකාශ නොකරන නමුත්, අපගේ කෑම සහ බීම පිළිබඳව **1 කොරි. 10 : 31** දෙස බලමු.

**1 කොරි. 10 : 31 :- '' එහෙයින් නුඹලා කතත් බොතත් වෙන යමක් කරතත් සියල්ල දෙවියන්වහන්සේගේ ගෞරවය පිණිස කරපල්ලා. ''**

දේව දරුව, ඔබගේ මුද්‍රිකපාන භාවිතය, <u>දෙවියන් - වහන්සේගේ නාමය</u> කිසිසේත් <u>අගෞරවයට පමුණුවනවා නම්</u>, <u>මුද්‍රිකපානය බීමෙන් වළකින්න</u>.

(c) කිතු දහම, මුද්‍රිකපානයෙන් වළකින ලෙස අපට අණ නොකරන නමුත්, අප රටේ පවතින්නාවූ සෙසු ප්‍රධාන ආගම් තුන වන, බෞද්ධාගම, හින්දු ආගම සහ ඉස්ලාම් ආගම යන ආගම් තුනම ඔවුන්ගේ බැතිමතුන්ට උගන්වන්නේ මුද්‍රිකපානයෙන් වළකින්ට කියාය.

මේ අතර, යේසුස්වහන්සේ අපට කියා සිටින්නේ -
**'' මනුෂ්‍යයන් විසින් නුඹලාගේ යහපත් ක්‍රියා දැක ස්වර්ගයෙහි සිටින නුඹලාගේ පියාණන්වහන්සේට ගෞරව කරන පිණිස නුඹලාගේ ආලෝකය ඔවුන් ඉදිරියේ බබළාවා. ''(මතෙව් 5 : 16)** කියාය. උන්වහන්සේ අපට උගන්වන නමුත්, අප අන් ආගමිකයන් ඉදිරියෙහි මුද්‍රිකපානය භාවිතා කරන විට, ඔවුන් දකින්නේ මෙය ''යහපත් ක්‍රියාවක් '' ලෙස නොව, ''අයහපත් ක්‍රියාවක් '' ලෙසය.

එබැවින් අපගේ මෙම ක්‍රියාව ඔවුන්ව දෙවියන්වහන්සේ වෙත ළඟා කරවීමට බොහෝවිට බාධාවක් විය හැක. දේව දරුව, දෙවියන්වහන්සේගේ කැමැත්ත වන්නේ -
**'' සියලු මනුෂ්‍යයන් ගළවනු ලැබ සැබෑව දැන ගැනීමට පැමිණීමයි. '' (1 තිමෝති 2 : 3)**

අපගේ ස්වාමීන්වහන්සේගේ කුරුසි පූජාව තුළින්, සෑම මනුෂ්‍යයෙකුටම ගැළවීමට ඇතුල්විය හැකි නමුත්, අපගේ '' මුද්‍රිකපානය භාවිතය'' අන් ආගමිකයන්ට බාධාවක් විය හැක. එම නිසා <u>ඔවුන් උදෙසා</u>, <u>මුද්‍රිකපානය බීමෙන් අප වැළකී සිටිමු</u>.

**රෝම 14 : 21 :-**

**" ...... මුද්‍රිකපානය බීමෙන්වත් වෙන යමකින්වත් නුඹේ සහෝදරයා බාධාවට පැමිණේද, එය නොකර සිටීම හොඳය."**

(d) **බීමත්කම පාපයක් බව දේවවචනය පැහැදිලි පෙන්වාදෙයි**

**හිතෝපදේශ 23 : 31 - 35 :-**

**" මුද්‍රිකපානය රතුව පෙනෙන විටත්, .... ඒ දෙස නොබලන්න. අන්තිමේදී එය සර්පයෙකු මෙන් හපාකා, පොළඟෙකු මෙන් දෂ්ට කරයි. නුඹේ ඇසට අද්භූත දේවල් (නොහොත් අන්‍ය ස්ත්‍රීන්) පෙනෙන්නේය, නුඹේ සිත හිතුවක්කාර දේවල් කථා කරන්නේය ..... නැවත එය තවත් සොයන්නෙමියි නුඹ කියන්නෙහිය. "**

ප්‍රේමණීය සහෝදරවරුනි, මෙම වචනවල අරුත මෙනෙහි කර බලන්න. බීමත්කමේ ප්‍රතිඵල ලෙස මෙහි අපට පෙන්වාදෙන සමහර කරුණු වන්නේ,

- අපගේ සිත් අන්ධවීම
- අපගේ හෘද සාක්ෂිය නිහඬවීම
- කාම මිථ්‍යාචාරයට පෙළඹවීම
- අපගේ හැසිරීම ගැන පාලනය අපට නැතිවීම
- ලජ්ජාව නැතිවීම
- බීමත්කමට ඇබ්බැහිවීම

බව ඔබට පැහැදිලි වනවා ඇත.

ඉහත සඳහන් කරුණුවලින්, " කාම මිථ්‍යාචාරයට පෙළඹ - වීම " දෙස තව දුරටත් බලමු. **එපීස 5 : 18** වන පදයෙහි සඳහන්වන්නේ, **" එයින් අනාචාරකම් හටගන්නේය "** කියාය. මේ පිළිබඳව පරණ ගිවිසුමේ සඳහන්, රන් වස්සෙක් සාදා ඉශ්‍රායෙල් සෙනඟ එයට පූජා ඔප්පුකිරීමේ සිද්ධිය වෙතද ඔබගේ අවධානය යොමුකිරීමට කැමැත්තෙමි.

**නික්මයාම 32 : 6 :- " ඔව්හු පසුවදා ..... දවන පූජා ඔප්පු කළෝය ..... එවිට සෙනඟ කන්ටත් <u>බොන්ටත් ඉඳ පසුව සෙල්ලම් කරන්ට නැගුටුණෝය</u>. "**

දේව දරුව, බීමෙන් පසුව මේ සෙනඟ කළාවූ " සෙල්ලම් " මොනවාද කියා ඔබගෙන්ම අසාගන්න. මාගේ ප්‍රිය මිතුරෙනි, මෙම භයානක පාපය කරා බීමත්කම තුළින් යක්ෂයාට ඉඩ නොදෙන්න. බීමත්කමේ අති භයානකකම පැහැදිලිව පෙන්වාදෙන්නාවූ, තව පද දෙකක් ඔබ ඉදිරියේ තබමි.

**1 කොරි. 6 : 10 :- " සොරුන්වත් ලෝභයෝවත් <u>බේබද්දෝවත්</u> ....... <u>දෙවියන්වහන්සේගේ රාජ්‍යය උරුම කර නොගන්නේය</u>. "**

**ගලාති 5 : 21 :- " වෛර, <u>බීමත්කම</u>, මංගල්‍ය ඝෝෂා සහ තවත් එවැනි දේවල්ය. <u>මෙබඳු දේ කරන්නන්ට</u> <u>දෙවියන්</u> - <u>වහන්සේගේ රාජ්‍යයෙහි උරුම නොලැබෙන බව</u> ....... නුඹලාට කියමි. "**

මෙම වචන ඔබට වැඩි දුර විස්තර කිරීමට අවශ්‍යය යයි නොසිතමි.

**ප්‍රිය සහෝදරයෙනි, බීමත්කමෙන් 100% වළකින්න.**

**2. <u>ශුද්ධාත්මයාණන්වහන්සේගෙන් පූර්ණවීම - එපීස 5 : 18</u>**

ශුද්ධාත්මයාණන්වහන්සේගෙන් පූර්ණව සිටීම, සහ මුද්‍රික - පානයෙන් වැළකී සිටීම අතර ඇති කිට්ටු සම්බන්ධකම, යොහන් බව්තීස්ම පිළිබඳව **ලූක් 1 : 15** වෙනි පදයේ සඳහන් වචන අපට පෙන්වාදෙයි.

**ලූක් 1 : 15 :- " මක්නිසාද ඔහු ස්වාමීන්වහන්සේ ඉදිරියෙහි උත්තමයෙක් වන්නේය, ඔහු මුද්‍රිකපානයවත් මද්‍යපානයවත් නොබොන්නේය : මවු කුස පටන්ම ඔහු ශුද්ධාත්මයෙන් පූර්ණව සිටින්නේය. "**

බීමත්කම සහ ශුද්ධාත්මයාණන්වහන්සේගෙන් පූර්ණව සිටීම අතරද ඇති සමානකමක්ද ඔබ ඉදිරියේ තබමි. එනම්, <u>මුද්‍රිකපානයෙන්</u> <u>මත්වූ කෙනෙක් මුද්‍රිකපානයේ පාලනයට</u> යටත්ව ක්‍රියා කරන අතර, ශුද්ධාත්මයාණන්වහන්සේගෙන් <u>පූර්ණවූ කෙනෙක් ශුද්ධාත්මයාණන්වහන්සේගේ පාලනය යටතේ</u> ක්‍රියා කරන බවය.

දේව දරුව, කිසිවිටක ඔබව පාලනය කිරීමට මුද්‍රිකපානයට ඉඩ නොහරින්න. ශුද්ධාත්මයාණන්වහන්සේගෙන් පූර්ණවීම පැහැදිලි කිරීම උදෙසා, ශුද්ධාත්මයාණන් - වහන්සේගේ ක්‍රියා කිරීම් ගැන වඩා පුළුල් ලෙස තේරුම් කර දීම වැදගත් වේ.

(a) යම් කෙනෙක් යේසුස්වහන්සේ තම ගැළවුම්කරු ලෙස පිළිගෙන, උන්වහන්සේට තම ජීවිතය භාරකළවිට ශුද්ධාත්මයාණන්වහන්සේ විසින් පහත සඳහන් දේ ඉටු කරනු ලබයි.

(i) ශුද්ධාත්මයාණන්වහන්සේ ඔහු තුළ වාසය කිරීම අරඹයි.

**1 කොරි. 3 : 16 :- '' නුඹලා දෙවියන්වහන්සේගේ මාළිගය බවද දෙවියන්වහන්සේගේ ආත්මයාණන්වහන්සේ නුඹලා තුළ වාසය කරන බවද නොදනිවුද ? ''**

යමෙක් තුළ ශුද්ධාත්මයාණන්වහන්සේ නැතිසේක් නම්, හෙතෙම යේසුස්වහන්සේට අයිති නොවන බව **රෝම 8 : 9** පෙන්වාදෙයි. මේ අනුව අපට පෙනීයන්නේ, අප අපගේ ජීවිත යේසුස්වහන්සේට භාරදී, උන්වහන්සේට අයිතිවූ විට, ශුද්ධාත්මයාණන්වහන්සේ අප තුළට පැමිණෙන බවයි.

**රෝම 8 : 9 :- '' නුමුත් නුඹලා තුළ දෙවියන්වහන්සේගේ ආත්මයාණන්වහන්සේ වාසය කරන සේක්නම්, නුඹලා මාංසයෙහි නොව ආත්මයෙහි සිටින්නෝය. <u>ක්‍රිස්තුස් - වහන්සේගේ ආත්මයාණන්වහන්සේ යම් කෙනෙකුට නැත්නම් ඔහු උන්වහන්සේට අයිති නැත</u>. ''**

(ii) ශුද්ධාත්මයාණන්වහන්සේ තුළ ඔහු මුද්‍රා කරනු ලබයි.

**2 කොරි. 1 : 22 :- '' උන්වහන්සේ අප මුද්‍රාකොට අපේ සිත් තුළ ආත්මයාණන්වහන්සේ නමැති අත්තිකාරම අපට දුන්සේක. ''**

**එපීස 1 : 14 :- '' අපේ උරුමයේ අත්තිකාරමවූ පොරොන්දුවේ ශුද්ධාත්මයාණන්වහන්සේගෙන් නුඹලා උන්වහන්සේ තුළ මුද්‍රා කරනු ලැබුවහුය. ''**

**එපීස 4 : 30 :-**
**'' ...... උන්වහන්සේ (ශුද්ධාත්මයාණන්වහන්සේ) තුළ නුඹලා මිදීමේ දවසට මුද්‍රාකරනු ලැබුවහුය. ''**

(iii) ශුද්ධාත්මයාණන්වහන්සේ විසින් ඔහු යේසුස්වහන් - සේගේ ශරීරයට බව්තීස්ම කරනු ලබයි.

**1 කොරි. 12 : 13 :- '' අප සියල්ලෝ එකම ආත්මයාණන් - වහන්සේ තුළ එකම ශරීරයට බව්තීස්ම කරනු ලැබ, සියල්ලෝ එකම ආත්මයාණන්ගෙන් පොවනු ලැබීමුව. ''**

ඉහත සඳහන් කරුණු තුනම, එනම් ශුද්ධාත්මයාණන් - වහන්සේ අප තුළ වැඩ විසීම, උන්වහන්සේ තුළ අප මුද්‍රා කරනු ලැබීම සහ යේසුස්වහන්සේගේ ශරීරයට බව්තීස්ම කරනු ලැබීම, කරනු ලබන්නේ ත්‍රිත්ව දෙවියන්වහන්සේ විසිනි. ඒවා සම්බන්ධයෙන් සෑම දෙයක්ම ඉටු කරනු ලබන්නේ දෙවියන්වහන්සේ විසින් වන බැවින්, ඒවා කිරීමට කියා දේව වචනය අපට ආඥා නොකරයි.

අප විසින් කළ යුත්තේ, යේසුස්වහන්සේ පිළිගැනීම සහ උන්වහන්සේට අපගේ ජීවිත භාරදීමය. අප එසේ කළවිට ත්‍රිත්ව දෙවියන්වහන්සේ ඉහත සඳහන් දේවල් සියල්ල සම්පූර්ණ කරන සේක. මෙම හේතුව නිසාම '' ශුද්ධාත්මයාණන්වහන්සේගෙන් බව්තීස්ම වන්න'' හෝ '' ශුද්ධාත්මයාණන්වහන්සේගෙන් මුද්‍රාකරනු ලබන්න '' කියා, දේව වචනය ආඥා නොකරයි. ශුද්ධාත්මයාණන් - වහන්සේ පිළිබඳව ඇත්තාවූ ආඥා තුනක් ඔබ ඉදිරියේ තබමි.

(A) **1 තෙසලෝනික 5 : 19 :- '' ආත්මයාණන්වහන්සේ නොනිවල්ලා. ''**

(B) **එපීස 4 : 30 :- '' ශුද්ධාත්මයාණන්වහන්සේට දුක් නොදෙල්ලා. ''**

(C) **එපීස 5 : 18 :- '' ආත්මයාණන්ගෙන් පූර්ණවී. ''**

මේ ආඥා තුනෙන්, මෙම අධ්‍යයනයේදී අපගේ අවධානය යොමු කරනු ලබන්නේ, **එපීස 5 : 18** හි සඳහන් ආඥාව වෙත පමණක්ය.

(b) ශුද්ධාත්මයාණන්වහන්සේ විසින් අප බව්තීස්ම කරනු ලැබූ විට, අපගේ සම්බන්ධකම්වල ඉතා වැදගත් වෙනස්වීම් දෙකක් ඇතිවෙයි.

(i) ක්‍රිස්තුස්වහන්සේ සමඟ අප අලුත් සම්බන්ධකමකට ඇතුල් වන අතර, එමගින් අප ක්‍රිස්තුස්වහන්සේ තුළට ඇතුල් වන්නෙමු. ක්‍රිස්තුස්වහන්සේ සමඟ ඇතිවන්නාවූ මෙම සම්බන්ධකමේ වැදගත්කම නිසාම, පාවුල්තුමාගේ ලිපිවල ''ක්‍රිස්තුස්වහන්සේ තුළ'' යන්න හැත්තෑ වතාවක් පමණ සඳහන් කරනු ලබයි.

(ii) අන් කිතුනුවන් සමඟ විශේෂ සම්බන්ධකමකට අප ඇතුල්වීම.

**රෝම 12 : 5 :- '' බොහෝ දෙනෙක් වූ <u>අපිත්</u> ක්‍රිස්තුස් - වහන්සේ තුළ එසේම <u>එක ශරීරයක්ව</u>, වෙන් වෙන් වශයෙන් ඔවුනොවුන්ගේ අවයවයෝ වෙමුව. ''**

**ගලාති 3 : 26 :- '' මක්නිසාද නුඹලා සියල්ලෝම ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ ඇදහිල්ල කරණකොටගෙන දෙවියන්වහන්සේගේ පුත්‍රයෝය. ''**

**ගලාති 3 : 28 :- '' නුඹලා <u>සියල්ලන්</u> ක්‍රිස්තුස් යේසුස් - වහන්සේ තුළ <u>එක්කෙනෙක්ව සිටින නිසා</u>, ..... ''**

දේව දරුවන් වන්නාවූ අප සැම දෙනාම එකම පියෙකුගේ දරුවන් බවට පත් වන අතර, ක්‍රිස්තුස්වහන්සේ තුළ අප එකම ශරීරයක්ව, '' ඔවුනොවුන්ගේ අවයවයෝ වෙමු '' **(රෝම 12 : 5)**.

(c) දේව වචනය අනුව, ආත්මික කිතුනුවන් සේම මාංසික කිතුනුවන්ද, ආත්මික බිලිඳුන් සේම ආත්මිකව මේරුණු කිතුනුවන්ද සිටින බව අප දනිමු.

**1 කොරි. 3 : 1 :- '' සහෝදරයෙනි, ආත්මිකයන්ට මෙන් නුඹලාට කථාකරන්ට නොහැකිව, මාංසිකයන්ටත් ක්‍රිස්තුස් - වහන්සේ තුළ බිළිඳුන්ටත් මෙන් කථා කළෙමි. ''**

මෙහි සඳහන් '' ආත්මිකයන් '' නොහොත් '' ආත්මික කිතුනුවන් '' ශුද්ධාත්මයාණන්වහන්සේ විසින් පාලනය කරනු ලබන අතර, '' මාංසිකයන් '' නොහොත් '' මාංසික කිතුනුවන් '' මාංසික ආසාවලින් පාලනය කරණු ලබති. කිතුනුවාගේ හැසිරීමේ සිදුවන්නාවූ පොරබැදීම ප්‍රායෝගිකව තේරුම් ගැනීම පිණිස **ගලාති 5 : 16, 17** වන පද දෙස බලමු.

**ගලාති 5 : 16, 17 :-**

'' [16] **නුමුත් ආත්මයාණන්වහන්සේ කරණකොටගෙන හැසිරියල්ලා, එවිට නුඹලා මාංසයේ තෘෂ්ණා සම්පූර්ණ - කරන්නේ නැතැයි කියමි.**

[17] **මක්නිසාද මාංසය ආත්මයාණන්වහන්සේට විරුද්ධවද ආත්මයාණන්වහන්සේ මාංසයට විරුද්ධවද ආශාකරයි. නුඹලා කැමති දේ නොකරන ලෙස මොව්හු එකිනෙකාට විරුද්ධ වෙති. ''**

දේව දරුකමට ඇතුලත්ව සිටින්නාවූ අප සැම දෙනාගේ ජීවිත තුළ, ''ආත්මයාණන්වහන්සේ කරණකොටගෙන හැසිරීම සහ මාංසයේ තෘෂ්ණා අනුව අප කැමති දේ කිරීමේ (**ගලාති 5:16,17** පෙන්වන ආකාරයට) පොරබැදීම පවතියි.

දෙවියන්වහන්සේගේ කැමැත්ත වන්නේ, අප සැමවිටම මාංසයේ ක්‍රියාවලින් වැළකී ආත්මයාණන්වහන්සේ විසින් ගෙනයනු ලබමින් ආත්මයාණන්වහන්සේගේ ඵල දැරීමය. **(ගලාති 5 : 18, 22 - 25). මේ අයුරින් ජීවත්වීම උදෙසා, සැමවිටම '' ආත්මයාණන්වහන්සේගෙන් පූර්ණව '' සිටීම අත්‍යවශ්‍ය වේ.**

අප '' ආත්මයාණන්වහන්සේගෙන් පූර්ණව '' සිටින විට, අප හැසිරෙන්නේ සහ ක්‍රියාකරන්නේ උන්වහන්සේ කරණකොටගෙනය.

එබැවින් **එපීස 5 : 18** හි සඳහන්, **'' ආත්මයාණන් - වහන්සේගෙන් පූර්ණවී '',** යන්නෙන් දෙවියන්වහන්සේ අපට කියා සිටින්නේ **<u>සැමවිටම ශුද්ධාත්මයාණන් - වහන්සේගේ පාලනය යටතේ ජීවත්වෙන්ට</u>** කියාය.

මේ සම්බන්ධයෙන් අවසාන වශයෙන්, '' ආත්මයාණන් - වහන්සේගෙන් පූර්ණවී '' ලෙස පරිවර්තනය කර ඇති වචන මඟින් ග්‍රීක් භාෂාවෙන් ප්‍රකාශ වන්නාවූ අදහස්ද ඔබ ඉදිරියේ තබමි.

(i) මෙය යෝජනාවක් හෝ උපදෙසක් නොවේ, එය අණකි නොහොත් ආඥාවකි.

(ii) එය සමහරෙකුට පමණක් සීමාවූ ආඥාවක් නොවේ. සෑම කිතුනුවෙකුටම අදාළ ආඥාවකි.

(iii) මෙසේ '' ආත්මයාණන්වහන්සේගෙන් පූර්ණවීම '' අප විසින් එක වරක් කළ යුතු දෙයක් නොවේ.

එහි අදහස වන්නේ සෑමදාම සෑමවිටම ''පූර්ණවෙමින් පවතින්න'' යන අදහසයි.

**3. <u>ආත්මයාණන්වහන්සේගෙන් පූර්ණව සිටින කෙනෙකුගේ හැසිරීම - එපීස 5 : 19 - 21</u>**

**එපීස 5 : 19 - 21** දක්වා ශුද්ධාත්මයාණන්වහන්සේගෙන් පිරුණාවූ කෙනෙකුගේ ජීවිතයෙන් ප්‍රකාශ විය යුතු ලක්ෂණ පහක් සඳහන් වේ. දේව දරුව, ශුද්ධාත්මයාණන් - වහන්සේගෙන් පූර්ණවී, මෙම හැසිරීමේ රටාව ඔබගේම කරගන්න.

(i) **සැබෑ නමස්කාරය - එපීස 5 : 19**

**එපීස 5 : 19 :- '' ...... නුඹලාගේ <u>සිත්වලින්</u> ස්වාමීන් - වහන්සේට ගායනාද ගීතිකාද කරමින්. ''**

මෙම පදයේ '' සිත්වලින් '' යන්නෙන් අදහස්වන්නේ,

(a) ගීතිකා ගායනා කරන අතර, ඒවා ගායනයේ සහ සංගීතයේ අලංකාරයට සීමා නොවී, ගයන්නාවූ වචන ශුද්ධාත්මයාණන්වහන්සේගෙන් පූර්ණවූ හදපත්ලෙන් නැගී එන්නාවූ නමස්කාරයක් ලෙස දෙවියන් - වහන්සේට පිදීම.

**යොහන් 4 : 24 :- '' දෙවියන්වහන්සේ ආත්මයක්ය. උන්වහන්සේට නමස්කාර කරන්නන් විසින් ආත්මයෙන්ද සැබෑකමෙන්ද නමස්කාර කළ යුතුයයි කී සේක. ''**

(b) වෙනත් වැඩවල යෙදෙනවිට පවා, හදවතින් සමිඳුන්ට ගී ගැයීම.

මා ඔබට යෝජනා කරන්නේ, මේ අරුතයන් දෙකම භාර ගනිමින්, දේව නමස්කාරය ඔබගේ ජීවිතයේ නිරන්තරයෙන්ම සිදුවන්නාවූ දෙයක් කරගැනීමට කියාය.

(ii) **සැබෑ සහභාගිකම - එපීස 5 : 19**

**එපීස 5 : 19 :-**

**" ගීතිකා වලින්ද, කව් වලින්ද, ආත්මික ගී වලින්ද, එකිනෙකාට කථාකොට, ...... "**

මෙයින් අදහස්වන්නේ කිතුනු අප එකතුවූ විට කථාකිරීම අතහැරදමා ගායනා යනාදියේ යෙදීම නොවේ. එයින් අදහස් වන්නේ, ශුද්ධාත්මයාණන්වහන්සේගෙන් පූර්ණව අප එකතුවූ විට, දෙවියන්වහන්සේට ප්‍රසන්නවූ කථා මෙන්ම, එක්ව උන්වහන්සේට ප්‍රශංසා ගී ගැයීම ස්වභාවයෙන්ම අප මුවින් නික්මිය යුතු බවය.

මේ මගින් කිතුනුවන් අතර සැබෑ සහභාගිකම වර්ධනය වනවා ඇත.

(iii) **සියල්ලේදී දෙවියන්වහන්සේට තුති පිදීම - එපීස 5 : 20**

**එපීස 5 : 20 :-**

**" අපගේ ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නාමයෙන් සියලු දේ ගැන පියවූ දෙවියන්වහන්සේට නිතරම ස්තූති කරපල්ලා. "**

මේ පිළිබඳව **කොලො. 3 : 17** සහ **1 තෙස. 5 : 18** දෙස බලමු.

**කොලොස්සි 3 : 17 :-**

**" නුඹලා ...... මොකක් කරතත්, සියල්ලම ස්වාමීවූ යේසුස් - වහන්සේගේ නාමයෙන් කරමින්, උන්වහන්සේ කරණකොට - ගෙන පියවූ දෙවියන්වහන්සේට ස්තූති කරපල්ලා. "**

**1 තෙසලෝනික 5 : 18 :- " සියල්ලේදී ස්තූති කරපල්ලා. "**

(iv) **ක්‍රිස්තුස්වහන්සේට යටත්වීම - එපීස 5 : 21**

**එපීස 5 : 21 :-'' ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි භය ඇතුව ... ''**

ආත්මයාණන්වහන්සේගෙන් පූර්ණවූ කෙනෙකුගේ මෙහි සඳහන්වන හතරවන ලක්ෂණය වන්නේ, යේසුස් - වහන්සේට අකීකරුවීමට ඔහු තුළ ඇත්තාවූ භයයි.

එබැවින් ඔහු, යේසුස්වහන්සේට යටත්වී, උන්වහන්සේට තම ජීවිතයේ ස්වාමීත්වය භාරදී, උන්වහන්සේට කීකරුවී ජීවත්වෙයි.

(v) **එකිනෙකාට යටත්වීම - එපීස 5 : 21**

**එපීස 5 : 21 :- '' ..... එකිනෙකාට යටත් වෙයල්ලා. ''**

මනුෂ්‍යවූ අප ස්වභාවයෙන්ම අන් අයට යටත්වීමට අකමැති වන්නෙමු. එබැවින් '' එකිනෙකාට යටත්වීම '' අපට අපහසුවේ. මෙනමුත් අප ශුද්ධාත්මයාණන් - වහන්සේගෙන් පූර්ණව, යේසුස්වහන්සේට යටත්වූ විට, එකිනෙකාට යටත්වීම, නොදැනුවත්වම අපගේ ස්වභාවය වනවා ඇත.

දේව දරුවෙනි,

**අප ශුද්ධාත්මයාණන්වහන්සේගෙන් පිරී හැසිරෙමු.**

**සැබෑ නමස්කාරය,**

**සැබෑ සහභාගිකම,**

**සියල්ලේදී සමිඳුන්ට තුති දීම,**

**ක්‍රිස්තුස්වහන්සේට යටත්වීම,**

**සහ එකිනෙකාට යටත්වීම**

**ආභරණයක් සේ පැළඳ ගනිමු.**

**එසේ කිරීමට දෙවි සමිඳුන්**

**ඔබට පිහිටවන සේක්වා !!!**

## සටහන

## සටහන

# කිතුනු පවුල - 01



# එපීස අධ්‍යයනය 17

# කිතුනු පවුල - 01

**එපීස 5 : 22 - 25**

**<u>හැඳින්වීම</u> :-**

ප්‍රේමයේ උල්පත වන්නාවූ අපගේ මැවුම්කාරවූ සර්වබලධාරී දෙවියන්වහන්සේ, මනුෂ්‍යයාට ප්‍රධානය කළාවූ ආශිර්වාද අතුරින්, ඉතාමත්ම අනර්ඝ ආශිර්වාදයක් වන්නේ, කිතුනු පවුලයි. දෙවියන්වහන්සේව නාඳුනන්නාවූ මනුෂ්‍යයන් සිතන ආකාරයට " **පවුලක්** " යන්න ඉබේම ඇතිවුනාවූ නැතහොත් මනුෂ්‍යයා විසින් නිර්මාණය කරන ලද්දාවූ ආයතනයක් නොවේ.

දෙවියන්වහන්සේ මනුෂ්‍යයාට ප්‍රධානය කර ඇති " **පවුල** " නමැති ත්‍යාගය කෙතරම් වටිනවාද කිවහොත්, මෙලොව මනුෂ්‍යයා අත්දකින්නාවූ දේ අතුරින්, කිතුනු පවුල තරම් අලංකාරවූද, එතරම් මනුෂ්‍යයාට සතුට සහ තෘප්තිය ගෙනදෙන්නාවූද වෙන ආයතනයක් නොමැත.

දෙවියන්වහන්සේගේ කැමැත්ත වන්නේ සෑම මනුෂ්‍ය - යෙක්ම පසුතැවිලිවී, ගැළවීමට පැමිණ " **කිතුනු පවුලේ** " වාසනාවන්තකම අත්දැකීමයි. එබැවින් කිතුනුවන් වන්නාවූ අප, අනිවාර්යයෙන්ම එම වාසනාවන්තවූද, ලොවට ආදර්ශයක් සහ අභියෝගයක් වන්නාවූද " **පවුල් ජීවිත ගතකිරීම** " උන්වහන්සේගේ කැමැත්ත වන සේක.

මේ අතර, දෙවියන්වහන්සේ විසින් නිර්මාණය කරන ලද්දාවූ '' කිතුනු පවුල '' යන්නාවූ ආයතනයේ සැබෑ ප්‍රීතිය අප අත්දැකීමට නම්, අප කළ යුත්තේ, **<u>උන්වහන්සේගේ කැමැත්ත සහ මඟපෙන්වීම</u> <u>අනුව අපගේ පවුල් ගොඩනැගීමයි</u>.**

මෙම අධ්‍යයනය මගින්, අතිශයින් වාසනාවන්තවූද, සතුටින් සමාදානයෙන් සහ සෑහීමෙන් පිරුණාවූද, කිතුනු පවුලක් ගොඩනැගීමට දෙවි සමිඳුන් ඔබට පිහිටවන සේක්වා ! යන්න අපගේ පැතුමයි.

**<u>අධ්‍යයනය</u> :-**

**1. <u>කිතුනු පවුලේ වැදගත්කම</u>**

කිතුනු පවුලේ වැදගත්කම දේව වචනය පුරාම අප දකින අතර, එහි වැදගත්කම අපට පෙන්වාදෙන්නාවූ අවස්ථා සහ ඉගැන්වීම් කිහිපයක් ඔබ ඉදිරියේ තබමි.

(i) **පවුලේදී ආදර්ශමත් ලෙස හැසිරීම**

දේව දරුවෙකුගේ ජීවිතය, ඔහුගේ ජීවිතයේ සෑම අවස්ථාවකදීම ආදර්ශමත් විය යුතුවේ. එබැවින් ඔහුගේ කාර්යාලයේදී, ව්‍යාපාරයේදී, ක්‍රීඩා පිටියේදී, සභාවේදී වැනි ස්ථානවල ඔහුගේ ජීවිතය අන් අයට ආදර්ශයක් විය යුතු අතර, එය එසේ විය යුතු වඩාත්ම වැදගත් ස්ථානය වන්නේ ඔහුගේ නිවසයි. අප අපගේ නිවෙස්වලදී නොහොත් අපගේ පවුලේදී ආදර්ශමත් ලෙස නොහැසිරේනම්, ඉහත සඳහන් කරන ලද වෙනත් ස්ථානවල '' ආදර්ශමත් වීම '' විහිළු සහගත වේ. එය අප විසින් කරනු ලබන ''රඟපෑමක් '' විය හැකිවේ. එබැවින් කිතුනු අපගේ ජීවිත ආදර්ශමත් විය යුතු ප්‍රථම ස්ථානය වන්නාවූ අප නිවසෙහි, දේව වචනයට අනුකූලව ක්‍රියාකිරීමට අදිටන් කර ගනිමු.

(a) **මාර්ක් 5 : 18, 19 :- '' [18] උන්වහන්සේ ඔරුවට නගිද්දී, යක්ෂාවේශව සිටි මනුෂ්‍යයා උන්වහන්සේ සමඟ සිටින ලෙස උදක්ම ඉල්ලා සිටියේය. [19] නුමුත් උන්වහන්සේ ඔහුට අවසර නොදී : නුඹ ගෙදර නුඹේ නෑ මිතුරන් ළඟට ගොස්, ස්වාමීන්වහන්සේ නුඹට කොපමණ මහත් දේවල් කළසේක්ද කියාත් උන්වහන්සේ නුඹට කරුණාකළ හැටිත් ඔවුන්ට දන්වාපන්නැයි ඔහුට කී සේක. ''**

යක්ෂාවේශව සිටියාවූ, 'ලෙගියොන් ' යේසුස්වහන්සේ සමඟ සිටින ලෙස නොහොත් උන්වහන්සේගේ ' අනුගාමිකයෙක් ' වීමට මහත් ඕනෑකමින් ඉල්ලීමක් කිරීම **මාර්ක් 5 : 18** වන පදයේ සඳහන් වේ. නමුත් තමාගේ තත්ත්වය නිසා තමාගේ ගෙදරින් පිටත වාසය කිරීමට පුරුදුව සිටි **(මාර්ක් 5 : 3)** ' ලෙගියොන්ට ', යේසුස්වහන්සේ උන්වහන්සේට ඊටත් වඩා වැදගත්වන්නේ තමාගේ ගෙදරට ගොස්, තමාගේ සතුට පවුල සමඟ බෙදාගැනීම බව කීසේක.

(b) **1 තිමෝති 5 : 4 :-**

**" නුමුත් යම් වැන්දඹු ස්ත්‍රියෙකුට දරුවෝවත් මුණුබුරෝවත් සිටත් නම්, ඔව්හු <u>පළමුකොට තමුන්ගේම පවුල ගැන භක්තිවන්ත ලෙස හැසිරෙමින්</u> ස්වකීය මවුපියන්ට ප්‍රත්‍යුපකාරකරන්ට ඉගෙනගනිත්වා. "**

දේව වචනය මෙහි උගන්වන්නේ, අසරණ වූවන්ට උදව්කිරීම අප විසින් කළ යුතු වන අතර, ඊට වඩා වැදගත් වන්නේ, තමුන්ගේම පවුලේ අයට අවශ්‍යවන්නාවූ උපකාර කිරීම බවය.

සමහර අවස්ථාවලදී, විවිධ හේතූන් මත දේව දරුවන් පවා තම දෙමව්පියන්ට යුතු ලෙස නොසලකමින්, සභාවේ සහ සමාජයේ අසරණවූවන් හට නොයෙක් උදව්ද උපකාරද කළ හැක. නමුත් දෙවියන්වහන්සේගේ වචනය මෙහි සඳහන් කරන්නේ, **" පළමුකොට තමුන්ගේම පවුල ගැන භක්තිවන්ත ලෙස හැසිරෙන්ට " (1 තිමෝති 5 : 4)** කියා බව ඔබ සැමට පැහැදිලිව පෙනේ යයි සිතමි.

නැවත වරක්, මෙහිදී අප දකින්නේ කිතුනු පවුලට දෙවියන්වහන්සේ දක්වන්නාවූ වැදගත්කමය. පවුලේ අප පෙන්නුම් නොකරන ආදර්ශය, අප පිටතදී පෙන්වනවිට, අප හැසිරෙන්නේ ' වංචාකාරයන් ' ලෙස බවද මෙම පදය වක්‍රව පෙන්වාදෙයි.

(c) **තීතස් 2 : 4 , 5 :-**

**" මෙසේ සිටිය යුතු වන්නේ, දෙවියන්වහන්සේගේ වචනයට අපහාස නොපැමිණෙන පිණිස යෞවන ස්ත්‍රීන් තමුන්ගේ <u>පුරුෂයන්ටත් දරුවන්ටත් ප්‍රේමකරමින්</u>, <u>සිහියෙන් යුක්තව</u>, <u>පිරිසිඳුව</u>, <u>ගෙදර වැඩ කරන්නියන්ව</u>, ..... "**

තරුණ භාර්යාවක් බොහෝවිට සමාජයේ ලස්සනට පෙනීමට උත්සාහ කිරීම හොඳ දෙයකි. නමුත් මෙම **'ලස්සන'** ගෙදරදී නොපෙනෙන විට **" දේව වචනයට අපහාස පැමිණිය හැකි බව ", තීතස් 2 : 4, 5** වන පද පෙන්වාදෙයි.

(ii) **සභාවේ නායකත්වය දැරීමට සුදුසුකම්**

කිතුනු සභාවේ නායකයෙක් ලෙස හෝ නිළධාරියෙක් ලෙස හෝ වැඩිමහල්ලෙක් ලෙස පත්කරනු ලැබීම උදෙසා, යමෙකු තුළ තිබිය යුතු සුදුසුකම් පාවුල්තුමා නිර්දේශ කරයි. තීතස්ට සහ තිමෝතියස්ට පාවුල්තුමා ලිව්වාවූ ලිපිවල සඳහන්වන්නාවූ, සභාවේ " **නායකයෙකුට** " තිබිය යුතු ඉතා වැදගත් සුදුසුකමක් වන්නේ, ඔහු **නිසි අයුරින් තම පවුල හසුරුවාගන්නාවූ කෙනෙක් වීමයි.**

(a) **1 තිමෝති 3 : 2 :-**

" **එහෙයින් නායක තෙමේ නිර්දෝෂ වූ, එක භාර්යාවකට පුරුෂයා වූ ....... කෙනෙක්ව සිටින්ට ඕනෑය.** "

**1 තිමෝති 3 : 4 :- " තමාගේම පවුල හොඳින් හසුරුවා - ගනිමින්, සියලු ආකාර සන්සුන්කම ඇතුව, ස්වකීය දරුවන් හික්මවා ගන්නාවූ තැනැත්තෙක්ව සිටිය යුතුය. "**

භාර්යාව සහ දරුවන්ගෙන් සමන්විත වන්නාවූ තම පවුලට නිසි නායකත්වය ගෙනදීමට අපොහොසත් වන්නාවූ කෙනෙක්, සභාවේ නායකත්වය දැරීමට නුසුදුසු බව ඉහත සඳහන් පද පෙන්වාදෙයි.

(b) **තීතස් 1 : 6 :-**

" **..... නිදොස්ව, එක භාර්යාවකට පුරුෂයාව, අවකල් ක්‍රියාව ගැන දෝෂාරෝපණය නොලත්, කීකරුවූ ඇදහිලිවන්ත දරුවන් ඇතුව සිටින්ට ඕනෑය.** "

සභාවේ වැඩිමහල්ලන් පත්කිරීමේදී, එම පුද්ගලයන්ගේ දරුවන්ගේ ඇදහීම සහ හැසිරීම සැලකිල්ලට ගැනීම පාවුල්තුමා නිර්දේශ කරන බව, වර්තමාන සභාවද අමතක නොකළ යුතු වේ.

(iii) **නිවසේදී ක්‍රිස්තුස්වහන්සේට යටහත්ව හැසිරීම**

බොහෝදෙනා සාමාන්‍යයෙන් අත්දකින්නාවූ දෙයක් වන්නේ, අඛණ්ඩව ආදර්ශමත් කිතුනු ජීවිතයක් ගත කිරීමට වැඩියෙන්ම දුෂ්කර ස්ථානයක් වන්නේ, තමාගේ නිවස බවයි.

මීට හේතු ලෙස දැක්විය හැකි කරුණු වන්නේ,

(a) අප සැමදෙනාම අපගේ සැබෑ ස්වභාවය පෙන්නුම්කරන (අපගේ වෙස්මුහුණු ගලවන) ස්ථානය වන්නේ අපගේ නිවසයි.

(b) අන් අයගෙන් අප බොහෝදේ බලාපොරොත්තු වන ස්ථානය වන්නේද අපගේ නිවසයි.

(c) අන් අයව බොහෝවිට අගයකිරීමට අප අපොහොසත් වන්නාවූ ස්ථානයක් වන්නේද මෙයයි.

(d) අන් අය සමඟ එකට එක කීමට ඉතා පහසුවෙන්ම පෙළඹෙන්නාවූ ස්ථානය වන්නේද මෙයමයි.

ඉහත සඳහන් කළාවූ හේතුන් නිසා, බොහෝවිට අපගේ හැසිරීම නොහොත් ක්‍රියාකිරීම ආදර්ශමත් නොවන්නාවූ ස්ථානයද නිවස වන අතර, සමිඳුන් අපව කැඳවන්නේ සැබෑ කිතුනු ජීවිතයක් අප නිවසේදී ගත කිරීමටයි.

**එපීස 5 : 2** වැනි පදයට ඉහලින්, ' ක්‍රිස්තියානි පවුලක තිබිය යුතු හැසිරීම ' යන උප මාතෘකාව අප බයිබලයේ සඳහන් වන නමුත්, බයිබලයේ වඩා පැරණි ඉංග්‍රීසි පරිවර්තනවල (KJV, RSV) මෙවැනි මාතෘකාවක් සඳහන් නොවේ. එබැවින් මා ඉතා යටහත්ව යෝජනා කරන්නේ, මෙම මාතෘකාව තිබිය යුතු ස්ථානය වන්නේ **එපීස 5 : 21** වන පදයට ඉහලින් බවයි. මාගේ මේ අදහස අනුව පෙනීයන්නේ, කිතුනු පවුලක හැසිරීම පිළිබඳව මෙහි සඳහන්වන්නාවූ ප්‍රථම උපදෙස වන්නේ -

' **ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි භය ඇතුව <u>එකිනෙකාට යටත්වෙයල්ලා</u> ' (එපීස 5 : 21)** යන්න බවයි.

මෙහි අදහස නිවැරදි බව අප පිළිගෙන, අප සැමදෙනාම අපගේ නිවෙස්වලදී ' **එකිනෙකාට යටත්වී** ' ක්‍රියා කරන අතර, මෙම කොටසේ මා කලින් පෙන්වාදුන් දුෂ්කරතා, ඉතා විගසින් අතුරුදහන්වී, අපගේ නිවෙස් අති ආදර්ශමත් ස්ථාන බවට පරිවර්තනය වේ.

මාගේ ප්‍රේමණීය සොයුර, සොයුරිය, අපගේ නිවෙස්වල නොහොත් අපගේ පවුල්වල, අප ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි භය ඇතුව, එකිනෙකාට යටත්වීම මගින්, අපගේ පවුල් **'ස්වර්ගයක්'** බවට පත්කර ගනිමු !!

## 2. කිතුනු භාර්යාවකගේ යුතුකම - එපීස 5 : 22-24

**එපීස 5 : 22 :-**

**" භාර්යාවෙනි, ස්වාමීන්වහන්සේට මෙන් නුඹලාගේ පුරුෂයන්ට යටත්ව සිටපල්ලා. "**

වර්තමාන යුගයේ අපගේ සවනට නිතර ඇසෙන්නාවූ වචනයක් වන්නේ, ' අයිතිවාසිකම් ' යන වචනයයි. මිනිස් අයිතිවාසිකම්, ස්ත්‍රීන්ගේ අයිතිවාසිකම්, දරුවන්ගේ අයිතිවාසිකම් යනාදිය ගැන නිතරම මාධ්‍ය මගින් අසනවා පමණක් නොව, එවැනි අයිතිවාසිකම් රැකගැනීම උදෙසා උද්ගෝෂණ පවා පවත්වනු ලැබේ. මෙම හේතුව නිසා තව කෙනෙකුට ' යටත්වීම ' යන අදහස, වර්තමාන සමාජයේ වැඩි පිළිගැනීමක් නැත්තාවූ නොහොත් ජනප්‍රිය නොවන්නාවූ අදහසකි.

මෙනමුත් දේව දරුවන් වන්නාවූ අප පිළිපැදිය යුත්තේ, සමාජය දරන්නාවූ අදහස් නොවේ. අප විසින් පිළිපැදිය යුත්තේ දෙවියන්වහන්සේ අපට ලබා දී ඇති මඟ-පෙන්වීමයි. එබැවින් දෙවියන්වහන්සේ භාර්යාවන්ට **එපීස 5 : 22** හි ලබා දී ඇති ආඥාව හොඳ හැටි තේරුම් - ගෙන ඊට කීකරුවීම, කිතුනු භාර්යාවකගේ වගකීමයි.

❖ මැවිල්ල දෙස බලන්නාවූ ඕනෑම කෙනෙකුට පෙනී - යන්නාවූ දෙයක් වන්නේ, දෙවියන්වහන්සේගේ මැවිල්ලේ ඇති පිළිවෙලයි. ස්වභාවධර්මය කෙරෙහි උන්වහන්සේ පවරා ඇති නීති ' සාමාන්‍යයෙන් ' උන්වහන්සේ වෙනස් නොකරන්නාවූ බව අප අත්දැකීමෙන් මෙන්ම දේව වචනයෙන්ද ඉගෙන ගන්නෙමු.

**උත්පත්ති 8 : 22 :-**

**" පොළොව පවතින තුරු වපුරන කාලය සහ කපන කාලයද, ශීතය සහ උෂ්ණයද, ග්‍රීෂ්ම කාලය සහ ශීත කාලයද, දවාල සහ රාත්‍රියද නොනවතින්නේයයි කී සේක. "**

දෙවියන්වහන්සේ මේ අයුරින් උන්වහන්සේගේ මැවිල්ල ඉතා පැහැදිලි පිළිවෙලකට පවත්වාගෙන යන අතර, ස්වභාවධර්මය තුළ උන්වහන්සේ පවරා ඇති නීතිවලට පටහැනිව මනුෂ්‍යයා ක්‍රියා කිරීම මගින්, අද ලෝකයේ 'දේශගුණය' ව්‍යාකූල තත්ත්වයකට පත්ව ඇති බව නොරහසකි.

දේව දරුවෙනි, මෙය වටහාගන්න. ස්වභාවධර්මය තුළ දෙවියන්වහන්සේ දමා ඇත්තාවූ නීති උල්ලංඝනය නොකිරීම ඉතා වැදගත් වේ. නමුත් ඊටත් වඩා වැදගත් වන්නේ, **මනුෂ්‍යයන් කෙරෙහි උන්වහන්සේ පවරා ඇති නීතිවලට යටත් වීමයි.** මේවායින් එකක් වන්නේ, **' භාර්යාවන් තම පුරුෂයන්ට යටත්වීමය. '**

❖ **එපීස 5 : 22** හි සඳහන් ' නීතිය ' නිවැරදිව තේරුම් ගැනීම වැදගත් වේ.

එයින් අදහස්වන්නේ, ස්ත්‍රියට වඩා වටිනාකමක් පුරුෂයාට ඇති බව නොවේ. දෙවියන්වහන්සේ **ස්ත්‍රිය සහ පුරුෂයා යන දෙදෙනාටම එක සමාන වටිනාකමක් දී ඇති අතර,** උන්වහන්සේ ඔවුන්ට පවරා ඇත්තාවූ වගකීම් වෙනස් වේ.

එබැවින් **එපීස 5 : 22** හි දෙවියන්වහන්සේ ප්‍රකාශ - කරන්නේ කිතුනු පවුලක් තුළ තිබිය යුතු අධිකාරියේ පිළිවෙලයි. උන්වහන්සේ පවුලක හිස හැටියට පත්කර ඇත්තේ ස්වාමිපුරුෂයාවයි.

**එපීස 5 : 23 :-**

**" ක්‍රිස්තුස්වහන්සේ සභාවේ හිසව සිටින්නා සේම පුරුෂයාත් භාර්යාවගේ හිසව සිටියි. "**

මෙය දෙවියන්වහන්සේම පුරුෂයාට දී ඇත්තාවූ අධිකාරිය බැවින්, අප සැමදෙනාම එය පිළිගත යුතුවේ.

මෙම දේව නියෝගය පිළිගෙන තම පුරුෂයාට යටත් - වන්නාවූ බිරිඳ, යටත්වන්නේ දෙවියන්වහන්සේටයි.

**<u>සටහන්</u>**

(i) භාර්යාව තම පුරුෂයාට යටත් විය යුත්තේ, එය දේව නියෝගයක් වන නිසාය. මෙනමුත් පුරුෂයා, දෙවියන් - වහන්සේ ඔහුට පවරා ඇති අධිකාරිය වැරදි ලෙස භාවිතකරමින්, වෙනත් දේව නියෝග කැඩෙන ආකාරයේ දේවල් කිරීමට තම භාර්යාවට කියන අවස්ථා ඇතිවුවහොත්, භාර්යාව ඔහුට කීකරුවීමට බැඳී නැත. මෙයින් අදහස්වන්නේ, මනුෂ්‍යයෙකු අපට කියන්නාවූ දේ, දෙවියන්වහන්සේගේ කැමැත්තට විරුද්ධ නම්, අප කීකරු විය යුත්තේ එම මනුෂ්‍යයාට නොව, දෙවියන්වහන්සේට බවය.

**ක්‍රියා 5 : 29 :- " පේත්‍රුස්ද ප්‍රේරිතයෝද උත්තර දෙමින් : මනුෂ්‍යයන්ට වඩා දෙවියන්වහන්සේට අප විසින් කීකරු විය යුතුය. "**

(ii) පුරුෂයාට දෙවියන්වහන්සේ පවරා ඇති අධිකාරිය, ඔහු විසින් කිසිසේත් ආත්මාර්ථකාමීව භාවිත නොකළ යුතුය. එම අධිකාරිය සමඟ ඔහුට පැවරෙන්නාවූ වගකීම වටහාගෙන, ඔහු මහත් වගකීමකින් ' භාර්යාවගේ හිස ' මෙන් ක්‍රියා කළ යුතු වේ.

❖ මනුෂ්‍යයාගේ මැවීමේ පටන්ම, දෙවියන්වහන්සේ පුරුෂයාට ප්‍රථම ස්ථානය ලබා දුන් බව දේව වචනයෙන් අප දකිමු.

**උත්පත්ති 2 : 21, 22 :- " [21] ස්වාමිවූ දෙවියන්වහන්සේ මනුෂ්‍යයාට බරවූ නින්දක් පැමිණෙවූ සේක, ඔහු නිදාගත්තේය ; උන්වහන්සේ ඔහුගේ ඉළ ඇටවලින් එකක් ගෙන ඒ ස්ථානය මාංසයෙන් පිරෙවූසේක. [22] ස්වාමිවූ දෙවියන්වහන්සේ මනුෂ්‍යයාගෙන් ගත් ඉළ ඇටයෙන් ස්ත්‍රියක් සාදා ඇය මනුෂ්‍යයා වෙතට පැමිණෙවූ සේක ..... "**

**1 තිමෝති 2 : 13, 14 :- " [13] මක්නිසාද පළමුකොට ආදම්ද පසුව ඒවද සාදනු ලැබීය ; [14] තවද ආදම් රැවටුණේ නැත, නුමුත් ස්ත්‍රී රැවටී, වරදට වැටී සිටින්නීය. "**

දෙවියන්වහන්සේ පෙන්වාදුන් මේ පිළිවෙල, වෙනස් කළ විට, අනිවාර්යයෙන්ම ගැටළු සහ ප්‍රශ්න ඇතිවේ.

❖ **එපීස 5 : 23** වන පදය ප්‍රකාශ කරන්නේ, පුරුෂයා භාර්යාවගේ හිසව සිටින බවයි. දෙවියන්වහන්සේ මෙලොව ස්ථාපනය කර ඇත්තාවූ අධිකාරිය වැඩි දුරට තේරුම් ගැනීම උදෙසා **1 කොරින්ති 11 : 3** දෙස බලමු.

**1 කොරින්ති 11 : 3 :-**

**" නුමුත් එක එක පුරුෂයාගේ හිස ක්‍රිස්තුස්වහන්සේ බවද, ස්ත්‍රියගේ හිස පුරුෂයා බවද, ක්‍රිස්තුස්වහන්සේගේ හිස දෙවියන්වහන්සේ බවද නුඹලා දැනගන්නවාට කැමැත්තෙමි. "**

මෙලෙස දෙවියන්වහන්සේ පවරා ඇති අධිකාරිය අනුව,

1. දෙවියන්වහන්සේ යේසුස්වහන්සේගේ හිසයි.
2. යේසුස්වහන්සේ පුරුෂයාගේ හිසයි.
3. පුරුෂයා ස්ත්‍රියගේ හිසයි.

එබැවින් යේසුස්වහන්සේ තම හිස වන්නාවූ දෙවියන් - වහන්සේට කුරුසියේ මරණය දක්වා කීකරු වූවා සේම, පුරුෂයා තම හිස වන්නාවූ යේසුස්වහන්සේට කීකරු විය යුතුවේ.

## 3. ක්‍රිතුනු ස්වාමිපුරුෂයන්ගේ යුතුකම් - එපීස 5 : 25

**එපීස 5 : 25 :- " පුරුෂයෙනි, ක්‍රිස්තුස්වහන්සේ සභාවට ප්‍රේමකොට, ඈ උදෙසා තමන්ම පාවා දුන්නාක්මෙන්ම, නුඹලාත් නුඹලාගේ භාර්යාවන්ට ප්‍රේමකරපල්ලා. "**

(a) මෙහිදී යමෙකුගේ සිතෙහි නැගෙන්නාවූ ප්‍රශ්න විය හැක්කේ, " භාර්යාවන්ට ප්‍රේමකරන ලෙස පුරුෂයාට දෙවියන්වහන්සේ නියෝග කරන්නේ මන්ද ? ", " පුරුෂයෙක් යම් ස්ත්‍රියක් සමග විවාහ වන්නේ ඇයට ප්‍රේමකරන නිසා නොවේද ? " වැනි ප්‍රශ්නයි.

දේව දරුවෙනි, මෙම නියෝගය ගැන සිතා බලන්න. දෙවියන්වහන්සේ ස්ත්‍රිය සහ පුරුෂයා මවා ඇත්තේ වෙනස්වූ ස්වභාවයකින් යුක්තවයි. එබැවින් ස්ත්‍රියක් ස්වභාවයෙන්ම තම සැමියාට ප්‍රේම කිරීමට නැඹුරු වන නමුත්, පුරුෂයා තුළ ස්ත්‍රිය තරමට වඩා මෙම නැඹුරුවීම බොහෝවිට අඩුය.

පුරුෂයාගේ සහ ස්ත්‍රියගේ ස්වභාවය වඩාත්ම සම්පූර්ණව දන්නාවූ දෙවියන්වහන්සේ, **' යේසුස්වහන්සේ සභාවට ප්‍රේම කළාක් මෙන්, තම භාර්යාවන්ට ප්‍රේම කරන ලෙස, පුරුෂයින්ට කියා දෙයි. '**

ප්‍රිය පුරුෂයෙනි, අප සැම අපගේ භාර්යාවන්ට ප්‍රේමකරමින්, යේසුස්වහන්සේ මෙන් ඔවුන් උදෙසා අපගේ ජීවිත පවා පුදන්ට සූදානම්ව ජීවත් වෙමු. අපගේ ප්‍රේමය මුවින් පමණක් නොව, අපගේ ක්‍රියාවලින් පෙන්වමු. අපගේ නිවෙස් සතුටින් සමාදානයෙන් හා ප්‍රේමයෙන් පිරුණාවූ නිවෙස් බවට පත්කර ගනිමු. පුරුෂයෙක් ලෙස, මේ සම්බන්ධයෙන් ප්‍රායෝගික යෝජනා කිහිපයක් ඔබ ඉදිරියේ තැබීමට කැමැත්තෙමි.

(i) ඔබගේ පවුලට දුක සහ වේදනාව ගෙනදෙන්නාවූ, පවුලේ සාමය සහ සමගිය නැතිකරන්නාවූ බීමත්කමින් 100% වලකින්න.

පුරුෂයෙනි, සැන්දෑ යාමයේ බීමත්ව නිවසට පැමිණ, යක්ෂයාට ගොදුරුවී, බිරිඳට සහ දරුවන්ට තලා පෙලා නින්දට ගොස්, පසු දින හඬා දුක්වී ඔබගේ ප්‍රේමය ප්‍රකාශ කරමින්, **නැවත එසේ නොකරන ලෙස පොරොන්දුවී එය කඩකරන චක්‍රයෙන් මිදෙන්න !!** අවශ්‍ය නම් එය උදෙසා ඔබගේ සභා පාලකතුමාගේ හෝ දේව ගැතිතුමාගේ උපකාර ලබා ගන්න.

(ii) පවුලේ ආර්ථිකයට අහිතකර ලෙස බලපාන්නාවූ ' දුම් පානයෙන් ' සහ ' පොඩි බියර් එකක් බීමෙන් ' වළකින්න. එමගින් ඉතිරිවන මුදල් ඔබගේ පවුල උදෙසා සහ සභාවේ වැඩ උදෙසා යොදවන්න.

(iii) ඔබගේ පවුලට අවශ්‍යවන්නාවූ දේ සැපයීමට ප්‍රමුඛ ස්ථානයක් දෙමින්, එය උදෙසා සැම පරිත්‍යාගයක්ම කරන්න.

(iv) ඔබගේ පවුලට අවශ්‍ය රැකවරණය සහ ආරක්ෂාව ලබා දීමට කටයුතු කරන්න.

(v) අනුන් ඉදිරියේ ඔබගේ භාර්යාව ලජ්ජාවට පමුණුවන්නාවූ අන්දමට කිසිවිටක නොහැසිරෙන්න, කථා නොකරන්න.

(vi) සැමවිටම ඔබගේ බිරිඳ සතුටු කිරීමට උත්සාහ කරන්න.

(vii) ඔබගේ බිරිඳ ආසා කරන්නාවූ සුළු සුළු දේවල් කිරීමට කිසිවිටක අමතක නොකරන්න.

(viii) නිතරම ඔබගේ බිරිඳට, ඔබගේ ආදරය පෙන්වන්න, ප්‍රකාශ කරන්න.

(b) **එපීස 5 : 21 :-**

**" ...... එකිනෙකාට යටත්ව සිටපල්ලා. "**

මනුෂ්‍ය ස්වභාවය වන්නේ , තමාගේ වරද නොපිළිගෙන, එම වරද නිවැරදි බව පෙන්වීමට විවිධාකාර හේතු දක්වීමයි නැතහොත් අන් කෙනෙකු දෙසට ඇඟිල්ල දිගු කිරීමයි.

පුරුෂයෙනි, ඔබ අතින් වරදක් සිදුවූ විට, එය පිළිගන්න. එම වැරැද්ද නිවැරදි කරන්න. වැරැද්ද සිදුවුනු තැනැත්තාගෙන් සමාව ඉල්ලා සිටින්න. සමිඳුන්ට තම පාපය කියා දී උන්වහන්සේගෙන් සමාව ලබා ගන්න. මෙය සෑම දේව දරුවෙකුම ගත යුතු ක්‍රියාමාර්ගයයි.

එමනිසා ඔබ අතින් විශේෂයෙන්ම ඔබගේ භාර්යාවට වරදක් වූ විට, ස්වාමීන්වහන්සේට භය ඇතිව, <u>ඇයට යටත් වී ඇයගේ සමාව ඉල්ලා සිටින්න</u>. භාර්යාවෙනි ඔබත් ඒ අයුරින්ම, ඔබගේ ස්වාමිපුරුෂයා සම්බන්ධයෙන් ක්‍රියා කරන්න.

පුරුෂවරුනි, '' නෑ මා ඇයට යටත්වෙන්නේ නෑ '' කියා පවසමින් සමිඳුන්ට යටත් නොවී ක්‍රියා නොකරන්න.

(c) **1 කොරින්ති 11 : 3 :-**

**" ..... ස්ත්‍රියගේ හිස පුරුෂයා බවද ..... "**

පුරුෂයෙනි, ඔබ ස්ත්‍රියගේ හිස බව ප්‍රකාශකරන්නාවූ දෙවියන්වහන්සේ තව දුරටත් ප්‍රකාශ කර ඇත්තේ, ඔබගේ හිස යේසුස්වහන්සේ වන බවය. එබැවින් ඔබගේ හිස වන යේසුස්වහන්සේට කීකරුවන්න.

යේසුස්වහන්සේ සභාවේ හිස ලෙස, සභාව ගොඩනගන ආකාරයට,

- ඔබගේ පවුලට ආත්මික නායකත්වය ලබාදෙන්න.
- ඔබගේ පවුලේ නමස්කාරය මෙහෙයවන්න.
- ක්‍රිස්තුස්වහන්සේ මෙන් ඔබගේ පවුලට ආදර්ශයක් වන්න.

ප්‍රිය දේව දරුවෙනි, අප සැම දෙන, පවුලේ වැදගත්කම තේරුම්ගනිමින්, **එපීස 5 : 21-25** දක්වා සඳහන් ආකාරයට අපගේ පවුල් ගොඩ නගමු.

**එසේ කිරීමට**

**දෙවි සමිඳුන්**

**ඔබට පිහිටවන සේක්වා !!!**

## සටහන

සටහන

# කිතුනු පවුල - 02



එපීස අධ්‍යයනය 18

# කිතුනු පවුල - 02

**එපීස 6 : 1 - 4**

**<u>හැඳින්වීම</u> :-**

තාක්ෂණික දැනුම ඉතා සීග්‍රයෙන් වර්ධනය වන්නාවූ නවීන යුගයේ, දරුවන් වැරදි මාර්ගවල ගමන්කිරීමට යොමුවීමේ උවදුරද දිනෙන් දින වැඩිවෙමින් පවතියි.

එබැවින් ඉතා බාල වයසේදීම දරුවන් විවිධාකාර අන්දම් - වලින් නුසුදුසු මාවත්වල ගමන් කිරීමේ පුවත්, නිතරම අපට අසන්ට ලැබේ.

මෙවැනි යුගයක දෙමව්පියන් තම දරුවන්ව, **' ස්වාමීන් - වහන්සේගේ හික්මවීමෙන්ද අවවාදයෙන්ද ' (එපීස 6 : 4)** වර්ධනය කිරීමේ වැදගත්කම, සෑම පියෙක් සහ මවක් වටහාගැනීම අතිශයින් වැදගත්වේ.

මේ සම්බන්ධයෙන්, කිතුනු දෙමව්පියන් තේරුම් ගතයුතු තවත් වැදගත් කරුණක් වන්නේ, **' අන්තිම දවස්වලදී '** දරුවන් **' මව්පියන්ට අකීකරුවීමට '** පෙළඹෙන බව, බයිබලය සඳහන් කරන බවයි.

**2 තිමෝති 3 : 1 - 3 :-**

" 1 **<u>නුමුත්</u> <u>අන්තිම දවස්වලදී</u> <u>අන්තරා සහිත කාලවල්</u> පැමිණෙන බව දැනගනින්න.**
2 **මක්නිසාද මනුෂ්‍යයෝ ..... <u>මවුපියන්ට අකීකරු වන්නෝව</u>, අභක්තිකයෝව,**
3 **<u>ජන්ම ස්නේහය නැත්තෝව</u> ..... "**

එබැවින් අප වෙසෙන්නේ ' අන්තිම දවස්වල ' බව කවුරුත් පිළිගන්නාවූ මේ සමයෙහි, දෙමව්පියන් තම දරුවන්ව නිසි මාර්ගයේ යොමුකිරීම කිසිවිටක අතපසු නොකළ යුතුවේ. ඒ අයුරින්ම දරුවන් තම දෙමව්පියන්ගේ උපදෙස්, අවවාද සහ මඟපෙන්වීම අනුව ක්‍රියාකිරීම ඉතාමත්ම වැදගත්වේ.

අධ්‍යයනය :-

1. දරුවන්ගේ යුතුකම් - එපීස 6 : 1 - 3

**එපීස 6 : 1 :- " දරුවෙනි, නුඹලාගේ දෙමව්පියන්ට ස්වාමීන් - වහන්සේ තුළ කීකරුවෙයල්ලා. මක්නිසාද එසේ කරන්ට යුතුය. "**

කිහිප වතාවක්ම, මින් පෙර කරනලද අධ්‍යයනයන් මඟින් ඔබට ප්‍රකාශ කරන ලද ආකාරයට, **ක්‍රිස්තුස්වහන්සේ තුළ** යන්න එපීස පොතේ ප්‍රධාන තේමාවයි. ඒ අනුව **එපීස 1 - 3** දක්වා ' ක්‍රිස්තුස්වහන්සේ තුළ ' අපට හිමි ආශිර්වාද අපට පෙන්වාදෙන අතර, **එපීස 4 - 6** දක්වා පෙන්වාදෙන්නේ, ' ක්‍රිස්තුස්වහන්සේ තුළ අපගේ හැසිරීම නොහොත් ඇවිදීම ' කුමන ආකාර විය යුතුද යන්නයි.

එබැවින් **එපීස 6 : 1** අපට පැහැදිලි කරන්නේ, යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළ වෙසෙන්නාවූ, දෙවියන්වහන්සේගේ අනුග්‍රහය නිසා ගැළවීමට ඇතුල්ව සිටින්නාවූ දේව දරුවෙකුගේ හැසිරීමයි. මෙහි අරුත වඩා පැහැදිලිව, ඔබට ඉදිරිපත් කිරීම උදෙසා, ' දරුවන්ගේ යුතුකම් ' **එපීස 6 : 2,3** යන පදවලින්, ඉගැන්වීම ඇරඹීමට අදහස් කරමි.

(i) **පියාටත් මවුටත් ගෞරව කිරීම - එපීස 6 : 2, 3**

**එපීස 6 : 2, 3 :- " [2] නුඹට වැඩ සිද්ධවන පිණිසද නුඹ පොළොවෙහි බොහෝකල් ජීවත්වන පිණිසද, [3] නුඹේ පියාටත් මව්ටත් ගෞරව කරපන්න. එය පොරොන්දුවක් ඇති පළමුවෙනි ආඥාවයි. "**

**එපීස 6 : 2, 3** යන පද උපුටාගෙන ඇත්තාවූ **නික්මයාම 20 : 12** සහ **ද්විතීය කථාව 5 : 16** දෙස බලමු.

**නික්මයාම 20 : 12 :- " තාගේ දෙවිවූ ස්වාමීන්වහන්සේ තට දෙන දේශයෙහි තාගේ දවස් බොහෝවන පිණිස තාගේ පියාටත් මව්ටත් ගෞරව කරව. "**

මෙය දෙවියන්වහන්සේ මෝසෙස් මඟින් තම සෙනඟට දුන්නාවූ දස පනතේ පස්වන ආඥාවයි.

**ද්විතීය කථාව 5 : 16 :-**

**" නුඹේ දෙවිවූ ස්වාමීන්වහන්සේ නුඹට දෙන දේශයෙහි නුඹේ දවස් බොහෝවන පිණිසද නුඹට ශුභසිද්ධ වන පිණිසද, නුඹේ දෙවිවූ ස්වාමීන්වහන්සේ නුඹට අණ කළ ලෙස නුඹේ පියාටද නුඹේ මව්ටද ගෞරව කරව. "**

මෙහි සඳහන්වන්නේ, මෝසෙස් ඉශ්‍රායෙල්වරුන් කැඳවා, දස පනත නැවත විස්තර කිරීමේදී පස්වන ආඥාව විස්තර කළ අයුරුයි.

මෙහි, තම දෙමව්පියන්ට ගෞරව කරන්නාවූ දරුවන්ට ආශිර්වාද දෙකක්, එනම් බොහෝකල් ජීවත්වීම සහ ශුභසිද්ධිය, ලැබෙන බව දේව වචනය ප්‍රකාශ කරයි.

(a) අප ප්‍රථමයෙන් තේරුම්ගත යුතු කරුණක් වන්නේ, මනුෂ්‍යයා (මෝසෙස්ගේ) ව්‍යවස්ථාව යටතේ සිටි කාලයේදීම, තම දෙමව්පියන්ට ගෞරව කරන්නාවූ දරුවන්ට, ආශිර්වාද කිරීමට දෙවියන්වහන්සේ පොරොන්දු වූ බවයි. දේව දරුවෙනි, **දෙමව්පියන්ගේ <u>ජීවිතාන්තය දක්වාම, ඔවුන්ට ගෞරව කරන්න</u>.**

ඔවුන් වයස්ගතවූ විට, ඔවුන්ට බොහෝ දේ අමතක වීමට පටන්ගත්විට, ඔවුන්ගෙන් වැඩි ප්‍රයෝජනයක් ඔබට නැතිවූ විට, ඔවුන් ඔබට ' කරදරයක් ' ලෙස දැනෙන අවස්ථා ඇතිවූ විට, **<u>එම ගෞරවය අඩු නොකරන්න</u> !!**

(b) දෙමව්පියන්ට ගෞරව කරන්නාවූ දරුවන්, විසින් අවම වශයෙන් කළ යුතු සමහර දේවල් ඔබට පෙන්වාදෙමි.

- ඔවුන්ගේ දුක සැප සොයා බැලීම
- ඔවුන්ට අවශ්‍යතාවයක් ඇතිවූ විට එය සැපයීම
- ආදරයෙන් සහ <u>ඉවසීමෙන්</u> ඔවුන්ට කථාකිරීම සහ <u>සවන්දීම</u>
- නිතර ඔවුන් බලන්ට යෑම
- ඔවුන් ආශාකරන්නාවූ දේවල් කිරීම
- ඔවුන් යෑමට කැමති ස්ථානවලට ඔවුන් ගෙනයෑම

**දේව දරුව, මෙවැනි දේ අතපසුකරමින්, දෙවියන්වහන්සේ ඔබට දීමට පොරොන්දුවී ඇත්තාවූ ඉහත සඳහන් ආශිර්වාද අහිමි කර නොගන්න.**

(ii) **දෙමව්පියන්ට ස්වාමීන්වහන්සේ තුළ කීකරුවීම - එපීස 6 : 1**

**මතෙව් 5 : 17 :-**

**" ව්‍යවස්ථාව හෝ අනාගතවාක්‍යය හෝ අවලංගුකරන පිණිස මම ආවෙමියි නොසිතල්ලා. සම්පූර්ණකරන්ට මිස අවලංගු - කරන්ට නාවෙමි. "**

මෙවදන් ප්‍රකාශකළේ යේසුස් ක්‍රිස්තුස්වහන්සේය.

උන්වහන්සේගේ පැමිණීම තුළින්, ව්‍යවස්ථාව සම්පූර්ණ - වූවා මිස අවලංගු වූයේ නැත. එබැවින් **එපීස 6 : 1** මගින්, ' පියාටත් මව්ටත් ගෞරව කරව ' යන ආඥාව සම්පූර්ණ - වනවා නොහොත් එයට එකතු කරනු ලබනවා මිස, එය කිසිසේත් අවලංගු නොවෙයි.

(a) ආරම්භයේදීම දෙවියන්වහන්සේ මනුෂ්‍යයාට ' පවුල ' නමැති ඉමහත් ආශිර්වාදය ප්‍රධානය කළසේක. උන්වහන්සේ මනුෂ්‍යය පවුල තුළ ඇතිකළ අධිකාරිය අනුව, පවුලක ප්‍රධානියා පුරුෂයාවූ අතර දරුවෝ දෙමව්පියන්ගේ අධිකාරිය යටතට පත්ව, තම දෙමව්පියන්ට ගෞරවකිරීමට ආඥා ලැබූහ.

මේ අතර අපගේ ස්වාමීවූ යේසුස්වහන්සේගේ කුරුසි පූජාවෙන් අනතුරුව, උන්වහන්සේව පිළිගත්තාවූ සැම දෙන ක්‍රිස්තුස්වහන්සේ තුළ අලුත් මැවිල්ලක් බවට පත් වෙති.

**2 කොරි. 5 : 17 :-**

**" එබැවින් යමෙක් ක්‍රිස්තුස්වහන්සේ තුළ සිටින්නේ නම් ඔහු අලුත් මැවිල්ලක්ය. පරණ දේ පහව ගියේය ; මෙන්න, සියල්ලම අලුත් වී තිබේ. "**

එබැවින් කිතුනු දෙමව්පියන් සහ දරුවන් අතර ඇති සම්බන්ධකමේ ඉතා වැදගත් සාධකයක් වන්නේ, ඔවුන් එක් එක්කෙනා යේසුස්වහන්සේ සමඟ ඇති සම්බන්ධකමයි.

එම සම්බන්ධකම නිසා, ' අලුත් මැවිල්ලක්ව ' සිටින දරුවන් ' <u>අලුත් මැවිල්ලක්ව ' සිටින තම දෙමව්පියන්ට යටත්වන්නේ සහ කීකරුවන්නේ</u>, එය ක්‍රිස්තුස්වහන්සේට යටත්වීමක් ලෙස සලකමින්, **(එපීස 5 : 21)** <u>ආදරයෙන් සහ සතුටිනි</u>. ප්‍රිය දරුවෙනි, ඔබ සිටින්නේ මෙම ස්ථානයේ නම්, **<u>දෙවියන්වහන්සේ ඔබ ගැන ප්‍රසන්න වන සේක</u>.**

**කොලොස්සි 3 : 20 :- " දරුවෙනි, සියලු කාරණාවලදී මව්පියන්ට කීකරුවෙයල්ලා, <u>මක්නිසාද ඒක ස්වාමීන් - වහන්සේට ප්‍රසන්නය</u>. "**

(b) සමහරවිට දරුවෙක් යේසුස්වහන්සේ තුළට (ගැළවීමට) පැමිණ අලුත් මැවිල්ලක් වී ඇති නමුත්, ඔහුගේ පියා හෝ මව හෝ ඔවුන් දෙදෙනාම එසේ නොවිය හැක.

මෙවැනි අවස්ථාවලදී,

(A) දරුවා සැමවිටම දෙමව්පියන්ට ගෞරව කළ යුතුවේ.

(B) මෙනමුත් දෙවියන්වහන්සේට අකීකරුවීමට තම දෙමව්පියන් ඔහුට නියෝග කළහොත්, ඔහු කළ යුත්තේ දෙවියන්වහන්සේට කීකරුවීමය.

දරුවෙනි, ඔබ මෙවැනි තත්ත්වයක සිටිනවා නම් ඉතාමත්ම සන්සුන්වද, ඉවසිලිවන්තවද, යටහත්වද, ආදරයෙන්ද, දෙමව්පියන්ගේ සිත් රිදීම අවම වන අන්දමට ක්‍රියා කළ යුතු බව සිතේ තබාගන්න. ඔබගේ දෙමව්පියන්ට ගෞරව කරන්න. ඔවුන්ගේ ගැළවීම උදෙසා යාච්ඤා කරන්න.

(iii) **දෙමව්පියන්ට කීකරුවීමට හේතු**

(a) **' මක්නිසාද එසේ කරන්ට යුතුය ' (එපීස 6 : 1)**

යම්කිසි දෙයක් යහපත්ද නැත්නම් අයහපත්ද කියා තීරණය කිරීම උදෙසා, සාමාන්‍යයෙන් කිතුනු අප පුරුදුව සිටින්නේ, දේව වචනය දෙස බැලීමටය. මෙසේ මඟ - පෙන්වීම සොයන අපට, ඒ දෙයට අදාල වන්නාවූ දේව නියෝගයක්, කිතුනු ප්‍රතිපත්තියක්, බයිබලයේ ඇති ආදර්ශයක් හෝ ශුද්ධාත්මයාණන්වහන්සේගේ මඟ - පෙන්වීමක් වැනි දේවල් සොයා ගැනීම අපහසු නොවේ.

මෙනමුත් දෙමව්පියන්ට කීකරුවීම යහපත් දෙයක් බව පෙන්වාදීමට **එපීස 6 : 1** හි සඳහන්වන්නාවූ හේතුව වන්නේ, ' එසේ කරන්ට යුතුය ' යන වචනයි. එබැවින් ' එසේ කරන්ට යුතුය ' යන වචන තුළ ගැබ්වී ඇත්තාවූ සත්‍යය අප අවබෝධ කරගැනීම වැදගත්වේ.

දෙවියන්වහන්සේ ආදම් සහ ඒව මවා, ඒදන් උයනේදී නිසැකවම බොහෝ දේ ඔවුන්ට කියාදෙන්ට ඇති අතර, උන්වහන්සේ මනුෂ්‍යයාට ව්‍යවස්ථාව ලබාදුන්නේ, මෝසෙස් තුළින්ය. මේ අතර දේව වචනය අපට පෙන්වා - දෙන්නේ, දෙවියන්වහන්සේ විසින් මැවිල්ලේදීම මනුෂ්‍යයාගේ සිත්වල ව්‍යවස්ථාවේ ක්‍රියා ලියන ලද බවයි.

**රෝම 2 : 16 :-**

**" ඔවුන්ගේ හෘදසාක්ෂිය සාක්ෂිදීමෙන්ද, ඔවුන්ගේ සිතුවිලි ඔවුනොවුන්ට දෝෂාරෝපණය කිරීමෙන් හෝ නිර්දෝෂ - කිරීමෙන්ද, <u>ව්‍යවස්ථාවේ ක්‍රියාව ඔවුන්ගේ සිත්වල ලියන ලදැයි ඔවුන් දක්වති</u>. "**

**රෝම 2 : 16** හි සඳහන් මෙම වචන ලියා ඇත්තේ ව්‍යවස්ථාව නොදත් ' අන්‍යජාතීන් ' ගැනයි **(රෝම 2 : 15).** මේ අනුව ඉතා පැහැදිලිව පෙනීයන්නේ, දෙවියන්වහන්සේ ව්‍යවස්ථාව නොදන්නාවූ අන්‍යජාතීන් ඇතුලු සෑම මනුෂ්‍යයෙකුගේම සිතේ නොහොත් හදවතේ ලියා ඇත්තාවූ **' ස්වභාවික නීති '** නිසා, ස්වභාවයෙන්ම ව්‍යවස්ථාවේ දේවල් ඔවුන් කරන බවයි.

**රෝම 2 : 15 :-**

**" මක්නිසාද ව්‍යවස්ථාව නැත්තාවූ අන්‍යජාතීන් ස්වභාවයෙන්ම ව්‍යවස්ථාවේ දේවල් කරන කල, ඔව්හු ව්‍යවස්ථාව නැතුව තමුන්ටම ව්‍යවස්ථාවක්ව සිටිති. "**

දේව දරුව, මොහොතක් මෙය සිතා බලන්න.

- දෙවියන්වහන්සේ සෑම මනුෂ්‍යයෙකුගේම හදවතේ ' ස්වාභාවික නීති ' දමා ඇති අතර, ' දෙමව්පියන්ට කීකරුවීම ' එවැනි ස්වභාවික නීති ගණයට අයිතිවේ.

- දෙවියන්වහන්සේ මෙය මනුෂ්‍යයා තුළ දමා ඇත්තාවූ ස්වභාවික නීතියක් බව පෙන්නුම් කරන්නාවූ සාධකයක් වන්නේ, සෑම ආගමකම සෑම සංස්කෘතියකම, සෑම සදාචාරයකම පාහේ මෙවැනි ඉගැන්වීම් තිබීමත්, මනුෂ්‍යයන්ගෙන් අති බහුතරයක් එය ක්‍රියාවට නැංවීමත්ය.

- මෙනමුත් දෙවියන්වහන්සේ දැනගැනීම ප්‍රතික්ෂේප කරන්නාවූ, නොහොත් උන්වහන්සේ මනුෂ්‍ය හදවතේ ලියා ඇති ස්වභාවික නීති නොසලකන්නාවූ මනුෂ්‍යයෝ සිටිති. මෙවැනි මනුෂ්‍යයන්ව දෙවියන්වහන්සේ ජඩ සිතකට පාවා දෙන බව **රෝම 1 : 28** පෙන්වාදෙයි.

**රෝම 1 : 28 :- '' තවද ඔවුන් දෙවියන්වහන්සේ දැනගන්ට අකමැතිව සිටි බැවින්, නුසුදුසු දේ කරන පිණිස දෙවියන් - වහන්සේ ඔවුන් ජඩ සිතකට පාවාදුන් සේක. ''**

මෙසේ පාවාදුන් අය ' **මව්පියන්ට අකීකරුවෝව** ' ' **ප්‍රේම ස්නේහය නැත්තෝව** ' ක්‍රියා කරන බව **රෝම 1 : 30, 31** තව දුරටත් පෙන්වාදෙයි.

**දේව දරුව, ඔබගේ හදවත තුළ දෙවියන්වහන්සේ දමා ඇත්තාවූ මෙම ' ස්වභාවික නීතිය ' කඩ නොකිරීමට වග බලා ගන්න.**

**<u>සැලකිය යුතුයි</u>**

මාගේ ප්‍රේමවන්ත සහෝදරයා, සහෝදරී, මා ප්‍රකාශ කරන දේ මෙනෙහි කර, ඔබම නිගමනයකට පැමිණෙන්න.

' **ස්වභාවික නීති** 'පමණක් හදවත් තුළ ඇත්තාවූ මනුෂ්‍යයන් මේ අයුරින් ' ස්වාමීන්වහන්සේ පාවා දෙන සේක් නම් ' ස්වභාවික නීතිද, ව්‍යවස්ථාවද, අපගේ ස්වාමීවූ යේසුස් - වහන්සේගේ අනුග්‍රහයද දන්නාවූ, කිතුනු නම දරන්නාවූ අප, උන්වහන්සේට කීකරුනොවීම උන්වහන්සේ කෙසේ සලකන සේක්ද ??

**රෝම 2 : 14 :- '' මක්නිසාද <u>ව්‍යවස්ථාව අසන්නන්</u> දෙවියන් - වහන්සේ ඉදිරියෙහි <u>ධර්මිෂ්ඨව සිටිනවා නොව</u>, ව්‍යවස්ථාව පවත්වන්නෝ ධර්මිෂ්ඨකොට ගණන් ගනු ලබන්නෝය. ''**

**ලූක් 12 : 47, 48 :-**

" [47] **තමාගේ <u>ස්වාමියාගේ කැමැත්ත දැනගනත් සූදානම් නොකළාවූ දාසයා බොහෝ පහර ලබන්නේය</u>.**

[48] **නුමුත් නොදැන, පහර ලැබීමට සුදුසු දේ කළාවූ අය පහර ස්වල්පයක් ලබන්නේය. යමෙකුට බොහෝ දේ දෙන ලද්දේද, ඔහුගෙන් බොහෝ දේ අයකරනු ලබන්නේය, ........ "**

අපගේ දෙවි ස්වාමීන්වහන්සේ අති සාධාරණ දෙවියන් - වහන්සේය. උන්වහන්සේ කිසි මනුෂ්‍යයෙකු අසාධාරණ ලෙස විනිශ්චය නොකරන දෙවියන්වහන්සේය.

**එබැවින් ' ස්වභාවික නීති ' පමණක් හදවත්වල ඇත්තාවූ ඕනෑම මනුෂ්‍යයෙක්, එම නීති පවත්වමින් තම දෙමව්පියන්ට ගෞරවකරන අතර දෙවියන්වහන්සේ ඔහුට ආශීර්වාද කරන සේක.**

දේව දරුව, ඔබ අවට වෙසෙන, වෙනත් ආගම්වල බැතිමතුන්ගේ ජීවිත මොහොතක් නිරීක්ෂණය කර බලන්න. **කුමන ආගමකට අයිති වුවද, තම දෙමව්පියන්ට ගෞරව කරන්නාවූ දරුවන්ගේ ජීවිත** (ඔවුන් නොයෙක් දරුණු පාපයන්හි නොයෙදෙනවා නම්) **වාසනාවන්ත වන බව ඔබට පෙනෙනවා ඇත.**

(b) **" එය පෙරොන්දුවක් ඇති පළමුවෙනි ආඥාව නිසා " - (එපීස 6 : 3)**

**නික්මයාම 20 : 1 - 17** දක්වා, සඳහන්වන්නේ දෙවියන් - වහන්සේ මනුෂ්‍යයාට දුන්නාවූ දස පනතයි. මෙම ආඥා දසයෙන් මුලින් සඳහන් ආඥා හතර මනුෂ්‍යයා දෙවියන් - වහන්සේ පිළිබඳව ක්‍රියා කළයුතු අන්දම ගැනද, අවසාන පහ මනුෂ්‍යයා සෙසු මනුෂ්‍යයන් සමඟ ක්‍රියා කළ යුතු ආකාරය ගැනද වේ. මෙම කොටස් දෙකට මැදිවී තිබෙන්නාවූ පස්වන ආඥාව මනුෂ්‍යයාගේ පවුල පිළිබඳවයි.

දේව දරුව,' පවුල ' දෙවියන්වහන්සේ මනුෂ්‍යයාට ප්‍රධානය කළ ඇති උතුම් ත්‍යාගයක් වන අතර, 'සැබෑ කිතුනු පවුලක් ' නිසැකවම මනුෂ්‍යයන් ඉදිරියේ බබලනවා ඇත.

දෙවියන්වහන්සේට කීකරුවන්නාවූද, දෙමව්පියන්ට ගෞරව කරන්නාවූද, තම අසල්වැසියන් සමග යහතින් වෙසෙන්නාවූද, කිතුනු පවුල්, නිසැකවම දෙවියන් - වහන්සේගේ නාමයට ගෞරවය ගෙනදෙනවා ඇත. ආලෝක මෙන් බබළනවා ඇත.

**මතෙව් 5 : 16 :- " මනුෂ්‍යයන් විසින් නුඹලාගේ යහපත් ක්‍රියා දැක ස්වර්ගයෙහි සිටින නුඹලාගේ පියාණන්වහන්සේට ගෞරව කරන පිණිස, නුඹලාගේ ආලෝකය ඔවුන් ඉදිරියේ බබළාවා. "**

- මෙවැනි පවුලක් වීමට අප උත්සාහ කරමු.
- එවිට දෙවියන්වහන්සේ නිසැකවම, ඔබටද ඔබගේ පවුලටද ආශීර්වාද කරනවා ඇත.
- ඔබගේ පවුල දකින අන් අයද, දෙවියන්වහන්සේ වෙත ඇදී එනවා ඇත.

**2. <u>පියවරුන්ගේ යුතුකම් - එපීස 6 : 4</u>**

**එපීස 6 : 4 :- " පියවරුණි, නුඹලාගේ දරුවන්ට කෝප නූපදවා, ස්වාමීන්වහන්සේගේ හික්මවීමෙන්ද අවවාදයෙන්ද ඔවුන් ඇතිකරපල්ලා. "**

මෙම පදයේ සඳහන්වන්නේ ' පියවරුනි ' කියා නමුත්, එහි සඳහන් උපදෙස් පියවරුන්ට සේම මව්වරුන්ටද අදාල වේ. මෙම පදයේ ' **කෝප නූපදවා** ' යන්න තව දුරට පැහැදිලි කරගැනීම උදෙසා **කොලොස්සි 3 : 21** දෙසද බලමු.

**කොලොස්සි 3 : 21 :- " පියවරුනි, නුඹලාගේ දරුවන් කලනොකිරෙන පිණිස ඔවුන් කෝප නොකරල්ලා. "**

**එපීස 6 : 4** හි සහ **කොලොස්සි 3 : 21** හි සඳහන්වූ ' කෝප ' යන වචනය ඉංග්‍රීසි බයිබල්වල PROVOKE, EXASPERATE, EMBITTER, DISCOURAGE වැනි වචන ලෙස ලියැවී තිබේ. ඒ අනුව, දෙමව්පියන්ගෙන් පාවුල්තුමා ඉල්ලා සිටින්නේ, තම දරුවන් අධෛර්‍යයට පත්කරන්නාවූ, ඔවුන් තුළ කලකිරීම ඇතිකරන්නාවූ, සමහර දේ ඔවුන්ට එපාකරවන්නාවූ සහ ඔවුන් කුපිත කරන්නාවූ දේවලින් වලකින ලෙසය.

(a) **දෙමව්පියන් දරුවන්ව ' කෝපයට ' පත්කරන අයුරු**

දෙමව්පියෙනි, පියෙක් සහ වැඩිහිටියෙක් ලෙස, යාච්ඤාවෙන් මා සඳහන් කරන්නාවූ කරුණු ඉදිරියේ, ඔබගේ ජීවිත විමසා බලන ලෙස යටහත්ව ඉල්ලා සිටිමි.

(i) දරුවාගේ හැකියාවන්ට නොගැළපෙන, දරුවාගේ දීමනා සහ අභිලාශයන් නොසලකන, දෙමව්පියන් තුළ ඇත්තාවූ බලාපොරොත්තු පෙරදැරිකරගනිමින්, දරුවාගේ අධ්‍යාපනය මෙහෙයවීම.

වසර 40 කට අධික කාලයක් තුළ, මෙවැනි තත්ත්වයන්ට මුහුණ දීමට සිදුවූ දරුවන් රාශියකගේ දුක සහ වේදනාව හඳුනන කෙනෙකු සේ, පියවරුනි, මා ඔබගෙන් ඉල්ලා සිටින්නේ, ඔබගේ දරුවන් ගැන (විශේෂයෙන්ම ඔවුන්ගේ අධ්‍යාපනය පිළිබඳව) දෙවියන්වහන්සේගේ මඟපෙන්වීම සොයමින් ඒ අනුව ක්‍රියාකරන ලෙසයි.

(ii) දරුවන් නුසුදුසු ලෙස විවේචනය කිරීම, ඔවුන්ගේ අඩුපාඩු සහ වැරදි නිතරම සෙවීම, ඔවුන්ගේ හොඳ අගය නොකිරීම සහ අනුන් ඉදිරියේ ඔවුන්ට බැනවැදීම මඟින් ලජ්ජාවට පත්කිරීම.

(iii) තමාගේ සෑම දරුවෙක්ම එක ලෙස නොසැලකීම, දරුවන්ට දෙන පොරොන්දු කඩකිරීම, දෙබිඩි පිළිවෙත් අනුගමනය කිරීම.

(iv) යුතු දේ කිරීම අතපසු කිරීම යනාදිය.

සෑම දෙමව්පියන්ම, තම දරුවන්ට අතිශයින් ප්‍රේමකරන බව අප දනිමු. එම ප්‍රේමය නිසාම ඔවුන්ගේ අනාගතය සාර්ථක කිරීම උදෙසා දෙමව්පියන් කරන්නාවූ සමහර දේ දරුවන්ට බාධාවක් විය හැක. එබැවින්, මාගේ දරුවන් ළදරු කාලයේදීම සමිඳුන් මට ඉගැන්වූ දෙයක් ඔබ ඉදිරියේ තබමි.

උන්වහන්සේ මට එක අවස්ථාවක ඉතා පැහැදිලිව පෙන්වාදුන්නේ, මා මගේ දරුවන්ට අතිශයින් ප්‍රේම කරන අතර, **උන්වහන්සේ ඔවුන්ටද, මටද ඊටත් වඩා ප්‍රේම කරන බවයි. ඔවුන් යහපත්, ආශීර්වාදලත්, වාසනාවන්ත ජීවිත ගතකිරීම උන්වහන්සේගේ කැමැත්ත සහ සැලැස්ම බවයි.**

එබැවින් මාගේ දරුවන්ව මා සැමවිටම යොමුකරන්නේ, දෙවියන්වහන්සේගේ කැමැත්ත ඉටු කිරීම වෙතයි. එමගින් දෙවියන්වහන්සේ මගේ පවුලට දී ඇත්තාවූ ආශීර්වාද කියා නිම කළ නොහැකි බව මා යටහත්ව පවසන්නේ, ඊටත් වැඩියෙන් ඔබට දේව ආශීර්වාද ලැබේවා !! කියා පතමිනි.

**(b) දෙමව්පියන් දරුවන් ඇතිදැඩි කළයුතු අයුරු - එපීස 6 : 4**

**එපීස 6 : 4 :- " පියවරුණි, ...... ස්වාමීන්වහන්සේගේ හික්මවීමෙන්ද අවවාදයෙන්ද ඔවුන් ඇතිකරපල්ලා. "**

(A) **<u>ස්වාමීන්වහන්සේගේ හික්මවීමෙන් දරුවන් ගොඩනගන්න</u>**

ප්‍රේමණීය සහෝදරයා, සහෝදරී, කිසිසේත් මෙය අමතක නොකරන්න. ' පවුලේ ' නිර්මාණ කතෘ වනුයේ දෙවියන් - වහන්සේය. එම නිසා අප අපගේ පවුල් ගොඩනැගිය යුත්තේ, අපගේ හික්මවීමෙන් (TRAINING) නොව සමිඳුන්ගේ හික්මවීමෙන්ය.

**ද්විතීය කථාව 6 : 6, 7 :- " [6] මා විසින් අද නුඹට අණකරන මේ වචන නුඹේ සිතේ තිබේවා. [7] ඒවා නුඹේ දරුවන්ට හොඳාකාරයෙන් උගන්වා, ........ ඒවා ගැන කථාකරපන්න. "**

දෙවියන්වහන්සේ ඉශ්‍රායෙල් ජාතියේ පියවරුන්ට කියා සිටින්නේ, උන්වහන්සේගේ වචනය හොඳහැටි ඉගෙන - ගෙන, එය ඔවුන්ගේ දරුවන්ට උගන්වා, නිතර ඒ වචන ගැන කථාකරන්ට කියාය. මාගේ සහෝදර පියවරුනි, අප <u>දේව වචනය ඉගෙන ගනිමු</u>, <u>එයට කීකරු වෙමු</u>, එය අපගේ <u>දරුවන්ට උගන්වමු</u>.

ඔබ මෙසේ කරනවා නම්, ඔබගේ දරුවන් කිසිදු නොමග යන්නේ නැත. ඔවුන් නිසැකවම ඉමහත් සතුට ඔබට සහ ඔබගේ පවුලට ගෙනදෙනවා ඇත.

පියවරුනි, හික්මවීමට දඬුවම් කිරීමද අයිති වන බව අමතක නොකරන්න. මෙය පෙන්වන්නාවූ පහත සඳහන් පද කරුණාකර කියවන්න.

**හිතෝපදේශ 13:24, 19:18, 23:13,14, 29:15, හෙබ්‍රෙව් 12 : 5-11**

(B) **ස්වාමීන්වහන්සේගේ <u>අවවාදයෙන්</u> දරුවන් ගොඩනගන්න**

**2 තිමෝති 3 : 16, 17 :-**

**" දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයා සම්පූර්ණව, සියලු <u>යහපත් ක්‍රියාවලට සූදානම්ව සිටින පිණිස</u> දේවානුභාවයෙන් දුන් මුළු ලියවිල්ල, <u>ඉගැන්වීමටත්</u> <u>තරවටුවටත්</u> <u>හික්මවීමටත්</u> ධර්මිෂ්ඨකම ගැන <u>ගුරුකම් දීමටත්</u> ප්‍රයෝජනවත්ව තිබේ. "**

ඔබගේ දරුවන්ට නිවැරදි දේ ඉගැන්වීම උදෙසා, අවවාද කිරීම උදෙසා සහ තරවටු කිරීම උදෙසා යනාදියට සැමවිටම ස්වාමීන්වහන්සේගේ වචනය භාවිතා කරන්න.

සමහර පියවරු දරුවන්ට දඬුවම් කිරීමට, සහ තරවටු කිරීමට අපොහොසත්වීම හේතුකොටගෙන, දරුවන් සහ මුලු පවුලද, ප්‍රපාතයකට වැටෙන්ට පුළුවන.

**1 සාමුවෙල් 3 : 13** කියවා බලන්න.

ඒලී පූජකයා, තම පුත්‍රයන්ගේ වැරදි දැනගෙන, ඔවුන් නොවැලැක්වූ නිසා, ඔහුද ඔහුගේ පුත්‍රයන් දෙදෙනාද දෙවියන්වහන්සේගේ දඬුවමට ලක්විය.

**1 සාමුවෙල් 4 : 17, 18** පෙන්වාදෙන්නේ ඔවුන් තිදෙනාම එකම දිනයේ මරණයට පත්වූ බවය.

පියවරුනි, ස්වාමීන්වහන්සේගේ හික්මවීමෙන්ද, අවවාද - යෙන්ද, ඔබගේ ජීවිතයේ ආදර්ශයෙන්ද, ඔබගේ දරුවන් ගොඩනගන්න. ඔබ එසේ කරන අතර, නිසැකවම ඔබගේ දරුවන්ද, ඔබට ගෞරවකරමින්ද ඔබට කීකරුවෙමින්ද, දෙවියන්වහන්සේගේ ආශීර්වාදවලට ඇතුල්වනු ඇත.

**එසේ කිරීමට**

**දෙවි පියාණන්වහන්සේ**

**ඔබට උපකාරකරන සේක්වා !!**

## සටහන

## සටහන

# දාසයන් සහ ස්වාමිවරුන්



# එපීස අධ්‍යයනය 19

## දාසයන් සහ ස්වාමිවරුන්

**එපීස 6 : 5 - 9**

**<u>හැඳින්වීම</u> :-**

රෝම අධිරාජ්‍යය තුළ වහලුන් මිලියන හැටක් පමණ සිටි බව එස්තමේන්තු කර ඇති අතර, රෝමය, කොරින්තිය සහ එපීසිය වැනි විශාල නගරවල ජනගහනයෙන් තුනෙන් එකක් පමණ සමන්විත වූයේ වහලුන්ගෙනි.

පාවුල්තුමා විසින් **' පිලමොන් '** නමැති ලිපිය ලියන ලද්දේ කොලොස්සි සභාවට අයිතිවූ, ඔනේසිමස් නමැති වහලාගේ ස්වාමියාවූ පිලමොන් වෙතය. කොලොස්සි සභාවේ මෙන්ම එපීස සභාවේද පිලමොන් වැනි ස්වාමිවරුන් සිටි අතර, සභාවේ වහලුන් සහ නිදහස් කරනු ලැබූ වහලුන්ද බොහෝදෙනෙක් සිටියහ.

පාවුල්තුමා විසින් **එපීස 6 : 5 - 9** දක්වා අමතනු ලබන්නේ මූලික වශයෙන්ම එකල විසුවාවූද, දේව දරුකමට ඇතුල්ව සිටියාවූද දාසයන් සහ ස්වාමිවරුන් වන අතර, ඔහු උගන්වන්නාවූදේ වර්තමානයේ රැකියාවල නියැලෙන්නාවූ සැමට අදාල වේ. ඔබ කරන්නාවූ රැකියාව කුමන ආකාර රැකියාවක් වුවත් මෙහි සඳහන් ඉගැන්වීම් ඔබේ ජීවිතයට අතිශයින් වැදගත්වනවා ඇත.

දේව දරුව, දාසයෙක්, ස්වාමියෙක්, ව්‍යාපාරිකයෙක් හෝ ස්වයං රැකියාවක නිරතව සිටින්නෙක් යනාදි අය වශයෙන් මෙහි සඳහන් සමහර ඉගැන්වීම් වලට පටහැනිව ක්‍රියාකරමින් සිටිනවා විය හැක. මෙනමුත් දෙවි සමිඳුන් ඔබට උන්වහන්සේගේ වචනයෙන් කථාකරන අතර, උන්වහන්සේට කීකරුවෙමින්, මෙම ඉගැන්වීම ඔබගේ ජීවිතයට අදාල කරගන්න.

**<u>අධ්‍යයනය</u> :-**

1. **<u>දාසයින්ගේ යුතුකම් - එපීස 6 : 5 - 8</u>**

**එපීස 6 : 5 :-**

**" දාසයෙනි, ක්‍රිස්තුස්වහන්සේට මෙන් මාංසාකාරයෙන් නුඹලා - ගේ ස්වාමිවරුන්ව සිටින්නන්ට භයෙනුත් වෙවුලුමෙනුත් නුඹලාගේ සිත්වල ඒකාන්තකමින් කීකරුවෙයල්ලා. "**

පාවුල්තුමා දාසයින් අමතමින් ' **<u>මාංසාකාරයෙන් නුඹලාගේ ස්වාමිවරුන්ව සිටින්නන්</u>** ' ලෙස සඳහන් කරන්නේ, ලෝකයේ සිටින ඔවුන්ගේ ස්වාමිවරුන් ගැනයි. මෙලෙස සඳහන් කිරීම තුළින්, ආරම්භයේදීම ඔහු දාසයන්ට පෙන්වාදෙන්නේ, ලෝකයේ සිටින ස්වාමිවරුන්ට වඩා උතුම්වූ ක්‍රිස්තුස්වහන්සේ නමැති ස්වාමියෙක් ඔවුන්ට සිටින බවයි.

(i) **තම ස්වාමියාට ගෞරව කිරීම**

**එපීස 6 : 5** වැනි පදයේ **<u>භයෙනුත් වෙවුලමිනුත්</u>** ලෙස සඳහන්වන්නාවූ වචන, ඉංග්‍රීසි බසින් සඳහන් කර ඇත්තේ, RESPECT and FEAR (NIV) යනුවෙනි. මේ වචනවලින් අදහස් කරුනු ලබන්නේ, දාසයා තම ස්වාමියාගේ තත්ත්වයට, තනතුරට, සහ අධිකාරියට ගෞරව කළ යුතු බවයි.

(a) **කිතුනු සේවකයෙක් කිතුනු නොවන ස්වාමියෙක් යටතේ සේවය කිරීම**

**එපීස 6 : 5** වැනි පදයේ, පාවුල්තුමා අමතන්නේ කිතුනු දාසයන් වන අතර, ඔවුන්ගේ ස්වාමියා කිතුනු නොවන්නාවූ කෙනෙක් යයි සිතමු. අද, රැකියාවන්හි නියැලෙන කිතුනුවන්ගෙන් අති බහුතරයකගේ තත්ත්වය වන්නේ මෙයයි. මේ අතරම, අද සමාජයේ ඇත්තාවූ විවිධාකාර හේතූන් නිසා, ඔබගේ 'ස්වාමියා' ඔබ තරම් දක්ෂ නොවන්නාවූද ඔබ තරම් කාර්යක්‍ෂම නොවන්නාවූද කෙනෙක් විය හැක. මෙනමුත් දේව දරුවන් වන්නාවූ අප සැමවිටම ඔවුන්ගේ තනතුරට සහ අධිකාරියට ගෞරව කරමින් සේවය කළ යුතුවේ.

**1 තිමෝති 6 : 1 :-**

'' **වියගහට යටත්වූ යම් පමණ දාසයෝ ඇද්ද, දෙවියන් - වහන්සේගේ නාමයටත් ඉගැන්වීමටත් අපහාස නොපැමි - ණෙන පිණිස ඔව්හු <u>තමුන්ගේ ස්වාමිවරු</u> සියලු ආකාර <u>ගෞරව ලබන්ට වටින්නෝයයි සිතත්වා</u>.** ''

**1 තිමෝති 6 : 1** වන පදය, තව දුරටත් අපට පෙන්වා - දෙන්නේ, අප මෙසේ නොකරනවිට **අපහාස** සහ අගෞරවය **පැමිණෙන්නේ, දෙවියන්වහන්සේගේ නාමයට සහ දේව වචනයේ ඉගැන්වීමට බවය.**

දේව දරුව, මෙය තේරුම් ගන්න. දෙවියන්වහන්සේ අපව කැඳවා ඇත්තේ, **''අපගේ යහපත් ක්‍රියා මගින්, දෙවියන් - වහන්සේගේ නාමයට ගෞරව ගෙන ඒමටය'' (මතෙව් 5:16)**. මේ අතර යක්ෂයා සැමවිටම බලාසිටින්නේ, පාපිෂ්ඨ ක්‍රියාවලට අපව අසුකරගනිමින්, දෙවියන්වහන්සේගේ නාමය අපකීර්තියට පැමිණවීමටය. යක්ෂයාගේ උගුල්වලට අසුවී, අප අපගේ සේවා ස්ථානවල 'ස්වාමිවරුන්ට ගෞරව නොකරන' අතර, අප ඉතා පහසුවෙන්ම නොයෙක් ප්‍රශ්නවලට අසුවිය හැක. අපට විරුද්ධව විනය ක්‍රියාමාර්ග ඇතිවෙන්නාවූ අවස්ථා පවා හටගත හැක. **මෙයින් අවනම්බු සහ අපහාස පැමිණෙන්නේ ඔබ වෙත පමණක් නොව, ඔබ උදෙසා ජීවිතය පිදුවාවූ සමිඳුන් වෙත බවද කිසිසේත් අමතක නොකරන්න.**

(b) **කිතුනු සේවකයෙක් කිතුනු ස්වාමියෙක් යටතේ සේවය කිරීම**

**1 තිමෝති 6 : 2 :-**

'' **ඇදහිලිවන්ත ස්වාමිවරුන් ඇත්තෝ වනාහි, <u>ස්වාමිවරු සහෝදරයන් නිසා ඔවුන් සුළු නොකර</u>, ප්‍රයෝජන ලබන්නෝ ඇදහිලිවන්තයන්ද ප්‍රේමවන්තයන්ද බැවින්, <u>වඩා සතුටින් ඔවුන්ට වැඩ කරත්වා</u> ......** ''

මෙහි සඳහන් අනුශාසනා අතිශයින් වැදගත් වන්නේ, කිතුනු ආයතනවල සහ කිතුනු සභා කාර්‍යාලවල වැනි ස්ථානවල වැඩ කරන්නාවූ දේව දරුවන්ටය. මෙවැනි ස්ථානවල ඉතා පහසුවෙන් සිදුවිය හැකි දෙයක් වන්නේ, සේවකයා සහ ස්වාමියා ' **සහෝදරයන්** ' වීම, එම ස්ථානයේ විනයට බාධාවක් වීමයි.

එබැවින් මෙවැනි රැකියාවල්වල යෙදී සිටින්නාවූ කිතුනුවන් ප්‍රමාද නොවී සේවයට පැමිණීම, තම වගකීම් උපරිම අන්දමින් ඉටුකිරීම වැනි සාමාන්‍ය දේවලදී පවා ඉතාමත්ම විනය ගරුකව කටයුතු කිරීම, ඉතා වැදගත් වේ.

දේව දරුව, ඔබ සේවය කරන්නේ මෙවැනි ස්ථානයක නම්, ඔබට දෙවියන්වහන්සේ ලබාදී ඇති මෙම ආශිර්වාදය ගැන උන්වහන්සේට තුති පුදමින්, ඔබගේ ස්වාමියාට ගෞරව කරමින්, සතුටින්ද, අවංකවද, ඔබගේ උපරිම ප්‍රමාණයට සේවය කරන්න.

(c) **සේවකයන් සහ ස්වාමිවරුන් තම ස්ථානවල සේවය කරන්නේ, දෙවියන්වහන්සේ එසේ වීමට ඉඩහැරිය නිසා බව තේරුම්ගෙන සේවය කිරීම**

අපගේ දෙවි ස්වාමීන්වහන්සේ සර්වබලධාරී වනසේක. එබැවින් උන්වහන්සේ වෙන්ට ඉඩහරින දේ මිස, අන් කිසිවක් මෙලොව සිදුවන්නේ නැත. දේව දරුවෙනි, ඔබ සේවය කරන්නාවූ ස්ථානයේ දාසයන් හෝ ස්වාමිවරුන් ලෙස සේවය කිරීමට එක් එක්කෙනාට ඉඩහැර තිබෙන්නේ දෙවියන්වහන්සේ වන අතර, <u>**සෑම දේව දරුවෙකුටම**</u> **තම සේවාස්ථානයේ ' <u>රාජකාරියක්</u> ' සේම ' <u>දේවකාරියක්</u> ' ද ඇති <u>බව අමතක නොකරන්න</u>.**

දිනපතාම මෙය ගැන යාච්ඤා කරමින්, ඔබ සේවය කරන ස්ථානයේ, දෙවියන්වහන්සේ ඔබගෙන් බලාපොරොත්තු වන්නාවූ **දේවකාරිය නොහොත් ආත්මික සේවය, ඔබගේ ස්වාමියාට ගෞරව කරමින්, විශ්වාසවන්තව ඉටුකරන්න.**

(ii) <u>**තම ස්වාමියාට අවංක හදවතකින් කීකරුවීම**</u>

**එපීස 6 : 5 :- '' දාසයෙනි ..... <u>සිත්වල ඒකාන්තකමින් කීකරුවෙයල්ලා</u> ; ''**

මෙහි ' **සිත්වල ඒකාන්තකමින්** ' ලෙස සඳහන් වචන ඉංග්‍රීසි බසින් සඳහන් වන්නේ, Sincerity of heart (NIV) යනුවෙනි. මෙයින් අදහස්වන්නේ අවංක හදවතකින් යුක්තව, වෙනත් අරමුණු නොමැතිව, එක සිතින් අප අපගේ ස්වාමිවරුන්ට කීකරු විය යුතු බවයි.

(iii) **ඔබට නියමවූ මුළු කාලය තුළ විශ්වාසවන්තව සේවය කිරීම**

**එපීස 6 : 6 :- " මනුෂ්‍යයන් සතුටු කරන්නන් මෙන් <u>පෙනීමට වැඩ නොකොට</u>, ...... "**

පාවුල්තුමා මෙහිදී කියා සිටින්නේ, ඔබගේ ස්වාමියා ළඟ සිටින විට පමණක් ඔහුට පෙනෙන පිණිස ඉතා කඩිසරව සේවය කරන්නාවූ වංචාකාර කෙනෙක් නොවෙන්ට කියාය. ඔබ මෙසේ ක්‍රියාකරන්නේ නම් ඔබ බොරු - කාරයෙක්, කම්මැලියෙක්, කපටියෙක් හෝ විශ්වාස කළ නොහැකි සේවකයෙක් ලෙස විස්තර කිරීම නිවැරදි වේ.

**<u>නිදසුනක් වශයෙන්</u>**

**මතෙව් 25 : 14 - 30 :- තලෙන්ත උපමාව**

මෙම උපමා කථාවේ සඳහන් දාසයන්ගෙන් දෙදෙනෙක්, තම ස්වාමියා නොමැති කාලය තුළ, විශ්වාසවන්තව සේවයේ යෙදුන අතර, ඔවුන්ගේ ස්වාමියා එම සේවය බොහෝසේ අගය කළේය.

**මතෙව් 25 : 21 :- " ඔහුගේ ස්වාමියා ඔහුට කථාකොට : <u>යහපත් වූ විශ්වාස වූ දාසය</u>, ඒ යහපත. <u>ස්වල්ප දේ ගැන නුඹ විශ්වාසවූවෙහිය</u>, බොහෝ දේ කෙරෙහි නුඹ අධිපති කරමි ..... "**

මේ අතර ස්වාමියා බැහැරව සිටි කාලයේ, තම සේවය නිසිලෙස ඉටු නොකලාවූ දාසයා දඬුවම් කරන ලද්දේය.

**මතෙව් 25 : 26 :- " ඔහුගේ ස්වාමියා ඔහුට උත්තර දෙමින් : <u>දුෂ්ටවූ අලසවූ දාසය</u> ..... "**

**මතෙව් 25 : 30 :- " ඒ නිෂ්ප්‍රයෝජන දාසයා පිටත අන්ධකාරයෙහි දමාපල්ලා. "**

දේව දරුවෙනි, අප රැකියාවල් කරන ස්ථානවල **' යහපත් විශ්වාසවන්ත දාසයන් '** ලෙස සේවයේ යෙදෙමු.

(iv) **සිතින් දෙවියන්වහන්සේගේ කැමැත්ත කරමින් සේවය කිරීම**

**එපීස 6 : 6 :- " ..... ක්‍රිස්තුස්වහන්සේගේ දාසයෙක් මෙන්, සිතින් දෙවියන්වහන්සේගේ කැමැත්ත කරපල්ලා. "**

අපගේ සේවාවන්වල අප යෙදෙන අතර, අපගේ සිත්වලින් දෙවියන්වහන්සේගේ කැමැත්ත කිරීමට පාවුල්තුමා මෙහි අපට අනුශාසනා කරයි. මේ අතර **එපීස 6 : 5** හි සඳහන්වන්නේ, '**ක්‍රිස්තුස්වහන්සේට මෙන්**' සේවය කරන්ට කියාය.

දේව දරුවෙනි, අපගේ රැකියාවල් නැතහොත් අප විසින් කෙරෙන්නාවූ සේවය කුමක් වුවත්, පහත සඳහන් දේ සිතෙහි තබා ගනිමු.

(a) අප රැකියාව කළ යුත්තේ, දෙවියන්වහන්සේ අප උදෙසා සැලසුම් කර ඇති ස්ථානයෙහි විය යුතුයි. එබැවින් අපගේ රැකියාව සහ රැකියා ස්ථානය අප තෝරා ගත යුත්තේ, යාච්ඤාවෙන් දෙවියන්වහන්සේගේ මඟපෙන්වීම ලබාගැනීමෙන් පසුවය.

(b) එම ස්ථානයේ 'මාංසාකාරයෙන් අපගේ ස්වාමිවරුන්ට' අප සේවය කරන අතර, '**එම සේවය අප කරන්නේ ක්‍රිස්තුස්වහන්සේටයි**' යන අදහස හදවතේ ඇතිව සේවයේ යෙදෙමු.

(c) සෑම සේවයකදීම, දෙවියන්වහන්සේ සතුටුවන අන්දමට ක්‍රියා කරමු.

ඉහත සඳහන් අයුරින්, අප කරන සෑම සේවයකදීම ක්‍රිස්තුස්වහන්සේට මෙන් සේවයේ යෙදෙමින් දෙවියන් - වහන්සේ සතුටු කරන්නේ කෙලෙසද ? යන්න පහදා - දීමට, පහත සඳහන් අයුරින් යෝජනා කිහිපයක් ඔබ ඉදිරියේ තබමි.

දේව දරුව ඔබ,

- වෛද්‍යවරයෙක් නම්, ඔබ වෙත පැමිණෙන රෝගීන්, ඔබගේම සහෝදරයන් සේ සලකමින් ඔවුන්ට ප්‍රතිකාර කරන්න.
- ගුරුවරයෙක් නම්, ඔබගේ සිසුවන් ගැන යාච්ඤාකරමින් ඔබගේම දරුවන් ලෙස ඔවුන්ට උගන්වන්න.
- කාර්මික ශිල්පියෙක් නම්, ඔබගේම වැඩක් ලෙස සලකමින්, ඔබට පැවරෙන්නාවූ වැඩෙහි යෙදෙන්න.
- ව්‍යාපාරිකයෙක් නම්, 100% ක් අවංකවද, 100% ක් සාධාරණවද එම ව්‍යාපාරයේ යෙදෙන්න.

ඔබ මෙලෙස සේවය කරන අතර, ඔබ විසින් කරනු ලබන්නේ දේව කැමැත්ත වේ. ඔබගේ හදවත දකින්නාවූ දෙවි සමිඳුන් ඔබට ආශිර්වාද කරනවා ඇත. ඔබගේ යහපත් ක්‍රියා සහ යහපත් සේවය දකින්නාවූ මනුෂ්‍යයන්, ඔබ නිසා දෙවියන්වහන්සේට ප්‍රශංසා කරනවා ඇත. ඔබගේ ආලෝකය මනුෂ්‍යයන් ඉදිරියේ බබළනවා ඇත.

(v) **කැමැත්තෙන් (ආශාවෙන්) තම සේවයේ යෙදීම**

**එපීස 6 : 8 :-**

**" මනුෂ්‍යයන්ට නොව ස්වාමීන්වහන්සේට මෙන් කැමැත්තෙන් මෙහෙකරපල්ලා. "**

රැකියාවල යෙදෙන්නාවූ අපට, ඉතා අප්‍රසන්න අයුරින්, සෑහීමට පත් නොවී, තම රැකියාව කරදරයක් ලෙස සලකමින්, කොඳුරමින් සහ කෙඳිරිගාමින් එම සේවය කළ හැක.

මෙවැනි ආකල්ප වලින් තුරන්ව, ඉතා සතුටින්ද, සිනාසෙමින්ද, ආශාවෙන්ද, දෙවියන්වහන්සේට අපගේ රැකියාව ගැන තුති පුදමින්ද අපට එම සේවය කළ හැකිවේ.

දෙවියන්වහන්සේ අපව කැඳවා තිබෙන්නේ, මේ දෙක අතුරෙන් දෙවැන්න තෝරාගැනීමට බව **එපීස 6 : 8** වන පදය ඉතා පැහැදිළිව පෙන්වාදෙයි.

කිතුනු හැසිරීම ගැන **1 තෙසලෝනික 5 : 16 - 18** දෙස බලන්න.

**1 තෙස. 5 : 16 - 18 :-**

**" 16 නිතරම ප්‍රීති වෙයල්ලා ; 17 නොකඩව යාච්ඤා කරපල්ලා ;**
**18 සියල්ලේදී ස්තුති කරපල්ලා. මක්නිසාද ක්‍රිස්තුස් යේසුස් - වහන්සේ තුළ නුඹලා ගැන දෙවියන්වහන්සේගේ කැමැත්ත මේය. "**

දේව දරුවෙනි, මෙහි සඳහන් අයුරින්, අප ප්‍රීතියෙන්ද, යාච්ඤාවෙන්ද, ස්තුති දෙමින්ද, අපගේ රැකියාවල නිරත වෙමු.

<u>**සැලකිය යුතුයි**</u>

(A) දාසයන්ගේ යුතුකම් සඳහන් කරනු ලබන්නාවූ **එපීස 6:5-8** දක්වා පද හතරේ, හතර වතාවක්ම, **ක්‍රිස්තුස්වහන්සේට මෙන්,** (5 වන පදය) **ක්‍රිස්තුස්වහන්සේගේ දාසයන් මෙන්,** (6 වන පදය) **දෙවියන්වහන්සේගේ කැමැත්ත කරපල්ලා,** (6 වන පදය) සහ **ස්වාමීන්වහන්සේට මෙන්** (8 වන පදය) වැනි වචන සඳහන් වේ.

දේව දරුවෙනි, අපගේ සේවා ස්ථානයේ සේවය පමණක් නොව අප කරන්නාවූ සෑම දෙයක්ම, දෙවියන්වහන්සේට ගෞරව ගෙන දෙන්නාවූ අයුරින් කිරීමට තීරණය කරමු !!

**1 කොරි. 10 : 31 :- " එහෙයින් නුඹලා කතත් බොතත් වෙන යමක් කරතත් සියල්ල දෙවියන්වහන්සේගේ ගෞරවය පිණිස කරපල්ලා. "**

(B) ඉහත සඳහන් අයුරින් අප සේවය කරන අතර, දෙවියන් - වහන්සේ අපට විපාක දෙන සේක.

**එපීස 6 : 7 :- "..... එක් එක් අය කරන්නාවූ යම් යහපත් දෙයක් ඇද්ද, ඊට <u>ස්වාමීන්වහන්සේගෙන් නැවත විපාක ලැබෙන බව දැන,</u> ..... "**

**කොලො. 3 : 23 :- " නුඹලාට නුඹලාගේ <u>විපාකයවූ උරුමය ස්වාමීන්වහන්සේගෙන් ලැබෙන බව දැන</u>, ..... "**

## 2. ස්වාමිවරුන්ගේ යුතුකම් - එපීස 6 : 9

**එපීස 6 : 9 :-**

**" ස්වාමිවරුනි, නුඹලාගෙත් ඔවුන්ගෙත් ස්වාමීන්වහන්සේ ස්වර්ගයෙහි සිටින බවද, උන්වහන්සේ මනුෂ්‍යයන්ගේ තරාතිරම් නොබලන බවද දැන, තර්ජන කිරීමෙන් වැලකී, ඔවුන්ට එම දේවල් කරපල්ලා. "**

මෙම පදයෙහි, ස්වාමිවරුන් ලෙස අමතනු ලබන්නේ, උසස් රැකියාවල්වල වර්තමානයේ යෙදී සිටින්නාවූ දේව දරුවන් ලෙස සැලකීම, ප්‍රායෝගික වේ.

### (i) දෙවියන්වහන්සේ සෑම දෙයම දකින බව අමතක නොකරන්න

**එපීස 6 : 9 :-**

**" ස්වාමීන්වහන්සේ ස්වර්ගයෙහි සිටින බවද ..... දැන ..... "**

පෞද්ගලික සමාගමක, ඉහල මට්ටමේ කළමණාකරුවෙකු ලෙස සේවය කරන්නාවූ කිතුනුවෙකුට මෙම වදන් ඉතා වැදගත් වේ. තම ආයතනයේ ඉලක්ක සහ අරමුණු ඉටුකර ගැනීම සඳහාද, එම ආයතනය උපයාගන්නාවූ ලාභය උපරිම කරගැනීම උදෙසාද ඔහුට පැවරෙන්නේ මහත් වගකීමකි. මෙම වගකීම ඉටුකිරීමට දැඩිලෙස උත්සාහය දරන්නාවූ කළමණාකාරයෙකුට, ඉතා පහසුවෙන් කිතුනු සාරධර්ම සහ අගයන් අමතක විය හැක.

දේව දරුව, ඔබේ ආයතනයේ ලාභ ඉහළට ගෙනයෑම මගින් **ඔබට ඉහළින් සිටින්නාවූ නිළධාරීන් සතුටු කිරීමට වඩා වැදගත්වන්නේ, දෙවියන්වහන්සේව සතුටු කිරීම බව ඔබට අමතක කරවීමට යක්ෂයාට ඉඩ නොදෙන්න.**

එම නිළධාරීන් සතුටු කිරීම අරමුණු කරගනිමින්, <u>දේව වචනයට පටහැනිව කිසිවිටක ක්‍රියා නොකරන්න</u>. ඔබ ඉන්නා උසස් ස්ථානය ලබා දුන්නේ, ඔබගේ පියාණන් - වහන්සේය. එම ස්ථානය උගුලක් ලෙස පාවිච්චි කිරීමට බලා සිටින්නාවූ සතුරාගේ උපක්‍රම හඳුනාගෙන එම සතුරා පරාජය කරන්න.

(ii) **දෙවියන්වහන්සේ තරාතිරම් නොබලන බව අමතක නොකරන්න**

**එපීස 6 : 9 :-**

**" ..... උන්වහන්සේ තරාතිරම් නොබලන බවද දැන, ..... "**

අපගේ වර්තමාන සමාජයේ මනුෂ්‍යයකු බොහෝවිට අගය කරන්නේ, ඔහු කරන්නාවූ රැකියාවෙනි. එබැවින් ආයතනයක උසස් නිලධාරියෙක් සමාජයේදී සාමාන්‍ය - යෙන් ලබන්නේ, සුළු සේවකයෙකුට වඩා අතිශයින් ඉහළ පිළිගැනීමකි. එබැවින් තමා තම සේවකයින්ට වඩා ඉතා උසස් කෙනෙකු වන බව සිතන්ට, ස්වාමිවරු පුරුදුවෙති.

මෙහි භයානක ප්‍රතිඵලයක් වන්නේ, ඔහු නොදැනුවත්වම, ඔහුගේ ක්‍රියාවන් මනින්ට එක මිම්මකුත්, ඔහුගේ සේවකයින්ගේ ක්‍රියා මනින්ට තවත් මිම්මක් භාවිතා කිරීමට ඔහු පුරුදු වීමයි.

එමනිසා ඔහු අතින් සිදුවන්නාවූ වරදක්, ' **කුඩා අතපසු - වීමක්** 'ලෙස විස්තර කරන ඔහු, තම සේවකයෙක් එවැනිම වරදක් කළවිට ඔහුට දඬුවම් කරන්නේ ' **බරපතල වරදකාරයෙක්** ' ලෙසය.

දේව දරුව, අප මෙන් අපගේ ස්වාමීන්වහන්සේ තරාතිරම් නොබලනසේක. ඉහත කී අයුරින් ඔබ ක්‍රියාකරනවිට උන්වහන්සේ ඔබ ගැන ප්‍රසන්න නොවනසේක. එබැවින් ඔබගේ තනතුර මගින් ඔබගේ වැරදිවලට ඔබව අන්ධකිරීමට යක්ෂයාට ඉඩ නොදී, සැමදෙනා ගැනම සාධාරණව ක්‍රියාකරන්න. ඔබ ඔබගේ සේවකයන්ව අසාධාරණ ලෙස සලකනවා නම්, දෙවි සමිඳුන් ඉදිරියේ ඔබ වරදකරුවෙකු වන බව අමතක නොකරන්න.

**කොලොස්සි 3 : 25 :-**

**" මක්නිසාද අයුක්තිය කරන්නා තමා කළාවූ අයුක්තියේ ඵල ලබන්නේය. තරාතිරම් බැලීමක් නැත්තේය. "**

(iii) **ඔබගේ සේවකයින්ට තර්ජන නොකරන්න**

**එපීස 6 : 9 :- " ...... තර්ජනකිරීමෙන් වැලකී ...... "**

ඔබ යටතේ සේවය කරන්නාවූ සේවකයන්, බොහෝවිට ගත කරන්නේ ඉතා දුෂ්කර ජීවිත විය හැක. තවද, ජීවන වියදම අධික වනවා මිස, අඩු නොවන බව අප දනිමු. එබැවින් සාධාරණ වැටුප් වර්ධනයක් නොලබන්නාවූ සේවකයෙකුගේ ජීවිතය තව තවත් ආර්ථික දුෂ්කර - තාවයට වැටීම අනිවාර්යයෙන්ම සිදුවනවා ඇත. මෙවැනි පසුබිමක් යටතේ යම් ස්වාමියෙක් අසාධාරණ ලෙස

- තම සේවකයෙක් සේවයෙන් පහකිරීමට හෝ
- වැටුප් වර්ධනය අත්හිටුවීමට හෝ
- අතිකාල සේවයේ නොයෙදීමට හෝ
- ඔහුට හිමි දීමනා කපා දැමීමට හෝ

තර්ජන කරන්නේ නම්, දෙවියන්වහන්සේ ඉදිරියෙහි එම ස්වාමියා කරන්නේ බරපතල වරදකි. උසස් නිලධාරීන් ලෙස සේවය කරන්නාවූ දේව දරුවෙනි, ඔබගේම සේවකයන්ව, කරුණාවෙන් සහ අනුකම්පා සහිතව සලකන්න. ඔවුන් වරදක් කළවිට, ඔවුන්ට තදින් අවවාද කර, ඔවුන්ගේ වැරදි නිවැරදි කිරීමට, එක අවස්ථාවක් හෝ ලබාදෙන්න.

මේ සම්බන්ධයෙන් **මතෙව් 18 : 21-25** දක්වා සඳහන් - වන්නාවූ **අකාරුණාවන්ත දාසයාගේ උපමාව**, ඔබ කියවා බැලීම සුදුසු යයි යෝජනා කරමි.

(iv) **ඔබ ලබන්ට කැමති දේ දාසයින්ටද ලැබෙන්ට සලස්වන්න**

**එපීස 6 : 9 :- " ...... ඔවුන්ට එම දේවල් කරපල්ලා. "**

මෙම වචන ඉංග්‍රීසි බයිබලයේ සඳහන්වන්නේ -
' Treat your slaves in the same way ' (NIV) යනුවෙනි.

මෙයින් අදහස්වන්නේ, ස්වාමිවරුන් තම සේවකයින් - ගෙන් බලාපොරොත්තු වන්නා දේ ඔවුන් විසින් තම සේවකයින්ට දිය යුතු බවය.

නිදසුනක් වශයෙන් -
ඔවුන් සේවකයන්ගෙන් බලාපොරොත්තු වන්නාවූ ගෞරවය, ඔවුන් තම සේවකයන්ටද දැක්විය යුතු බවයි.

**මතෙව් 7 : 12 :- රන් අණ - " එබැවින් මනුෂ්‍යයන් විසින් නුඹලාට යමක් කරනවාට නුඹලා කැමතිද නුඹලාත් එසේම ඔවුන්ට කරපල්ලා ..... "**

ස්වාමිවරුනි, සැමවිටම ඔබගේ සේවකයන්ට සුදුසු වැටුප් ලබාදෙන්න. ඔවුන්ගේ අයිතිවාසිකම් නොඅඩුව ලබා දෙන්න. ඔවුන් සමඟ සැමවිටම අවංකව ක්‍රියා කරන්න. ඔවුන්ට අකරුණාවන්ත නොවන්න. ඔවුන්ට ගෞරව කරන්න. '**රන් අණ**' අනුව ඔවුන් පිළිබඳව ක්‍රියා කරන්න.

**කොලො. 4 : 1 :- " ස්වාමිවරුනි, ස්වර්ගයෙහි නුඹලාටත් ස්වාමි කෙනෙක් සිටින බව දැන, නුඹලාගේ දාසයන්ට ධර්මිෂ්ඨවූ සාධාරණවූ දේ දීපල්ලා. "**

### 3. එකවර ස්වාමියෙක් සේම දාසයෙක්ද වන්නාවූ කෙනෙකුගේ යුතුකම් - එපීස 6 : 5 - 9

යම්කිසි කෙනෙක් මැද මට්ටමේ නිලධාරියෙක් (M) ලෙස සේවය කරන විට, හෙතෙම එකවරම ස්වාමියෙක්සේම දාසයෙක්ද වනවා ඇත.

පුද්ගලික අංශයේ ආයතනවලින් අති බහුතරයක්ම කටයුතු කරන්නේ, උපරිම ලාභ ලබාගන්නා අරමුණ ඇතිවය. මේ අරමුණ ඉටුකර ගැනීම උදෙසා (M) වෙත ඉහලින් එන්නාවූ නියෝග (M) විසින් ක්‍රියාත්මක කළ යුතුවේ. එබැවින් බොහෝවිට මෙහි ප්‍රතිඵලය වන්නේ (M) තම ස්වාමිවරුන් සතුටු කිරීමට උත්සාහ කරන අතර, තමා යටතේ සේවය කරන්නාවූ සේවකයන්ගේ අයිතිවාසිකම් යනාදිය ගැන වැඩි සැලකිල්ලක් නොදැක්වීමයි.

මෙනමුත් (M) තම ආයතනයට සහ ස්වාමිවරුන්ට **විශ්වාසවන්තව සේවය කළ යුතු අතර,** ඔහු තමා යටතේ සිටින සේවකයන් පිළිබඳව **අනිවාර්යයෙන්ම සාධාරණ විය යුතුමය.**

(M) ගේ ස්ථානයේ සිටින්නාවූ දේව දරුවන්ගෙන් මා ඉල්ලා සිටින්නේ ඔබගේ ස්වාමිවරුන් සහ සේවකයන් යන **දෙපාර්ෂවයටම සාධාරණව ඔබගේ සේවය ඉටුකරන්ට කියාය.** ඔබගේ ස්වාමිවරුන්ගෙන් උසස්වීම් ලබන බලා - පොරොත්තුවෙන් මෙයට පටහැනිව ක්‍රියා නොකරන්න.

අපට උසස්වීම ලබා දෙන්නේද, ආශිර්වාද කරන්නේද **(විපාක දෙන්නේ ' දෙවි සමිඳුන් බව ' - එපීස 6 : 7)** අමතක නොකරන්න.

**දේව දරුවෙනි, අප සැම දෙන ස්වාමියෙක් වුවත්,**

**දාසයෙක් වුවත්, එකවර මෙම කටයුතු දෙකෙහිම**

**නියැලුනත්, දෙවියන්වහන්සේගේ වචනය අනුවද,**

**උන්වහන්සේ සතුටුවන අයුරින්ද අපගේ**

**රැකියාවල්වල යෙදෙමු.**

**එසේ කිරීමට ස්වාමීන්වහන්සේ ඔබට**

**උපකාර කරන සේක්වා !!!**

## සටහන

# කිතුනුවාගේ යුද්ධායුධ




# එපීස අධ්‍යයනය 20

# කිතුනුවාගේ යුද්ධායුධ

**එපීස 6 : 10 - 18**

**<u>හැඳින්වීම</u> :-**

එපීස පොත ඇසුරෙන් අප කිරීමට යන්නාවූ විසි වන සහ අන්තිම අධ්‍යයනය වන්නේ මෙයයි.

මෙම කොටසෙහි එනම් **එපීස 6 : 14-17** දක්වා සඳහන් - වන්නාවූ, ' කිතුනුවාගේ යුද්ධායුධ ' පිළිබඳව දේශනාවක් බොහෝ දේවස්ථානවල අවම වශයෙන් දෙවසරකට එක් වරක් හෝ, අසන්ට ලැබෙන බව මාගේ විශ්වාසයයි.

මේ හේතුව නිසා, මෙම අධ්‍යයනය කියවන්නාවූ ඔබගෙන් බහුතරයකට මෙය ගැන හොඳ අවබෝධයක් තිබෙනු ඇත.

ඉහත සඳහන් හේතුව නිසා, මෙම අධ්‍යයනයේ වැදගත් අරමුණක් වන්නේ, අපට විරුද්ධව යුද්ධයට පිවිස සිටින්නාවූ අපගේ සතුරා නොහොත් ' සාතන් ' ගැන පැහැදිලි තේරුම් ගැනීමක් ඔබට ලබා දීමයි. මෙම සතුරාගේ කුරිරුකම, භයානකකම සහ කපටිකම වැනි දේ ගැන ඔබට පෙන්වාදී, **'දෙවියන්වහන්සේගේ සියලු යුද්ධායුධ'** වලින් සැමවිටම සන්නද්ධව සිටීමට ඔබව පෙළඹවීමයි.

**එපීස 6 : 11 :-**

**" යක්ෂයාගේ උපායවලට විරුද්ධව සිටින්ට නුඹලාට පුළුවන්වන පිණිස <u>දෙවියන්වහන්සේගේ සියලු යුද්ධායුධ පැළඳගනිල්ලා</u>. "**

**එපීස 6 : 13 :-**

**" එබැවින් නපුරු දවසේදී විරුද්ධව සිටින්ටත්, සියල්ල සම්පූර්ණකරගෙන ස්ථිරව සිටින්ටත් පුළුවන්වෙන පිණිස, <u>දෙවියන්වහන්සේගේ සියලු යුද්ධායුධ අරගනිල්ලා</u>. "**

<u>අධ්‍යයනය</u> **:-**

මෙලොව උපදින්නාවූ සෑම මනුෂ්‍යයෙක්ම ගැළවීමට නොහොත් දේව දරුකමට ඇතුල්වීම දෙවියන් - වහන්සේගේ කැමැත්තයි.

**2 පේත්‍රුස් 3 : 9 :- " ....... නුමුත් <u>සියල්ලන්ම පසුතැවිලි - වනවාට</u> මිස කිසිවෙක් විනාශවෙනවාට උන්වහන්සේ නොකැමැතිව, නුඹලා කෙරෙහි බොහෝකල් ඉවසන සේක. "**

**1 තිමෝති 2 : 3, 4 :- " [3] මෙය <u>සියලු මනුෂ්‍යයන් ගළවනු ලැබ</u>, සැබෑව දැනගැනීමට පැමිණෙනවාට කැමතිවූ, [4] අපගේ ගැළවුම්කාරයාණන්වන දෙවියන්වහන්සේ .... "**

මේ අතර යක්ෂයාගේ අභිප්‍රාය වන්නේ සෑම මනුෂ්‍යයෙක්ම ආත්මික මරණයට පත්කොට, ඔවුන් විනාශකර දැමීමයි.

**යොහන් 10 : 10 :- " සොරා එන්නේ සොරකම් කරන්ටත් මරන්ටත් විනාශකරන්ටත් පමණක්ය ..... "**

එබැවින් ඕනෑම මනුෂ්‍යයෙක්, දෙවියන්වහන්සේ කෙරෙහි ඇදහිල්ල තබමින්, දේව දරුකමට ඇතුල්වූවිට, ඔහු යක්ෂයා සමඟ, මරණය දක්වාම පවතින, මහත් සටනකටද ඇතුල්වෙයි. මෙම සටනේදී යක්ෂයාගේ අරමුණු තුනක් **යොහන් 10 : 10** වන පදයෙහි සඳහන් වේ. ඒවා වන්නේ,

(i) අපගෙන් සොරකම් කිරීම -
(දෙවියන්වහන්සේ උන්වහන්සේගේ දරුවන්ට ලබාදීමට සූදානම් කර ඇති ආශිර්වාද ඔවුන්ගෙන් සොරකම් කර ගැනීම)

(ii) අපව ආත්මික මරණයට පත්කිරීම -
(ආත්මික මරණය යනු, අපගේ ආත්මය දෙවියන්වහන්-සේගෙන් වෙන් කිරීමයි)

(iii) අපව විනාශකිරීම -
(දෙවියන්වහන්සේගෙන් අපව ඈත් කරමින්, අපගේ අනාගතය සම්පූර්ණයෙන්ම විනාශකර දැමීම)

දේව දරුවෙනි, දෙවියන්වහන්සේ අපව තෝරා, අපව කැඳවා ඇත්තේ, අපගේ සතුරාගෙන් ආරක්ෂාවී සතුරාව පරාජය කරන්ටයි. එබැවින් අප ඉදිරියේ තිබෙන්නාවූ සටන උදෙසා අප සූදානම් වීම ඉතා වැදගත්වේ. මෙම සටනට සූදානම්වීමට අත්‍යවශ්‍යය වන්නාවූ මුල් පියවරක් වන්නේ, අපගේ සතුරා හඳුනාගැනීමයි.

**1. <u>සතුරා හඳුනාගැනීම - එපීස 6 :11, 12</u>**

**එපීස 6 : 12 :- " මක්නිසාද අපේ පොරබැදීම වනාහි මාංසයට සහ රුධිරයට විරුද්ධව නොව, අධිපතිකම්වලටත් පරාක්‍රමධාරීන්ටත් මේ අන්ධකාර ලෝක මුලාදෑනීන්ටත් ස්වර්ගීය ස්ථානවල සිටින දුෂ්ටකමේ ආත්ම සේනාවන්ටත් විරුද්ධවය. "**

(a) **අපගේ සතුරා, මනුෂ්‍යයෙක් නොවේ. අපට විරුද්ධව ක්‍රියාත්මක වන්නාවූ සතුරු සේනාව වන්නේ, යක්ෂයාගේ නායකත්වය යටතේ ක්‍රියා කරන්නාවූ දුෂ්ටකමේ ආත්ම සේනාවක් වේ.**

අප දෙවියන්වහන්සේගේ සේවයේ යෙදෙන අතර, නොයෙක් මනුෂ්‍යයන් මඟින් අප වෙත විරුද්ධවාදීකම් සහ බාධාවන් පැමිණිය හැක. මේ අයුරින් පැමිණෙන්නාවූ බාධාවන් කිතුනු නොවන්නාවූ සෙනඟ තුළින් මෙන්ම, කිතුනු නම දරන්නාවූ අය තුළින්ද පැමිණෙනු ඇත. මෙනමුත් අප හඳුනාගත යුතුව ඇති දෙයක් වන්නේ, අපගේ සැබෑ සතුරා, අපට විරුද්ධව නැඟී සිටින්නාවූ මනුෂ්‍යයන් නොවන බවයි. අපගේ සැබෑ සතුරා වන්නේ, මනුෂ්‍යයන්ව මුලාකරමින්, අන්ධකරමින්, අපට විරුද්ධව ක්‍රියාකිරීමට ඔවුන් යොදවන්නාවූ යක්ෂයා සහ යක්ෂයාට පක්ෂවූ දුෂ්ටකමේ ආත්මයන්ය.

සැබෑ සතුරාව මේ අයුරින් අඳුනාගෙන ඇත්තාවූ අප විසින් කළ යුත්තේ, සාතන්ට මුළාවී, අපට විරුද්ධව ක්‍රියා කරන්නාවූ මනුෂ්‍යයන්ගේ ගැළවීම උදෙසා යාච්ඤා කිරීමයි. දේව දරුවෙනි, සභාවට පිටස්තර ප්‍රහාර එල්ලවන අතර, සභාවේ ආරක්ෂාව උදෙසා මෙන්ම, සාතන්ට මුළාවී මෙසේ ක්‍රියාකරන මනුෂ්‍යයන්ගෙන් ගැළවීම උදෙසා නිරන්තරයෙන්ම යාච්ඤාවේ යෙදෙන්න.

මේ අතරම සභාවට විරුද්ධව ක්‍රියාකිරීමට මනුෂ්‍යයන් පෙළඹී ඇත්තේ සභාවේම ඇති දුර්වලකම් නිසාද කියා විමසා බලා, එවැනි දුර්වලකම් වලින් ජයගැනීම උදෙසා නොපමාව ක්‍රියාත්මක වන්න.

(b) **අපගේ සතුරා බලවන්ත සතුරෙකි**

**එපීස 6 : 12** හි සඳහන්වන්නේ, සාතන්ගේ සේනාවේ **' අධිපතිකම් ', ' පරාක්‍රමධාරීන් '** සහ **' ලෝක මුලාදෑනීන් '** සිටින බවයි. ශුද්ධාත්මයාණන්වහන්සේගේ මඟපෙන්වීම යටතේ පාවුල්තුමා සඳහන් කරන්නාවූ මෙම නම් වලින් හඳුන්වා දෙන්නේ දුෂ්ට ආත්ම අතරේ ඇත්තාවූ විවිධ තත්ත්වයන් සහ තනතුරුද යන්න නිශ්චිත වශයෙන් අප නොදනිමු. මෙනමුත් ' අධිපතිකම් ' සහ ' පරාක්‍රමධාරීන් ' යන නම් අපට පෙන්නුම් කරන්නේ ඔවුන්ට **බලය සහ අධිකාරිය ඇති බව** කියා නිගමනය කළ හැක.

මෙම දුෂ්ට ආත්මවලට ඇත්තාවූ බලය, අධිකාරිය සහ ශක්තිය පෙන්වාදීම උදෙසා, පරණ ගිවිසුමෙන් සහ අලුත් ගිවිසුමෙන් නිදසුන් දෙකක් ඔබ ඉදිරියේ තබමි.

**<u>පළමුවැනි නිදසුන</u> - දානියෙල් 10 : 12 -13**

මෙම පද දෙක අපට පෙන්වාදෙන්නේ, දෙවියන්වහන්සේ දානියෙල් වෙත එව්වාවූ උන්වහන්සේගේ පණිවිඩ - කාරයාට විරුද්ධව ක්‍රියාකරමින් **' පර්සියා රාජ්‍යයේ අධිපතියා '** ලෙස හැඳින්වෙන්නාවූ සාතන්ගේ දාසයා, ඔහුව දින 21ක් ප්‍රමාද කළ බවයි. ඉක්බිතිව දෙවියන් - වහන්සේගේ **' ප්‍රධාන අධිපතීන්ගෙන් එක්කෙනෙක් වන මිකායෙල් ' (දානියෙල් 10 : 13)** එම පණිවිඩකාරයාට උපකාර කරමින් දානියෙල් වෙත පැමිණීමට ඔහුට ඉඩ සැලැස්වූ බවද මෙහි සඳහන් වෙයි.

**<u>දෙවැනි නිදසුන</u> - ක්‍රියා 19 : 13 - 16**

මෙහි සඳහන් සිද්ධිය පෙන්වාදෙන්නේ ප්‍රධාන පූජකයෙක් වූ ස්කේවාගේ පුත්‍රයන් සත්දෙනෙකුට පහරදී, ඔවුන් දමනය කිරීමටද, ඔවුන්ට තුවාලකර නිරුවත්කර පලවාහැරීමටද, නපුරු ආත්මයක් වැහී සිටි එක මනුෂ්‍යයෙක් සමත්වූ බවයි.

ඉහත සඳහන් නිදසුන් දෙකෙන්, දුෂ්ට ආත්මවලට ඇත්තාවූ බලය, අධිකාරිය සහ ශක්තිය අපට පැහැදිලිව පෙනේ. දේව දරුව, අපගේ සතුරා බලවත් වන නමුත් අප තුළ වැඩ වසන්නාවූ ශුද්ධාත්මයාණන්වහන්සේ, යක්ෂයාට වඩා බලවත් බැවින්, ඌව පරාජය කිරීමට අපට හැකිවේ.

**1 යොහන් 4 : 4 :- " මාගේ ප්‍රිය දරුවෙනි, නුඹලා දෙවියන් - වහන්සේට අයිතිව, ලෝකයෙහි සිටින තැනැත්තාට වඩා නුඹලා තුළ සිටින තැනන්වහන්සේ උතුම් බැවින්, නුඹලා ඔවුන්ගෙන් ජය ගෙන සිටින්නෝය. "**

(c) **අප සතුරාගේ රාජ්‍යය ලොව පුරා පැතිරී තිබේ**

**එපීස 6 : 12 :- " ....... මේ අන්ධකාරයේ ලෝක මුලාදෑනීන්ටත් ...... "**

' **අධිපතිකම්** ' සහ ' **පරාක්‍රමධාරීන්ට** ' අමතරව සාතන්ට සේවය කරන්නාවූ ' **ලෝක මුලාදෑනීන්** ' සිටින බව **එපීස 6 : 12** පෙන්වාදෙයි. ' **ලෝක මුලාදෑනීන්** ' ලෙස හඳුන්වනු ලබන්නාවූ දුෂ්ට ආත්ම සාතන්ගේ හමුදාවේ සිටීම තුළින්, සාතන්ගේ රාජ්‍යය ලොව පතලවූ රාජ්‍යයක් බව අපට නිගමනය කළ හැක. මෙය වැඩි දුරටත් තේරුම් ගැනීම උදෙසා, පහත සඳහන් පද බලන්න.

**මතෙව් 4 : 8 , 9 :- " [8] නැවතත් යක්ෂයා උන්වහන්සේ ඉතා උස කන්දකට පමුණුවා, ලෝකයේ සියලු රාජ්‍යයන්ද එහි ඓශ්වර්යද උන්වහන්සේට පෙන්වා : [9] ඔබ බිම වැටී මට නමස්කාර කරන්නෙහි නම් මේ සියල්ල ඔබට දෙන්නෙමියි උන්වහන්සේට කීවේය. "**

**යොහන් 12 : 31 :- " ...... මේ ලෝකයේ අධිපතියා දැන් පිටත දමනු ලබන්නේය. "**

**යොහන් 14 : 30 :- " ...... මක්නිසාද ලෝකයේ අධිපතියා එන්නේය. "**

**යොහන් 16 : 11 :- " ..... මේ ලෝකයේ අධිපතියා විනිශ්චය කරනුලැබ සිටින නිසාය. "**

**1 යොහන් 5 : 19 :- " අප දෙවියන්වහන්සේගෙන් වන බවද මුළු ලෝකය නපුරා තුළ බවද දනිමුව. "**

ප්‍රේමණීය සහෝදරයා, සහෝදරී, කිතුනුවූ අප බොහෝවිට තේරුම් ගැනීමට අපොහොසත් වන්නාවූ සත්‍යයක් වන්නේ, අපගේ ජීවිතවල අප මුහුණ දෙන්නාවූ, පසුබෑම්, ප්‍රශ්න, ගැටළු සහ බාධා බොහෝසේ පැමිණෙන්නේ අප දෙවියන්වහන්සේගේ කැමැත්ත අනුව ජීවත් නොවීම නිසා බවයි. මෙසේ අප ජීවත්වන විට, අපට විරුද්ධව ප්‍රහාර එල්ල කරමින් අපව පරාජය කිරීමට යක්ෂයා සමත්වෙයි.

මෙසේ සිදුවන්නේ, අපගේම වරද නිසා බව අප තේරුම් නොගෙන, විවිධාකාර හේතු දක්වමින්, අපගේ ප්‍රශ්නයට විසඳුම ' බටහිර රටකට යෑම ' වැනි නිගමන වලට පවා කිතුනුවන් පැමිණීම, ඉතා කණගාටු සහිතය.

දේව දරුවෙනි, මෙය තේරුම් ගන්න. අපගේ විරුද්ධ - කාරයා වන්නාවූ සාතන්ගේ රාජ්‍යයද, සාතන්ගේ දාසයන්ද මෙලොව සෑම රටකම ක්‍රියාත්මකව සිටිති. දෙවියන්වහන්සේ ඔබව මෙම රටේ තබා ඇති අතර, ඔබ උන්වහන්සේගේ මඟපෙන්වීම නොලබා, ' බටහිර රටකට යෑම ' තුළින් සිදුවන්නේ ඔබ යක්ෂයාගේ කැමැත්තට තවත් අසුවීම විය හැක.

මා හඳුනන සභා පාලකතුමෙක් ළඟදී මට කියා සිටියේ, තම සභාවේ බොහෝ දීමනාලත්, ආශිර්වාදලත්, සේවයට ආසා කළාවූ විශාල සංඛ්‍යාවක් ඉහත කී අන්දමට ක්‍රියා කිරීම හේතුවෙන්, ඔහුගේ සභාව බොහෝසේ දුර්වලවී ඇති බවයි. මෙම දේව දාසයා කී ආකාරයට බොහෝ දේව දරුවන් **(දෙවියන්වහන්සේගේ කැමැත්ත නොසොයා)** විදේශගතවීම තුළින් ඉටුවන්නේ දෙවියන්වහන්සේගේ කැමැත්තද ? නැතහොත් යක්ෂයාගේ කැමැත්තද ? කියා සිතා බලන්න.

අපගේ ප්‍රශ්නවලට විසඳුම දෙවියන්වහන්සේ තුළ නොසොයමින්, ක්‍රියාකිරීම මඟින්, බොහෝවිට සිදුවන්නේ **දෙවියන්වහන්සේ අපව කැඳවා ඇති සේවය ඉටු නොවීමයි. අපගේ සභාව දුර්වල වීමයි. විදේශ රටේද යක්ෂයා අපව මුලාකිරීමට තවත් සමත්වීමයි**(යක්ෂයාගේ රාජ්‍යය/ ක්‍රියාකිරීම ලොව පුරා පැතිර තිබේ).

(d) **යක්ෂයා අතිශයින් දුෂ්ටය**

**එපීස 6 : 12 :- "...... දුෂ්ටකමේ ආත්ම සේනාවන්ටත් විරුද්ධවය. "**

යක්ෂයාට බලය ඇති බව අප දනිමු. නමුත් 'බලය' යන්න හොඳ හෝ නරක නොවේ, එය මධ්‍යස්ථ දෙයකි. මෙනමුත් බලය සමග දුෂ්ටකම හෝ නපුරුකම එකතුවූවිට, ඇතිවන්නාවූ ප්‍රතිඵලය අති භයානක වේ. මෑත අතීතයේ මෙලොව විසුවාවූ, අති දරුණු දුෂ්ට සහ බලවත් නායකයින් විසින් කරන ලද සමූහ ඝාතනයන් පිටුපස, යක්ෂයා සිටි බව නිසැකය.

**මතෙව් 2 : 16 :- " එකල හෙරොද් ..... මනුෂ්‍යයන් යවා, බෙත්ලෙහෙම්හිද එහි සියලු සීමාවලද සිටි <u>දෑවුරුදු වයස්වූද ඊට බාලවූද සියලු පිරිමි දරුවන් මැරෙව්වේය</u>. "**

මේ අයුරින් කුඩා බිළිඳුන් මරා දැමීමට හෙරොද් රජතුමාව පෙළඹෙව්වේද යක්ෂයා බව නිසැකය. දේව දරුවෙනි, යක්ෂයා අති දුෂ්ට ආත්මයකි. ඔබගේ ජීවිතයේ යක්ෂයාට කිසි ඉඩක් නොදෙන්න.

(e) **යක්ෂයා අතිශයින් කපටිය**

**එපීස 6 : 11 :- " යක්ෂයාගේ උපායවලට විරුද්ධව ..... "**

යක්ෂයා ප්‍රයෝගකාරී, කපටි. අපව මුලාකිරීම උදෙසා බොරුවෙන් සහ රැවටීමෙන් ක්‍රියාකිරීමෙහි දක්ෂයෙකි. එබැවින් යක්ෂයාගේ උපායවලට අසුනොවීම පිණිස, අප සැමවිටම සුපරීක්ෂාකාරීව සිටිය යුතුවේ.

**2 කොරි. 2 : 10, 11 :- " [10] ....... සාතන් අප කෙරෙහි වාසි නොලබන පිණිස ..... [11] මක්නිසාද ඔහුගේ උපායවල් අප විසින් නොදැන සිටිනවා නොවේ. "**

**2 කොරි. 11 : 14 :- " මක්නිසාද සාතන් පවා ආලෝකයේ දූතයෙකුගේ වෙස් ගනියි. "**

**1 පේත්‍රුස් 5 : 8 :- " සිහි ඇතිව, අවදිව ඉඳිල්ලා. නුඹලාගේ විරුද්ධකාරයාවූ යක්ෂයා ගොරවන සිංහයෙකු මෙන් කවරෙකු ගිලිම්දෝහෝයි සොයමින් ඔබ මොබ ඇවිදින්නේය. "**

## 2. සතුරාගේ උපායවලට විරුද්ධව සිටීම - එපීස 6 : 10, 11

අපට විරුද්ධව ක්‍රියාකරන්නාවූ, අපගෙන් සොරාගන්ටත්, අපව මරන්ටත්, විනාශකරන්ටත් බලා සිටින්නාවූ යක්ෂයාට ඇත්තාවූ බලය, දුෂ්ටකම සහ කපටිකම දන්නාවූ අප, ඌට විරුද්ධව ක්‍රියා කළ යුතු අන්දම, දෙවියන්වහන්සේ **එපීස 6 : 10, 11** යන පදවල අපට පහදා දී ඇත. යක්ෂයාගේ සියලු උපක්‍රම දන්නාවූ, සියලු බල ඇති දෙවි සමිඳුන් මෙහිදී ඇති පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියාකිරීමට, අප සැවොම දැන්ම තීරණය කරමු.

### (i) ස්වාමීන්වහන්සේ තුළ බලවත්වෙන්න - එපීස 6 : 10

**එපීස 6 : 10 :-**

**" ඉතින් ස්වාමීන්වහන්සේ තුළද උන්වහන්සේගේ ශක්තියේ බලවත්කමෙහිද බලවත්වෙයල්ලා. "**

ස්වාමීන්වහන්සේ තුළ බලවත්වීම උදෙසා, අප **ස්වාමීන් - වහන්සේ තුළ ජීවත්වීම නොහොත් ස්වාමීන්වහන්සේගේ කැමැත්ත තුළ ජීවත්වීම** අතිශයින් වැදගත්වේ. මෙය ගැන මොහොතකට ඔබ මෙනෙහි කළොත්, දෙවියන් - වහන්සේගේ කැමැත්ත වන්නේ අප කිසිවෙක් යක්ෂයාට පාරාජය නොවීම බව ඔබට පෙනීයනවා ඇත. එබැවින් අපගේ ජීවිතයේ සෑම තීරණයක්ම දෙවියන්වහන්සේට යටත්කිරීම මඟින්, අපට යක්ෂයාගේ සෑම උපායකින්ම ජයගත හැකි බව පැහැදිලිය.

දේව දරුව, ඔබගේ ජීවිතයේ ' හදිසි තීරණ ' ගැනීමෙන් හැකිතාක් දුරට වැලකී සිටින්න. ඔබගේ ජීවිතයේ වැදගත් වන්නාවූ තීරණ, යාච්ඤාවෙන්ද දෙවියන්වහන්සේගේ පැහැදිලි මඟපෙන්වීම අනුවද ගැනීමට සැමවිටම මතක තබාගන්න. දෙවියන්වහන්සේගේ කැමැත්ත ඔබට පැහැදිලිව නොපෙනෙන අවස්ථා ඇතිවූ විට, ඔබගේ සභා පාලකතුමාගෙන් හෝ පරිණත ආත්මික නායකයෙකුගෙන් උපදෙස් ලබාගන්න.

මේ අයුරින් ඔබට යක්ෂයාට අසුනොවී, එලබර ජීවිතයක් ගත කිරීමට හැකිවේ.

(ii) **ස්වාමීන්වහන්සේගේ බලවත්කමෙන් බලවත් වෙන්න - එපීස 6 : 10**

අපගේ දෙවි ස්වාමීන්වහන්සේ සර්වබලධාරී වන අතර, උන්වහන්සේගේ බලය අප තුළ ක්‍රියාකරන්නේ ශුද්ධාත්මයාණන්වහන්සේ මඟින්ය.

**එපීස 1 : 19 - 22** දක්වා යාච්ඤාවෙන් කියවන්න. මේ පද අපට දෙවියන්වහන්සේගේ බලයේ මහත්කම පෙන්වාදෙමින්, යේසුස්වහන්සේව මළවුන්ගෙන් නැගිටු-වීමට තරම් බලවත්වූ ඒ බලයම, අප තුළද, අප තුළින්ද ක්‍රියාකරන බව, තව දුරටත් පැහැදිලි කරයි.

දේව දරුව, මේ බලය එනම් ශුද්ධාත්මයාණන් - වහන්සේගේ බලයෙන් අප බලවත්වන අතර, යක්ෂයාට අපව පරාජය කිරීමට කිසිසේත් නොහැකිවනවා ඇත. මෙය උදෙසා අප සැමවිටම **' ආත්මයාණන්ගෙන් පූර්ණවී '** (**එපීස 5 : 18**) ජීවත්වෙමු.

(iii) **දෙවියන්වහන්සේගේ සියලු යුද්ධායුධ පැළඳගන්න - එපීස 6 : 11**

යක්ෂයාගෙන් ආරක්ෂාවීම සහ යක්ෂයාව පරාජය කිරීම උදෙසා, දෙවියන්වහන්සේ අපට ලබාදී ඇත්තාවූ යුද්ධායුධ පිළිබඳව පැහැදිලි අවබෝධයක් මෙම අධ්‍යයනය කියවන්නාවූ ඔබ සැමට ඇති බව නිසැකය. මෙනමුත් ඔබගෙන් බොහෝ දෙනෙක් එම යුද්ධායුධ **සියල්ලම සැමවිටම පැළඳවීමට අපොහොසත් වන බවද** නොඅනුමානය. අප සැම දෙවියන්වහන්සේගේ **සියලු යුද්ධායුධ** පැළඳගෙන සිටීමේ වැදගත්කම තේරුම් ගැනීම උදෙසා, **එපීස 6 : 11** සහ **13** වන පද වෙත ඔබගේ අවධානය යොමු කරමි.

**එපීස 6 : 11 :- " ...... දෙවියන්වහන්සේගේ සියලු යුද්ධායුධ පැළඳගනිල්ලා."**

**එපීස 6 : 13 :- "...... දෙවියන්වහන්සේගේ සියලු යුද්ධායුධ අරගනිල්ලා."**

ප්‍රේමණීය දේව දරුව, **එපීස 6 : 11 - 13** දක්වා ඇති පද තුනෙන් දෙකකම 'සියලු යුද්ධායුධ' යන වචන සඳහන්වන්නේ, වැරදීමකින් නොවේ. දෙවියන්වහන්සේ මේ අයුරින් දෙවතාවක්ම මෙය සඳහන් කරන්නේ, සියලු යුද්ධායුධ පැළඳසිටීමේ වැදගත්කම නිසාය. එබැවින් මා ඔබගෙන් ඉල්ලා සිටින්නේ, වහාම මෙය ගැන ඔබවම සෝදිසි කරගන්නා ලෙසය.

අප දෙසම සහ අප ඇසුරු කරන්නාවූ කිතුනුවන් දෙස බලන අපගේ නිගමනය වන්නේ, දෙවියන්වහන්සේ දී ඇත්තාවූ **' සියලු යුද්ධායුධ පැළඳගනිල්ලා '** යන උපදෙස අනුව ක්‍රියාකරන්නේ කිතුනුවන්ගෙන් සුළුතරයක් වන බව නිසැකය.

දේව දරුවෙනි, අප මෙහි වෙනසක් ඇතිකරමු !

**අප දෙවියන්වහන්සේගේ සියලු යුද්ධායුධ පැළඳ ගනිමු !!**

## 3. දෙවියන්වහන්සේගේ යුද්ධායුධ - එපීස 6 : 14 - 17

දෙවියන්වහන්සේ අපට දී ඇත්තාවූ යුද්ධායුධ පිළිබඳව ඔබට හොඳ අවබෝධයක් ඇති බව මා සිතන බැවින්, ඒවා ගැන දීර්ඝ විස්තරයක් මෙම කොටසෙහි සඳහන් නොකර, ඒ ගැන කෙටි සටහනක් පමණක් ඔබ ඉදිරියේ තබමි.

(i) **සැබෑකම නමැති ඉඟ පටිය - එපීස 6 : 14**

**කොලොස්සි 3 : 9 :- " එකිනෙකාට බොරු නොකියල්ලා. මක්නිසාද නුඹලා පරණ මනුෂ්‍යයා ඔහුගේ ක්‍රියා සමඟ අහක දමා, ........ "**

**එපීස 4 : 25 :- " එහෙයින් බොරුකීම අත්හැරදමා, එක් එක්කෙනා තම තමාගේ අසල්වාසියා සමඟ සැබෑව කථාකරපල්ලා. "**

අපගේ ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ **සැබෑව (යොහන් 14 : 6)** වන අතර, සාතන් **බොරුවේ පියාය (යොහන් 8 : 44).** එබැවින් සැබෑකම, දෙවියන්වහන්සේගේ යුද්ධායුධවලට අයිති සේම, බොරුකීම සාතන්ගේ ආයුධයකි. එමනිසා අප බොරු කියනවිට, අප ක්‍රියාකරන්නේ සාතන්ගේ හමුදාවේ කෙනෙක් ලෙසයි.

දේව දරුව, කිසිවිටක බොරු නොකියා, සැමවිටම යේසුස්වහන්සේ මෙන්, **' ප්‍රේමයෙන් යුක්තව ඇත්ත කථාකරන්න.' (එපීස 4 : 15)**

එසේ කිරීමට ඔබට උපකාර කිරීම උදෙසා යේසුස් - වහන්සේ, ප්‍රේමයෙන් ඇත්ත කථාකිරීමේ නිදසුන් පහක් ඔබ ඉදිරියේ තබමි.

**මතෙව් 16 : 23** (පේත්‍රුස්ට); **මතෙව් 20 : 22, 23** (යාකොබ්ට සහ යොහන්ට); **මතෙව් 19 : 21** (පොහොසත් යෞවනයාට) ; **ලූක් 10 : 41, 42** (මාර්තාට) ; **යොහන් 8 : 10, 11** (අනාචාර ස්ත්‍රියට). මෙම බයිබල් කොටස් කියවමින්, යේසුස්වහන්සේ ක්‍රියා කළ සහ කථා කළ අන්දම, අනුගමනය කරන්න.

(ii) **ධර්මිෂ්ඨකම නමැති ළය වැස්ම - එපීස 6 : 14**

යේසුස්වහන්සේ අපගේ ධර්මිෂ්ඨකම වන අතර, සාතන්ගේ ක්‍රියාකිරීම අධර්මිෂ්ඨකමින් වේ.

**2 තෙසලෝනික 2 : 9, 10 :- " [9] ..... සාතන්ගේ ක්‍රියාකිරීමේ හැටියට ...... [10] අධර්මිෂ්ඨකමේ සියලු රැවටිලි වලින්ද යුක්තවේ ; ......"**

අපගේ ස්වාමීවූ යේසුස්වහන්සේ **සැබෑවද, ධර්මිෂ්ඨකමද** වන අතර, සාතන් **බොරුවෙන්ද අධර්මිෂ්ඨකමින්ද** සැමවිටම ක්‍රියාකරයි. එමනිසා යක්ෂයාට අසුනොවී සිටීම පිණිස, අපගේ හදවත් ධර්මිෂ්ඨකම නමැති ළයවැස්මෙන් ආරක්ෂා කරගනිමු.

දේව දරුවෙනි, යක්ෂයාට අපගේ හදවත්වල ඉඩ නොදෙමු. අධර්මිෂ්ඨ චේතනාවලින් මිදෙමු, අපගේ හදවත් පවිත්‍රව තබාගනිමු.

(iii) **සමාදානයේ ශුභාරංචියේ සූදානම නමැති පාවහන් - එපීස 6 : 15**

**මාර්ක් 16 : 15 :- " නුඹලා ලොව මුළුල්ලේ ගොස් සකල ජනතාවට ශුභාරංචිය ප්‍රකාශ කරපල්ලා."**

මෙසේ කිරීම උදෙසා, අප සැම දෙන :

- ශුභාරංචිය පැහැදිලිව අන් අයට කියා දීමට පුහුණු වෙමු.
- දෙවියන්වහන්සේව නොදන්නා අය ගැන, දිනපතා යාච්ඤාකරමු.
- ශුභාරංචිය වෙනුවෙන් කාලය වැයකිරීමට සැමවිටම සූදානම්ව සිටිමු.

(iv) **ඇදහිල්ල නමැති පලිහ - එපීස 6 : 16**

සාතන් සැමවිටම ක්‍රියාකරන්නේ අපගේ ඇදහිල්ල දුර්වල කිරීමටයි. අප තුළ සැක ඇතිකිරීමටයි. දෙවියන්වහන්සේ සහ උන්වහන්සේගේ වචනය අවිශ්වාස කිරීමට අපව පෙළඹවීමටයි.

**හෙබ්‍රෙව් 12 : 1 :- " ....... ඇදහිල්ලේ කතෘවරයාද සම්පූර්ණ කරන්නාවූද යේසුස්වහන්සේ දෙසම බලමින්, අප ඉදිරියෙහි තබා තිබෙන දිවීම ඉවසිල්ලෙන් දුවමු. "**

**2 කොරි. 5 : 7 :- " මක්නිසාද අප හැසිරෙන්නේ පෙනීමෙන් නොව ඇදහීමෙන්ය. "**

අප යේසුස්වහන්සේ දෙසම බලමින්, ඇදහිල්ලෙන් අපගේ සතුරා පරාජය කරමින්, අවසානය දක්වාම ඉදිරියට යමු.

(v) **ගැළවීම නමැති ආරක්ෂා තොප්පිය - එපීස 6 : 17**

සතුරා පරාජය කිරීමේ ප්‍රථම පියවර වන්නාවූ දේව දරුකමට නොහොත් ගැළවීමට පැමිණෙන පිණිස, දෙවියන්වහන්සේව අපගේ හදවත්වලට පිළිගනිමු. **(යොහන් 1 : 12)**

(vi) **දෙවියන්වහන්සේගේ වචනය නමැති ආත්මයාණන් - වහන්සේගේ කඩුව - එපීස 6 : 17**

දෙවියන්වහන්සේ අපට ලබාදී ඇත්තාවූ යුද්ධායුධ කට්ටලයේ, ප්‍රථමයෙන් සඳහන්වන්නාවූ පහම අපගේ ආරක්ෂාව උදෙසා වන අතර, දේව වචනය නමැති කඩුව, ආරක්ෂාව පිණිස සහ සතුරාට පහරදීම උදෙසාද භාවිතා වේ.

සාතන් යේසුස්වහන්සේව පරීක්ෂා කළවිට, යේසුස්වහන්සේ එම ප්‍රහාරවලින් ජය ගැනීමට, දේව වචනය නමැති කඩුව පාවිච්චි කළ සේක.

දේව දරුවෙනි, දේව වචනය නමැති කඩුව සැමවිටම අප ළඟ තබා ගනිමු. යක්ෂයාව පලවාහැරීම උදෙසා එම වචනය පාවිච්චි කරමු. එම කඩුව මුවහත්ව තබා ගනිමින් **දේව වචනය දිනපතාම <u>කියවමු</u>, <u>කටපාඩම් කරමු</u>, <u>මෙනෙහි කරමු</u>, <u>එයට කීකරුවෙමු</u>.**

ඉහත සඳහන්, දෙවියන්වහන්සේගේ යුද්ධායුධ දෙස විමසිල්ලෙන් බලන අපට, ඉතා වැදගත් සත්‍යයක් පෙනේ. එනම් අපගේ ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ,

- සැබෑකම නමැති ඉඟ පටියද **(එපීස 6 : 14)**
- ධර්මිෂ්ඨකමේ ළය වැස්මද **(එපීස 6 : 14)**
- ශුභාරංචිය නමැති පාවහන්ද **(එපීස 6 : 15)**
- ඇදහිල්ල නමැති පලිහද **(එපීස 6 : 15)**
- ගැළවීම නමැති ආරක්ෂා තොප්පියද **(එපීස 6 : 17)**
- දේව වචනය නමැති කඩුවද **(එපීස 6 : 17)**

මෙම සියලුම යුද්ධායුධවලට සෘජුවම සම්බන්ධ බවයි.

එබැවින් **අප යේසුස්වහන්සේ තුළද, උන්වහන්සේ අප තුළද වසන විට අප දෙවියන්වහන්සේගේ සියලු යුද්ධායුධ පැළඳ සිටින්නෙමු.**

මීට ප්‍රථමයෙන් කිහිප වතාවක් ඔබට පෙන්වාදී ඇති ආකාරයට **එපීස පරිච්ඡේද 4 - 6** දක්වා තේමාව වන්නේ, ක්‍රිස්තුස්වහන්සේ තුළ ඇවිදීම නොහොත් හැසිරීම නොහොත් ජීවත්වීම වේ. ඒ අනුව **එපීස 6 : 10 - 17** දක්වා, දෙවියන්වහන්සේ අපට උගන්වන්නාවූ ප්‍රධානතම පාඩම වන්නේ **ක්‍රිස්තුස්වහන්සේ තුළ ජීවත්වීමේ** වැදගත්කමයි. **උන්වහන්සේව පැළඳගැනීමේ** වැදගත්කමයි.

දේව දරුවෙනි, අප සැම දෙන යේසුස්වහන්සේව පැළඳ - ගනිමින්, උන්වහන්සේට අප තුළ ජීවත්වන්ටද, අප තුළින් ක්‍රියාකරන්ටද ඉඩ හරිමු.

**ගලාති 2 : 20 :-**

**" මම ක්‍රිස්තුස්වහන්සේ සමඟ කුරුසියෙහි ඇණගසනු ලැබ සිටිමි ; එසේවී නමුත් මා ජීවත් වෙමි ; නුමුත් <u>තවත් මා නොව ක්‍රිස්තුස්වහන්සේ මා තුළ ජීවත් වනසේක</u>. තවද මා දැන් මාංසයෙහි ජීවත්වන ජීවිතය, මට ප්‍රේමකළාවූ, මා උදෙසා තමන්ම පාවාදුන්නාවූ දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන් - වහන්සේ කෙරෙහි ඇදහිල්ලෙන් ජීවත්වෙමි. "**

**යක්ෂයාව පරාජය කරමින්,**

**ක්‍රිස්තුස්වහන්සේ තුළ ජීවත්වීමට,**

**දෙවි ස්වාමීන්වහන්සේ**

**ඔබට සවිය සහ බලය දෙනසේක්වා !!!**

# නොමිලේ ලැබෙන අමිල ත්‍යාගය



# ගැළවීම

# නොමිලේ ලැබෙන අමිල ත්‍යාගය

**හැඳින්වීම**

මනුෂ්‍ය වූ අප සැම සාමාන්‍යයෙන් පිළිගන්නාවූ ද, බොහෝ විට අත්දකින්නාවූද ''සත්‍යයක්'' වන්නේ, **'වටින්නාවූ ඕනෑම දෙයක් ලබා ගැනීම උදෙසා, අනිවාර්යයෙන්ම වැයවීමක්, කැපවීමක් හෝ පරිත්‍යාගයක් හෝ අධික මිලක් වැනි දෙයක් ගෙවීම අත්‍යවශ්‍යය වන බවයි.**

නිදසුනක් වශයෙන් වෛද්‍යවරයෙක් වීමට අපේක්ෂා කරන්නාවූ තරුණයෙකුට, එම ඉලක්කය කරා ලඟාවීමට මහත් කැපවීමෙන් තමාගේ අධ්‍යාපනය උදෙසා, තම කාලය වැය කිරීමට සිදුවේ. එලෙසම ඕනෑම ක්ෂේත්‍රයක ඉහල මට්ටමක් කරා යෑම උදෙසා බොහෝ දේ පරිත්‍යාග කිරීමට හෝ තමා ආස කරන්නාවූ සමහර දේ අතහැරීමට අපට සිදුවේ. එබැවින් අපට යමක් නොමිලේ ලැබෙන බව, අසන්ට ලැබුනු විට, අප තුළ බොහෝ විට ඇතිවන්නේ, ඒ පුවත ගැන විශ්වාසයක් නොව සැකයකි.

මාගේ ආදරනීය සහෝදරයා/ සහෝදරී මේ 'පොත් පිංච' මා ලියන්නේ ඔබට ඇදහීමට බැරි තරම් පුදුම ආරංචියක් ඔබට කියා දීමටයි. එනම් මනුෂ්‍ය ජීවිතයේ අපට ලබා ගත හැකි, වඩාත්ම වටින්නාවූ, **අමිල තෑග්ග ඔබට නොමිලේ ලබා ගත හැකි බවයි.**

එබැවින් මෙම ත්‍යාගය ලබා ඇත්තාවූ මා, ඉතා ඕනෑකමින් ඔබගෙන් ඉල්ලා සිටින්නේ ඔබගේ වටිනා කාලයෙන් අඩහෝරාවක් වැයකර, විවෘත හදවතකින් සහ මනසකින්, මේ පොතේ අවසානය දක්වා කියවීමටයි.

## 1. නවීන සමාජයේ පවතින සමහර සෘණාත්මක ලක්ෂණ

### (i) දැනුමේ වර්ධනය සහ මිනිස් හැසිරීමේ පරිහානිය

අප අද ජීවත්වන්නේ, මිනිසාගේ දැනුම ඉතා සීග්‍රයෙන් වර්ධනය වන්නාවූ ලෝකයකය. තාක්ෂණික දියුණුව අද කෙතරම් සීග්‍රයෙන් වර්ධනයවේද යත්, වර්තමාන

ලෝකයේ තිබෙන්නාවූ වඩාත්ම නවීන ජංගම දුරකථනයක් අප අද මිලදී ගතහොත්, තව වසරක ඇවෑමෙන් එයට වඩා බොහෝ සේ දියුණු වූ දුරකථනයක් ඊට වඩා අඩු මිලකට ගතහැකි වනු නොඅනුමානය.

මේ අයුරින් ඉමහත් වේගයකින් මිනිසාගේ දැනුම වර්ධනය වන්නාවූ ලෝකයේ, මිනිසාගේ සදාචාරාත්මක භාවයේ, අපට බොහෝ විට පෙනෙන්නේ, වර්ධනයක් නොව පිරිහීමකි. මිනිස් ශිෂ්ඨාචාරය දියුණුවීම සමඟ, මිනිස් හැසිරීමේ ද දියුණුවක් අපට අපේක්ෂා කළ හැකි නමුත්, නවීන සමාජය අපට පෙන්නුම්කරන්නේ මීට හාත්පසින්ම වෙනස්වූ තත්වයකි.

**'දියුණු වූ වර්තමාන සමාජයේ'** අසාධාරණය, වංචාව, සොරකම, අල්ලස් සහ දූෂණ වැනි දේ වල වර්ධනයක් මිස අඩුවීමක් අප නොදකින්නෙමු. මාගේ ආදරණීය සහෝදරයා/ සහෝදරී, මෙයට හේතුව කුමක්ද කියා, ඔබ ඕනෑකමින් සිතා තිබෙනවාද? ඔබ මෙය ගැන සිතා තිබේ නම්, සමහරවිට මෙසේ සිදුවන්නේ, මනුෂ්‍යයාගේ ස්වභාවයෙන්ම ඔහුගේ අභ්‍යන්තරයෙන් නැතහොත් හදවතෙන් පැනනැගෙන්නාවූ හේතු නිසා බව ඔබ නිගමනය කරන්ට පුළුවන.

ඉහත සඳහන් අයුරින්, දැනුම අතින් සීඝ්‍රයෙන් වර්ධනය වන ලෝකයේ, මනුෂ්‍යයාගේ හැසිරීමේ පිරිහීමට හේතුව සහ **එම ප්‍රශ්නයට විසඳුමක්ද** මෙම 'පොත් පිංච' මගින් ඔබට ලැබෙනු ඇතැයි මම විශ්වාස කරමි.

## (ii) <u>**යහපත සහ අයහපත අතර ගැටුමෙන් අයහපත ජයගැනීමේ ප්‍රවනතාවය**</u>

දියුණු වෙමින් පවතින්නාවූ මිනිස් සමාජයේ නිරන්තරයෙන්ම පවතින්නාවූ එක් ගැටළුවක් වන්නේ, හොඳ සහ නරක, යහපත සහ අයපත, සාධාරනත්වය සහ අසාධාරනත්වය වැනි දේ අතර ඇත්තාවූ ගැටුමයි. මෙයට මූලික හේතුවක් ලෙස අප දකින්නේ, සමාජයේ ඉහල මං පෙත්තක් කරා නැගීමට සමාජයේ අති බහුතරයක් දරන්නාවූ දැඩි උත්සාහයයි.

තමාගේ ජීවිතය ඉහල ඉලක්කයක් වෙත ගෙන යෑමට වෙර දැරීම

අප කවුරුත් අගය කළ යුතු ගුණාංගයකි. මෙනමුත් මෙය තුළින් ඇතිව තිබෙන්නාවූ ඉතා අහිතකර ප්‍රතිඵලයක් අප දකින්නෙමු. එනම්, තමාගේම ඉලක්කය ඉටුකර ගැනීම උදෙසා, **'වැරදි ක්‍රම'** භාවිතා කරන්නාවූ, අන් අයගේ අයිතිවාසිකම් නොසලකන්නාවූ, ඉතාමත් ආත්මාර්ථකාමීව ක්‍රියා කරන්නාවූ සමූහයක් බිහිවීමයි. මෙය හේතුකොටගෙන මනුෂ්‍යයන් අතර සහයෝගය වෙනුවට තරඟකාරීකම වැඩිවෙමින් පවතින්නාවූ තමාගේ **'දියුණුව'** ගැන පමණක් සිතන්නාවූ මනුෂ්‍යයන්ගේ සංඛ්‍යාව ඉතා වේගවත්ව වැඩිවෙන්නාවූ සමාජයක් අද නිර්මාණය වෙමින් පවතියි.

මෙම ඉතා අහිතකර තත්වය නිසා අද අප සමාජයේ දකින්නාවූ අයහපත් ප්‍රතිඵල කීපයක් පහත සඳහන් වේ.

(i) නැති බැරි අයගෙන් ඇති හැකි අය අයුතු ප්‍රයෝජන ගැනීම

(ii) විවිධ අරමුණු ඉටු කර ගැනීම උදෙසා, බොහෝ දෙනා අල්ලස් දීමට පෙළඹීම.

(iii) තමාගේ උසස් වීම තකා, අන් අය පාවා දීම සහ අසාධාරන දේ කිරීම ප්‍රචලිත වීම.

(iv) මනුෂ්‍යයන් තම තත්වය, බලය සහ මිල මුදල් අයුතු ලෙස භාවිතා කිරීම.

ඉහත සඳහන් හේතු නිසා, සමාජය තුළ යහපත සහ අයහපත අතර ගැටුමෙන්, අද බොහෝවිට ජය ගන්නේ අයහපතයි.

මාගේ ආදරණීය සහෝදරයා සහෝදරී, මෙලෙස අයහපත ජයග්‍රහණය කරන්නාවූ සමාජයේ වෙනසක් ඇති කිරීමට ඔබට නොහැකියයි ඔබ සිතනවාද?

**සැබවින්ම ඔබට එසේ කළ හැකි බව අපගේ විශ්වාසයයි.**

## 2. ඉහත සඳහන් සෘණාත්මක ලක්ෂණ සමාජයේ ඇතිවීමට මූලික හේතු

නවීන සමාජයේ පවතින්නා වූ සෘණාත්මක ලක්ෂණ දෙස අපගේ අවධානය යොමු කළ විට අප දකින්නේ, ඉහත සඳහන් ලක්ෂණ

සමග තවත් බොහෝ අහිතකර ලක්ෂණ ලෝකයේ සෑම රටකම දක්නට ඇති බවයි.
ඒවායින් සමහරක් පහත සඳහන්වේ.

(i) මත් ද්‍රව්‍ය වලට ඇබ්බැහිවීම.
(ii) ඉතා සුළු හේතූන් මත මිනිස් ඝාතන සිදුවීම.
(iii) ස්ත්‍රී දූෂණ වැඩිවීම.
(iv) ළමා අපචාර වැඩිවීම.
(v) ගබ්සා කිරීම් වැඩිවීම.
(Vi) දික්කසාද වැඩිවීම.
(Vii) සමලිංගික සම්බන්දකම් සහ විවාහයන් ප්‍රචලිත වීම.
(viii) සමාජයේ සෑම මට්ටමකම සොරකම්, මැරකම් සහ වංචාව වැඩිවීම.
(ix) මැර කල්ලි බලවත්වීම.
(x) ජනතාවගෙන් බහුතරයක්, තමා අසුනොවේ යයි සිතන අවස්ථාවන්හිදී, රටේ නීති කැඩීම.
(xi) බොරු කීම **'ඉතා සුළු දෙයක්'** ලෙස සැලකීමට සමාජය පුරුදුවීම.

ප්‍රිය මිතුර, මෙම ඉතා ඛේදජනක, ගෝලීය තත්වය ගැඹුරින් අධ්‍යයනය කර, **එයට හේතුව ඔබට සොයා ගැනීමට හැකිනම්, ඔබ විසින් ලෝක ප්‍රජාවට කරනු ලබන්නේ මහඟු සේවයකි.** මෙම හේතුව සොයාගෙන, **එයට විසඳුමක් ඔබට සපයා දීමට හැකිනම්, ඔබ මනුෂ්‍ය වර්ගයාට කරන්නාවූ සේවය අමිල සේවයක් ලෙස සඳහන් කිරීම නිවැරදි වේ.**

එබැවින් මා මෙය කියවන ඔබට ඇරයුම් කරන්නේ, ඉහත සඳහන් ගෝලීය තත්වයට හේතුව විමසා බැලීමට මා සමග එකතු වන ලෙසයි.

මේ විමසා බැලීම මා අරඹන්නේ, අප වෙසෙන්නා වූ මේ ලෝකය ඉබේම ඇති නොවුන බවත්, මෙම ලෝකය මෙන්ම මනුෂ්‍ය වර්ගයාද මැව්වාවූ සර්වබලධාරී දෙවි කෙනෙක් සිටින බවත් උපකල්පනය කරමිනි. මෙය සත්‍යයක් බව ඔබ පිළිගන්නේ නම්, අද ලෝකයේ පවතින ඛේදජනක තත්වයට හේතු සමහරක් පහත

සඳහන් ඒවා විය හැකි බව අපට නිගමනය කළ හැකිවේ.

(i) මැවුම්කාර දෙවියන්වහන්සේ, උන්වහන්සේ විසින් මවන ලද මනුෂ්‍යයා ක්‍රියා කරන අන්දම ගැන නොසලකන්නාවූ දෙවි කෙනෙකි.

(ii) මැවුම්කාර දෙවියන්වහන්සේ, මනුෂ්‍යයා ගේ තත්වය හොඳහැටි දන්නා නමුත්, උන්වහන්සේ එම තත්වයට විසඳුමක් ලබාදීමට හැකියාවක් නොමැති දෙවිකෙනෙකි.

(iii) මැවුම්කාර දෙවියන්වහන්සේ මැව්වාවූ මනුෂ්‍යයාව නොමග හැරීම උදෙසා ක්‍රියාකරන්නාවූ ද, දෙවියන්වහන්සේට විරුද්ධවූද, බලවේග මෙලොව ක්‍රියාත්මක වන අතර, එම බලවේග පරාජය කිරීමට දෙවියන්වහන්සේට බලය නැත.

(iv) **මැවුම්කාර දෙවියන්වහන්සේ සර්වබලධාරී බැවින් උන්වහන්සේට මෙම තත්වය වෙනස් කළ හැකි නමුත්, උන්වහන්සේ සර්ව සාධාරන වන බැවින් උන්වහන්සේ අපට සිතාගත නොහැකි තරම් පුදුමාකාර විසඳුමක් මනුෂ්‍යයාට ලබාදී තිබේ.**

මාගේ ප්‍රේමණීය සහෝදර සහෝදරී, මාගේ විශ්වාසය වන්නේ, ඉහත සඳහන් විවිධ මත අතුරෙන්, අංක (iv) ලෙස සඳහන් නිගමනය වඩාත්ම නිවැරදි බවයි. එම විශ්වාසය නම්, **මැවුම්කාරවූ, සර්ව බලය ඇත්තාවූ, සර්ව සාධාරනවූ, මනුෂ්‍යයාට අතිශයින් ප්‍රේමකරන්නාවූ දෙවියන්වහන්සේ, සෑම මනුෂ්‍යයෙකුට මෙලොව තිබෙන්නාවූ 'සෑම ප්‍රශ්නයකින්ම මුදවා ගැනීම උදෙසා - අමිල තෑග්ගක් අපට නොමිලේ ලබා දීමට බලාසිටින්නාවූ' දෙවිකෙනෙක් වන බවයි.**

## 3. ප්‍රේමයේ දෙවියන්වහන්සේ අප සැමට නොමිලේ ප්‍රදානය කිරීමට සූදානම්ව සිටින්නාවූ අමිල තෑග්ග

## (i) <u>මනුෂ්‍ය සංහතියේ තුඩුදෙන ප්‍රශ්නය</u>

සර්වබලධාරී, සර්වසාධාරන, මහෝත්තමවූ, ප්‍රේමයේ දෙවියන්වහන්සේ තමන්වහන්සේගේ **'ස්වරූපයෙන් සහ සමානත්වයෙන්'** මනුෂ්‍යයා මැවූ සේක. **(උත්පත්ති 1:26)** උන්වහන්සේ සතුටින්, සමාදානයෙන් සහ තෘප්තියෙන් පිරුනාවූ ජීවිතයක් ගත කිරීම උදෙසා, මනුෂ්‍යයාට අවශ්‍යවන්නාවූ සෑම දෙයක්ද, ආරම්භයේදී සැපයූ සේක.

දෙවියන්වහන්සේ විසින්ම නිර්මාණය කරන ලද්දාවූ, **'දැකීමට ප්‍රියවූ කෑමට හොඳවූ සියලු ගස්වලින්'** සමන්විත වූ අති අලංකාර උයනක්, නිවසක් ලෙස මනුෂ්‍යයාට උන්වහන්සේ ප්‍රදානය කළ සේක. **(උත්පත්ති 2:9)** එබැවින් මනුෂ්‍යයා ආරම්භයේදී විසුවේ, රසවත් පෝෂ්‍යදායී ආහාර නොඅඩුවූ, දූෂණයෙන් තොරවූ, අති පිරිසිදු පරිසරයක් තුළ විය. දෙවි සමිඳුන් මනුෂ්‍ය වර්ගයාට මෙන්ම පොළොවේ සියලු මෘගයන්ට අවශ්‍ය ආහාරද සපයා දුන් සේක.

**උත්පත්ති 1:29,30:- " [29] තවද දෙවියන්වහන්සේ: බලව, මුළු පොළෝතලයෙහි ඇති බීජ දරන සියලු පලාද, බීජ දරන ඵල ඇති සියලු වෘක්ෂයන්ද නුඹලාට දුනිමි; එය නුඹලාට ආහාර පිණිස වන්නේය. [30] පොළොවේ සියලු මෘගයන්ටත් ආකාශයේ සියලු පක්ෂීන්ටත් පොළොව පිට බඩගා යන පණ ඇති සියලු සතුන්ටත් ආහාර පිණිස සියලු නිල් පලා දුනිමියි කීසේක."**

දෙවියන්වහන්සේ ඉහත සඳහන් ආහාර උන්වහන්සේගේ මුළු මැවිල්ලට සපයා දුන් බැවින්, මුළු මැවිල්ල තුළ 'බිය සහ සැක' වැනිදේ නොතිබුණි. මනුෂයා සහ මැවුම්කාර දෙවියන්වහන්සේ අතරද, මනුෂ්‍යයා සහ සත්ව ලෝකය අතරද, මනුෂ්‍යයා සහ සොබාදහම අතරද, පැවතුනේ අති යහපත් සබැඳියාවකි.

දෙවියන්වහන්සේට එරෙහිව සිටින යක්ෂයා, උන්වහන්සේ මැව්වාවූ සුන්දර ලෝකයේ, මනුෂ්‍යයාට උන්වහන්සේ විසින් දෙන ලද්දාවූ **ආශිර්වාද සොරාගැනීමටත්,** උන්වහන්සේ සහ මනුෂ්‍යයා අතර තිබුනාවූ **සම්බන්දකම නැතිකර දැමීමටත්,** මනුෂ්‍යයාගේ **අනාගතය විනාශකර දැමීමටත්,** ක්‍රියාත්මක විය.

**යොහාන් 10:10:- '' සොරා එන්නේ සොරකම් කරන්ටත් මරන්ටත් විනාශකරන්ටත් පමණක්ය......''**

යක්ෂයා බොරුවෙන් සහ වංචාවෙන් මනුෂ්‍යයා මුලාකොට, දෙවියන්වහන්සේට අකීකරු වීමට මනුෂ්‍යයාට සැලසුවේය. මනුෂ්‍යයාගේ මේ අකීකරුකමේ ප්‍රතිඵලය වූයේ, මනුෂ්‍යයා දෙවියන්වහන්සේ දුන්නාවූ උයනින් නෙරපා දමනු ලැබීම, දෙවියන්වහන්සේ සහ මනුෂ්‍යයා අතර තිබුනාවූ සම්බන්දකම කැඩීයාම, සහ සදාකාල විනාශය මනුෂ්‍යයාට හිමිවීමයි.

මීට අමතරව, තව ඛේදජනක දෙයක් මනුෂ්‍යයාට සිදුවිය. අප කලින් දුටු ආකාරයට මනුෂ්‍යයා මවන ලද්දේ 'දෙවියන්වහන්සේගේ ස්වරූපය සහ සමානත්වය' ඇතිවය. එබැවින් **මනුෂ්‍යයා තුළ දෙවියන්වහන්සේගේ ස්වභාවය රජකම් කළේය.** නමුත් මනුෂ්‍යය යක්ෂයාට රැවටී, යක්ෂයාට කීකරු වූ විට මනුෂ්‍යයා, දෙවියන්වහන්සේගේ ස්වභාවය අතහැර යක්ෂයාගේ ස්වභාවය පැළඳගත්තේය. **එදා පටන් මනුෂ්‍යයා තුළ රජකම් කරන්නේ යක්ෂයාගේ ස්වභාවයයි.**

**අප ප්‍රථමයෙන්ම ඔබට පෙන්වා දුන්නාවූ, මිනිස් හැසිරීමේ පරිහානියද , යහපත සහ අයහපත අතර ගැටුමේදී අයහපත ජයගැනීමේ ප්‍රවනතාවයද සීග්‍රයෙන් වර්ධනය වන්නාවූ ගෝලීය තත්ත්වයක් අද ඇතිව තිබෙන්නේ, මනුෂ්‍යයා තුළ ක්‍රියාකරන්නාවූ යක්ෂයාගේ ස්වභාවය හේතුවෙනි.**

මනුෂ්‍යයා යක්ෂයාට කීකරුවීමෙන් පසුව, මෙලොව උපදින සෑම මනුෂ්‍යයෙක්ව ලොවට බිහිවන්නේ, යක්ෂයාගේ ස්වභාවට නොහොත් පාපිෂ්ඨ ස්වභාවයකින් යුතුවය. මෙලොව උපත ලබන සෑම මනුෂ්‍යයෙක්ම උපදින්නේ, පව්කාර ස්වභාවයක් සහිතව බැවින්, පවින් තොර ජීවිතයක් ගත කිරීමට කිසි මනුෂ්‍යයෙකුට නොහැක. එමෙන්ම කිසිම මනුෂ්‍යයෙකුට 'පාපිෂ්ඨ' නොහොත් 'වැරදි' දේ කිරීමට කිසිවෙක් ඉගැන්වීම අවශ්‍ය නොමැත. තමා තුළ සහජයෙන්ම ඇත්තාවූ පාපිෂ්ඨ ස්වභාවය නිසා, සෑම මනුෂ්‍යයෙක්ම පාපයට ගොදුරු වෙයි. මෙම හේතුව නිසාම ඉතා බිලිඳු වයසේ දරු දූරියන්ට වැරදි දේ කිරීමට කිසි කෙනෙක් ඉගැන්වීම අනවශ්‍ය බව, අප සැමදෙන අත්දැකීමෙන් දනිමු.

මාගේ ප්‍රේමනීය සහෝදරයා, සහෝදරී **අප සැම තුළ ඇත්තාවූ, පාපිෂ්ඨ ස්වභාවයෙන් ගැළවෙන්නේ කෙසේද?** යන්න මුළු මනුෂ්‍ය සංහතියට තිබෙන්නාවූ විශාලතම ප්‍රශ්නයයි.

## (ii) දෙවියන්වහන්සේ නොමිලේ ලබා දී ඇත්තාවූ විසඳුම

අපව මැව්වාවූ දෙවියන්වන්සේ බොරු නොකියන්නාවූ වෙනස් නොවන්නාවූ දෙවියන්වහන්සේ වන සේක. ප්‍රේමයෙන් පරිපූර්ණ වූ උන්වහන්සේ නොවෙනස්වන බැවින්, මනුෂ්‍යයා උණ්වහන්සේට අකීකරු වූ නමුත් මනුෂ්‍යයා වෙත උන්වහන්සේගේ ප්‍රේමය කිසිසේත් අඩු නොවූ සේක.

එම ප්‍රේමය නිසා, දෙවියන්වහන්සේගේ කැමැත්ත වන්නේ උන්වහන්සේ සහ මනුෂ්‍යයා අතර ආරම්භයේදී තිබුනාවූ සම්බන්ධකම නැවත ඇතිකර ගැනීමයි.

දෙවියන්වහන්සේ ප්‍රේමයේ දෙවියන්වහන්සේ වන අතර උන්වහන්සේ ඇති ශුද්ධ වූ දෙවියන්වහන්සේ වනසේක. එබැවින් ශුද්ධ වූ නොහොත් කිසි පාපයක් නැත්තාවූ උන්වහන්සේට 'පව්කාර මනුෂ්‍යයා' හා සමඟ සම්බන්ධකමක් ඇති කර ගැනීමට නොහැකි වේ.

එපමණක් නොව, උන්වහන්සේ සර්ව සාධාරන වූ දෙවියන්වහන්සේ වන සේක. එබැවින් පව්කාර මනුෂ්‍යයාගේ පාපය විනිශ්චය කිරීමට සහ නිසි දඬුවම් ඔහුට ලබා දීමට දෙවියන්වහන්සේ බැඳී සිටින සේක.

මාගේ ප්‍රේමනීය සහෝදරයා/සහෝදරී මෙම 'විසඳුමක් නොමැති ප්‍රශ්නයට' දෙවියන්වහන්සේ ලබා දී ඇත්තාවූ විසඳුම අපට සිතා ගැනීමට බැරි තරම් පුදුමාකාර වේ. කිසිම මනුෂ්‍යයෙකුට පාපයෙන් සම්පූර්ණයෙන්ම මිදී ජීවත්වීමට නොහැකි බව දන්නාවූ උන්වහන්සේ, සැම මනුෂ්‍යයෙකුට හිමි වන්නාවූ **'පාපයේ කුලිය නොහොත් මරණය'** විඳීමට උන්වහන්සේ එකම පුත්‍රයා වන යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ලොවට එවූසේක. උන්වහන්සේ පව්න් තොර ජීවිතයක් ගත කර, අපගේ පව් උදෙසා, උන්වහන්සේගේ ජීවිතය කල්වරි කුරුසියේදී පිදූසේක.

**රෝම 5:8 :- "නුමුත් දෙවියන්වහන්සේ අප කෙරෙහි ඇති තමන්වහන්සේගේ ප්‍රේමය පෙන්වන්නේ අප පව්කාරයන්ව සිටියදීම <u>අප වෙනුවට ක්‍රිස්තුස්වහන්සේ මරණය විඳීමෙන්ය.</u>"**

දෙවි සමිඳුන් ඔබ සහ මා වෙනුවෙන් කළාවූ මෙම පූජාව අදහමින්, යේසුස්වහන්සේට තම ජීවිතය භාරකරන්නාවූ සැමදෙනාට, දේව දරුකමට ඇතුල්වීමට දෙවියන්වහන්සේ පොරොන්දු වී ඇතිසේක.

**යොහන් 1:12 :- "නුමුත් යම් පමණ දෙනෙක් උන්වහන්සේ පිළිගත්තෝද, එනම් උණ්වහන්සේගේ නාමය කෙරෙහි අදහාගන්නෝද, <u>ඔවුන්ට දෙවියන්වහන්සේගේ දරුවන් වෙන්ට උන්වහන්සේ බලය දුන්සේක.</u>"**

මාගේ සෙනෙහෙවන්ත සහෝදරයා/ සහෝදරී දෙවියන් වහන්සේ ඔබ ඉදිරියේ තබන්නාවූ මෙම පොරොන්දුව දෙස විමසිල්ලෙන් බලන්න.

උන්වහන්සේ මෙහි පොරොන්දු වන්නේ, උන්වහන්සේගේ දරුවන්වීමට අපට බලය දෙන බවයි. එනම් 'දේව ස්වභාවය' අප තුළ අලුතෙන් ඇති කරන්ට යන බවයි. අප තුළ පවතින්නාවූ 'යක්ෂයාගේ නොහොත් පාපයේ ස්වභාවය' ඉවත් කර, ඒ වෙනුවට දේව දරුකම අපට දී, දේව ස්වභාවට අප තුළ අලුතින් ඇති කරන බවයි.

**2 කොරින්ති 5:17 :- "එබැවින් යමෙක් ක්‍රිස්තුස්වහන්සේ තුළ සිටින්නේ නම් ඔහු අලුත් මැවිල්ලක්ය. <u>පරණ දේ පහව ගියේය; මෙන්න, සියල්ලම අලුත් වී තිබේ.</u>"**

ප්‍රේමයේ දෙවියන්වහන්සේ අප තුළ ක්‍රියාකරන්නාවූ අශුද්ධ බලවේග පහකර දමා, අපව ඇතුලාන්තයෙන් වෙනස්කරන බව මම ඒකාන්තයෙන්ම දන්නේ, මීට වසර 44 ට පෙර උන්වහන්සේ මේ මහත් හාස්කම මගේ ජීවිතයේ කළ නිසාය. එබැවින් මාගේ මුළු හදවතින්, මා ඔබට ඇරයුම් කරන්නේ, පහත සඳහන් අයුරින් ක්‍රියා කරන ලෙසය.

**1 නි පියවර** - ඔබ තුළ ක්‍රියාකරන්නාවූ 'පාපිෂ්ඨ ස්වභාවය'

හේතුකොටගෙන, ඔබ දැන හෝ නොදැන කළා වූ **සියලු පාප ගැන පසුතැවිලි වී, දෙවියන්වහන්සේගෙන් ඒවාට සමාව ලබාගන්න.**

**2 නි පියවර** - යේසුස්ක්‍රිස්තුස්වහන්සේට ඔබගේ ජීවිතය භාරදී, දෙවියන්වහන්සේගේ දරුකමට ඇතුල් වන්න.

**3 නි පියවර** - දෙවියන්වහන්සේගේ දරුවකු සේ **උන්වහන්සේට කීකරුව ද විශ්වාසවන්තවද ජීවත්වීමට තීරණය කරන්න.**

ඔබ මෙසේ කරන විට, ඔබට අසීමිත ලෙස ප්‍රේමකරන්නාවූ දෙවියන්වහන්සේ, ඔබව උන්වහන්සේගේ දරුවෙක් ලෙස බාරගෙන, එඬේරෙකු මෙන් ඔබව ගෙන යනසේක.

**ගීතාවලිය 23:1-6 "ස්වාමීන්වහන්සේ මාගේ එඬේරාය; මට හිඟයක් නොවන්නේය. [2] උන්වහන්සේ තිල් ගොදුරු බිම්වල මා ලගින්ට සලස්වනසේක. නිශ්චල වූ දිය අසලින් මා ගෙනයනසේක. [3] උන්වහන්සේ මාගේ ආත්මය ප්‍රාණවත් කරනසේක;..... ධර්මිෂ්ඨකමේ මාවත්වල මා ගෙනයන සේක..........[5] මාගේ හිස තෙලින් ආලේප කළ සේක; මාගේ කුසලාන උතුරා යයි. [6] සැබවින් යහපතකමත් කරුණාවත් මාගේ ජීවිතයේ සියලු දවස්වල මා අනුව එන්නේය. මම සදාකල්ම ස්වාමීන්ගේ ගෘහයෙහි වාසය කරන්නෙමි.**

ඉහත සඳහන් අයුරින් දෙවියන්වහන්සේ ඔබට ලබාදෙන්නාවූ අමිල තෑග්ග, උන්වහන්සේට කැපවී අදම නොමිලේ ලබාගන්න. එසේ ලබා ගැනීම උදෙසා, පහත සඳහන් යැදුම අවංකව දෙවි සමිඳුන්ට පුදන්න.

*ප්‍රේමණීය දෙවිපියාණනි, ඔබ වහන්සේ මා උදෙසා කළ ඇති පූජාව අද දින මා තේරුම් ගත්තෙමි. යේසුස් වහන්සේ මාගේ පාපයේ දඬුවම කුරුසියේ ගෙවූ බව මම අද දින දැන ගත්තෙමි. යේසුනි, මාගේ පව් උදෙසා කුරුසියේ මැරුණාට ස්තුතියි. මාගේ ගැලවුම් කාරයාණන් හා ස්වාමීන් හැටියට ඔබ පිළිගනිමි. මාගේ ජීවිතය භාරගෙන ඔබගේ කැමැත්ත අනුව මා හැඩ ගැස්සුව මැනව. ආමෙන්.*

මෙම පුදුමාකාර ශුභ ආරංචිය, අන් අය සමගත් බෙදාගන්න.

**එසේ කිරීමට, ඔබගේ දෙව් පියාණන්වහන්සේ ඔබට ශක්තිය සහ ධෛර්‍යය දෙන සේක්වා !!**